# සසර තතු දත යුතු

## (දේවදූත සූත්‍රය ඇසුරෙන්)

**සංස්කාරකඃ-**

**පූජ්‍ය නිකපිටියේ ගුණරතන හිමි**

**(ධර්ම දානය පිණිසයි)**

ශ්‍රී බුඃ වඃ 2563 ක් වූ ඉල් මස පුර පසළොස්වක නම් තිථිය ලත් සඳු දින

ව්‍යඃ වර්ෂ 2019-11-11

# පෙරවදන

අතීත අනාගත වර්තමාන කාලත්‍රයට අයත් වූ ද, කාල විනිර්මුක්ත නිර්වාණ ප්‍රඥප්ති නම් වූ ද සර්ව ධර්මයන් අතැඹුලක් (අතට ගත් නෙල්ලි ගෙඩියක්) සේ සියලු ආකාරයෙන් අවබෝධ කර ගත්තා වූ සිද්ධාර්ථ ගෞතම ශාක්‍ය මුනීන්ද්‍ර නම් වූ අපගේ සර්වඥ රාජෝත්තමයන් වහන්සේ විසින් ලෝක ධාතුව පිළිබඳව දේශනා කරන ලද දේශනා අතුරෙන් දේවදූත සූත්‍රාන්ත දේශනාව විශේෂ තැනක් ගනී.

බෞද්ධයන් විසින් මනාව දැනගත යුතු වූ ද, එහෙත් නිතර ලොව තුළ පැතිරෙන සන්නිවේදන මාධ්‍යයෙන් හෝ කලාතුරකින් අසන්නට ලැබෙන්නා වූ ද දේවදූත සූත්‍රාන්තය කුසලාකුසල හේතුඵල ධර්මයන් පිළිබඳ ඵල විපාක විවරණය කෙරෙන බුද්ධ දේශනාවකි. සසර දුක ගැන අවබෝධ කොට නොපමාව නිවන් මඟ පියනැගීම පිණිස නුවණ අවධි කරවන අනුශාසනාවකි.

පූජ්‍ය නිකපිටියේ ගුණරතන ස්වාමින් වහන්සේ විසින් සම්පාදිත වූ මේ දහම් පොත දේවදූත සූත්‍රාන්ත දේශනාව සම්බන්ධ ඉතාමත් සරල වූ ද, සවිස්තර වූ ද අනර්ඝ නිබන්ධනයකි.

මෙය සිහි නුවණින් යුතුව සාවධානව කියවා වටහාගෙන අප්‍රමාදීව ශීල සමාධි ප්‍රඥා ශීර්ෂයෙන් ප්‍රතිපත්ති පිරීමෙහි උත්සාහ වෙත්වා යනු අපගේ මෛත්‍රී ආරාධනාවයි.

පූජ්‍ය නිකපිටියේ ගුණරතන ස්වාමින් වහන්සේට මෙම ධර්ම දානමය පුණ්‍යානුභාවයෙන් සහ රත්නත්‍රයානුභාව බලයෙන් ධර්මඥනය භාවනාඥනය තව තවත් සිය දහස් ගුණයෙන් මුදුන්පත් වේවා. විංශත් ශතවර්ෂාධික කාලයක් දීර්ඝායුෂ ශ්‍රී සම්පත් අත් වේවා. ශාන්ති ලක්‍ෂණ නිර්වාණ ධාතුව සුවසේම සාක්‍ෂාත් වේවා.

මෙම දහම් පොත ධර්ම දානමය වශයෙන් මුද්‍රණය කරවා පිරිනමන ධර්මකාමී පරිත්‍යාගශීලී සැමත් මෙය මුද්‍රණය කරවා දෙන

මුද්‍රණාලයෙහි කාර්ය මණ්ඩලයත්, මෙය කියවන සැමත් ප්‍රතිපත්ති පිරීමෙහි උත්සාහ වෙත්වා.

**"සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා"**

මෙයට
මෙතැති
නා උයනේ අරියධම්ම ස්ථවිර
නා උයන ආරණ්‍ය සේනාසනය
පන්සියගම.

# හැඳින්වීම

**"පමත්තස්ස ච නාම චත්තාරො අපායා සකගෙහසදිසා, අම්හාකඤ්හි සකගෙහං විය අට්ඨ මහානිරයා විවටද්වාරායෙව"**

(ධම්මපදට්ඨකථා)

පමා වූවහුට වනාහි සතර අපාය තම ගෙදර වැනිය. අපගේ මහ ගෙදර දොර සැමවිට අපට විවෘතව පවතින්නා සේ අට මහ නිරයෙහි දොරටු ඇරී පවතී.

අගක් මුලක් නැතිව අනාදිමත් කලක් සසර දුක් විඳින සත්වයන්ට නාමරූප, ස්කන්ධ, ධාතු, ආයතන, පටිච්ච සමුප්පාද ආදී සත්‍ය වශයෙන් පවත්නා ධර්ම ස්වභාවයන් පිළිබඳව අනවබෝධය හේතුවෙන් ලෝ සතුන් අවිද්‍යාවෙන් මුලා වී තෘෂ්ණාවෙන් බැඳී දිට්ඨියෙන් වෙළී පැටලී දුකෙන් දුකට පත් වී සසරම රැඳෙති. ඒ අතර බන්ධනාගාර ගත සිරකරුවන් එක් බන්ධනාගාරයක සිට අන් බන්ධනාගාරයකට මාරු කරන්නාක් මෙන් අපායෙන් අපායට අපායෙන් ප්‍රේත ලෝකයට ප්‍රේත ලෝකයෙන් තිරිසන් ලෝකයට තිරිසන් අපායෙන් මනුලොවට මනුලොවින් නැවත අකුසල් කොටගෙන තිරිසන් ප්‍රේත නරකාදී අපායන්ට කර්මානුරූපව උප්පත්ති වශයෙන් පැමිණෙති.

ඇතැම් විට අසරණයෙකු දුක් මහන්සි වී ධනයක් සොයාගෙන සැපයක් විඳීමට මුදල් ගෙවා උසස් ලෙස ඒ ගෙවූ වටිනාකම අනුව සැප පහසුව ඇති තානායමකට ගොස් දින කිහිපයක් සැපයක් විඳ ඒ ගෙවූ වටිනාකම අවසන් වූ පසු නැවත තම වාසස්ථානයට ම යන්නා සේ ලෝ සතුන් තම නිවසෙහි සිටින්නා සේ සතර අපායෙහි වාසය කොට තානායමක සැප විඳීමට ධනයක් රැගෙන යන්නා සේ කුසල් කොට මනුලොවට දෙව්ලොවට බඹ ලොවට උත්පත්ති වශයෙන් ගොස් එහි සීමිත කාලයක් සැප විඳ නැවත තම නිවසට ම යන්නා සේ සතර අපායටම යති.

මෙලෙස සත්වයන් සසරක විඳින දුක් දැක මහත් කරුණා පෙරදැරිව මහා පුරුෂයෝ බෝධි සම්භාර පුරා සියලු ධර්මයන් අතැඹුලක් සේ අවබෝධ කොට ලොව්තුරා බුදු බවට පැමිණ ගමින් ගම වඩිමින් මහා කරුණාවෙන් ධර්ම දේශනා කොට ආර්‍ය මාර්ගය විවෘත්ත කොට නිවන් මග පෙන්වා සසර තතු පහදා එයින් නිදහස් වීමට මඟ කියා දෙති.

මෙසේ සසර තතු පහදා දෙමින් වදාළ ලොව පහළ වූ සියලු බුදුරජාණන් වහන්සේලා අත නොහැර දේශනා කරන්නා වූ අවිජහිත දේශනාවක් වන මෙම දේවදූත සූත්‍රය තුළින් සසරෙහි ඇති සැබෑ තත්වය මැනවින් පහදා දෙන අනර්ඝ බුද්ධ දේශනාවකි. මෙය කියවා මැනවින් තේරුම් ගන්නේ නම් එය සසර දුකින් නිදහස් වීමට අතිශයින් ප්‍රයෝජනවත් වේ.

මෙම අගනා ධර්ම ග්‍රන්ථය ධර්ම දානයක් වශයෙන් පිරිනමනු ලබන්නේ පුණ්‍යකාමී ජේ. එම්. මිස්සක බණ්ඩාර මහත්මා සහ ඒ. එල්. ඒ. කේ, කුමාරි මහත්මිය යන දෙපල විසින් ව්‍යඃ වඃ 2019-11-11 වන ඉල් පුර පසළොස්වක පොහොය දින නා උයන ආරණ්‍යයෙහි දී සිදු කරන ධර්ම දානමය කුසලයෙන් පින්වත් මිස්සක බණ්ඩාර මහත්මාට සහ කුමාරි මහත්මියට නිදුක් නිරෝගී සුවයෙන් දාන සීල භාවනා පුණ්‍ය ක්‍රියාවන් මතුවටත් ඉතා පහසුවෙන් සිදුකර ගනිමින් සැප ප්‍රතිපදාවෙන් පාරමී ධර්ම මුදුන්පත් කරගෙන ධර්මඥාන, භාවනාඥාන වර්ධනය කරගෙන නිවන් සුව ලබන්නට හේතු වේවා. මෙය ඉතා හොඳින් මුද්‍රණය කරවා දුන් යක්කල දිමුතු මුද්‍රණාලයාධිපති තුමා ප්‍රධාන සැමට ද සසර තතු වටහාගෙන අප්‍රමාදීව සීල සමාධි ප්‍රඥා පූර්ණය කොට නිවන් සුව ඉතා පහසුවෙන් අවබෝධ කර ගැනීමට හේතු වේවා. නා උයන ආරණ්‍ය වැසි වූ ද, ලක්දිව වැසි වූ ද, ලෝ වැසි වූ ද සියලු මහ සඟ රුවණට ද සදේවක ලෝකවාසී සැමට ද, නමින් මියගිය ඥාතීන්ට ද, සියලු ප්‍රාර්ථනා මුදුන්පත් වී සැප ප්‍රතිපදාවෙන් නිවන් සුව ලබන්නට හේතු වේවා.

මෙයට
සසුන් දියුණුව කැමති
පූජ්‍ය නිකපිටියේ ගුණරතන ස්ථවිර.

# පුණ්‍යානුමෝදනාව

**"සබ්බදානං ධම්මදානං ජිනාති
සබ්බං රසං ධම්මරසො ජිනාති,
සබ්බං රතිං ධම්මරතී ජිනාති
තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති".**

දානය වනාහි ආමිස දානය, ධර්ම දානය යැයි දෙ වැදෑරුම් වේ. මේ දාන දෙක අතරින් ධර්මදානය අග්‍ර වන්නේ ය. දිය යුත්ත "**දානය**" නම් වේ. එයින් චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස, බෙහෙත්, පරිෂ්කාරාදිය පූජා බුද්ධියෙන් දන් දීම "**ආමිස දානය**" නම් වේ. ඒවා තණ්හා දිට්ඨි ආදියෙන් ස්පර්ශ කළ යුතු බැවින් "**ආමිස**" යයි කියනු ලැබේ. ඒ ආමිස චේතනාවෙන් පරිත්‍යාග කළ යුතු බැවින් "**ආමිස දානය**" නම් වේ. මේ ආමිස වනාහි සියලු දානයන්ගේ නිදානය හෙවත් මූල හේතුවයි. සියලු සම්පත්තීන්ගේ මූලයයි.

අන්‍යයන් හට කරුණාවෙන් දහම් දෙසීම, ධර්ම කථිකයන්ට ගෞරව සත්කාර කොට දහම් දෙසවීම, දහම් පොත පත ලිවීම, ලියැවීමාදිය "**ධර්ම දානය**" නම් වේ. තව ද මේ කුසලධර්මය, මේ අකුසලධර්මය, මේ වැරදිධර්මය ය, මේ නිවැරදිධර්මය ය, මේ නුවණැත්තන් විසින් ගැරහිය යුතු ධර්මය, මේ නුවණැත්තන් විසින් පැසසිය යුතු ධර්මය, මේ ධර්මය අහිත පිණිස දුක් පිණිස පවතී. මේ ධර්මය හිතසුව පිණිස පවතී. යනුවෙන් ත්‍රිවිධ ද්වාරයෙන් සිදු කරන කුසල, අකුසල වශයෙන්, කර්ම, කර්මපථ වශයෙන් බෙදමින්, කර්මය, කර්මවිපාකය වශයෙන් බෙදමින් මෙලොව පරලොව ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්වන්නාක් මෙන් ප්‍රකට කරමින් අකුසල ධර්මවලින් වළක්වමින් කුසල ධර්මයන්හි පිහිටුවමින් ධර්මදේශනා කිරීම, දහම් පොත් ලියා බෙදදීමාදීය "**ධර්ම දානය**" නම් වේ.

එසේම බණ ඇසීම සියලු කුසලයන්ට උපකාර වේ. සත්වයෝ බණ නො අසත් නම් කිසිඳු කුසලයක් නොකරති. සියලු කුසලධර්ම කරන්නේම බණ ඇසීමෙන් ඇතිවන පැහැදීම නිසාමය. බණ ඇසීමෙන්, බණ පොත පත කියවීමෙන් ලෞකික ලෝකෝත්තර ප්‍රඥාව වැඩෙයි. පරතෝඝෝෂ ප්‍රත්‍යය නැතිව සෝවාන් මාර්ගයට නො පැමිණිය හැකි

බැවින් බණ අසා දාන ඉගෙන තිබිය යුතුමය. එබැවින් මෙලොව යමෙක් මනුලොව පටන් බඹලොව දක්වා දණහිසින් දණහිස ස්පර්ශ වන සේ බුදු පසේබුදු මහරහතන් වහන්සේලා වඩා හිඳුවා අග්‍ර ලෙස සිව්පසයෙන් සංග්‍රහ කරන්නේ ද, එය සතර පද ගාථාවකින් කරන එම දානයෙහි ම දානානුමෝදනා කුසලයෙන් සොළොස්වන කලාවෙන් කලාවක් තරම් වත් නොවන්නේය.

සත් තිස් බෝධිපාක්ෂික ධර්ම හා නව ලෝකෝත්තර ධර්ම "**ධර්මරසය**" නම් වේ. දෙවියන් ගේ සුධාබෝජනය ප්‍රධාන සත්ව ලෝකයෙහි ඇති සියලු ආහාර රස වර්ග සතර අපායට සසරට හෙලා දුක් ඇති කරවීමට සමත් ය. ධර්මරසය ජරාමරණ දී දුක්වලින් ද අපා දුක්වලින් ද නිදහස් කොට නිවනට පමුණුවන බැවින් සියලු රසයන් ට වඩා ශ්‍රේෂ්ඨ වේ.

ලාභාපේක්ෂාවෙන් තොරව නිස්සරණාධ්‍යාශයෙන් යුතුව දහම් දෙසීම, දහම් ඇසීම, ධර්මවිනය ඉගෙනීම - ඉගැන්වීම, දහම් පොත පත කියවීම තුලින් උපදනා නිරාමිස ප්‍රීතිය "**ධර්මරතිය**" නම් වේ. අඹු, දරු, දාසි, දස්, ධන, ධාන්‍ය, නැටුම්, ගැයුම්, වැයුම් ආදියෙහි ඇලීම සසර දුකට හේතු වේ. නිරාමිස ප්‍රීතිමත් ධර්මරතිය අර්හත්වයෙන් සියලු දුක් අවසන් කරවන බැවින් සියලු ඇලීම්වලට වඩා ශ්‍රේෂ්ඨ වේ.

කාම, භව, විභව තෘෂ්ණාවන් නසාලන බැවින් අර්හත් මාර්ග ඥානය "**තෘෂ්ණාක්ෂය**" නම් වේ. ධර්මදානය, ධර්මරසය, ධර්මරතිය තුළ යෙදීම තුලින් සියලු සසර දුක් නසාලන බැවින්, ජය ගන්නා බැවින් අර්හත් මාර්ගය සියල්ලට ම ශ්‍රේෂ්ඨ වේ.

නිවන් සුව ලැබීමට තථාගත ධර්මය හැර අන් පිහිටක් නැත. එබැවින් තථාගත ධර්මය නිස්සරණාධ්‍යාශයෙන් දේශනා කිරීම, ශ්‍රවණය කිරීම, දහම් පොත පත කියවීම, දහම් පොත්පත් ලියා ධර්මදානය කිරීම ද අනෙකුත් දානාදී පින්කම් කිරීම, දස කුසල ධර්මයන්හි යෙදීමාදී මේ සියල්ල කැමති වන්නහුට ම ලෞකික ලෝකෝත්තර සියලු සැපතට පැමිණිය හැකි වෙයි. මේ කුසල ධර්මයන්ට අකැමැති වන්නා මේ සියලු සැපතින් පිරිහෙයි.

ඉහත සඳහන් වූ ආකාරයට මහත් ආනිශංස ඇති ධර්‍ම දානමය කුසලයෙන් අප මේ පින්කම්හි යෙදීමෙන් සැනසෙන සම්බුද්ධ ශාසනය තව බොහෝ කලක් ලොව බැබළෙමින් පවතීවා යන ශාසන ගෞරවයෙන්මය.

මෙසේ සිදු කරගන්නා වූ උතුම් කුසලය අපවත් වී වදාළ අති පූජනීය නා උයනේ අරියධම්ම මහා ස්වාමින් වහන්සේට සුව සේ පාරමී පුරා ලොව්තුරා බුදුබව ලබන්නට හේතු වේවා. අති පූජනීය මීගොඩ මහා ස්වාමින් වහන්සේ අති පූජනීය අඟුල්ගමුවේ අරියනන්ද ස්වාමින් වහන්සේ ප්‍රධාන නා උයන ආරණ්‍ය වාසී සියලු කල්‍යාණ මිත්‍ර ස්වාමින් වහන්සේලාට ප්‍රාර්ථනීය බෝධියකින් නිවන් සුව ලබන්නට හේතු වේවා.

අනුරාධපුර කවරක්කුලම විසූ ජේ: එම්: කලුබණ්ඩා හා ජී: වී: මුතුමැණිකා මව්පියන්ට ද, රේස්වත්ත, මැල්සිරිපුර විසූ ඒ: එල්: ඒ: සෝමපාල හා ජී: ඒ: පොඩිමැණිකා මව්පියන් ඇතුළු අප පවුල්වල මියගිය සියලු ඥාතීන්ට සුවසේම නිවන් සුව ලබන්නට හේතු වේවා.

විශේෂයෙන් සසර තතු පහදා දෙන මෙම දහම් පොත සම්පාදනය කිරීමෙහිලා තම වටිනා කාලය කැපකර සියලු ලෝක වාසීන්ගේ යහපත උදෙසා පිළියෙල කර දුන් පූජ්‍ය නිකපිටියේ ගුණරතන ස්වාමින් වහන්සේට ප්‍රාර්ථනීය බෝධියකින් නිවන් සුව ලබන්නට මෙම ධර්‍ම දානමය කුසලය හේතු වේවා.

එසේම අප දෙදෙනාට ද නුදුරේදීම මෙම ඝෝර කටුක සසරින් එතර වී අති උතුම් නිර්වාණ සම්පත්තිය ලඟාකර ගැනීමට මෙම ආමිස දානමය හා ධර්‍ම දානමය කුසලය හේතු වාසනා වේවා.

මෙයට
ජේ. එම්. මිස්සක බණ්ඩාර
ඒ. එල්. ඒ. කේ, කුමාරි.

# පටුන

දේවදූත සූත්‍රය....................13
❈ සූත්‍ර නිදානය....................13
❈ ප්‍රථම ධර්ම සංගායනාව....................14
☸ ආනන්ද තෙරුන් රහත් වීම....................21
☸ විනය සංගායනා කිරීම....................22
☸ ධර්මය සංගායනා කිරීම....................23
☸ ධර්ම විනය බෙද දැක්වීම....................24
❈ දේවදූත සූත්‍ර සංගායනාව....................29
☸ නිසි බුද්ධෝපස්ථායෙකු නොවීම....................29
☸ නිත්‍ය උපස්ථායෙකු පත් කර ගැනීම....................31
☸ ප්‍රතික්ෂේප සතර....................32
☸ ආයාචනා සතර....................33
☸ දිබ්බචක්ඛු ඤාණය....................43
☸ ආයර්‍ය උපවාදය....................45
☸ මිථ්‍යා දෘෂ්ටිය....................46
✿ නාස්තික දෘෂ්ටිය....................46
✿ අහේතුක දෘෂ්ටිය....................47
✿ අකිරිය දෘෂ්ටිය....................47
✿ කේවල සාස්වත දෘෂ්ටි සතර....................48
✿ ඒකත්ත සාස්වත දෘෂ්ටි සතර....................50
✿ අත්තානන්තික දෘෂ්ටි සතර....................51
✿ අමරාවික්ෂේපවාදී දෘෂ්ටි සතර....................52
✿ අධිත්‍ය සමුප්පන්න වාද දෘෂ්ටි දෙක....................53
✿ සඤ්ඤීවාද දෘෂ්ටි සොළොස....................54
✿ අසඤ්ඤීවාද දෘෂ්ටි අට....................56

- නේවසඤ්ඤීනාසඤ්ඤීවාද දෘෂ්ටි අට ....57
- උච්ඡේදවාදී දෘෂ්ටි සත ....58
- දිට්ඨධම්මනිබ්බානවාද දෘෂ්ටි පස ....60

සතර අපාය ....63

- තිරිසන් අපාය ....63
- ප්‍රේත අපාය ....64
- අසුර අපාය ....66
- නරකය ....67
- අසංඛ්‍යය ....74

පළමුවන දේව දූතයා....76

- යමරජ ....77
- නිරය පාලයෝ (යමපල්ලෝ)....78
- දේවදූත ....78

දෙවන දේවදූතයා....79

තෙවන දේවදූතයා ....81

සිව්වන දේවදූතයා ....83

පස්වන දේවදූතයා ....88

- නිරි සත්වයා අපා දුකට වැටීම ....91

මහා නිරය .... 92

- මහා නිරයෙන් නිදහස් වීම....96
- ගුථ නරකයෙහි වැටීම ....97
- කුක්කුල නරකයෙහි වැටීම ....97
- කටු ඉඹුල් වන නරකයෙහි වැටීම ....97
- අසිපත්‍රවන නරකයෙහි වැටීම ....98
- වේතරණී ගංගාවෙහි වැටීම....98
- ලෝහගුලි ගිල්වීම ....99
- ලෝදිය පෙවීම ....100

- **මිලක්ක තිස්ස** ........................................................................ 102
- **අවීචි මහා නරකය වටා පිහිටි ඔසුපත් නරක සොළොස** ............... 104
- **සෙසු ඔසුපත් නරක** .................................................................. 113
- නිගමනය ........................................................................................ 149

ප්‍රථම මුද්‍රණය :- 2009 ඉල්
දෙවන මුද්‍රණය :- 2010 නවම්
තෙවන මුද්‍රණය :- 2018 වප්
සිව්වන මුද්‍රණය :- 2019 ඉල්

# දේවදූත සූත්‍රය

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර **අනාථපිණ්ඩික** මහ සිටුතුමා විසින් සාදවා පූජා කරන ලද **ජේතවනාරාමයෙහි** වැඩසිටි දිනක මෙම දේවදූත සූත්‍රය ධර්මශ්‍රවණය පිණිස දම් සභා මණ්ඩපයට රැස් වූ **භික්ෂූන් වහන්සේලා** අරහයා දේශනා කොට වදාළ සේක. ඒ පිළිබඳ අර්ථ විවරණය මෙසේ ය.

## ❄ සූත්‍ර නිදානය

**"එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ."**

**"මා විසින් මෙසේ අසන ලදී. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනය නම් වූ අනාථපිණ්ඩික මහ සිටුතුමා විසින් සාදවා පූජා කරන ලද ආරාමයෙහි වැඩ වසන සේක."**

බුද්ධ උපස්ථායක වූ ආනන්ද තෙරුන් වහන්සේ විසින් ප්‍රථම සංගායනා කාලයෙහි ධර්ම සංගායනා කරන්නා වූ ආයුෂ්මත් මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ විසින් විමසූ කල්හි පන්සියයක් මහ රහතන් වහන්සේලා හමුවෙහි මෙම සූත්‍රය සංගායනාවට භාජනය කළේ ය. මෙය මජ්ඣිම නිකායේ උපරි පණ්ණාසකයේ තුන් වන සුඤ්ඤත වර්ගයෙහි එන දසවන සූත්‍ර දේශනාවයි.

භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ වනාහි සියලු ධර්මයන් තමන් වහන්සේ විසින්ම අවබෝධ කළ සේක. ආචාර්යවරයෙකු නොමැත්තේ ය. ලෝක නාථ වූ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවෙහි පටන් සුභද්‍ර පරිබ්‍රාජක තුමා භික්මවීම දක්වා වූ පන්සාලිස් වස තුළ කළ යුතු සියලු බුද්ධ

කෘත්‍යයන් සම්පූර්ණ කොට කුසිනාරා නුවර උපවර්තන නම් මල්ල රජ දරුවන්ගේ සල් වනයෙහි යමක ශාල වෘක්ෂයන් අතර පනවන ලද උතුම් බුද්ධාසනයෙහි නැවත නො නැඟිටිනා සෙය්‍යාවෙන් වැඩ හිඳ වෙසක් පුර පසළොස්වක පොහොය දින අලුයම් වෙලෙහි අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළ සේක.

## ❄ ප්‍රථම ධර්ම සංගායනාව

තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය නිමිත්තෙන් රැස් වූ සත් ලක්ෂයක් භික්ෂු සංඝයා වහන්සේ අතර සංඝ ස්ථවිර වූ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණයෙන් සත් වන දින පාවා නුවර සිට කුසිනාරාව වෙත වඩිමින් සිට මඳක් විවේක ගැනීම පිණිස මාර්ගයෙන් ඉවත්ව එක් වෘක්ෂ මූලයක වැඩසිටි සේක. එකල්හි පාවා නුවර වැසි එක් උපාසකයෙක් බුද්ධ ශරීරයට ගෞරව දක්වා දෙවියන් විසින් ආකාශයෙහි සිට බුදු සිරුරට පූජා කරන ලද පාත්‍රයක් පමණ වූ දිව්‍යමය මදාරා මලක් රැගෙන පාවා නුවර වෙත යමින් සිට මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ වෙත පැමිණ වැඳ සිටියේ ය. එවිට තෙරුන් වහන්සේ ඒ උපාසක තුමාගෙන් "**කොහි සිට එන්නේ ද**" යැයි අසා සිටියේ ය. ඔහු කුසිනාරාවෙහි සිට ආවෙමි යැයි කීවේ ය. "**අපගේ ශාස්තෲන් වහන්සේ දන්නෙහි ද**" යැයි තෙරුන් වහන්සේ විචාළේ ය. එසේය ස්වාමීනි. ඒ තථාගතයන් වහන්සේ පිරිනිවී සත් දවසක් වන්නේය යැයි කීවේ ය. එය අසා රහතන් වහන්සේලා ද, අනාගාමී ආර්යයන් වහන්සේලා ද ධර්ම සංවේග උපදවා ගත්හ. කාම රාග, ව්‍යාපාද ප්‍රහීණ නොවුණු බැවින් සෝවාන්, සකෘදගාමී ආර්යයන් වහන්සේලා ද, කල්‍යාණ පෘථග්ජන භික්ෂූන් වහන්සේලා ද අඬා වැලපෙන්නට වූහ.

ඒ අවස්ථාවේ සුභද්‍ර නම් මහලු පැවිද්දෙක් ඒ පිරිසෙහි සිටියේය. එම භික්ෂුව පූර්වයෙහි ආතුමා නුවර කරණවැමියෙකු ව සිට වයස්ගත ව පැවිදි වූවෙකි. මහලු වයසේ සිටි බැවින් දරුවන් ලවා තම ගෙවත්තෙහි ම කුටියක් සාදවාගෙන එහි සිටිමින් තම දරුවන්ගේ කෙස් රැවුල් කපමින් ජීවිකාව කළේ ය. එක් චාරිකා සමයක තථාගතයන්

වහන්සේ එක්දහස් දෙසිය පනසක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් පිරිවරාගෙන කුසිනාරා නුවර සිට ආතුමා නුවරට වැඩි සේක. එකල්හි එම භික්ෂුව තථාගතයන් වහන්සේ විශාල සඟ පිරිසක් සමග වඩින්නේය යැයි අසා සාමණේර භාවයෙන් සිටි තම දරුවන් දෙදෙනා අමතා **"දරුවනි, නුඹලා ගොස් හිස කෙස් කැපීමට උවමනා උපකරණ රැගෙන ගෙයක් පාසා ඇවිද මිනිසුන්ගේ කෙස්, රැවුල් කපා ලුණු, තෙල් හා අනුභව කළ යුතු දේ රැස් කරව්. භාග්‍යවතුන් වහන්සේ ප්‍රධාන සංඝයාට බෙහෙත් කැඳ දනයක් දෙන්නෙමු"** යැයි කීවේ ය. ඒ සාමණේර පැවිද්දෝ ද එසේ කළහ. භාග්‍යවතුන් වහන්සේ වැඩි කල්හි මිනිසුන්ගේද අත් උදව් ඇතිව එලෙස එක්රැස් කරන ලද දෙයින් භොජ්ජ යාගුවක් (ඝන කැඳක්) සෑදවූහ. ගිතෙල්, මී පැණි, මත්ස්‍ය, මාංශ, මල් ඵල රස ආදිය ද, යම් කෑ යුතු දෙයක් වේ ද ඒ සියල්ල එහි දැම්මවීය. තව ද හකුරු යොදා කරන ලද **"මධුගෝළක"** නම් කැවිලි ද පිළියෙල කරවූයේය. මෙයට **"අතිරස කැවුම්"** යැයි ද, **"මධුසීසක"** යැයි ද කියනු ලැබේ. මේ සියල්ල දන්නා භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග නගරයට පිඬු පිණිස වැඩි සේක. මිනිස්සු **"භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග නගරයට පිඬු පිණිස වඩියි, ඔබ කවුරුන් හට කැඳ පිළිගන්වන්නෙහිද"** යැයි එම භික්ෂුවට කීහ. එවිට ඒ භික්ෂුව කලබල වී භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට ගොස්, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, කැඳ පිළිගන්නා සේක්වා"** යැයි ආරාධනා කළේය. භාග්‍යවතුන් වහන්සේ **"මහණ, නුඹ කෙසේ කැඳ සැකසුවේද"** යැයි අසා ගර්හා කොට අකප්පිය සමාදනයද, **"පූර්වයෙහි භාවිතා කළ කරණවැමි බඩු පාවිච්චි නොකළ යුතුය"** යැයි ද මෙසේ ඒ භික්ෂුව නිමිති කොට දුෂ්කට සිකපද දෙකක් පනවා දැහැමි කථාවක් කොට භික්ෂූන් අමතා මෙසේ වදළ සේක. **"මහණෙනි, අනේක කල්ප කෝටි ගණනක් භෝජනය සොයන්නවුන් සමගම මේ දීඝ සංසාරයේ කල් ගත කරන ලදි. මෙය වනාහි නුඹලාට අකැප ය. මේ අධර්මයෙන් උපයා ගත් භෝජනය පරිභෝග කළවුන් අනේක වූ ආත්මභාව සිය දහස් ගණනක් අපායෙහිම උපදින්නෙහි ය. ඉවත් වන්න, මෙය පිළි නො ගන්න"** යැයි වදාරා පිඬු පිණිස වැඩි සේක. එක් භික්ෂුවකුදු එය පිළි නොගත්හ. සුභද්‍ර භික්ෂුව නොසතුටුව **"මොහු සියල්ල දනිමි යැයි ඇවිදියි. ඉදින් නොගනු කැමැත්තෙහි නම් එය කිය යුතු නොවන්නේද, මා වෙහෙසීමෙන් කරන ලද සියල්ල මොහු විසින් නසන ලද්දේය. මොහු මා කෙරෙහි හිතවත් බවක් නැත්තේය"** යැයි තථාගතයන් වහන්සේ සමග වෛරීව සිට

තථාගතයන් වහන්සේ ජීවමානව සිටියදී කිසිවක් කියන්නට නොහැකිව සිට පිරිනිවියේ යැයි අසා සතුටුව අඬා වැලපෙන භික්ෂූන් අමතා මෙසේ කීවේය.

"**ඇවැත්නි, ශෝක නොකරව්. නොවැලපෙව්. අපි ඒ මහා ශ්‍රමණයාගෙන් සම්පූර්ණයෙන් මිදුණෝ වෙමු. ඒ මහා ශ්‍රමණයා මෙය නුඹලාට කැපය, මෙය නුඹලාට අකැපය යනාදී ලෙස සිකපද පනවමින් අපි පීඩාවට පත් කරනු ලැබුවෝ වෙමු. දැන් අපි ඒ ගැහැට වලින් නිදහස් වූවෝ වෙමු. එබැවින් දැන් අපි යමක් කැමැත්තෙමු නම් එය කරන්නෙමු. යමක් අකැමැත්තෙමු නම් එය නො කරන්නෙමු**" යැයි මේ වචනය කීවේය.

මේ වචනය මහා කාශ්‍යප මහ රහතන් වහන්සේට හදවතට වැදුණු පහරක් මෙන් ද, හිසට පහත් වූ වියලි හෙනයක් මෙන් ද හැඟී ගියේය. මහත් වූ ධර්ම සංවේගයක් හට ගත්තේය. තෙරුන් වහන්සේ සිතන සේක් "**සත් දිනකට පෙර භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ නමුත් අදත් ඒ බුදු සිරුර රන් පැහැයමය. භාග්‍යවතුන් වහන්සේ විසින් දුක සේ ගොඩනැගූ සසුනෙහි පාපී කසටක්, කටුවක් හට ගත්තේය. මෙවන් පාපී පුද්ගලයන්ට වැඩෙන්නට ඉඩ ලැබුණ හොත් තවත් සහායකයන් ලැබ ශාසනය පසු බස්සවන්නට හැකි වන්නේය. ඉදින් වනාහි මම මේ මහල්ලාව මෙහි දී ම රෙදි කඩක් අන්දවා අළු විසුරුවා බැහැර කරන්නෙම් නම්, මිනිස්සු ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ දේහය තිබියදීම ශ්‍රාවකයෝ විවාද ඇති කර ගනිති යැයි අපට දෙස් පවරන්නාහුය**" යැයි සිතා නැවත ද මෙසේ සිහිපත් කළේය.

භාග්‍යවතුන් වහන්සේ විසින් එකට එකතු නොකළ මල් රාශියක් මෙන් ධර්මය දේශනා කරන ලදි. එහි යම් සේ වාතය වැදීමෙන් සමහර මල් විසිරී යයි. එපරිද්දෙන් මෙබඳු පව්ටු පුද්ගලයන් නිසා කල් ගතවන විට විනයෙහි සිකපද එක දෙක බැගින් විනාශ වී යන්නේය. සූත්‍රයන්හි එකක් දෙකක් ප්‍රශ්න වාරයන් නැසී යන්නේය. අභිධර්මයෙහි එක දෙක වෙනස් වාරයන් නැසී යන්නේය. මෙසේ පිළිවෙළින් මුල නැසුණු කල්හි අපි පිසාචයන් හා සම වූවෝ වෙමු. එබැවින් ධර්මයත් විනයත් සංගායනා කරන්නෙමි. මෙසේ ඇති කල්හි ශක්තිමත් නූලකින් ගැට ගසන ලද මල් මාලාවක් මෙන් ධර්ම විනය දෙක ස්ථිරව

පිහිටන්නේය. භාග්‍යවතුන් වහන්සේ මේ සඳහාම මට පෙර ගමන් කළ සේක. අවවාද තුනකින් උපසම්පදාව දුන් සේක. කයින් සිවුරු මාරු කළ සේක. මේ සියල්ලට වඩා අසාධාරණ වූ නවානුපූර්ව විහාර සමාපත්තීන්ගෙන් සම තැන තැබූ සේක. මෙසේ තමන් වහන්සේ හා සම තැන්හි තැබීමෙන් අනුග්‍රහ කරන ලද මට ධර්ම විනය සංගායනාව හැර අන් කිනම් මගකින් ණය නැති බවක් වන්නේ ද, සක්විති රජ කෙනෙකු තමන්ගේ සන්නාහයත් ඓශ්වර්‍යයත් දීමෙන් ස්වකීය කුල වංශය පිහිට වූ පුතුට මෙන් භාග්‍යවතුන් වහන්සේ "**මෙතෙම මාගේ සද්ධර්ම වංශය පිහිටුවන්නෙකු වන්නේය**" යැයි දැන මේ අසාධාරණ අනුග්‍රහයෙන් මට අනුග්‍රහ කළ සේක යැයි සිතුවේය. එසේම "**මා වැනි භික්ෂූන් වහන්සේලා සිටියදී මේ පාපියෙකුට සසුනෙහි දියුණු වන්නට ඉඩක් නො තැබිය යුතුය. යම්තාක් අධර්මය අවිනය නොබැබළේ ද ඒ තාක් ධර්මයත් විනයත් පසු බසින්නේ නැත. යම් විටෙක අධර්මය අවිනය බැබළේ ද එවිට ධර්මයත් විනයත් පසු බසින්නේය. එබැවින් අධර්මවාදීන් අවිනයවාදීන් බලවත් වීමට පෙර ධර්මවාදීන් විනයවාදීන් දුබල වීමට පෙර ධර්ම විනය දෙක සංගායනා කරන්නේ නම් මැනවි**" යැයි සිතා ඒ මොහොතේ කිසිවක් නොකියා කුසිනාරාව වෙත වැඩම කොට බුදු සිරුර තැන්පත් කරන ලද විසි රියන් උස සඳුන් දර සෑය වටා ප්‍රදක්ෂිණා කොට අධිෂ්ඨාන බලයෙන් බුදු සිරිපා තම නළලෙහි තබා වන්දනා කළේ ය. ඉන් පසු දේවානුභාවයෙන් ඒ චිතකය ගිනි ඇවිල ආදාහනය වූයේය.

පරිනිර්වාණයෙන් පසු බුදු සිරුර සත් දිනක් ඒ ආසනයෙහිම පැවතුණේය. ඒ කාලය සදේවක ලෝකවාසීන් විසින් වැඳුම් පිදුම් කළහ. සත් වන දින ආදාහනය සිදු විය. ඉන් පසු සත් දිනක් ධාතු පූජා කාලය වූහ. ඉන් පසු සර්වඥ ධාතු බෙදා දීමට සත් දිනක් ගත විය. මේ අවස්ථාවට සත් ලක්ෂයකට අධික භික්ෂු සංඝයා වහන්සේ රැස්ව සිටියහ. ඒ සර්වඥ ධාතු බෙදා දීමේ කටයුතු නිමා වූ පසුව මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ මෙවැනි භික්ෂු සන්නිපාතයක් නැවත දුර්ලභ යැයි සිතා භික්ෂු සංඝයා අමතා ඇවැත්නි, **මම එක් සමයක පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමග පාවා නුවරින් නික්ම කුසිනාරාව බලා එන අතර තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය අසා භික්ෂූන් හඬා වැලපෙන කල්හි එක් පාපී භික්ෂුවක්** "ඇවැත්නි නො හඬන්න

**නො වැලපෙන්න.... යමක් අකැමැත්තෙමු නම් එය නො කරන්නෙමු"** යැයි මෙසේ කීවේය.

පරිනිර්වාණයට පත් තථාගතයන් වහන්සේගේ බුද්ධ ශරීරය ආදහනය වීමටත් පෙර මේ නිර්ලජ්ජී පාප භික්ෂූන්ගේ නැඟී සිටීම විය. ධර්මය ශාස්තෘන් වහන්සේ සමගම නැතිව ගියේ යැයි ද, ධර්මය ශාස්තෘවරයෙකු නැති එකක්ය යැයි ද සිතන පාපී භික්ෂූහු අලජ්ජී පක්ෂය ලැබ, කොටස්වලට බෙදී නොබෝ කලකින්ම සද්ධර්මය අතුරුදහන් කරන්නාහුය යන මේ කාරණයක් වේද, මෙය විද්‍යමාන වන්නේය. යම්තාක් ධර්මය විනය පවත්නේද, ඒ තාක් බුද්ධ වචනය නො ඉක්මවා සිටින ශාස්තෘවරයෙකු ඇති එකක් වන්නේය. භාග්‍යවතුන් වහන්සේ විසින්ම **"යො වො, ආනන්‍ද, මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො, සො වො මමච්චයෙන සත්‍ථා"** යනුවෙන් **"ආනන්දය, මා විසින් යම් ධර්මයක් දේශනා කරන ලද්දේ ද, යම් විනයක් පනවන ලද්දේ ද, ඒ ධර්ම විනය දෙක මාගේ පරිනිර්වාණයෙන් පසු නුඹලාට ශාස්තෘ වන්නේ ය"** යැයි මේ කාරණය වදාරන ලද්දේමය. එබැවින් යම් සේ මෙම ශාසනය බොහෝ කල් පැවැත්මට සුදුසු වූවක් කොට ධර්මයත් විනයත් සංගායනා කරන්නෙමු" යැයි දන්වා සිටියහ.

භික්ෂූන් වහන්සේලා **"ස්වාමීනි, එසේ නම් ස්ථවිරයන් වහන්සේම ඒ සඳහා භික්ෂූන් වහන්සේලා තෝරා ගන්නා සේක්වා"** යැයි කීහ. තෙරුන් වහන්සේ සියලු නවාංග ශාස්තෘ ශාසන සංඛ්‍යාත පර්‍යාප්තිධර, නොයෙක් සිය, දහස් ගණන් පෘථග්ජන, සෝතාපන්න, සකෘදගාමී, අනාගාමී, ශුෂ්ක විදර්ශක ක්ෂීණාශ්‍රව භික්ෂූන් හැර පියා ත්‍රිපිටක බුද්ධ වචනය හා සියලු පර්‍යාප්ති ප්‍රභේදයන්හි පරප්‍රාප්ත සිවුපිළිසිඹියා පත් මහත් ආනුභාව ඇති, භාග්‍යවතුන් වහන්සේ විසින්ම අග්‍ර ස්ථානයෙහි තබන ලද ත්‍රිවිද්‍යා ආදී ප්‍රභේද ඇති ක්ෂීණාශ්‍රව භික්ෂූන් වහන්සේලාම හාරසිය නව අනූ නමක් (499) තෝරා ගත්හ. කුමක් සඳහා එක නමක් අඩු කළ සේක් ද යත්? ආනන්ද තෙරුන් වහන්සේට ඉඩ සලසනු සඳහාය. ඒ වන විට ආනන්ද තෙරණුවෝ රහත්ව නොසිටි බැවිනි. මේ ආනන්ද තෙරුන් වහන්සේ, භාග්‍යවතුන් වහන්සේ පසුපස යමින් අග්‍ර උපස්ථානය කරමින් බොහෝ ධර්ම විනය කාරණා උගත්තේය. එබැවින් තෙරුන් වහන්සේ නොමැතිව ධර්ම සංගායනාව නොකළ හැකිය. ඉන් පසු අන් භික්ෂූන් වහන්සේලාගේ ඉල්ලීමෙන්

ආනන්ද තෙරුන් වහන්සේ ද තෝරා ගත්හ. ඉන් පසු ස්ථවිර භික්ෂූන් වහන්සේලාට "**අපි ධර්ම, විනය සංගායනාව කොතැන්හි දී කරන්නෙමුද**" යැයි මේ සිත විය. එවිට එම භික්ෂූන් වහන්සේලාට මේ අදහස වූහ.

"**රජගහ නුවර භික්ෂාව ලැබීමට පහසුය. බොහෝ සෙනසුන් ද ඇත. අජාසත් රජතුමාගේ දැහැමි ආරක්ෂාව ද ලැබිය හැක. එබැවින් අපි රජගහ නුවර වස් වසමින් ධර්මයත් විනයත් සංගායනා කරන්නෙමු, අපගේ මේ කටයුත්ත බොහෝ කල් පවත්නකි. කිසියම් විරුද්ධ පුද්ගලයෙකු සඟ මැදට පැමිණ අර්බුද ඇති කිරීමට ඉඩ ඇත. එබැවින් අන් භික්ෂූහු රජගහ නුවර වස් නො විසිය යුතුය. ධර්ම සංග්‍රාහක තෙරුන් වහන්සේලා පමණක් රජගහ නුවර වස් සමාදන් විය යුතුය**" යැයි අදහස වී ඤත්ති දුතිය කර්මයෙන් එලෙස සම්මත කර ගත්හ.

ඉන් පසු වස් එළඹෙන සමය ලංවන බැවින් මහා කාශ්‍යප තෙරුන් වහන්සේ, සංගායනාවට සම්මත කරගත් රහතන් වහන්සේලාගෙන් අඩක් ගෙන රජගහ නුවර බලා එක් මඟකින් වැඩි සේක. අනුරුද්ධ තෙරුන් වහන්සේ ද, රහතන් වහන්සේලාගෙන් අඩක් ගෙන රජගහ නුවර බලා එක් මඟකින් වැඩි සේක. ආනන්ද තෙරුන් වහන්සේ ද, රජගහ නුවර වඩිනු කැමතිව, භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රය හා චීවර ගෙන මහත් වූ භික්ෂු පිරිසක් පිරිවරා සැවැත් නුවර බලා චාරිකාවෙහි වැඩි සේක. ජේතවනාරාමයට වැඩ භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි ගඳකිළියෙහි දොර විවර කොට ඇඳ පුටු බැහැරට ගෙන ගසා දමා ගඳකිළිය හැමද මැලවුණු මල් ආදී කසල බැහැර කොට ඇඳ පුටු ඇතුළට ගෙන ගොස් සුදුසු තැන්හි තබා භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි කල්හි මෙන් කළ යුතු සියලු වතාවත් සිදුකළ සේක. ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයෙහි පටන් සිටීම් හිඳීම් බහුලව සිටි බැවින් සෙම් පිත් ආදී දෙස් කිපුණු ශරීරයෙන් සිටි බැවින් දෙවන දින කිරි විරේකයක් පානය කොට විහාරයෙහිම වැඩසිටි සේක. පසු දින සුභ මානවකයාගේ ආරාධනාවෙන් ඔහුගේ නිවසට වැඩ ඔහු විසින් විචාරන ලද පැන විසඳමින් දීඝ නිකායෙහි ඇතුළත් "**සුභ සූත්‍රය**" වදාළ සේක. අනතුරුව දෙව්රම් වෙහෙරෙහි කැඩුණු බිඳුණු තැන් පිළිසකර කරවා වස් එළඹෙන සමය ළං වන බැවින් උපකාරක එක් භික්ෂුවක් සමග රජගහ නුවරට වැඩි සේක.

එසමයෙහි වනාහි රජගහ නුවර මහා විහාර අටලොසක් (18) වූහ. ඒවා අතර **තල් වනය, වේළුවනය, සීත වනය, මද්දකුච්ඡි මිගදය, ජීවක අම්බ වනය, මෝර නිවාපය, ලට්ඨි වනය** යන මේවා රජගහ නුවර සමීපයෙහි විය. එසේම **චෝර ප්‍රපාතය,** ඉසිගිලි පර්වතය පාමුල වූ **කාලසිලාව,** වේභාර පර්වතය පාමුල වූ **සප්තපර්ණී ගුහාව, සීත** වන සොහොන් බිම සමීපයෙහි වූ **සප්තසොණ්ඩික පබ්බභාරය, ගෝතම කන්දරය, තින්දුක ගුහාව, තපෝද කන්දරය, ඉන්ද සාල ගුහාව, පිප්ඵලි ගුහාව,** ගිජ්ජකූට පර්වතයෙහි වූ **සූකර කත ලෙන** යන මේවා රජගහ නුවර වටා පිහිටි ඒවාය. භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු භික්ෂූන් වහන්සේලා මේ විහාර සියල්ල අතහැර දමා ගිය බැවින් මකුළු දැල් බැඳී කොළ රොඩු වලින් ගැවසී පාලු විය. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ ද, අනුරුද්ධ තෙරුන් වහන්සේ ද සපිරිවරින් රජගහ නුවරට වැඩ අපවිත්‍ර වී පාලුවට ගොස් ඇති සෙනසුන් දැක **"භාග්‍යවතුන් වහන්සේගේ වචනයට ගරු කිරීම පිණිස ද, තීර්ථක උපවාදයෙන් මිදෙනු පිණිස ද පළමු මාසය අපවිත්‍ර සේනාසන පිරිසිදු කර කැඩුණු බිඳුණු** තැන් **පිළිසකර කරන්නෙමු"** යැයි මෙසේ සිතූහ.

තීර්ථකයෝ **"ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකයෝ ශාස්තෲන් වහන්සේ සිටි කල්හි පමණක් විහාරයන් පිළිදැගුම් කළහ. පිරිනිවි කල්හි ඒ වතාවත් අත හැරියාහු වෙති"** යැයි මෙසේ කියන්නාහය. භාග්‍යවතුන් වහන්සේ විසින් විහාරයන්හි කැඩුණු බිඳුණු තැන් පිළිසකර කිරීම වර්ණනා කරන ලදි. ඇවැත්නි, එබැවින් අපි වස් කාලයෙහි පළමු මස විහාර පිළිසකර කරමු, මැද මාසයෙහි රැස්ව ධර්ම විනය සංගායනා කරන්නෙමු යැයි කතිකා කරගෙන දෙවන දින රජ මාලිගයට වැඩ අජාසත්ත රජතුමා සම්මුඛ වී විහාර පිළිසකර කිරීමට අත් උදව් අවශ්‍ය බව කීහ. රජතුමා මිනිසුන් දුන්නේය. තෙරුන් වහන්සේලා විහාර පිළිසකර කරවා රජතුමාට ඒ බව දන්වා නැවත ද **"මහ රජ, ධර්ම සංගායනාවක් කරනු කැමැත්තෙමු"** යැයි කීහ. රජතුමා එය අසා **"ස්වාමීනි, විශ්වාස ඇත්තෝව කරනු මැනවි. ස්වාමින් වහන්සේලාට ධර්මචක්‍රය වේවා. මා හට ආඥා බලය වේවා. ඒ සඳහා මා විසින් කුමක් කළ යුතු ද"** යැයි අසා සිටියේය. **"මහ රජ, ධර්මය , විනය සංගායනා කරන්නා වූ භික්ෂූන් වහන්සේලාට වැඩ හිඳීමට තැනක් කරවා ගත යුතුය"** යැයි කීහ. **"එය කොතැන්හි කළ යුතු ද"** යැයි රජතුමා

ඇසුවේ ය. "**වේභාර පර්වතය පාමුල වූ සප්තපර්ණි ගුහා ද්වාරයෙහි සුදුසුය**" යැයි තෙරුන් වහන්සේලා කීහ.

එකල්හි රජතුමා, විශ්ව කර්ම දිව්‍ය පුත්‍රයා විසින් මවන ලද්දක් හා සමානව, මැනවින් බෙදන ලද බිත්ති ඇති, කණු ඇති, පියගැට පෙළ ඇති, නන් වැදෑරුම් මල් කම් ලිය කම්වලින් විසිතුරු කරන ලද මහා මණ්ඩපයක් කරවා, නොයෙක් මල් දම් එල්ලන ලද මනහර වියනක් කරවා, නොයෙක් රත්නයන්ගෙන් විසිතුරු වූ මැණික් ඔබ්බවන ලද මාලා කර්මයන්ගෙන් විසිතුරු වූ බිමක් එහි කරවා, බ්‍රහ්ම විමානයක් සේ සරසා, පන්සියයක් භික්ෂූන් වහන්සේලාට වැඩ හිඳීමට අනගි වූ පසතුරුණු පණවා, මණ්ඩපය මැද නැගෙනහිරට මුහුණ ලා සම්මා සම්බුදු රජාණන් වහන්සේට වැඩ හිඳීමට සුදුසු බුද්ධාසනයක් ද පනවා, එහි දකුණුපස උතුරු දෙසට මුහුණ ලා ථේරාසනයක් ද, ඇත් දළවලින් ලියවන ලද විසිතුරු විජිනිපතක් තබා "**ස්වාමීනි, මගේ කටයුතු නිමවන ලදී**" යැයි තෙරුන් වහන්සේලාට දන්වා සිටියේය.

## ☸ ආනන්ද තෙරුන් රහත් වීම

මේ වන විටත් ආනන්ද තෙරුන් වහන්සේ ශෛක්‍ෂව සිටි බැවින් රහතන් වහන්සේලා ආනන්ද තෙරුන් වෙත පැමිණ "**ආනන්දය, හෙට අපගේ රැස්වීම වන්නේය. නුඹ තවම ශෛක්‍ෂයෙකි, රැස්වීමට යැමට නුසුදුස්සෙකි. එබැවින් අප්‍රමාදී විය යුතුය**" යැයි කීහ. ආනන්ද තෙරණුවෝ ද "**හෙට රැස්වීම වන්නේය. මා විසින් ශෛක්‍ෂව රැස්වීමට යැම නොවටීය**" යැයි සිතා රාත්‍රියෙහි බොහෝ වේලාවක් "**කායගතා සති**" කමටහනින් යුතුව සක්මනෙහි යෙදී උත්සාහ කළ නමුත් විශේෂාධිගමයක් නොවූ බැවින්, මඳක් විවේක ගෙන නැවත උත්සාහයෙහි යෙදෙන්නෙමි යැයි සිතා, අලුයම් වෙලෙහි සක්මනින් බැස පා සෝද විහාරයට පිවිස, විඩා හරින්නෙමි යැයි ඇඳෙහි වැඩ හිඳ කොට්ටය වෙත හිස එළ වූ සේක. දෙපා පොළොවෙන් මිඳුණාහ. හිස කොට්ටයට නො පැමිණියේය. මේ අතර රහත් වූ සේක. මෙසේ හිඳීම, සිටීම, සක්මන් කිරීම සැතපීම යන සිව් ඉරියව්වෙන් තොරව රහත් වූහ. **එබැවින් මේ බුදු සසුනෙහි සිව් ඉරියව්වෙන් තොරව යම් භික්ෂූන්**

**වහන්සේ නමක් රහත් වූයේ නම් ඒ ආනන්ද තෙරුන් වහන්සේය** යැයි කිව යුතු වන්නේය.

පසු දින ස්ථවිර භික්ෂූන් වහන්සේලා බත් කිස කොට පාත්‍ර චීවර තැන්පත් කොට තබා ධර්ම මණ්ඩපයෙහි රැස්ව තමන් වහන්සේලාට නියමිත ආසනයන්හි වැඩහුන් සේක. ආනන්ද තෙරුන් වහන්සේ ගේ ආසනය පමණක් හිස් විය. ආනන්ද තෙරුන් වහන්සේ තමන් රහත්ව වැඩි බව හඟවනු පිණිස භික්ෂූන් වහන්සේලා සමග නො වැඩියේය. භික්ෂූන් වහන්සේලා "**මේ ආසනය කවරෙකු සඳහා ද**" යැයි විචාළහ. "**මෙය ආනන්ද තෙරුන් වහන්සේ සඳහා**" යැයි කීහ. ආනන්ද තෙරුන් වහන්සේ ඒ මොහොතේ සිටි ආවාසයෙන් පොළොව කිමිද මණ්ඩපයෙන් මතුව තමන් වහන්සේට නියමිත ආසනයෙහි වැඩසිටි සේක. මේ හේතුවෙන් ආනන්ද තෙරුන් වහන්සේ රහත්ව වැඩි බව සියලු භික්ෂූන් වහන්සේලාම පිළිගත්හ.

## ☸ විනය සංගායනා කිරීම

මෙසේ ධර්ම සංග්‍රාහක මහා රහතන් වහන්සේලා ධර්ම මණ්ඩපයෙහි රැස් වූ කල්හි සංඝ ස්ථවිර වූ මහා කාශ්‍යප තෙරුන් වහන්සේ "**ඇවැත්නි, ධර්මය විනය දෙකෙන් කවරක් පළමු ව සංගායනා කරන්නෙමු ද**" යැයි භික්ෂු සංඝයා ඇමතු සේක. භික්ෂූන් වහන්සේලා "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, විනය නම් බුද්ධ ශාසනයාගේ ආයුෂයයි. විනය පිහිටි කල්හි ශාසනය සිටියේ වෙයි. එබැවින් පළමු ව විනය සංගායනා කරමු**" යැයි කීහ. "**කවුරුන් ප්‍රධාන කොට ගෙන විනය සංගායනා කළ යුතු ද**" යැයි කාශ්‍යප තෙරුන් වහන්සේ ඇසුවේය. "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, මේ උපාලි තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ විසින්ම විනයධරයන් අතර අග්‍ර ස්ථානයෙහි තබා වදාළ සේක. එබැවින් උපාලි තෙරුන් වහන්සේ ප්‍රධාන කොට ගෙන සංගායනා කරමු**" යැයි භික්ෂූන් වහන්සේලා කීහ. ඉන් පසු කාශ්‍යප තෙරුන් වහන්සේ විනය විචාරීමට "**සුණාතු මෙ, ආවුසො, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මන්තං උපාලිං විනයං පුච්ඡෙය්‍යං**" යනුවෙන් තමන් වහන්සේම සම්මත කරගෙන ථේරාසනයෙහි වැඩසිටි සේක. උපාලි තෙරුන් වහන්සේ විනය විසඳීමට "**සුණාතු මෙ, භන්තෙ,**

**සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මතා මහාකස්සපෙන විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යං"** යනුවෙන් තමන් වහන්සේම සම්මත කරගෙන අසුනින් නැගිට සිවුර ගැට වටු ගන්වා ගෙන, වැඩිහිටි ස්ථවිර භික්ෂූන් වැඳ, විජිනිපත ගෙන ධර්මාසනයෙහි වැඩහුන් සේක. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ උපාලි තෙරුන් වහන්සේගෙන් මෙසේ විනය විචාළ සේක.

**"ඇවැත්නි, උපාලිය, භාග්‍යවතුන් වහන්සේ පළමු පාරාජිකාව කොතැනක දී පනවා වදාළ සේක් ද"** යැයි ඇසීය. උපාලි තෙරුන් වහන්සේ **"ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, විශාලා මහනුවරදී පනවා වදාළ සේක"** යැයි විසඳුවේය. **"කවුරුන් අරබයා පනවා වදාළ සේක්ද"** යැයි ඇසීය. **"කලන්දක පුත්‍ර සුදින්න තෙරුන් අරබයා පනවා වදාළ සේක"** යැයි විසඳුවේය. **"කුමන වස්තුවෙහි පනවා වදාළ සේක්ද"** යැයි ඇසීය. **"මෛථුන ධර්ම ප්‍රතිසේවනයෙහි පනවා වදාළ සේක"** යැයි විසඳුවේය. ඉන් පසු සියලු දෙනා වහන්සේම එකතුව පළමු පාරාජිකා සිකපදය නිදාන සහිතව ඝන සජ්ඣායනා කළහ. මෙලෙස සෙසු ශික්ෂාපදයන් ද, භික්ෂු භික්ෂුණී උභතෝ විභංගය ද, දෙවිසි ඛන්ධකයන් ද, සොළොස් පරිවාරයන් ද සහිත සියලු විනය පිටකය සංගායනා කොට උපාලි තෙරුන් වහන්සේ විජිනිපත තබා ධර්මාසනයෙන් බැස වැඩිහිටි තෙරුන් වහන්සේලා වැඳ තමාට පැමිණි අසුනෙහි වැඩහුන් සේක.

## ☸ ධර්මය සංගායනා කිරීම

විනය සංගායනාවෙන් අනතුරුව ධර්මය සංගායනා කරනු කැමති මහා කාශ්‍යප තෙරුන් වහන්සේ, භික්ෂු සංඝයා වහන්සේ අමතා **"ධර්මය සංගායනා කරන්නා වූ අප විසින් කවුරුන් ප්‍රධාන කොට ගෙන කළ යුතු ද"** යැයි අසා සිටියේය. භික්ෂූන් වහන්සේලා **"ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි බොහෝ ධර්මයන් ඉගෙනගත්තෙකි. භාග්‍යවතුන් වහන්සේ විසින් කරුණු පසකින් අග්‍ර ස්ථානයෙහි තබන ලද්දෙහිය. එබැවින් මේ ආනන්ද තෙරුන් වහන්සේ ප්‍රධාන කොට ගෙන සංගායනා කරමු"** යැයි කීහ. ඉන් පසු කාශ්‍යප තෙරුන් වහන්සේ ධර්මය විචාරීමට **"සුණාතු මෙ, ආවුසො, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං,**

**අහං ආයසමන්තං ආනන්දං ධම්මං පුච්ඡෙය්‍යං"** යනුවෙන් තමන් වහන්සේම සම්මත කරගෙන ථේරාසනයෙහි වැඩසිටි සේක. ආනන්ද තෙරුන් වහන්සේ ධර්මය විසඳීමට **"සුණාතු මෙ, භන්තෙ, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මතා මහාකස්සපෙන ධම්මං පුට්ඨො විස්සජ්ජෙය්‍යං"** යනුවෙන් තමන් වහන්සේම සම්මත කරගෙන අසුනින් නැඟිට සිවුර ගැටවටු ගන්වා ගෙන වැඩිහිටි ස්ථවිර භික්ෂූන් වහන්සේලා වැඳ විජිනිපත ගෙන ධර්මාසනයෙහි වැඩහුන් සේක. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ ආනන්ද තෙරුන් වහන්සේගෙන් මෙසේ ධර්මය විචාළ සේක.

"**ඇවැත්නි, ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්ම ජාල සූත්‍රය කොතැනක දී දේශනා කොට වදාළ සේක්ද**" යැයි ඇසීය. ආනන්ද තෙරුන් වහන්සේ, "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, රජගහ නුවරටත් නාලන්ද නුවරටත් අතර අම්බලට්ඨිකා රජ උයනෙහි වූ රාජාගාරයෙහිදී දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවේය. "**කවුරුන් අරබයා දේශනා කොට වදාළ සේක්ද**" යැයි ඇසීය. "**ස්ථවිරයන් වහන්ස, සුප්පිය පරිබ්‍රාජකයා හා බ්‍රහ්මදත්ත මානවකයා අරබයා දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවේය. මෙසේ බ්‍රහ්ම ජාල සූත්‍රයෙහි නිදානය ද විචාළහ. පුද්ගලයා ද විචාළහ. ඉන් පසු "**ඇවැත්නි, ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ සාමඤ්ඤ ඵල සූත්‍රය කොතැනකදී දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. ආනන්ද තෙරුන් වහන්සේ, "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, රජගහ නුවර ජීවක අඹ වනයෙහි දී දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවෙහිය. "**කවුරුන් අරභයා දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. "**වේදේහිපුත්‍ර අජාසත්ත රජතුමා අරබයා දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවෙහිය. මෙසේ සාමඤ්ඤ ඵල සූත්‍රයෙහි නිදානය ද විචාළහ. පුද්ගලයා ද විචාළහ. මේ ක්‍රමයෙන් සියලු සූත්‍ර පිටකය ද, සියලු අභිධර්ම පිටකය ද සංගායනා කළහ. මෙසේ සංගායනා කරන ලද්දේ වූ ධර්ම විනය විවිධාකාරයෙන් බෙදා දැක්වූහ.

## ☸ ධර්ම විනය බෙදා දැක්වීම

මේ සියලු බුද්ධ වචනය **රස වශයෙන් එක් වැදෑරුම් වේ. ධර්මය විනය වශයෙන් දෙවැදෑරුම් වේ. වචන වශයෙන් තෙවැදෑරුම් වේ.**

**පිටක වශයෙන් ද තෙවැදෑරුම් වේ. නිකාය වශයෙන් පස් වැදෑරුම් වේ. අංග වශයෙන් නව වැදෑරුම් වේ. ධර්මස්කන්ධ වශයෙන් සුවාසූ දහසක් (84,000) වේ.**

✠ **බුද්ධ වචනය රස වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද?**

භාග්‍යවතුන් වහන්සේ අනුත්තර සම්මා සම්බෝධියට පැමිණ දම්සක් සූත්‍රය පැවැත්වීමේ පටන් පිරිනිවන් මඤ්චකය දක්වා වදාළ සියලු බුද්ධ වචනය, මහා සමුද්‍රයෙහි කොතැනින් ජල බිඳක් ගත්තේ ද එකම ලුණු රසය වන්නා සේ, දහම් පදයක් පාසා ම සත්වයන් නිවනට පමුණුවන ගුණයෙන් යුක්ත බැවින් නිවන් රසයෙන් යුක්තය.

✠ **ධර්ම විනය වශයෙන් දෙ වැදෑරුම් වන්නේ කෙසේ ද?**

කාය වාක් සංවරය පිණිස පනවා වදාළ සියලු බුද්ධ වචනය **"විනය"** නම් වේ. සිතෙහි පවත්නා කෙලෙසුන්ගේ තදංග විෂ්කම්භන සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය පිණිස දේශනා කොට වදාළ අවශේෂ බුද්ධ වචනය **"ධර්ම"** නම් වේ.

✠ **වචන වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේ ද?**

බුදු බවට පැමිණ පටිච්ච සමුප්පාද හේතුඵල ධර්මය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මනසිකාර කිරීමෙන් ඇති වූ පහන් සංවේගය වචන බවට පෙරළී ප්‍රථමයෙන් ම බුදු මුවින් පිටවුණු :-

**"අනෙක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං,**
**ගහකාරකං ගවෙසන්තො - දුක්ඛා ජාති පුනප්පුනං"**

**"ගහකාරක දිට්ඨොසි - පුන ගෙහං න කාහසි,**
**සබ්බා තෙ ඵාසුකා භග්ගා - ගහකූටං විසඞ්ඛතං,**
**විසඞ්ඛාරගතං චිත්තං - තණ්හානං ඛයමජ්ඣගා"ති.**

යන මේ ගාථා දෙක ප්‍රථම බුද්ධ වචනයයි.

පරිනිර්වාණ මඤ්චකයෙහි සැතපී අවසාන වශයෙන් වදළ "**හන්දදනි, භික්ඛවෙ, ආමන්තයාමි වො, වයධම්මා සඞ්ඛාරා, අප්පමාදෙන සම්පාදෙථ**" යන මෙය අන්තිම බුද්ධ වචනයයි. මේ අතරතුර පන්සාළිස් වසක් මුළුල්ලෙහි වදළ සියල්ල මධ්‍යම බුද්ධ වචනයයි.

### ✠ පිටක වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේ ද?

ප්‍රථම සංගායනාවේ දී සංගායනාවට නැගුණා වූ ද, නොනැගුණා වූ ද සියල්ල එක් කොට "**උභය ප්‍රාතිමෝක්ෂය, උභය විභංගය, දෙවිසි කඳුවත්, සෝළස පරිවාර**" යන මේ සියල්ල "**විනය පිටකය**" නම් වේ. "**දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය, ඛුද්දක නිකාය**" යන මේ සියල්ල "**සූත්‍ර පිටකය**" නම් වේ. "**ධම්මසංගණී, විභංග, ධාතු කථා, පුග්ගල පඤ්ඤත්ති, කථා වත්ථු, යමක, පට්ඨාන**" යන ප්‍රකරණ සත "**අභිධර්ම පිටකය**" නම් වේ.

### ✠ නිකාය වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේ ද?

බ්‍රහ්ම ජාල සූත්‍රයෙහි පටන් දීඝී වූ සූත්‍ර තිස්හතරක් ඇති වර්ග තුනකින් යුත් සංග්‍රහය "**දීඝනිකාය**" නම් වේ. මූලපරියාය සූත්‍රයෙහි පටන් මධ්‍යම ප්‍රමාණයෙන් යුත් සූත්‍ර එකසිය දෙපණසකින් යුක්ත වූ වර්ග පසළොසකින් යුත් සංග්‍රහය "**මජ්ඣිම නිකාය**" නම් වේ. ඕඝතරණ සූත්‍රයෙහි පටන් සත්දහස් සත්සිය දෙසැටක් (7762) සූත්‍ර ඇති සංයුත්ත පනස් හයකින් යුත් සංග්‍රහය "**සංයුත්ත නිකාය**" නම් වේ. චිත්ත පරියාදය සූත්‍රයෙහි පටන් සූත්‍ර නවදහස් පන්සිය සත්පනසකින් (9557) යුත් වර්ග එකසිය සත් සැත්තෑවක් ඇති නිපාත එකොළොසකින් යුත් සංග්‍රහය "**අංගුත්තර නිකාය**" නම් වේ. එසේම මේ නිකාය සතරට ඇතුළත් නොවූ "**ඛුද්දකපාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත, විමානවත්ථු පෙතවත්ථු, ථෙරගාථා, ථෙරිගාථා, පටිසම්භිදා, අපදාන, ජාතක, නිද්දේස, බුද්ධවංස, චරියා පිටක**" යන කුඩා ග්‍රන්ථ පසළොසද, "**විනය පිටකය හා අභිධර්ම පිටකය**" යන දෙක ද ඇතුළත්ව මේ සියල්ල "**ඛුද්දක නිකාය**" නම් වේ. මෙසේ නිකාය වශයෙන් පස් වැදෑරුම් වේ.

✠ **අංග වශයෙන් නව වැදෑරුම් වන්නේ කෙසේ ද?,**

"**සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල**" යන මේ නවයයි. මෙය "**නවාංග ශාස්තෘ ශාසනය**" නම් වේ.

❖ "**උභතෝ විභංගය, නිද්දේස, ඛන්ධක, පරිවාර**" යන මේවා ද, සුත්ත නිපාතයෙහි ඇතුළත් "**මංගල සූත්‍රය, රතන සූත්‍රය, නාලක සූත්‍රය, තුවටක සූත්‍රය**" ආදී සූත්‍ර නාමයෙන් දක්වෙන සියලු බුද්ධ වචනය "**සුත්ත**" නම් වේ.

❖ සියලු ගාථා සහිත සූත්‍ර "**ගෙය්‍ය**" නම් වේ. සංයුත්ත නිකායෙහි සගාථ වර්ගය ද, අන් සියලු සගාථ සූත්‍රයන් ද මෙහි ඇතුළත් වේ.

❖ සියලු අභිධර්ම පිටකය ද, සියලු නිර්ගාථක සූත්‍රයන් ද, අන් අංග අටෙහි සංග්‍රහ නොවූ සියලු බුද්ධ වචනය ද "**වෙය්‍යාකරණ**" නම් වේ.

❖ "**ධම්මපද, ථෙර ගාථා, ථෙරි ගාථා**" යන මේවා ද, සුත්ත නිපාතයෙහි සූත්‍ර සංඛ්‍යාවට නො ගැනෙන ගාථා වශයෙන් ඇති සියල්ල ද "**ගාථා**" නම් වේ.

❖ සොම්නස් සහගත සිතින් උපන් ගාථාවන්ගෙන් ප්‍රතිසංයුක්ත දෙයසූවක් (82) සූත්‍ර "**උදන**" නම් වේ.

❖ "**වුත්තඤ්හෙතං භගවතා**" ආදී ලෙස නැවත දේශනා කරන ලද එකසිය දොළොසක් සූත්‍ර "**ඉතිවුත්තක**" නම් වේ.

❖ අපණ්ණක ජාතකය ආදී කරුණක් ඇති කල්හිම දේශනා කරන ලද පන්සිය පණසක් පමණ පූර්ව බෝධිසත්ව චර්යාවන් "**ජාතක**" නම් වේ.

❖ "**චත්තාරොමෙ, භික්ඛවෙ, අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ**" යනාදී ලෙස පැවති සියලු ම ආශ්චර්ය අද්භූත ධර්මයන්ගෙන් ප්‍රතිසංයුක්ත සූත්‍ර දේශනා "**අබ්භූතධම්ම**" නම් වේ.

- **"චූළවෙදල්ල සූත්‍රය, මහාවෙදල්ල සූත්‍රය, සම්මා දිට්ඨි සූත්‍රය, සක්කපඤ්හ සූත්‍රය, සංඛාර භාජනීය සූත්‍රය, මහා පුණ්ණම සූත්‍රය"** ආදී සංවාද ස්වරූපයෙන් නුවණත් සතුටත් ලබමින් විචාරන ලදුව වදාළ සියලු සූත්‍ර **"වෙදල්ල"** නම් වේ.

**✠ ධර්මස්කන්ධ වශයෙන් සුවාසූදහසක් වන්නේ කෙසේ ද?,**

ධර්ම සංගායනාවේ දී ආනන්ද තෙරුන් වහන්සේ විසින් මෙසේ වදරන ලද්දේ ය.

**"ද්වාසීති බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො,**
**චතුරාසීති සහස්සානි - යෙ මෙ ධම්මා පවත්තිනො"**

**"මම, භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙයසූදහසක් උගතිමි. සැරියුත්, මුගලන් ආදී මහ රහතන් වහන්සේලා සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙදහසක් උගතිමි. මෙසේ මාගේ සිතෙහි ධරන්නා වූ ධර්මය ප්‍රමාණ වශයෙන් සුවාසූ දහසකි"** යැයි වදාළේ ය.

එහි එක් අනු සන්ධියක් ඇති සූත්‍රයක් එක ධර්මස්කන්ධයකි. අනු සන්ධි බොහෝ ඇති සූත්‍රයන්හි ඒ අනු සන්ධි ගණනින් ධර්මස්කන්ධ ගණන් ගත යුතුය. දෙවියන් විසින් **"කති ඡින්දෙ කති ජහෙ"** යනාදී ලෙස ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ දී ඒ ප්‍රශ්න ගාථාවක් එක ධර්මස්කන්ධයකි. එයට භාග්‍යවතුන් වහන්සේ **"පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ"** යනාදී ලෙස වදාළ පිළිතුරු ගාථාව එක ධර්මස්කන්ධයකි. අභිධර්මයෙහි දුක මාතිකා, තික මාතිකාවන් බෙදීම ද, එක චිත්තවාර බෙදීම ද, එක එක ධර්මස්කන්ධ වේ. විනයෙහි වස්තු ඇත, මාතෘකා ඇත, පද භාජනීය ඇත, අන්තරාපත්ති ඇත, ආපත්ති ඇත, අනාපත්ති ඇත, තික පරිච්ඡේද ඇත. එහි එක එක කොට්ඨාශ එක ධර්මස්කන්ධ වේ. මෙසේ සියල්ල එකතුව ධර්මස්කන්ධ වශයෙන් (84,000) සුවාසූ දහසකි.

## ❄ දේවදූත සූත්‍ර සංගායනාව

පඤ්චසතික සංගායනාවේ දී මූලාසනයෙහි වැඩසිටි මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ අසන සේක් "**ආනන්දය, තථාගතයන් වහන්සේ මෙම දේවදූත සූත්‍රය කොතැනකදී දේශනා කළ සේක්ද?**" ධර්මාසනයෙහි වැඩ සිටියා වූ ආනන්ද මහ රහතන් වහන්සේ එය විසඳන සේක් "**ස්වාමීනි කාශ්‍යප ස්ථවිරයන් වහන්ස, සැවැත් නුවර ජේතවනය නම් වූ අනාථපිණ්ඩික මහ සිටුතුමා විසින් සාදවා පූජා කරන ලද ආරාමයෙහි දී දේශනා කොට වදාළ සේක**" යැයි කීවේය. මහා කාශ්‍යප රහතන් වහන්සේ "**ආනන්දය, කවුරුන් අරභයා වදාළ සේක්ද**" යැයි ඇසුවේය. ආනන්ද තෙරුන් වහන්සේ "**ස්වාමීනි කාශ්‍යප ස්ථවිරයන් වහන්ස, භික්ෂූන් වහන්සේලා අරභයා වදාළ සේක**" යැයි කීවේය. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ "**කුමන කරුණක් හේතුකොටගෙන වදාළ සේක්ද**" යැයි ඇසුවේය. ආනන්ද තෙරුන් වහන්සේ "**ස්වාමීනි ස්ථවිරයන් වහන්ස, දම් සභා මණ්ඩපයට ධර්මශ්‍රවණය පිණිස රැස් වූ අවස්ථාවක දේශනා කොට වදාළ සේක**" යැයි කීවේ ය.

බුද්ධ උපස්ථායක වූ ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙනගන්නා ලද මේ සූත්‍රය සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගත වූ තැන දී මහා කාරුණික වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ අධිෂ්ඨානය පරිදි මේ උතුම් සද්ධර්මය වේනෙය්‍ය ජනයාගේ ප්‍රයෝජනය පිණිස බොහෝ කලක් පැවැත්මට භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙනගත් බව දැක්වීමට මෙසේ ඉදිරිපත් කළේය. එහි පිළිවෙළ කථාව මෙසේය.

## ☸ නිසි බුද්ධෝපස්ථායෙකු නොවීම

ප්‍රථම බෝධිය වූ විසි වර්ෂය තුළ තථාගතයන් වහන්සේට නිත්‍ය උපස්ථායකයෙකු නොවීය. ඒ කාලපරිච්ඡේදයෙහි දී "**නාගසමාල, නාගිත, උපවාන, සුනක්ඛත්ත, චුන්ද සාමණේර, සාගත, රාධ, මේඝිය**"

**යන තෙරුන් වහන්සේලා ද ඇතැම් විටෙක "ආනන්ද තෙරනුවෝ" ද** උපස්ථාන කළහ.

එක් දිනක් භාග්‍යවතුන් වහන්සේ, නාගසමාල තෙරුන් වහන්සේ උපස්ථායක කොට දීඝී මාගීයට පිළිපන්නේ දෙමන් සන්දියකට පැමිණ, එයින් එක් මගකින් වැඩි සේක. එවිට නාගසමාල තෙරුන් වහන්සේ "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, අපි මේ මගින් වඩිමු**" යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ "**නැත මහණ, මා විසින් මේ මාගීයෙන් යා යුතුය**" යැයි වදාළ සේක. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තුන් වතාවක් වදාළ නමුත් නාගසමාල තෙරණුවෝ "**එසේ නම් භාග්‍යවතුන් වහන්ස, පාත්‍ර චීවර ගත මැනව**" යැයි කියා භාග්‍යවතුන් වහන්සේ ගේ පාත්‍ර චීවර බිම තබා ගියේය. පසුව භාග්‍යවතුන් වහන්සේ තම පාත්‍ර චීවර ගෙන එකලාව වැඩි සේක. අන් මගින් ගිය නාගසමාල තෙරුන් වනයෙහි දී සොරුන්ට හසු වූහ. පාත්‍ර චීවර ද පැහැර ගත්හ, හිස ද පැලූහ. ඉන් පසු තෙරණුවෝ "**මට භාග්‍යවතුන් වහන්සේ හැර අන් පිහිටක් නැත**" යැයි සිතා භාග්‍යවතුන් වහන්සේ සොයා ආයේය. භාග්‍යවතුන් වහන්සේ මේ කිම් ද යැයි ඇසූ සේක. තෙරණුවෝ සිදු වූ සියල්ල කීවේය. භාග්‍යවතුන් වහන්සේ "**මහණ, ඔය කරුණ දැනගෙනම ඒ මගින් යෑම වැළකුවෙමි**" යැයි වදාළ සේක.

එසේම තවත් දිනක භාග්‍යවතුන් වහන්සේ මේඝිය තෙරුන් වහන්සේ උපස්ථායකයෙකු වශයෙන් කැඳවාගෙන පාචීනවංශ මුව වනයෙහි ජන්තු නම් ගමට වැඩි සේක. එහි පිඬු සිඟා ගිය මේඝිය තෙරුන් වහන්සේ අලංකාර වූ අඹ වනයක් දැක භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ මෙසේ කීවේය. "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ගේ පාත්‍ර චීවර බාර ගන්නා සේක්වා. මම මේ වනයට ගොස් මහණ දම් පුරමි**" යැයි කීවේය. භාග්‍යවතුන් වහන්සේ තුන් වතාවක්ම වැළකූ නමුත් ගියේය. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ තම පාත්‍ර චීවර රැගෙන එකලාවම වැඩි සේක. තෙරණුවෝ ඒ අඹ වනයට ගොස් භාවනාවට පටන් ගත්තේය. එහෙත් සුළු වේලාවකින්ම අකුසල විතර්කයන්ගෙන් පීඩිතව මට භාග්‍යවතුන් වහන්සේ හැර අන් පිහිටක් නැතැයි සිතා භාග්‍යවතුන් වහන්සේ සොයා ආයේය.

භාග්‍යවතුන් වහන්සේ "**මේඝිය, මම ඔය කරුණ දැනගෙනම ඒ ගමන වැළකුවෙමි**" යැයි වදාළ සේක.

## ☸ නිත්‍ය උපස්ථායෙකු පත් කර ගැනීම

පසු කාලයෙහි බුද්ධත්වයෙන් විසිවන වර්‍ෂයෙහි දී සැවැත්නුවර ජේතවනාරාමයට වැඩියා වූ භාග්‍යවතුන් වහන්සේ, අග්‍ර ශ්‍රාවක, අසූ මහා ශ්‍රාවක මහ රහතන් වහන්සේලා ප්‍රධාන විශාල භික්ෂූන් වහන්සේලා පිරිසක් පිරිවරා උතුම් බුද්ධාසනයෙහි වැඩ හිඳිමින්, මෙසේ වදාළ සේක. "**මහණෙනි, මම දැන් වයෝවෘධයෙමි. මට උපස්ථානයට පැමිණෙන ඇතැම් භික්ෂූන් වහන්සේලා මේ මගින් යමු යැයි කී විට, නැත භාග්‍යවතුන් වහන්ස, මේ මගින් යමු යැයි කියා මගේ පාත්‍ර චීවර බිම දමා යති. එබැවින් මා හට නිත්‍ය උපස්ථායකයෙකු සම්මත කෙරේවා**" යැයි භික්ෂු සංඝයාට පැවරූ සේක. එවිට මහා සංඝයා හට මහත් සංවේගයක් ඇතිවූහ.

එවේලෙහි සැරියුත් මහ රහතන් වහන්සේ නැගිට චීවරය ගැට වටු කොට පොරවා ගෙන භාග්‍යවතුන් වහන්සේට අභිවාදනය කොට "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේම ප්‍රාර්ථනා කරගෙන ඒකාසංඛ්‍යය කල්ප ලක්ෂයක් පෙරුම් දම් පිරුවෙමි. මා වැනි වූ මහත් ප්‍රඥාවන්තයෙකු උපස්ථානයට සුදුසු නොවන්නෙහි ද? මම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරමි**" යැයි කීවේ ය.

භාග්‍යවතුන් වහන්සේ එය අසා "**කම් නැත සාරිපුත්‍රය, නුඹ යම් දිශාවක වාසය කරන්නේ ද, ඒ දිශාව නොසිස්ය. එබැවින් ඔබගෙන් උවටැන් කරවා ගැනීමක් අවශ්‍ය නැත**" යැයි ප්‍රතික්ෂේප කළහ. මෙසේ මුගලන් මහ රහතන් වහන්සේ, මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ආදී මහ රහතන් වහන්සේලා ද, වෙන වෙනම උපස්ථානය ඉල්ලා සිටියහ. භාග්‍යවතුන් වහන්සේ ඒ සියලු දෙනා වහන්සේගේම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ සේක. එසේ වුව ද ආනන්ද තෙරුන් වහන්සේ නිහඬවම සිටියේය. එවිට අන් භික්ෂූන් වහන්සේලා ආනන්ද තෙරුන් වහන්සේ අමතා "**ආනන්දය, ඔබ භාග්‍යවතුන් වහන්සේ වෙතින් උපස්ථායක තනතුර ඉල්ලා ගනුව**" යැයි කීහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ

**"ඇවැත්නි, ඉල්ලා ගත් තනතුරු කෙබඳු වේද? කිම, භාග්‍යවතුන් වහන්සේ මා නොදක්නා සේක් ද, භාග්‍යවතුන් වහන්සේ කැමති වන සේක් නම් ආනන්දය, මට උපස්ථාන කරන්න"** යැයි වදාරන සේක යැයි කීවේය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"මහණෙනි, ආනන්ද අනුන් විසින් උත්සාහ කළ යුත්තෙකු නොවේ. තමන්ම ඒ බව දැන මට උපස්ථාන කරන්නේය"** යැයි වදාළහ. එවිට භික්ෂූන් වහන්සේලා **"ආනන්දය, නැගී සිටින්න දස බලධාරීන් වහන්සේ ගේ උපස්ථානය ඉල්ලන්න"** යැයි කිහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ නැගිට චීවරය ගැට වටු ගන්වා පොරවා ගෙන භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ ඇඳිලි බැඳ ප්‍රතික්ෂේප කිරීම් සතරක් ඉල්ලා සිටියේ ය.

## ☸ ප්‍රතික්ෂේප සතර

1. භාග්‍යවතුන් වහන්සේට ලැබෙන චීවර මට නො දෙන සේක්වා.
2. භාග්‍යවතුන් වහන්සේට ලැබෙන පිණ්ඩපාතය මට නොදෙන සේක්වා.
3. භාග්‍යවතුන් වහන්සේ සමග එක ගඳකිළියෙහි විසීමට මට අවසර නොදෙන සේක්වා.
4. භාග්‍යවතුන් පිළිගත් ආරාධනාවලට මා කැඳවා ගෙන නොයන සේක්වා.

**"භාග්‍යවතුන් වහන්සේ මේ ප්‍රතික්ෂේප සතර පිළිගන්නා සේක් නම් මම උපස්ථාන කරමි"** යැයි කීවේය. එවිට භාග්‍යවතුන් වහන්සේ, **"ආනන්දය, නුඹ කවර ආදීනවයක් දැක මේ ප්‍රතික්ෂේප සතර ඉල්ලන්නෙහි ද"** යැයි අසා වදාළහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඇතැම් කෙනෙක් ආනන්ද තෙරුන් ලාභ අපේක්ෂාවෙන් භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරන්නේය යැයි මේ වචනය කියන්නේය. එබැවින් මේ ප්‍රතික්ෂේප සතර ඉල්ලමි"** යැයි කීවේය. නැවත මේ ආයාචනා සතර ද ඉල්ලා සිටියේය.

## ☸ ආයාචනා සතර

1. මා විසින් බාරගත් දන ආරාධනාවලට භාග්‍යවතුන් වහන්සේ වඩින සේක්වා.
2. භාග්‍යවතුන් වහන්සේ දැකීමට පිටතින් පැමිණෙන පැවිදි ගිහි ආගන්තුකයන් පමා නොවී භාග්‍යවතුන් වහන්සේ වෙත යොමු කරවීමට මට අවසරය දෙන සේක්වා.
3. ධර්මය විනය පිළිබඳව සැකයක් උපන් විගස ඒ මොහොතෙහිදීම එය විසඳ ගැනීමට භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණීමට මට අවසරය දෙන සේක්වා.
4. භාග්‍යවතුන් වහන්සේ මා නැති තැනක දී දේශනා කරන ධර්මයන් නැවත මා හට දේශනා කරන සේක්වා.

**"භාග්‍යවතුන් වහන්සේ මේ ආයාචන සතර පිළිගන්නා සේක් නම් මම උපස්ථාන කරමි"** යැයි කීවේය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"ආනන්දය, නුඹ කුමන ආනිසංසයක් දැක මේ ආයාචන සතර ඉල්ලන්නෙහි ද"** යැයි අසා වදාළහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, සැදැහැ ඇති සත්පුරුෂයෝ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි අවකාශ නොලැබ මා හමුවට පැමිණ, ස්වාමීනි! ආනන්ද ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සමග හෙට මාගේ ගෙයි දනට වඩින සේක්වා"** යැයි ආරාධනා කොට යයි. භාග්‍යවතුන් වහන්සේට එයට අවකාශ නැති විට ඒ සත්පුරුෂයන් භාග්‍යවතුන් වහන්සේ හමුවට පමුණුවාලීමටත් සැක දුරුකර ගැනීමටත් අවකාශ ලබති. එසේ නො ලැබුණු කල්හි **"කුමකට නම් මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ගේ උපස්ථායක වූයෙහි ද, අපට මෙපමණකුදු අනුග්‍රහයක් නැත"** යැයි දෙස් නගන්නේය.

තව ද භාග්‍යවතුන් වහන්සේ නැති විටෙක ඇතැම් සත්පුරුෂයෝ මා හමුවට පැමිණ **"ඇවැත්නි, මේ සූත්‍රය, මේ ජාතකය, මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ කොතැනක දී දේශනා කළ සේක්ද"** යැයි මගෙන් ඇසුව හොත් එය කිව යුතු වන්නේය. නොහැකි වුව හොත් **"මේ ආනන්ද තෙරුන් වහන්සේ කුමකට නම් භාග්‍යවතුන්**

**වහන්සේගේ සෙවණැල්ල මෙන් පාත්‍ර  චීවර ගෙන යමින් පසුපස ඇවිද්දෙහි ද? මෙපමණවත් දෙයක් නො දන්නෙහි ද?"** යැයි මා හට දෙස් නගන්නේය. එබැවින් මේ ආනිශංස දැක මා නැති තැන දෙසූ ධර්මයන් නැවත මා හට දේශනා කරන ලෙස ඉල්ලමි යැයි කීවේය. භාග්‍යවතුන් වහන්සේ එම ඉල්ලීම් අට පිළිගෙන උපස්ථායක තනතුර දුන් සේක. එතැන් පටන් ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ නිත්‍ය උපස්ථායක වූයේ ය.

මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උපස්ථායක වීමට කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි පුරන ලද පාරමිතා ගුණ ඇති මහෝත්තමයෙකි. මේ වරය ලත් දින පටන් ඇල් පැන්  උණු පැන් දැහැටි සපයමින්, පිට පිරිමදිමින්, පාද පිරිමදිමින්, ගඳකිළි පිරිවෙන අමදිමින්, මේ වේලාවෙහි භාග්‍යවතුන් වහන්සේට මේ දෙය ලැබෙන්නට වටීය, මේ වේලාවෙහි මේ දෙය කරන්නට වටීය යැයි දවස මුළුල්ලෙහි ම බුද්ධෝපස්ථානයෙහි යෙදී සිටියේය. එසේම රාත්‍රී කාලයෙහි දඬු වැට පහනක් ගෙන නව වාරයක් භාග්‍යවතුන් වහන්සේ සැතපුණු ගඳකිළිය වටා ඇවිදින්නේය. මෙසේ  කරන්නේ භාග්‍යවතුන් වහන්සේ මා ඇමතූ විටෙක නිදි බරව සිටියේ නම්, එවිට ප්‍රති උත්තර දීමට නොහැකි වන්නේය යැයි ඒ පහන අතින් නුමුදම රෑ පහන් කරන්නේය. මෙසේ මහත් ගුණ ඇති ආනන්ද තෙරුන් වහන්සේ මේ බුදු සසුනෙහි **"බහුශ්‍රැත භික්ෂූන් අතර අග්‍ර වූහ. සතිමන්ත භික්ෂූන් අතර අග්‍ර වූහ. ගතිමන්ත භික්ෂූන් අතර අග්‍ර වූහ. ධෘතිමන්ත භික්ෂූන් අතර අග්‍ර වූහ. බුද්ධ උපස්ථායක භික්ෂූන් අතර අග්‍ර වූහ"**. මෙසේ අග්‍ර ස්ථානාන්තර පසකින් පිදුම් ලැබූහ.

ඒ මේ ආනන්ද තෙරුන් වහන්සේට එක් වරකට බණවර හැටක් (ගාථා පසළොස් දහසක්) ධාරණය වන්නේය. එය දීඝ නිකාය තරම් වූ ප්‍රමාණයකි. වසර විසි පහක්ම භාග්‍යවතුන් වහන්සේ පසුපස යමින් බොහෝ ධර්මයන් ඉගෙන ගත්තේය. ඒ නිසාම පඤ්චසතික සංගායනාවෙහි දී ආනන්ද තෙරණුවෝ :

**"ද්වාසීති බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො,**
**චතුරාසීති සහස්සානි - යෙ මෙ ධම්මා පවත්තිනො"**

යනුවෙන් **"මම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙයාසූ දහසක් (82,000) උගතිමි. සැරියුත් මුගලන් ආදී මහ රහතන් වහන්සේලා සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙදහසක් උගතිමි. මෙසේ මාගේ සිතෙහි ධරන්නා වූ ධර්මය ප්‍රමාණ වශයෙන් සුවාසූ දහසකි (84,000)"** යැයි වදළේය.

මෙසේ ත්‍රිපිටක බුද්ධ වචනයෙන් බොහෝ දෑ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගන්නා ලද මේ ආනන්ද තෙරුන් වහන්සේ එම ධර්ම සංගීතියෙහි දී **"දේවදූත සූත්‍රය"** නමින් මෙසේ සංගායනාවට නැගූහ. එහි අර්ථ විවරණය මෙසේය.

**"එවං මෙ සුතං"** මා විසින් මෙසේ අසන ලදි. මෙය වනාහි මා විසින් අවබෝධ නොකරන ලද්දකි. ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දකි. යනුවෙන් තමන් වහන්සේ අත්හැර, මෙය මා විසින් භාග්‍යවතුන් වහන්සේ වෙතින් ම උගත්තෙමි යැයි අවධාරණය කොට දක්වන්නේය.

**"එවං"** යනුවෙන් තථාගතයන් වහන්සේ විසින් මාගේ ශාසනයෙහි බහුශ්‍රැත භික්ෂූන් අතර ද, යහපත් පැවතුම් ඇති භික්ෂූන් අතර ද, මනා සිහිය ඇති භික්ෂූන් අතර ද, ධාරණ ශක්තිය ඇති භික්ෂූන් අතර ද, උපස්ථායක භික්ෂූන් අතර ද මේ ආනන්ද තෙරුන් වහන්සේ අග්‍ර යැයි වදළ බුද්ධ වචනයට අනුරූප වූ තමන්ගේ ධාරණ ශක්තිය දක්වමින් **"මා විසින් මෙසේ අසන ලදි. එය ද අර්ථ වශයෙන් ද ව්‍යඤ්ජන වශයෙන් ද නො අඩුය. නො වැඩිය. මෙය මෙසේ ම මිස අන් අයුරකින් නොදත යුතුය"** යැයි සත්වයන් ගේ ඇසීමේ කැමැත්ත උපදවයි.

**"මෙ"** යනු මා විසින් යනුයි. භාග්‍යවතුන් වහන්සේ යම් සේ දේශනා කළ සේක ද, එසේම මා විසින් අඩු වැඩි නොකර වෙනස් නොකර මා විසින්ම භාග්‍යවතුන් වහන්සේ වෙතින් උගත්තෙමි යනුවෙන් දක්වමින් භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය දේශනා කළ ධර්ම ශාස්තෲවරයාණන් වහන්සේ වශයෙන් දක්වා තමන් ශ්‍රාවකයෙකු කොට දක්වයි.

**"සුතං"** යනු අසන ලදි යනුයි. ඒ ඇසීම වනාහි අනිකෙකු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දැනගෙන මට කීවා නොවේ.

භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී මගේ කණින්ම අවධානය යොමු කොට මනා ධර්ම ගෞරවයෙන්ම අසා දැන ගත්තෙමි යැයි දක්වයි.

එසේම මේ ආනන්ද තෙරුන් වහන්සේ වනාහි මිහිරි හඬින් ධර්මදේශනා කරන්නා වූ බහුශ්‍රැත වූ විචිත්‍ර ධර්ම කථිකයෙකි. මේ ආනන්ද තෙරුන් වහන්සේ මෙසේ වාක් චාතුර්‍යයෙන් යුක්තව මහේශාක්‍ය මහ රහතන් වහන්සේලා ඉදිරියෙහි මේ උතුම් බුද්ධ වචනය සංගායනා කරන කල්හි එය දැකීමට ශ්‍රවණය කිරීමට අප්‍රමාණ දෙවියෝ ද, බ්‍රහ්මයෝ ද රැස් වූහ. ඔවුන් අතරින් ඇතැම් දෙවියන්ට මෙබඳු සැකයක් උපන්හ.

**"තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ද ශාක්‍ය වංශිකයෙකි. මේ ආනන්ද තෙරුන් වහන්සේ ද ශාක්‍ය වංශිකයෙකි. භාග්‍යවතුන් වහන්සේ ගේ සුළු පියා වූ අමිතෝධන ශාක්‍ය රජතුමාගේ පුත්‍රයාය. රූපයෙන් ද ස්වරයෙන් ද ශෝභමානය. භාග්‍යවතුන් වහන්සේගේ දයාදය ද ලබති. භාග්‍යවතුන් වහන්සේම මේ ආනන්ද තෙරුන් වහන්සේ කරුණු පසකින් අග්‍ර තැන්හි තැබූහ. ඓශ්වර්‍යය ධර්ම සතරකින් යුක්ත වූවෙකු ද වෙති. සැමට ප්‍රියමනාප වූයේ වේ. දැන් භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්ම දයාදය ලැබ බුදු වූයේය"** යැයි සිතූහ. එබැවින් ආනන්ද තෙරුන් වහන්සේ දෙවියන් තුළ වූ ඒ සිත තම සිතින් දැන එසේ වූ අද්භූත වූ ගුණ සම්භාවනාව නො ඉවසන සුළු වූයේ දෙවියන්ට ඇති වූ ඒ රැවටුණු අදහස් දුරු කරමින් ශාස්තෲන් වහන්සේට ඉමහත් ගෞරවය දක්වා තමන්ගේ ශ්‍රාවක බව **"එවං මෙ සුතං"** යනුවෙන් ප්‍රතිඥා කළේ ය.

තවද "එවං මෙ සුතං" යනුවෙන් **"මා විසින් මේ ධර්මය චතු වෛශාරද්‍ය විශාරද වූ, දසබලධාරී වූ, උත්තම ස්ථානයෙහි පිහිටියා වූ, සිංහ නාද සමාන නාද ඇත්තා වූ, සියලු සත්වයන්ට උත්තම වූ, ධර්මේශ්වර වූ, ධර්මරාජ වූ, ධර්මාධිපති වූ, ධර්මද්වීප වූ, ධර්මසරණ වූ, සද්ධර්ම වර චක්‍රවර්ති වූ, සම්මා සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ ගේ සම්මුඛයෙන් පිළිගන්නා ලද්දේ වෙමි. මෙහි අර්ථයෙහි හෝ ධර්මයෙහි හෝ පදයෙහි හෝ ව්‍යඤ්ජනයෙහි හෝ සැකයක් හෝ විමතියක් හෝ නොකළ යුතුය"** යැයි සියලු දෙව් මිනිසුන් ගේ මේ ධර්මයෙහි අශ්‍රද්ධාව නසන සේක. ශ්‍රද්ධාව උපදවන සේක.

**"එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ"** එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අනාථපිණ්ඩික මහ සිටුතුමා විසින් සාදවා පූජා කරන ලද ජේතවනාරාමයෙහි වැඩසිටි සේක.

මෙහි **"එකං සමයං"** යන මෙහි සංවත්සර, ඍතු, මාස පක්‍ෂ දින පූර්වාහ්නය, මධ්‍යාහ්නය, අපරාහ්නය ප්‍රථම යාමය, මධ්‍ය යාමය, පශ්චිම යාමය වශයෙන් කාලය දැක්වීම **"සමය"** නම් වේ. මෙහි සමය බොහෝ වේ. පූරිත පාරමිතා ගුණ ඇති මහ බෝසතාණන් වහන්සේ දසදහසක් ලෝකධාතු වැසි දිව්‍ය බ්‍රහ්මයන්ගේ ආරාධනයෙන් පඤ්ච මහා විලෝකනයන් බලා සුදුසු මව් කුසෙහි පිළිසිඳ ගැනීම **"ගර්භාවක්‍රාන්ති සමය"** නම් වේ. උයනක දී මව් කුසෙන් බිහි වීම **"ජාති සමය"** නම් වේ. එතැන් පටන් සතර පෙර නිමිති දැකීම දක්වා ගිහි ව විසීම **"සංවේග සමය"** නම් වේ. පුතෙකු උපන් දම පැවිදි රුවක් දැක මහාභිනිෂ්ක්‍රමණය කිරීම **"අභිනිෂ්ක්‍රමණ සමය"** නම් වේ. අඩුම තරමින් සත් දිනක් හෝ දුෂ්කර ක්‍රියා කිරීම **"දුෂ්කර ක්‍රියා සමය"** නම් වේ. බෝධි මූලයට වැඩ අපරාජිත පර්‍යංකයෙහි වැඩ හිඳිමින් මාර පරාජය කිරීම **"මාරවිජය සමය"** නම් වේ. ඒ එකම පර්‍යංකයෙහි වැඩ හිඳිමින් තුන් යම් රාත්‍රියෙහි පූර්වේනිවාස ඥානය, දිව්‍යශ්‍රෝත ඥානය, ආශ්‍රවක්‍ෂය ඥානය ලැබීමත් සමගම සර්වඥතාඥාන ඥාන ප්‍රතිලාභයෙන් අභිසම්බෝධියට පැමිණීම **"අභිසම්බෝධි සමය"** නම් වේ. සත්සති ගතකිරීම ද, නිරෝධ සමාපත්ති, ඵල සමාපත්ති, ධ්‍යාන සමාපත්ති සුව විඳීම ද **"දිට්ඨධම්ම සුඛවිහරණ සමය"** නම් වේ. බ්‍රහ්මාරාධනාවෙන් දම්සක් සූත්‍රය දෙසීමෙහි පටන් ධර්මදේශනා කිරීම **"ධර්මදේශනා සමය"** නම් වේ. සූවිසි කෝටි ලක්‍ෂ වාරයක් නවානුපූර්ව විහාර සමාපත්ති සුව විඳ එයින් නැඟී සිට අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පරිනිර්වාණයට පැමිණීම **"පරිනිර්වාණ සමය"** නම් වේ.

ඒ සමයන් අතර මෙහි **"එකං සමයං"** යනු එක් ධර්ම දේශනා සමයක දී යනුයි. ඒ දේශනා සමය ද, **"ඥාණ කෘත්‍ය, කරුණා කෘත්‍ය"** සමයන් අතර **"කරුණා කෘත්‍ය"** සමයකි. **"ආත්ම හිත ප්‍රතිපත්ති සමය, පරහිත ප්‍රතිපත්ති සමය"** යන ප්‍රතිපත්ති සමයන් අතර **"පරහිත ප්‍රතිපත්ති"** සමයකි. රැස් වූ විට කළ යුතු වූ **"ධර්මකථා සමය, දේශනා**

**ප්‍රතිපත්ති සමය**" යන සමයන් අතර "**ධර්මකථා**" **සමයකි**. මේ සියල්ල අතරින් මෙය "**දේශනා සමයකි**".

"**භගවා**" යනු ගුණයෙන් විශිෂ්ට වූ සත්වයන්ට උත්තම වූ ලෞකික ලෝකෝත්තර සැප නිපදවන්නා වූ දන සීලාදී පාරමී භාවයට පැමිණි කුසල් ඇති බැවින් ද, දස ක්ලේශ, අකුශල මූල, දුෂ්චරිත ආදී අනේක විධ වූ ක්ලේශයන් බිඳ හළ බැවින් ද, ඓශ්වර්‍ය්‍ය භාග්‍යා දී කීර්ති ප්‍රශංසාවට ගෞරවයට ලක්වන ගුණයෙන් යුක්ත වන බැවින් ද, අවබෝධ කළ යුතු වූ සියලු ධර්ම කුසල ත්‍රික ආදී ලෙස බෙද දක්වූ බැවින් ද "**භගවා**" නම් වන සේක.

තවද මෙහි "**එවං මෙ සුතං**" යන වචනයෙන් ඇසූ පරිදි ඉගෙන ගත් පරිදි ධර්මය දේශනා කරන්නා වූ දේශකයෝ භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම ශරීරය පමණක්ම දේශනා කරති. එබැවින් "**මේ ධර්මය වනාහි ශාස්තෲවරයෙකු නොමැති එකක් නොවේ. මේ නුඹලාගේ ශාස්තෲවරයාය**" යැයි භාග්‍යවතුන් වහන්සේ නොදැකීමෙන් රූපකයෙහි පිරිනිවීම දක්වයි. එමගින් "**මේ ආර්‍ය්‍ය ධර්මය දේශනා කරන ලද්ද වූ දසබල ධාරී වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ද, වජ්‍ර සමාන කයක් ඇත්තේ නමුදු පරිනිර්වාණයට පත් වූ සේක් නම්, එබඳු ශක්තියක් නැති අන්‍යයන් විසින් දුබල ජීවිත කෙරෙහි කුමන කරුණක් හේතුකොටගෙන ජීවිතාශාව ඉපදවිය යුත්තේ ද**" යැයි ජීවිත මදෙන් මත් වූ ජනතාව සංවේගයට පත් කරයි. ඔවුනට සද්ධර්මයෙහි උත්සාහ උපදවයි. මෙසේ "**එවං**" යන්නෙන් දේශනා සම්පත්තිය ද "**මෙ සුතං**" යන්නෙන් ශ්‍රාවක සම්පත්තිය ද "**එකං සමයං**" යන්නෙන් කාල සම්පත්තිය ද "**භගවා**" යන්නෙන් දේශක සම්පත්තිය ද දක්වයි.

"**සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ**" සැවැත් නුවර සමීපයෙහි වූ අනාථපිණ්ඩික සිටුතුමා විසින් සාදවා පූජා කරන ලද ජේතවනාරාමයෙහි වැඩසිටි සේක යන මෙහි "**සාවත්ථියං** " යනු මෙනම් නම් ඇති නගරයයි.

ස්වස්ථ ඍෂිවරයා හට වාසභූමිය වූ බැවින් මේ භූමිය "**සාවස්ථී**" නම් විය. මිනිසුන්ට අවශ්‍ය උප භෝග පරිභෝග භාණ්ඩ මෙහි ගබඩා

කොට ඇති බැවින් "**සියල්ල ඇත්තේ ය**" යනාර්‍ථයෙන් සාවත්ථි නම් විය.

මෙසේ සියල්ල පරිපූර්‍ණ වූ මේ සැවැත් පුරයෙහි එන්න, කන්න, බොන්න ආදී වූ දසවිධ ශබ්දයන්ගෙන් වෙන් නොවූ ආහාර පානාදියෙන් පරිපූර්‍ණ වූ කොසොල් රට වැසියන්ගේ මේ අග නගරය වනාහි රම්‍ය වූ ද, දර්‍ශනීය වූ ද, මනෝ රමණීය වූ පුණ්‍ය භූමියක් වූයේය. අභිවෘධියෙන් යුක්ත වූ විපුල බවට පත් සාරවත් වූ සමෘධිමත් වූ දෙවියන්ගේ ආලකමන්දව වැනි වූ මේ සැවැත්නුවර උතුම්ය. බුද්ධ කාලයෙහි පසේනදි කොසොල් මහ රජතුමාගේ වාස භූමිය වූයේ ද මෙහිය. පිහිටීම් වශයෙන් අචිරවතී නදී තීරයෙහි විය. මේ නදිය වක්‍රාකාරව ගලා යන බැවින් නගරයෙහි උතුරු දකුණු දෙදිසාවෙන්ම නදිය විය. බුදුරජාණන් වහන්සේගෙන්ම ධර්‍මය ශ්‍රවණය කොට මඟ ඵල ලැබුවෝ පන්කෝටියක් වූහ. අනාථපිණ්ඩික සිටුතුමා විශාකා මහෝපාසිකාව වැනියවුන් නිසා මේ නුවර බැබළීමට ගියේය.

"**විහරති**" යනු දිව්‍ය බ්‍රහ්ම ආයර්‍ය විහරණයන්ගෙන් යම් විහරණයකින් වාසය කරයි යනුයි. එනම් ගමන් කිරීම සිටීම සැතපීම යන සිව් ඉරියව් පවත්වමින් වාසය කිරීමයි. භාග්‍යවතුන් වහන්ස බුද්ධත්වයෙන් තුන් වන වර්‍ෂයෙහි දී මේ සැවැත් නුවරට වැඩි පළමු වතාවෙහිදීම නව මසක් වැඩසිටි සේක. ඉන් පසු දහතර වන වස් කාලයෙහි ද, විසි එක් වන වස්කාලයෙහි පටන් සතළිස් හතර වන වස්කාලය අවසන් වීම දක්වා වූ විසිපස් වසරක කාලයක් මේ සැවැත් නුවරම වැඩසිටි සේක.

"**ජෙතවනෙ**" යනු තමාගේ සතුරු ජනයා ජයගනීනුයි "**ජේත**" නම් වේ. නොහොත් රජු තම සතුරු ජනයා දිනූ කල්හි උපන් බැවින් මේ කුමරාට "**ජේත**" යැයි නම් තැබීය. සේවනය කෙරේනුයි "**වන**" නම් වේ. නොයෙක් ආකාරයේ මල් සුවඳින් සතුටු වූ මත් වූ කොවුල් ආදී පක්ෂීන්ගේ නාදයෙනන ද මඳ පවනින් ද සෑම කල්හිම දළු කොළවලින් ද, මල් ගෙඩි බරින් පිරී බර වී පවතින මෙය "**එවු මා පරිභෝග කරවු**" යැයි ආයාචනා කරන්නාක් වැනි වූ බැවින් "**වන**" නම් වේ. තවද ජීවිතය පිළිබඳ බලාපොරොත්තු ඇති කරවන බැවින් ද "**වන**" නම් වේ. මෙහි අර්‍ථය නම් ජීවිතය පිළිබඳ කලකිරීමක් දුකක් කනගාටුවක් ව්‍යසනයක්

ඇති වූ විටෙක මේ වනයට ගිය කල්හි එහි ඇති අනේක විධ වූ සුවඳවත් වූ මලින් ද ඉදුණු පැසුණු මියුරු පලතුරු ආදියෙන් ද, ඒ මල් පැණි පලතුරු ආදිය පරිභෝගයෙන් තෘප්තිමත් වූ මී මැසි බඹර පක්ෂීන් සිව්පාවන් වැනි සත්වයින්ගේ මිහිරි නාදයෙන් ද, කයට සුව එළවන මඳ පවනින් ද සිත් ඇදගන්නා සුළු වූ ඒ අසිරිය තුලින් මනසෙහි ඇති දුක් පීඩා අමතක වී යන්නේ වේ. එබැවින් ද මෙය "**වන**" නම් වේ. මෙය ජේත කුමාරයාට අයත් වූ ඔහු විසින් රෝපණය කරන ලද පවත්වාගෙන යන ලද්දක් බැවින් "**ජේතවන**" නම් වේ.

"**අනාථපිණ්ඩිකස්ස ආරාමෙ**" අනාථපිණ්ඩික සිටුතුමා විසින් කරවා බුද්ධ ප්‍රමුඛ වූ භික්ෂු සංඝයා වෙත පූජා කරන ලද ආරාමයෙහිය. මව්පියන් තැබූ නමින් "**සුදත්ත**" නම් වූ ඒ ගෘහපති තෙමේ සියලු කාමයෙන් යුක්ත වූ බැවින් ද, පහ වූ මසුරු මල ඇති බැවින් ද, කරුණා ආදී විශේෂ ගුණයන්ගෙන් යුක්ත බැවින් ද, සියලු කල්හිම අනාථයන්ට ආහාරාදියෙන් සංග්‍රහ කළ බැවින් ද "**අනාථපිණ්ඩික**" යැයි ගෞරව නාමයක් විය. "**ආරාමං**" යනු ආරාමයයි. ප්‍රාණීහු හෝ පැවිද්දෝ සිත් අලවා වෙසෙත්නුයි "**ආරාම**" නම් වේ. මේ ආරාමය ජනාවාසයට ඉතා ළඟ ද නොවූ, ඉතා දුර ද නොවූ ධ්‍යාන භාවනා වැඩීමට ඉතාමත් යෝග්‍ය වූ දැකුම්කලු භූමියකි. මෙම භූමිය ලොව පහළ වන සියලු බුදුරජාණන් වහන්සේලාගේ නිත්‍ය වාසස්ථානය වන්නේය. මෙම ආරාම පූජාව උදෙසාම කල්ප ලක්ෂයක් පුරාවට පිරූ පාරමී ඇති අනාථපිණ්ඩික සිටුතුමා විසින් කහවනු අටළොස් කෝටියක් ජේත කුමාරයාට අයත් එම භූමියෙහි අතුරා එම භූමිය මිල දී ගෙන එහි කහවනු අටළොස් කෝටියක් වැය කොට හඳුන් දැවයෙන් සුවඳවත් ආරාමයක් කරවා බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයා හට පවරා දුන් බැවින් අනාථපිණ්ඩික සිටුතුමාගේ ආරාමය නම් විය. අටළොස් කෝටියක් කහවනු වැය කොට ආරාම පූජාව කළේ ය. මෙසේ අනාථපිණ්ඩික සිටුතුමා මෙම ආරාම පූජාව දක්වා කහවනු පනස්හතර කෝටියක් වැය කළේය. එසේම ජේත කුමාරයා විසින් මෙම ආරාම භූමියෙහි අප්‍රමාණ ධනයක් වැය කොට අලංකාරමත් ලෙස රෝපණය කරන ලද වෘක්ෂලතා, මල්, පලතුරු උයන් ආදිය එතුමාගේ පරිත්‍යාගයෝය. ආනන්ද තෙරුන් වහන්සේ විසින් මෙම කථාවස්තුව ඉදිරිපත් කිරීමෙන් "පුණ්‍යකාමීහු මෙසේ පින් රැස් කෙරෙති" යැයි දක්වමින් පින් කැමති අන්‍යයන් ද එසේම පින් කිරීමෙහි යොදවයි.

**මෙහි සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ:** යන මෙහි සැවැත්නුවර දක්වීමෙන් ගොදුරු ගම ද ආරාමය දක්වීමෙන් පැවිද්දට යෝග්‍ය නිවාසස්ථානය ද, තවද සැවැත් පුරය දක්වීමෙන් භාග්‍යවතුන් වහන්සේගේ ගිහි ජනයාට අනුග්‍රහ කිරීම ද ආරාමය දක්වීමෙන් පැවිද්දන්ට අනුග්‍රහ කිරීම ද, එසේම නගරය දක්වීමෙන් සිවුපසය ලැබීමෙන් අත්ථකිලමතානුයෝගයෙන් දුරු වීම ද, ආරාමය දක්වීමෙන් වස්තු කාම ප්‍රහාණයෙන් වෙන් වීමේ උපාය ද, එසේම නගරය දක්වීමෙන් ධර්‍මශ්‍රවණය ද ආරාමය දක්වීමෙන් ඒ ධර්‍මයෙහි යෙදීම ද, එසේම ගොදුරු ගම දක්වීමෙන් කරුණාවෙන් ජනයා වෙත එළඹීම ද ආරාමය දක්වීමෙන් ඒ ගෘහ වාසයෙහි ආදීනව දක ඒවායෙන් නිදහස් වීම ද, එසේම ගොදුරු ගම දක්වීමෙන් සත්වයන්ට හිත සුව ඇති කිරීමේ අදහස ද, ආරාමය දක්වීමෙන් අනුන්ට හිත සුව ඇති කිරීමෙහි නොගැලී සිටීම ද, එසේම ගොදුරු ගම දක්වීමෙන් ධාර්මික සැපය අත නොහැරීම නිමිති කොට ඇති පහසු විහරණය ද ආරාමය දක්වීමෙන් උත්තරිමනුෂ්‍ය ධර්‍මයෙහි යෙදීම නිමතිකොට ඇති පහසු විහරණය ද, එසේම ගොදුරු ගම දක්වීමෙන් මිනිසුන්ට බොහෝ උපකාර බව ද ආරාමය දක්වීමෙන් දෙවියන්ට බොහෝ උපකාර බවත් ද, එසේම ගොදුරු ගම දක්වීමෙන් ලෝක ජනයා අතර ඉපද ඔවුන් අතරම වැඩුණු බව ද, ආරාමය දක්වීමෙන් ලෝකය හා නො ඇලුණු බව ද දක්වයි.

**තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවො'ති. භදන්තෙ'ති ඛො භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.**

එකල්හි භාග්‍යවතුන් වහන්සේ **"මහණෙනි"** යැයි භික්ෂූන් වහන්සේලාට ආමන්ත්‍රණය කළ සේක. එවිට භික්ෂූන් වහන්සේලා **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස"** යැයි පිළිතුරු දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙම **"දේවදූත සූත්‍රය"** වදාළ සේක.

එහි **"තත්‍ර"** යන්නෙන් දේශනා කාලය දක්වයි. එනම් මෙම දේශනාව කරන කාලයෙහි යම් තැනක වැඩසිටි සේක් ද එම ස්ථානය වූ ජේතවනාරාමය දක්වීමයි. එසේම දම් සභා මණ්ඩපයෙහි රැස්ව සිටි භික්ෂූන් වහන්සේලාට ධර්‍ම ශ්‍රවණය සඳහා ආමන්ත්‍රණය කිරීම ද මෙයින් දක්වේ. **"භගවා"** යන්නෙන් මෙම සූත්‍රය දේශනා කරන්නා වූ දේශකයන්

වහන්සේ වන සම්මා සම්බුදු රජාණන් වහන්සේ දක්වයි. "**භික්ඛූ ආමන්තෙසි**" යන්නෙන් ධර්ම දේශක වූ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි සිට අවවාද අනුශාසනා පිළිගෙන ඒ අනුව පිළිපදින්නා වූ ශ්‍රාවක පිරිස වන භික්ෂූන් වහන්සේලා ආසන්නයෙන්ම සිටින පිරිස බැවින් ද, හැම කල්හි එක්රැස් වන බැවින් ද, සිව් පිරිසෙහි ප්‍රධාන ශ්‍රාවක පිරිස බැවින් ද ඇසීමෙහි නියෝජනය කරනු පිණිස ආමන්ත්‍රණය කරයි. භාග්‍යවතුන් වහන්සේ පිරිවරා සිටින භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ කථා නොකරන කල්හි කර්මස්ථාන අරමුණකම යෙදී සිටිති. එසේ ඇති කල්හි කරන දේශනාවට ඒ භික්ෂූන් වහන්සේලා සිත නො යොදත්. එයින් කරන දෙසුම ප්‍රයෝජනවත් නොවෙයි. එබැවින් ඒ භික්ෂූන් වහන්සේලාගේ අවධානය ඇති කරවා ගෙන ධර්ම ශ්‍රවණයෙහි සිහිය උපදවා දේශනාව කරනු පිණිස ආමන්ත්‍රණය කළ සේක. "**භික්ඛවො**" යන්නෙන් එසේ කරණ ආමන්ත්‍රණය දක්වයි.

"**භදන්තෙ'ති බො භික්ඛූ භගවතො පච්චස්සොසුං**" යන්නෙන් යම් භික්ෂු පිරිසක් සඳහා භාග්‍යවතුන් වහන්සේ ආමන්ත්‍රණය කරන සේක් ද, එම භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි භාග්‍යවතුන් වහන්සේගේ දේශනය ප්‍රාර්ථනා කරන අදහසින් එම ආමන්ත්‍රණය අසා සතුටු සිත් ඇත්තාහු වෙති. එබැවින් එක් භික්ෂූන් වහන්සේ නමක් දෙනමක් නොව රැස්ව සිටි සියලු භික්ෂු සංඝයාම "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස!**" යනුවෙන් භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ.

"**භගවා එතදවොච**" යන්නෙන් ඒ රැස්ව සිටි භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව් පිරිස ධර්ම ශ්‍රවණයෙහි හටගත් උත්සාහ ඇතියවුන් බව දැන භාග්‍යවතුන් වහන්සේ දෙසිය යුතු සූත්‍ර දේශනාව දේශනා කොට වදාළ සේක.

"**සෙය්‍යථාපි, භික්ඛවෙ, ද්වෙ අගාරා සද්වාරා, තත්ථ චක්ඛුමා පුරිසො මජ්ඣෙ ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තෙපි නික්ඛමන්තෙපි අනුචඞ්කමන්තෙපි අනුවිචරන්තෙපි, එවමෙව බො අහං, භික්ඛවෙ, දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සාමි චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ, සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාමි**"

මහණෙනි, යම් සේ මුහුණට මුහුණලා පිහිටි දොරවල් ඇති ගෙවල් දෙකක් වෙත් ද, එහි ඇස් ඇති පුරුෂයෙක් මැද සිටියේ එක් ගෙයකින් නික්ම අනිත් ගෙට පිවිසෙන්නා වූ ද, ඒ ගෙයින් නික්ම අනිත් ගෙට පිවිසෙන්නා වූ ද, ඒ ගෙවල් තුළ ඇවිදින්නා වූ ද, ඔබිනොබ හැසිරෙන්නා වූ ද, මිනිසුන් යම් සේ දක්නේ ද, මහණෙනි, එපරිද්දෙන් ම මම පිරිසිදු වූ, මිනිස් ඇස ඉක්ම පැවැත්තා වූ දිවැසින් චුත වන්නා වූ ද, උපදින්නා වූ ද, හීන වූ ද, ප්‍රණීත වූ ද, මනා වර්ණ ඇත්තා වූ ද, දුර්වර්ණ ඇත්තා වූ ද, සුගතියෙහි උපදින්නා වූ ද, දුගතියෙහි උපදින්නා වූ ද කර්මය වූ පරිදි මියගිය සත්වයන් දකිමි.

## ☸ දිබ්බචක්ඛු ඤාණය

දෙවියන්ගේ සුචරිත කර්මයෙන් පහළ වූ වා, පිත්, සෙම්, ලේ ආදී කුණපයන්ගෙන් බාධා නොවූ උපක්ලේශ දෝෂයන්ගෙන් මිදුණු බැවින් දුර පිහිටියා වූ ද, සියුම් වූද අරමුණු පිළිගැනීමෙහි සමත් ප්‍රසාද චක්ෂුස වැනි හෙයින් දිව්‍ය චක්ෂුසය නම් වේ. දිව්‍ය විහාර යැයි කියන ලද චතුර්ථ ධ්‍යාන බලයෙන් ලබන බැවින් ද, එම චතුර්ථ ධ්‍යානය ඇසුරු කොටගෙන හටගත් බැවින් ද දිව්‍ය චක්ෂු නම් වේ. එසේම ආලෝක කසිණය වැඩීමෙන් පැමිණිය යුතු බැවින් තමාගේ ඤාණාලෝකය පැතිර යන බැවින් මහත් ආලෝක ඇති බැවින් ද දිව්‍ය චක්ෂුසය නම් වේ.

මේ පින්වත් සත්වයෝ ඒකාන්තයෙන් කාය සුචරිතයෙන් යුක්ත වූවාහුය. වාක් සුචරිතයෙන් යුක්ත වූවාහුය. මනො සුචරිතයෙන් යුක්ත වූවාහුය. ආර්‍ය්‍ය උපවාද නොකළාහුය. සම්‍යක් දෘෂ්ටි ඇත්තාහුය. සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදනයෙන් යුක්ත වූවාහුය. ඔවුහු ශරීරයාගේ භේදයෙන් මරණින් මතු මනා ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපන්නාහුය.

නැවත ද, මේ පින්වත් සත්වයෝ ඒකාන්තයෙන් කාය සුචරිතයෙන් යුක්ත වූවාහුය. වාක් සුචරිතයෙන් යුක්ත වූවාහුය. මනෝ සුචරිතයෙන් යුක්ත වූවාහුය. ආර්‍ය්‍ය උපවාද නොකළාහුය. සම්‍යක් දෘෂ්ටි ඇත්තාහුය. සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදනයෙන් යුක්ත වූවාහුය. ඔවුහු ශරීරයාගේ භේදයෙන් මරණින් මතු මිනිසුන් අතර උපන්නාහුය.

මේ පින්වත් සත්වයෝ ඒකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. වාක් දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. මනෝ දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. ආර්‍ය්‍යයන්ට උපවාද කළාහුය. මිථ්‍යා දෘෂ්ටි ඇත්තාහුය මිථ්‍යා දෘෂ්ටි කර්‍ම සමාදනයෙන් යුක්ත වූවාහුය. ඔවුහු ශරීරයාගේ භේදයෙන් මරණින් මතු ප්‍රේත යෝනියෙහි උපන්නාහුය.

මේ පින්වත් සත්වයෝ ඒකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. වාක් දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. මනෝ දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. ආර්‍ය්‍යයන්ට උපවාද කළාහුය. මිථ්‍යා දෘෂ්ටි ඇත්තාහු ය මිථ්‍යා දෘෂ්ටි කර්‍ම සමාදනයෙන් යුක්ත වූවාහුය. ඔවුහු ශරීරයාගේ භේදයෙන් මරණින් මතු තිරිසන් යෝනියෙහි උපන්නාහුය.

මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. වාක් දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. මනෝ දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. ආර්‍ය්‍යයන්ට උපවාද කළාහුය. මිථ්‍යා දෘෂ්ටික වූවාහුය. මිථ්‍යා දෘෂ්ටි කර්‍ම සමාදනයෙන් යුක්ත වූවාහුය. ඔවුහු ශරීරයාගේ භේදයෙන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති නිරයෙහි උපන්නාහුය යැයි දැනගනී.

මෙම ඥාණය දෙවියන්ගේ ඇස සමාන බැවින් දිබ්බ (දිව්‍ය) යැයි කියනු ලැබේ. දර්‍ශන අර්‍ථයෙන් චක්‍ෂුව යැයි කියනු ලැබේ. මේ දෙ පදය එක් වූ විට දිබ්බචක්‍ෂු නම් වේ.

## ✪ කාය දුෂ්චරිත

කයින් සිදුවන ප්‍රාණඝාතය, අදත්තාදනය, කාමමිථ්‍යාචාරය, සුරාපානය යන අකුසල් කාය දුෂ්චරිත නම් වේ.

## ✪ වාක් දුෂ්චරිත

වචනයෙන් සිදුවන බොරු කීම, කේලාම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම යන අකුසල් වාග් දුෂ්චරිත නම් වේ.

## ✪ මනෝ දුෂ්චරිත

සිතින් සිදුවන අභිජ්ඣා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි යන අකුසල් මනෝ දුෂ්චරිත නම් වේ.

## ☸ ආර්‍ය්‍ය උපවාදය

බුදු, පසේ බුදු, අග්‍ර ශ්‍රාවක, මහා ශ්‍රාවකයන් වහන්සේලා ද, සෝවාන් සකෘදගාමි, අනාගාමි, අර්හත් මාර්ග ඵල ලාභී ගිහි හෝ පැවිදි සියලු දෙනාම ආර්‍ය්‍ය නම් වෙති. එබඳු උතුමන්ට අනර්ථය කැමතිව "**මේ ඥණ මොවුන්ට නැත, ශ්‍රමණ ධර්මයක් නැති මොවුහු අශ්‍රමණයෝය**" යැයි දුස්සීල භාවයෙන් හෝ, "**මොවුන්ට ධ්‍යානයක් හෝ විමෝක්ෂයක් මාර්ගයක් හෝ ඵලයක් හෝ නැත**" යනාදී ලෙස ගුණ වැනසීම් වශයෙන් දැන හෝ නොදැන උපවාද කරන්නේ ද ආර්‍ය්‍ය උපවාදය නම් වේ. මේ පාප කර්මය ආර්‍ය්‍ය මාර්ගාවබෝධය ද, ස්වර්ගගාමිත්වය ද වලක්වන්නා වූ මරණින් මතු ඒකාන්තයෙන් අවීචි මහ නරකයෙහි උපදවව කල්පයක් දුක් විඳිය යුතු වූ භයානක අකුසල කර්මයකි. එහෙත් පිළියම් කළ හැකි වේ. එබැවින් යමෙක් ආර්‍ය්‍ය උපවාදයක් කළේ නම් එම ආර්‍ය්‍යයන් වහන්සේ වෙත ගොස් ඒ ආර්‍ය්‍යයන් වහන්සේ තමාට වැඩිහිටි නම් වැඳ, බාල කෙනෙක් නම් උක්කුටියෙන් හිඳ "**මම ආයුෂ්මතුන් වහන්සේට මෙසේ ද, මෙසේ ද දෝෂාරෝපණය කෙළෙමි. ඒ සඳහා මට සමාවන්න**" යැයි ක්ෂමා කරවා ගත යුතුය. ඉදින් තමන්ට ඒ ආර්‍ය්‍යයන් වහන්සේ වැඩ සිටින තැනකට යා නොහැක්කේ නම් වෙනත් කෙනෙක් යවා ක්ෂමා කරවා ගත යුතුය. ආර්‍ය්‍යයන් වහන්සේ එම විහාරයෙහි නැත්තේ නම් එම විහාරයෙහි වසන අන් භික්ෂූන් වහන්සේලා වෙත් ද එම භික්ෂූන් වහන්සේලා වෙත ගොස් උක්කුටිකයෙන් හිඳ "**මම අසවල් ආයුෂ්මතුන් වහන්සේට මෙසේ ද, මෙසේ ද කීවෙමි. ආයුෂ්මතුන් වහන්සේලා ඒ සඳහා මට සමාවන සේක්වා**" යැයි කියා එම ක්ෂමා කරවා ගත යුතුය. ඉදින් එම ආර්‍ය්‍යයන් වහන්සේ වසන තැන් ගිය තැන් සොයාගත නොහැක්කේ නම් වෙනත් නුවණැති භික්ෂුවක් වෙත ගොස් "**ස්වාමීනි, මම අසවල් ආයුෂ්මතුන් වහන්සේට මෙසේ ද මෙසේ ද දෙස් කීවෙමි. එය සිහිකරන වාරයක් පාසා මාහට විපිළිසර බව ඇති වේ.**

**මම කුමක් කළ යුතු ද යැයි කියනු මැනවි"** යැයි කිව යුතුය. එවිට එම භික්ෂුව **"නුඹ ඒ පිළිබඳව නොසිතන්න. ආයුෂ්මතුන් වහන්සේ නුඹට ක්ෂමා කරන සේක. නුඹ සිත සන්සුන් කරගන්න"** යැයි කියයි. එවිට ඒ වරද කළ තැනැත්තා විසින් එම ක්ෂීණාශ්‍රවයන් වහන්සේ වැඩිය දිසාවට ඇඳිලි බැඳ වැඳ **"ආයුෂ්මතුන් වහන්සේ මට ක්ෂමා වන්න"** යැයි කිව යුතුය. එම ආයුෂ්මතුන් වහන්සේ පිරිනිවියේ නම් පිරිනිවියා වූ තැනට හෝ සොහොනට ගොස් ක්ෂමා කරවිය යුතුය. එසේ කිරීමෙන් ආවරණයන්ගෙන් නැගී සිටිය හැකිය.

## ☸ මිථ්‍යා දෘෂ්ටිය

කය වචනය සිත යන ද්වාරයන්ගෙන් සිතට වැදගන්නා අරමුණු වරදවා දැඩි කොට අල්ලා ගැනීම, සත්‍යයට විරුද්ධව ගැනීම දිට්ඨි නම් වේ. ලෝකය දෙවියෙකු විසින් මවන ලද්දේය යනාදී හේතු රහිත අදහස් ඇති බව ආදිය මෙහි ඇතුළත් වේ. කැට කැබිලිති රන් රුවන් කොට දක්වන්නාක් මෙන් මේ දෘෂ්ටිය ඒ ඒ අරමුණුවල නියම තතු වසා දක්වයි. මෙම මිථ්‍යාදෘෂ්ටිය ප්‍රධාන වශයෙන් **"නාස්තික දෘෂ්ටිය, අහේතුක දෘෂ්ටිය, අකිරිය දෘෂ්ටිය"** යැයි තෙවැදෑරුම් වේ. එහිː-

### ❁ නාස්තික දෘෂ්ටිය

**"දනයෙහි විපාක නැත, යාගයෙහි විපාක නැත, පූජා සත්කාරයන්හි විපාක නැත, කුසලාකුසල කර්මයන්හි විපාක නැත, මෙලොවක් නැත, පරලොවක් නැත, මවට කරන හොඳ නරක දෙකෙහි විපාක නැත, පියාට කරන හොඳ නරක දෙකෙහි විපාක නැත, ඕපපාතිකවය උපදනා සත්වයෝ නැත, මෙලොව පරලොව තමන් විසින්ම දැන ප්‍රත්‍යක්ෂ කොට පවසන්නා වූ එබඳු සම්‍යග් මාර්ගය අනුගමනය කරන ශ්‍රමණ බ්‍රාහ්මණයින් (බුද්ධාදී උතුමන්) ලොව නැත"** යන මේ විපරිත දර්ශනය නාස්තික දෘෂ්ටිය නම් වේ.

## ❁ අහේතුක දෘෂ්ටිය

කාම රූප අරූප යන තුන් භවයෙහි වසන සත්වයන්ගේ සිත කෙලෙසීමට හේතුවක් නැත, හේතුවක් ප්‍රත්‍යයක් නැතිවම සත්වයෝ කෙලෙසෙති. සත්වයන්ගේ සිත පිරිසිදු වීමට හේතුවක් නැත, හේතුවක් ප්‍රත්‍යයක් නැතිවම සත්වයෝ පිරිසිදු වෙති. තමන් කළ කර්මයෙහි විපාක නැත. අනුන්ගේ අවවාදයෙහි පිහිටා කළ කර්මයෙහි විපාක නැත. තමන්ගේ පුරුෂ වීර්‍ය්‍යයෙහි ඵලයක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. සියලු සත්වයෝ, සියලු ප්‍රාණීහු, සියලු භූතයෝ, සියලු ජීවයෝ අවසඟයෝය. බල නැත්තෝය. වීර්‍ය්‍ය නැත්තෝය. නියම පැවතුම් ඇති බැවින් සවැදෑරුම් අභිජාතීන් අතුරෙහි ඒ ඒ ගතිවලට පැමිණ සුව දුක් විඳින්නාහ යැයි ගන්නා හේතු ඵල නොපිළිගන්නා දෘෂ්ටිය අහේතුක දෘෂ්ටිය නම් වේ.

## ❁ අකිරිය දෘෂ්ටිය

සිය අතින් ප්‍රාණඝාතාදිය කරන්නා හට ද, අණ දී අනුන් ලවා කරවන්නා හට ද, අත් පා ආදිය කපන්නා හට ද, අනුන් ලවා කප්පවන්නා හට ද, අනුන් දඬු ආදියෙන් පෙළන්නා හට ද, එසේ පරපීඩා කරවන්නා හට ද, තමන්ම පර සන්තක බඩු ආදිය පැහැර ගෙන අනුන්ට ශෝක ඇති කරන්නා හට ද, එලෙස ම අනුන් ලවා ශෝක ඇති කරවන්නා හට ද, ආහාර වැළැක්වීම් ආදියෙන් අනුන් වෙහෙසවන්නා හට ද, එසේම අනුන් ලවා වෙහෙස කරවන්නා හට ද, ප්‍රාණ හිංසා කරන්නාහට ද, එසේම අනුන් ලවා කරවන්නා හට ද, නුදුන් දෙය ගන්නා හට ද, ගෙවල් බිඳින්නා හට ද, කිසිවක් ඉතිරි නොකොට පැහැර ගන්නා හට ද, අනුන් ලවා එසේ කරවන්නහුට ද, එක් ගෙයක් වට කොට උපද්‍රව කොට එහි ඇති බඩු පැහැර ගන්නහුට ද, මඟ රැක සිට එහි යන්නවුන්ගේ බඩු පැහැර ගන්නවුන්ට ද, පර අඹුවන් කරා යන්නා හට ද, බොරු කියන්නා හට ද මෙසේ පව් කරමි යැයි සිතා යමක් කරන්නාට පව් සිදු නොවේ.

තවද යමෙක් කර කැත්තක් සේ තියුණු නිම් වලල්ලක් ඇති චක්‍රයකින් මේ පොළොවෙහි වසන (සියලු) සත්වයන් මරා එකම මස්

ගොඩක් එකම මස් පිඩක් කරන්නේ ද, ඒ හේතුවෙන් පවක් නැත්තේය, පාපයාගේ පැමිණීමක් නැත්තේය. (සත්වයන්) හිංසා කරමින්, කරවමින්, සිඳිමින්, සිඳවමින්, පීඩා කරමින්, කරවමින් ඒ හේතු කොට ද සිදුවන පාපයක් නැත්තේය, පාපයාගේ පැමිණීමක් නැත්තේය.

එසේම සතුන් මරමින්, අනුන් ලවා මරවමින්, අත පා සිඳිමින්, අනුන් ලවා සිඳුවමින්, අන්‍යයන් පෙලමින්, අනුන් ලවා පෙලවමින්, ගංගා නදියේ දකුණු තෙරට[1] යන්නේ නමුත් ඒ හේතුවෙන් පවක් නැත.

එසේම දන් දෙමින්, අනුන් ලවා දෙවමින්, යාග කරමින්, අනුන් ලවා කරවමින් ගංගා නදියෙහි උතුරු තෙරට[2] යන්නේ නමුත් ඒ හේතුවෙන් ද පිනක් නැත්තේය. පුණ්‍යයාගේ වැඩීමක් නැත්තේය. (දන්) දීමෙන් ද, ඉන්ද්‍රිය සංවරයෙන්, සීල් රැකීමෙන් සත්‍ය ප්‍රකාශ කිරීමෙන් පිනක් නැත්තේය. පුණ්‍යයාගේ පැමිණීමක් නැත්තේය යැයි ගන්නා හාත්පසින්ම පින් පව් ප්‍රතික්ෂේප කිරීම අකිරිය දෘෂ්ටිය නම් වේ. මෙම මිථ්‍යා දෘෂ්ටිය දෙසැට ආකාර වේ. ඒවා මෙසේ ය.

**කේවල සාස්වත දෘෂ්ටි සතරකි. ඒකත්ත සාස්වත දෘෂ්ටි සතරකි. අත්තානන්තික දෘෂ්ටි සතරකි. අමරාවික්ෂේපවාදී දෘෂ්ටි සතරකි. අධිත්‍ය සමුප්පන්න වාද දෘෂ්ටි දෙකකි. සඤ්ඤීවාද දෘෂ්ටි සොළොසකි. අසඤ්ඤීවාද දෘෂ්ටි අටකි. නේවසඤ්ඤීනාසඤ්ඤීවාද දෘෂ්ටි අටකි. උච්ඡේදවාදී දෘෂ්ටි සතකි. දිට්ඨධම්මනිබ්බානවාද දෘෂ්ටි පසකි. සියල්ල** දෙසැටකි. ඒවා මෙසේය :-

## ❁ කේවල සාස්වත දෘෂ්ටි සතර

1. ධ්‍යාන සමාපත්ති බලයෙන් ලත් පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණ ලබා කල්පයකින් මෙපිට, තමහට පෙනෙන පමණින් ජාතීන් සිහි කිරීමෙහි සමත් තැනැත්තාගේ, චිත්ත චෛතසිකයන්ගේ ක්ෂණ

---

[1] දකුණු දිසාවෙහි මනුෂ්‍යයෝ කර්කශ දරුණුය එබැවින් මෙසේ කීවේය.

[2] උතුරු දිසාවෙහි මනුෂ්‍යයෝ ශ්‍රද්ධා ඇත්තෝය. ප්‍රසන්න වූවෝය. රත්නත්‍රය විෂයයෙහි ගෞරව ඇත්තෝය එබැවින් මෙසේ කීවේය.

භංගය නොදක්මෙන් යම්කිසි ස්කන්ධයක් ආත්මය යැයි සලකා ඒ ආත්මය හා ලෝකය, නිත්‍යය, සදාකාලිකය යැයි ගැනීම.

2. ප්‍රථම අවස්ථාවට වඩා මෝරාගිය පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණින් දස කල්පයකින් මෙපිට මුත්, එපිට සිහි කිරීමෙහි අපොහොසත් වූවහුගේ දස කල්පයකින් මෙපිට විසූ කඳ පිළිවෙළ දැක ආත්මය හා ලෝකය, නිත්‍යය, සනාතනය යැයි ගැනීම.

3. ද්විතීය අවස්ථාවට වඩා තදබද වූ පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණින්, ධ්‍යාන සමාපත්තියෙහි වශී භාවය නිසා, සතළිස් කල්පයකින් මෙපිට විසූ ආත්මභාවයන් සිහි කොට, ආත්මය හා ලෝකය නො නැසී පවතී යැයි ගැනීම.

4. සිව්වැනි කේවල ශාශ්වත දෘෂ්ටිය, දෘෂ්ටි ගතිකයන්ගේ වශයෙන් සිව් වැදෑරුම්ය. **අනුශ්‍රැතික** - **ජාතිස්මරණික** - **ලාභී** - **තාර්කිකය** යැයි සිව් වැදෑරුම් වේ.

✠ එහි 'එදවස වෙසතුරු රජ වූයේ දැන් බුදුරජාණන් වහන්සේ නම්, ආත්මය සදාකාලිකය' යැයි ගන්නේ **අනුශ්‍රැතිකය**.

✠ ජාතීන් සිහි කිරීමෙහි නුවණින්, ආත්මභාව එකක් දෙකක් සිහි කොට 'මම පෙර මෙනම් වීමි, එහෙයින් ආත්මය සදාකාලිකය යැයි ගන්නේ **ජාතිස්මරණිකය**.

✠ තමන් වෙත ගලා එන අධික ලාභ දැක 'මම පෙරත් මෙසේ වීමි, මතුත් මෙසේ වන්නෙමි" යැයි ආත්මය සදාකාලික කොට ගන්නේ **ලාභීය**.

✠ මෙසේ ඇති විට මෙසේ වේ. මෙසේ නැති විට මෙසේ නොවේ යැයි සිතන්නේ **තාර්කිකය**.

මේ කියන ලද්දේ **කේවල ශාශ්වත දෘෂ්ටි** සතරය. **සියල්ලම සදාකාලිකය** යැයි යැයි ගන්නේ මේ දෘෂ්ටියෙනි.

## ❁ ඒකත්ත සාස්වත දෘෂ්ටි සතර

1. කල්පය නැසී හට ගන්නා කල්හි, පහළ වන ශූන්‍ය වූ බ්‍රහ්ම විමානයෙහි, උඩ බඹ තලයකින් ගිලිහී උපදනා සත්වයා හට, පසු කාලයෙහි තම පැතීම නිසා, එහි උපන් අනික් සත්වයන් ගැණ, **'මම මහා බ්‍රහ්ම වෙමි, මගේ ප්‍රාර්ථනාව නිසා මොවුහු මෙහි උපන්නෝ ය, මම සියල්ලන්ට වඩා වෘද්ධ වෙමි, ලෝකය හා පෘථිවි-පර්වත-චන්ද්‍රසූර්යයාදීන් මම මැවීමි, මොවුහු මවන ලද්දෝ මා විසින්ය'** යැයි සිතිවිල්ලක් උපදන්නේය. එහි පසු ව උපන් අනික් සත්වයෝද **'අප මැවූවේ මේ මහා බ්‍රහ්ම තෙමේය'** යැයි අදහා ගණිත්. මොවුන් අතුරෙහි යම් සත්වයෙක් ආයු ගෙවී යෑම් ආදී යම් කිසි හේතුවකින්, එයින් ගිලිහී මිනිස් ලොව ඉපිද, පැවිදිව, චිත්ත සමාධියට පැමිණ, පෙර විසීම් පමණක් සිහි කොට **'ඒ මහා බ්‍රහ්මයා නිත්‍යය, සනාතනය, ඔහු විසින් මැවූ අපි අනිත්‍ය වූවෝ වෙමු, මහා බ්‍රහ්ම තෙමේ සදාකාලිකය, නොපෙරළෙන්නේය, අපි සදාකාලිකත්, නො පෙරළෙන්නෝත් නොවෙමු'** යැයි දෘෂ්ටිග්‍රහණය කරන්නේය. ඒ ගැණිමය එකත්‍ය ශාශ්වත දෘෂ්ටියෙහි පළමුවැන්නයි.

2. ඛිඩ්ඩාපදූසිකා නම්, දෙව්ලොව උපන් කිසියම් දෙවියෙක් ක්‍රීඩාවෙන් කල් යවා ආහාර නොගැණීමෙන්, එයින් ගිලිහී මිනිස් ලොවට ආයේ, පැවිදිව ධ්‍යාන ලබා ඒ පළමු සිටි අත්බව සිහි කොට **'මම ආහාරය අමතක කිරීම නිසා එයින් ගිලිහී ගියෙමි, ඒ මම අනිත්‍ය වෙමි, සනාතන නොවෙමි, එබඳු අමතක වීම් නැත්තෝම නිත්‍යයෝය, සනාතනයෝය'** යැයි ගණියි. එය එකත්‍ය ශාශ්වත දෘෂ්ටියෙහි දෙවැන්න.

3. මනෝපදූසිකා නම්, දෙව්ලොව උපන් දිව්‍ය පුත්‍රයෝ දෙදෙනෙක් උනුන් කෙරෙහි කිපී දෙවඟනන් හඬමින් සිටියදීම, ඒ කෝප හේතුවෙන් එයින් ච්‍යුතව යන්නාහ. ඔවුන් අතර යම් කෙනෙක් මිනිස් ලොව උපන්නේ නම්, ඔහු පැවිදිව ධ්‍යාන ලබා පෙර විසූ ආත්මභාවය සිහි කොට **"උනුන් කෙරෙහි නො කිපුණු දෙවියෝම නිත්‍යයහ, අපි අනිත්‍ය වෙමු"** යැයි මේ ආදී ලෙසින් දෘෂ්ටි ගණියි. එය මෙහි තෙවැන්න.

4. ඇස - කණ - නාසය - දිව - කය - සිත යන ඉඳුරන් ආත්මය යැයි වරදවා ගෙන පසුව **"චක්ෂුරාදී වූ පඤ්චේන්ද්‍රිය අනිත්‍යය, සිත සදාකාලිකය, පක්ෂීහු ගසක් හැර ගසක ලගිත්ද, එපරිද්දෙන් ආත්මභාවය නැසී ගිය කල්හි, සිත අන් භවයකට යන්නේය"** යයි වරදවා ගැණීමයි. මෙහි සිව්වැන්න.

**කොටසක් සදාකාලික ය, කොටසක් සදාකාලික නොවේය** යැයි ගන්නේ මේ දෘෂ්ටියෙනි.

## ❁ අන්තානන්තික දෘෂ්ටි සතර

1. යමෙක් ප්‍රතිභාග නිමිත්ත සක්වළ කෙළවර කොට නොවඩා, කසින සමාපත්තියෙහි ලත් චිත්ත සමාධි ඇති බැවින් එහි වූ රූපාරූප ධර්‍ම ලෝකය යැයි සලකා ලෝකය කෙළවර ඇත්තක් යැයි ගණී ද, ඒ ගැණීමය අන්තානන්තික දෘෂ්ටියෙහි පළමු වැන්න. මෙය ශාශ්වතත් වේ. උච්ඡේදත් වේ. 'ලෝකය කෙළවර ඇත්තෙක්ය, හාත්පසම පෙණෙයි, සිත එකඟ කිරීමෙන් මම දන වෙසෙමි' යැයි මේ දෘෂ්ටියෙහි බැස සිටින්නා කියා පායි.

2. සක්වළ කෙළවර කොට වැඩූ කසින ඇත්තේ, සමාපත්තිය තුළ පැවති රූපාරූප ධර්‍ම ලෝකය යැයි ද, කසින පරිච්ඡේදයාගේ අන්තිමය කෙළවර නැත්තක්ය යැයි ද ගෙන 'මේ ලෝකය කෙළවර නැති එකක්ය යැයි කියන්නේය. ඒ කීමට හේතු වන දෘෂ්ටිය මෙහි දෙ වැන්නය. මෙය ද ශාශ්වත - උච්ඡේද දෘෂ්ටි දෙකට ම බැස ගණියි.

3. උඩ යට දෙදිශාවෙහි නොවඩා සරසට වැඩූ කසින සමාපත්තියෙහි, සිත එකඟ කිරීමෙන් 'උඩ යට දෙ දිශාව කෙළවර ඇත්තේය, සරස කෙළවර නැත්තේය' යැයි අන්තානන්ත ගැණීම මෙහි තෙවැන්නය.

4. මේ වාදයට ප්‍රතිපක්ෂව ආත්ම දෘෂ්ටිය පෙරටු කොට තමහට වැටහෙන පමණක් ගෙන 'ලෝකය කෙළවර ඇත්තෙක් විය.

ලෝකය කෙළවර නැත්තක් නොවූයේය' යැයි ගැණීම මෙහි සිව්වැන්නය.

**ලෝකයෙහි කෙළවර ඇත්තේය, ලෝකයෙහි කෙළවර නැත්තේය, ලෝකයෙහි කෙළවර ඇත්තේ ද වේ, නැත්තේ ද වේ, ලෝකයෙහි කෙළවර ඇත්තේ ද නොවේ, නැත්තේ ද නොවේ යන** කරුණු සතර උඩ පැවති දෘෂ්ටිය අන්තානන්තික දෘෂ්ටි නම් වේ.

## ❀ අමරාවික්ෂේපවාදී දෘෂ්ටි සතර

1. යමෙක් කුසල් අකුසල් ගැණ විචාළ විට කිසිවක් නොකියා 'මේ කුසල්ද යැයි අසන ලද්දේ 'එසේත් නොවේ යැයි ද 'මේ අකුසල් ද යැයි අසන ලද්දේ 'එසේත් නොවේ යැයි ද ආත්මය හා ලෝකය සදකාලිකද' යැයි අසන ලද්දේ 'එසේත් නොවේ යැයි ද ශාශ්වතයෙන් අන්‍ය වූ ඒකත්‍ය ශාශ්වත ද' යැයි අසන ලද්දේ එපරිද්දෙන් නොවේය යැයි මෙසේ කුසල් අකුසල් ආදිය පිළිබඳව ප්‍රශ්නයට පිළිතුරු දී ගත නොහැකිව, ඡන්දදි භය කරණ කොට නොමග යැමට වචන ගසා දැමීමට හේතු වන දෘෂ්ටිය අමරාවික්ෂෙපික දෘෂ්යෙහි පළමුවැන්නය.

2. මම කුසල් අකුසල් තත් වූ පරිදි නො දනිමි, එබැවින් මම මේ කුසලය කියා හෝ, අකුසලය කියා හෝ කියම් ද, එහි දී මට රාගයක් හෝ ක්‍රෝධයක් හෝ වන්නේය, යම් ප්‍රකාශයක් නිසා මට ඡන්දයක් හෝ රාගයක් හෝ ද්වේෂයක් හෝ ප්‍රතිඝයක් හෝ වන්නේ ද, එය මට දැඩි ගැණීමක් වන්නේය, යමෙක් මට දැඩි ගැණීමක් වේ ද, එය මට දුක් පිණිස වන්නේය, යමෙක් මට දුක් පිණිස වේ නම්, එය මට ස්වර්ග - මෝක්ෂ දෙක වළකන්නේය' යැයි මෙසේ යමෙක් දැඩි ගැණීමට බියෙන් පිළිකුල් කිරීමෙන් කුසල් අකුසල් ගැණ ඇසූ විට කිසිවක් නො කියා, එසේ ද, එපරිද්දෙන් ද, අන් පරිද්දෙන් ද' යැයි ඇසූ කල්හි එසේ නොවේ, නැත් ද' යැයි ඇසූ කල්හි, නැත කියාත් වේ, නැත්තේත් නොවේ ද' යැයි ඇසූ කල්හි, නැත්තේ නොවන්නේත් නොවේය' යැයි මේ පිළිවෙළින් කෙළවරක් නැති

පරිදි වචන වික්ෂේපයට පැමිණේ ද, එයට හේතු වන දෘෂ්ටිය එහි දෙ වැන්නය.

3. අස් ලොම් ආදිය බලා විදින දුනුවායන් සමාන වූ සියුම් නුවණින් මිසදිටු බිඳින්නන් සේ හැසිරෙන මහණ බමුණෝ මා අතින් ලබ්ධිය විචාළෝ නම්, ඔවුන්ට එය සපුරා කියන්නට මම අපොහොසත් වෙමි, එය මට පීඩාවකි, යමෙක් මට පීඩා නම්, එය ස්වර්ග මෝක්ෂ දෙකට අන්තරායකි' යැයි ඔවුන් හා එක්ව යෙදීමේ බියෙන් කුසල් අකුසල් ගැණ ඇසූ ප්‍රශ්නයන් ගැණ කිසිවක් නොකියා 'මෙසේත් මට නැත්තේය, එසේත් මට නැත්තේය, අන් පරිද්දකින් ද නැත්තේය, නැත්තේත් නොවේය, නැත්තේ නොවන්නේත් නොවේ' යැයි මෙසේ ගන්නහුගේ ඒ ගැණීමට, වචන ගසා දැමීමට හේතු වන එහි තෙවන දෘෂ්ටිය යි.

4. යම්කිසි මහණ බමුණෙක් මඳ නුවන හා බලවත් ව නැගුණු මුලාව ඇති බැවින් ඒ ඒ තැන්හි ප්‍රශ්න විචාළේ නම්, කිමෙක්ද, පරලොවක් ඇත්ද' යැයි විචාළේ නම්, 'පරලොව ඇත යැයි මට වැටහිනි නම්, එය නුඹට කියන්නෙමි, මට එසේත් නොවේ, ඒ පරිද්දෙනුත් අන් පරිද්දකිනුත් නොවේ, නැත්තේත් නොවේ, නැත්තේ නොවන්නේත් නොවේ' යැයි යනාදි ලෙසින් යමෙක් පවසා නම්, එයට හේතු වන එහි සිව්වැන්නය.

**මැරීමක් නැති බැවින් 'අමර' නම් වූ දෘෂ්ටි වචනයන්ගේ ඉවත දැමීම ඇති බැවින් අමරවික්ෂේපික නම් වූ නොහොත් දියෙහි ගැලීම් මතු වීම ආදි වශයෙන් හැසිරෙන අල්ලා ගත නො හැකි (ආඳ වැනි) අමර නම් මත්ස්‍ය ජාතිය සේ ඔබිනොබ දුව යන මේ වාදය අමරාවික්ෂේප නම් වේ.**

## ❀ අධිත්‍ය සමුප්පන්න වාද දෘෂ්ටි දෙක

1. තීර්ථායතනයක පැවිදි වූ ඇතැම් කෙනෙක් වායෝ කසින භාවනාව වඩා සිව්වැනි ධ්‍යානය උපදවා ඉන් නැගී සිතෙහි දෙස් දකියි. 'සිත ඇති විට අත්, පා සිඳීම් බිඳීම් ආදී වූ දුක් බිය ද ඇති වේ, එහෙයින්

සිතින් කම් නැත, වැඩක් නැත, සිත නැති බවම යහපති යැයි සිතා නො පිරිහුණු ධ්‍යානයෙන්ම කලුරිය කිරීමෙන් අසඤ්ඤතලයෙහි උපදී. සිත මෙහි නිරුද්ධ වේ. රූපස්කන්ධ මාත්‍රයක්ම එහා පහළ වෙයි. යම් සේ දුනු දියෙන් විදිනා ලද ඊය දුනු දියෙහි වේගය පමණින් අහස යයි ද, එසේ ධ්‍යාන වේගය තිබෙන තුරුම එහි සිටියි. ධ්‍යාන වේගය නැති වූ විටම පිරිහී ගිය විටම රූපස්කන්ධය අතුරුදහන් වේ. ප්‍රතිසන්ධි සඤ්ඤාවෙන් අසඤ්ඤතල සත්වයන්ගේ ච්‍යුතිය පෙණෙන්නීය. එහෙයින් සඤ්ඤා මාත්‍රයම උත්පත්තිය කොට ඇති අසඤ්ඤතල සත්වයෝ අසඤ්ඤතලයෙන් ච්‍යුත වෙත්. ඒ බ්‍රහ්ම කායෙන් ච්‍යුතව මිනිස් ලොව ඉපිද පැවිදිව චිත්ත සමාධිය ලැබූ හෙතෙම අසඤ්ඤතලයෙහි උත්පත්තිය පමණක් සිහි කරයි. ඉන් මතු එයින් ඔබ සිහි නොකොට 'ආත්මයත් ලෝකයත් කරුණු නැතිව හේතු රහිතව උපන්නේය, එබැවින් පෙර නොවූ මම සත්ත්ව භාවයට පැමිණියෙමි' යැයි ගැනීමට අනුබල දෙන දෘෂ්ටිය දෙ වැදෑරුම් අධීත්‍ය සමුත්පන්නික දෘෂ්ටියෙහි පළමුවැන්නය.

2. යමෙක් තර්කානුකූල ව තීරණය කොට තමන්ගේ නුවණට වැටහෙන පමණක්ම ගෙන 'ලෝකය හා ආත්මය හේතු රහිතව උපන්නේය' යැයි ගණී ද, ඔහුගේ ඒ ගැණීමය එහි දෙවන දෘෂ්ටිය.

**ආත්මය හා ලෝකය අහේතුකව උපන්නේය යයි ගන්නා දෘෂ්ටිය අධීත්‍යසමුත්පන්නික** නම් වේ.

## සඤ්ඤීවාද දෘෂ්ටි සොළොස

1. රූප ධ්‍යානය ලබා 'කසින රූපය ආත්මය වේ, එහි පැවති සඤ්ඤාව සඤ්ඤීය' යැයි ගැණීම, සොළොස් වැදෑරුම් සඤ්ඤා දෘෂ්ටියෙහි පළමුවැන්නය.

2. අරූප ධ්‍යාන ලබා අරූප සමාපත්ති නිමිත්ත ආත්ම වශයෙන් ගෙන සලකා 'ආත්මය අරූපිය, නිත්‍යය, මරණින් මතු සමාපත්ති සඤ්ඤාව ඇත්තේය' යැයි ගැණීම, එහි දෙවැන්නය.

3. රූප - අරූප සමාපත්ති දෙක මුසු කොට ගැණීමෙන් 'ආත්මය රූපවත් ද අරූපවත් ද වේ, මරණින් මතු නිත්‍යය' යැයි ගැණීම, තෙවැන්නය.

4. 'ආත්මය රූපයෙන් තොරය, ආත්මය අරූපයෙන්ද තොරය, එහෙත් ඒකාන්තයෙන් සඤ්ඤා ඇත්තේ මරණින් මතු නිත්‍ය සඤ්ඤා ඇත්තේය' යැයි ගැනීම සිව්වැන්නය.

5. 'ආත්මය කෙළවරක් ඇත්තේය, මරණින් මතු එය නිත්‍ය වූයේ සඤ්ඤා ඇත්තේය' යැයි ගැනීම, පස්වැන්නය.

6. ආත්මය කෙළවරක් නැත්තේත්, මරණින් මතු එය නිත්‍ය වූයේය, සඤ්ඤා ඇත්තේය' යැයි ගැණීම, සයවැන්නය.

7. ආත්මය කෙළවර ඇත්තක් ය, කෙළවර නැත්තක් ය, මරණින් මතු එය නිත්‍ය වූයේ ය සඤ්ඤා ඇත්තේය' යැයි ගැණීම, සත්වැන්නය.

8. කෙළවර ඇත්තක් වූයේත්, කෙළවර නැත්තක් නොවූයෙත් ආත්මය වේ, මරණින් මතු නිත්‍ය වූ සඤ්ඤා ඇත්තේය' යැයි ගැනීම අටවැන්නය.

9. ධ්‍යාන සමවැදුනහුගේ වශයෙන් ඒකත්ව සඤ්ඤා ඇත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍ය වූ සඤ්ඤා ඇත්තේය' යැයි ගැනීම, නවවැන්නය.

10. ධ්‍යාන සමාපත්තියට නොසමවැදුනහුගේ සමවැදීමක් නැත්තහුගේ වශයෙන් හා නානාත්ව සඤ්ඤා ඇත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍ය වූ සඤ්ඤා ඇත්තේය' යැයි ගැනීම, දසවැන්නය.

11. හීන කසිනයාගේ වශයෙන් පරිත්ත සඤ්ඤා ඇත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍ය වූ සඤ්ඤා ඇත්තේය' යැයි ගැනීම, එකොළොස් වැන්නය.

12. විපුල කසිණයාගේ වශයෙන් අප්‍රමාණ සඤ්ඤ ඇත්තේ ආත්මය වේ, ඒ මේ ආත්මය මරණින් මතු නිත්‍ය වූ සඤ්ඤ ඇත්තේය' යැයි ගැනීම, දෙළොස් වැන්නය.

13. සිව්වන ධ්‍යාන භූමියෙහි ඉපදීම් වශයෙන් ඒකාන්ත සැප ඇත්තේ ආත්මය වේ, ඒ මේ ආත්මය මරණින් මතු නිත්‍ය වූ සඤ්ඤ ඇත්තේය' යැයි ගැනීම, තෙළස්වැන්න ය.

14. නරකයෙහි ඉපදීම් වශයෙන් ඒකාන්තයෙන් දුක් ඇත්තේ ආත්මය වේ, ඒ මේ ආත්මය මරණින් මතු නිත්‍ය වූ සඤ්ඤ ඇත්තේය' යැයි ගැනීම, තුදුස් වැන්නය.

15. මිනිස් ලොව ඉපදීම් වශයෙන් සැප දුක් දෙක ඇති ආත්මය තෙමේ මරණින් මතු නිත්‍ය වූ සඤ්ඤ ඇත්තේය' යැයි ගැනීම, පසළොස්වැන්නය.

16. වෙහප්ඵල බඹලොව උපන්නුවුන් දැක එහි ඉපදීම් වශයෙන් සැප දුක් දෙක නැති ආත්මය තෙමේ නිත්‍ය සඤ්ඤ ඇත්තේය' යැයි ගැනීම, සොළොස්වැන්න ය.

**සිත ඇත්තේය යැයි ගන්නා ගැණුමය, සඤ්ඤී දෘෂ්ටිය යැයි කියනු ලබන්නී.**

## ❀ අසඤ්ඤීවාද දෘෂ්ටි අට

1. රූපය ඇත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍යය, සිත නැත්තේය' යැයි ගත් දෘෂ්ටිය අට වැදෑරුම් අසඤ්ඤී දෘෂ්ටියහෙි ප්‍රථමය වේ.

2. රූපය නැත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍යය, සඤ්ඤ නැත්තේය' යැයි ගැනීම දෙවැන්නය.

3. රූපය නැත්තේ ද, අරූප නැත්තේ ද ආත්මය වේ, මරණින් මතු නිත්‍යය, සඤ්ඤ නැත්තේය' යැයි ගැනීම තෙවැන්නය.

4. රූපය නැත්තේ ද, අරූප නැත්තේ ද ආත්මය වේ. මරණින් මතු නිත්‍යය, සඤ්ඤා නැත්තේය' යැයි ගැනීම සිව්වැන්නය.

5. කෙළවර ඇත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍යය, සඤ්ඤා නැත්තේය' යැයි ගැනීම පස්වැන්නය.

6. කෙළවර නැත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍යය, සඤ්ඤා නැත්තේය' යැයි ගැනීම සයවැන්නය.

7. කෙළවර ඇත්තේ ද, කෙළවර නැත්තේ ද, ආත්මය වේ, මරණින් මතු නිත්‍යය, සඤ්ඤා නැත්තේය' යැයි ගැනීම සත්වැන්නය.

8. කෙළවර නැත්තේ ද, කෙළවර නැත්තේ නොවූයේ ද ආත්මය වේ, මරණින් මතු නිත්‍යය, සඤ්ඤා නැත්තේය' යැයි ගැනීම අට වැන්නය.

**මරණින් මතු සිත නැතැයි ගන්නා දෘෂ්ටිය අසඤ්ඤී නම් වේ.**

## නේවසඤ්ඤීනාසඤ්ඤීවාද දෘෂ්ටි අට

1. රූපය ඇත්තේ ආත්මය වේ, මරණින් මතු නිත්‍යය, නේවසඤ්ඤීනාසඤ්ඤී යැයි' ගත් දෘෂ්ටිය අට වැදෑරුම් වූ නේවසඤ්ඤීනාසඤ්ඤී දෘෂ්ටියෙහි ප්‍රථමය වේ.

2. රූපය නැත්තේ ද ආත්මය වේ, මරණින් මතු නිත්‍යය, නේවසඤ්ඤීනාසඤ්ඤීය' යැයි ගැනීම දෙවැන්නය.

3. රූපය ඇත්තේ ද, නැත්තේ ද ආත්මය වේ. මරණින් මතු නිත්‍ය වූයේ, නේවසඤ්ඤීනාසඤ්ඤීය' යැයි ගැනීම තෙවැන්නය.

4. රූපය නැත්තේ ද, අරූප නැත්තේ ද ආත්මය වේ. මරණින් මතු නිත්‍ය වූයේ, නේවසඤ්ඤීනාසඤ්ඤීය' යැයි ගැනීම සිව්වැන්නය.

5. කෙළවර ඇත්තේ ආත්මය වේ. මරණින් මතු නිත්‍ය වූයේ, නේවසඤ්ඤීනාසඤ්ඤීය' යැයි ගත්තී පස් වැන්නය.

6. කෙළවර නැත්තේ ආත්මය වේ. මරණින් මතු නිත්‍ය වූයේ, නේවසඤ්ඤීනාසඤ්ඤීය' යැයි ගැනීම සයවැන්නය.

7. කෙළවර ඇත්තක් වූයේ ද, නැත්තක් වූයේ ද, ආත්මය වේ. මරණින් මතු නිත්‍ය වූයේ, නේවසඤ්ඤීනාසඤ්ඤීය' යැයි ගැනීම සත්වැන්නය.

8. කෙළවර ඇත්තේ නොවූයේ ද, කෙළවර නැත්තේ නොවූයේ ද ආත්මය වේ. මරණින් මතු නිත්‍ය වූයේ, නේවසඤ්ඤීනාසඤ්ඤීය' යැයි ගැනීම අටවැන්නය.

**'සඤ්ඤා ඇත්තේ නොවන්නේය, සඤ්ඤා නැත්තේ නොවන්නේය' යැයි ගත් දෘෂ්ටිය නේවසඤ්ඤීනාසඤ්ඤී** නම් වේ.

## ❁ උච්ඡේදවාදී දෘෂ්ටි සත

1. සතර භූතයන්ගෙන් හට ගත් මව්පියන්ගේ ශුක්‍ර ශ්‍රෝණිත දෙකෙන් උපන් රූපයක් ඇති මේ ආත්මය ශරීර භේදයෙන් සිඳෙන්නේය, විනාශ වන්නේ ය, මරණින් මතු නොපවතින්නේය, මෙපමණකින් මේ ආත්මය හොඳින් සිඳී ගියේ වේය' යැයි මෙසේ විද්‍යාමාන වූ සත්ත්වයාගේ උච්ඡේදය, විනාශය විභවය, ප්‍රකාශ කිරීම සත් වැදෑරුම් වූ උච්ඡේද දෘෂ්ටියෙහි ප්‍රථමය වේ.

2. රූපය ඇති සදෙව් ලොව හැසිරෙන කැබලි කොට කන ආහාර අනුභව කරන අන්‍ය වූ දිව්‍ය ආත්මයක් ඇත්තේය, ඒ ආත්මය ශරීර භේදයෙන් මත්තෙහි සිඳෙන්නේ ය, විනාශ වන්නේය, මරණින් මතු නො වන්නේය, එපමණකින් මේ ආත්මය මනා කොට සිඳුණේය යැයි සත්වයාගේ විනාශය ප්‍රකාශ කිරීම එහි දෙවැන්නය.

3. ඒ ආත්මය ඇත්තේය, නැත්තේ නොවේ, ඒ ආත්මය මෙපමණකින් සිඳු නොවේ, රූපයක් ඇති සිතින් උපදනා ලද සියලු අඟ පසඟ

අවයව ඇති පරිපූර්ණ ඉන්ද්‍රියන් ඇති අන්‍ය වූ දිව්‍ය ආත්මයක් ඇත්තේය, යම් හෙයකින් ඒ ආත්මය ශරීර භේදයෙන් සිඳෙන්නේ ද, විනාශ වන්නේ ද, මරණින් මතු නොවන්නේ ද, එ පමණකින් මේ ආත්මය මනා කොට සිඳුණේය' යැයි සත්වයාගේ විනාශය පැවසීම එහි තෙ වැන්නය.

4. ඒ මේ ආත්මය ආකාසානඤ්චායතනයට පැමිණ අන්‍ය වූ ආත්මයක් ඇත්තේය, යම් කලෙක ඒ ආතමය ශරීර භේදයෙන් සිඳෙන්නේය, විනාශ වන්නේ ද, මරණින් මතු නො වන්නේ ද, මෙපමණකින් ඒ ආත්මය මනා කොට සිඳුණේය' යැයි සත්වයාගේ විනාශය පැවසීම එහි සිව්වැන්නයය.

5. ඒ ආත්මය ඇත්තේය මෙපමණකින් ඒ ආත්මය මනාව සිඳුණේ නොවේ, සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනයට පැමිණි ආත්මයක් ඇත, යම් කලෙක ඒ ආත්මය, ශරීර භේදයෙන් සිඳෙන්නේ ද, විනාශ වන්නේ ද, මරණින් මතු නොවන්නේ ද, මෙපමණකින් ඒ ආත්මය මනා කොට සිඳුණේය' යැයි සත්වයාගේ විනාශය පැවසීම එහි පස්වැන්නය.

6. ඒ ආත්මය නැත්තේ නොවේ, ඒ ආත්මය මෙපමණකින් මනාව සිඳුණේ නොවේ, සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා ආකිඤ්චඤ්ඤායතනයට පැමිණියා වූ අන්‍ය ආතමයක් ඇත්තේය, ඒ ආත්මය, ශරීර භේදයෙන් සිඳෙන්නේ ද, විනාශ වන්නේ ද, මරණින් මතු නොවන්නේ ද, මෙපමණකින් ඒ ආත්මය මනා කොට සිඳුණේය' යැයි සත්වයාගේ විනාශය කියා පෑම සය වැන්නය.

7. ඒ ආත්මය ඇත්තේය, මෙපමණකින් මනාව සිඳුණේ නොවේ, සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤා නාසඤ්ඤායතයට පැමිණි අන්‍ය ආත්මයක් ඇත්තේය, යම් කිසි කලෙක ඒ ආත්මය ශරීර භේදයෙන් සිඳෙන්නේ ද, විනාශ වන්නේ ද, මරණින් මත්තෙහි නොවන්නේ ද, මෙපමණකින් ඒ ආත්මය මනාව සිඳුණේය යැයි විද්‍යාමාන සත්වයාගේ විනාශය කියා පෑම එහි සත් වැන්නය.

**සත්ව තෙමේ මරණින් මතු නූපදින්නේය යැයි ගත් දෘෂ්ටිය උච්ඡේද නම් වේ.**

## ❁ දිට්ඨධම්මනිබ්බානවාද දෘෂ්ටි පස

1. මේ ආත්මය මන්ධාතු රජු සේ මානුෂික කාමයෙන් ද, පරනිර්මිත වශවර්තිරාජයා සේ දිව්‍ය කාමයෙන් ද, සමන්විත වූයේ ඉඳුරන් පිනවයි ද, ඉඳුරන් හසුරුවයි ද, මෙපමණකින් මේ ආත්මය උත්තම වූ දෘෂ්ටධර්ම නිර්වාණයට පැමිණියේ වෙයි' යැයි විද්‍යාමාන සත්වයාගේ උත්තම දිට්ඨධර්ම නිර්වාණය පැවසීම පස්වැදෑරුම් වූ දිට්ඨධර්ම නිර්වාණවාදයෙහි ප්‍රථමය වේ.

2. ඒ ආත්මය ඇත්තේය, නැත්තේ නොවේ, මේ ආත්මය මෙපමණකින් උත්තම වූ දිට්ඨධර්ම නිර්වාණයට නොපැමිණියේ වේ, හේතු කවරේ ද? පංච කාමයෝ වනාහි අනිත්‍යය, දුක්ඛය, පෙරළෙන සුලුය, ඔවුන්ගේ පෙරළීම් වෙනස් වීම් නිසා, සෝක, වැලපීම්, කායික වූ දුක් දොම්නස් හා උපායාස ද යන මොවුහු උපදිත්, යම් හෙයකින් මේ ආත්මය කාමයන්ගෙන් වෙන්ව අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක විචාර සහිත වූ විවේකයෙන් හට ගත් ප්‍රීතියෙන් යුත් සැප ඇති ප්‍රථම ධ්‍යානයට එළඹ වාසය කෙරේ ද, එපමණකින් මේ ආත්මය උත්තම වූ දිට්ඨධර්ම නිර්වාණයට පැමිණියේ වේය' යැයි පැවසීම එහි දෙවැන්නය.

3. ඒ ආත්මය ඇත්තේය, ඒ නැත්තේ නොවේ, මෙපමණකින් එය උත්තම වූ දිට්ඨධර්ම නිර්වාණයට පැමිණියේ නොවේ, එහි වූ විතර්ක, විචාරයන් කරණ කොට, ඒ ධ්‍යානය ලාමක සේ පෙණෙයි. එහෙයින් හේ ආත්මය විතර්ක, විචාරයන්ගේ සංසිඳීමෙන් මත්තෙහි ප්‍රසන්නතාවෙන් හා එකඟ බැවින් යුත් විතර්ක, විචාර රහිත සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති ද්විතීය ධ්‍යානයට එළඹ වාසය කෙරේ ද, මෙපමණකින් මේ ආත්මය උත්තම වූ දිට්ඨධර්ම නිර්වාණයට පැමිණියේය' යැයි කිය පෑම තෙවැන්නය.

4. මෙපමණකින් ඒ ආත්මය උත්තම වූ දිට්ඨධර්ම නිර්වාණයට පැමිණියේ නොවේ, එහි ප්‍රීතිය ද, සිතෙහි ඉපිල පවතිනා බව ද, හේතු කොට ඒ ධ්‍යානය ලාමක යයි පෙනේ, මේ ආත්මය ප්‍රීතියෙහි නො ඇලීමෙන් සිහිය හා ප්‍රඥාව ඇත්තේ උපේක්ෂකව වාසය කෙරේද, කයින් සැප විඳී ද, ආර්‍යයෝ යමකට පැමිණ උපේක්ෂාව ඇත්තෝය, සැප විහරණ ඇත්තෝය යැයි කියත් ද, ඒ තෘතිය ධ්‍යානයට පැමිණ වාසය කෙරේ ද, මෙපමණකින් මේ ආත්මය උත්තම වූ දිට්ඨධර්ම නිර්වාණයට පැමිණියේය' යැයි කියාපෑම එහි සිව්වැන්නය.

5. මෙපමණකින් ඒ ආත්මය දෘෂ්ටධර්ම නිර්වාණයට පැමිණියේ නොවේ, එහි සැප යැයි නැවත නැවත මෙනෙහි කිරීමක් ද වේ, එයින් එය ලාමකය යැයි පෙණේ, මේ ආත්මය සැප දුක පහ කිරීමෙන් සොම්නස් දොම්නස් නැතිව යෑමෙන් දුක් සැප නැති උපේක්ෂා, ස්මෘති දෙදෙනාගේ පිරිසිදු බව ඇති චතුර්ථ ධ්‍යානයට පැමිණ වාසය කෙරේ ද, මෙපමණකින් මේ ආත්මය පරම දිට්ඨධර්ම නිර්වාණයට පැමිණියේය' යැයි පැවසීම පස්වැන්නය.

**මේ ආත්මභාවයේදීම දුක් සංසිඳීම වේ යැයි ගත් දෘෂ්ටිය දිට්ඨධර්ම නිර්වාණවාද නම් වේ.**

මෙහි **ශාශ්වත, ඒකත්‍යශාශ්වත, අනන්තානන්තික, අමරවික්ෂේප, අධීත්‍යසමුත්පන** යන දෘෂ්ටීහු පූර්ව භවය ඇසුරු කොට සිටිය බැවින් පූර්වාන්ත කල්පික නම් වෙත්. **සඤ්ඤී, නෙවසඤ්ඤී නාසඤ්ඤී, උච්ඡේද, දිට්ඨධර්ම නිර්වාණවාද** දෘෂ්ටීහු අනාගත භවය ඇසුරු කොට සිටිය බැවින් අපරන්ත කල්පික නම් වෙත්. මොවුන් අතරින් පස් පනසක් ශාශ්වත දෘෂ්ටියෙහි ද, සතෙක් උච්ඡේද දෘෂ්ටියෙහි ද වෙති.

මේ දෘෂ්ටි ජාලය ඉපදෙන්නේ දස වස්තුවෙහි ය. ඒ දස වස්තුව යට කියූ නාස්තික දෘෂ්ටියෙහි දක්වූ ලෙස දත යුතුය.

**පුබ්බේක හේතුවාදය, ඊශ්වරනිර්මාණහේතුවාදය, අහේතු අප්පච්චයවාදය** යැයි මෙහි තවත් භේද තුනක් වේ. එහිː-

සත්වයන් විසින් විඳිනු ලබන සියලු සැප දුක් පෙර කරණ ලද කුසල කර්‍මයන්ගේ විපාක බලයෙන්ම විඳිනු ලබන්නේය, වා පිත් සෙම් ආදී එකකින් හට ගත් රෝග ව්‍යසනයෝ නැත්තාහුය, සියලු සැප දුක් කර්‍මානුකූලව සිද්ධ වේ යැයි ගත් දෘෂ්ටිය "**පුබ්බේක හේතුවාදය**" නම් වේ.

ලොකයත් සත්වයෝත් යම්කිසි දෙවියෙකු විසින් මවන ලද්දේය, සත්වයන් විසින් විඳිනු ලබන සැප දුක් ඒ මැවුම්කාර දෙවියන්ගේ කැමැත්ත ලෙසම විඳිනු ලබති යැයි ගත් දෘෂ්ටිය "**ඊශ්වර නිර්‍මාණ හේතුවාද**" නම් වේ.

සත්වයන් විසින් විඳිනු ලබන සැප දුක් කිසියම් හේතුවක් නිසා විඳිනු ලබන්නේ නොවේ, හේතුවක් නොමැතිවම විඳිනු ලබති' යැයි ගත් දෘෂ්ටිය "**අහේතුක අපච්චයවාදය**" නම් වේ.

යමෙකුට මේ කියන ලද මිථ්‍යා දෘෂ්ටියක් ඇති වූයේ ද, ඔහුට බොහෝ කලකට අපායෙන් ගොඩ ඒමක් නැත්තේය. කල්පය විනාශ වන කල්හි ද, සසරට සිටවූ කණුවක් මෙන් වී පිට සක්වළ අපායන්හි ඉපදී එයින් ගැලවීමට ඉඩක් නැතිව කල්ප ගණනින් ද පමණ නොකළ හැකි කාලයක් දුක් විඳින්නේ වේ. මේ මිථ්‍යා දෘෂ්ටිය හා සමාන දරුණු වූ මහා සාවද්‍ය වූ අන් කිසි අකුසලයක් නැත්තේ වේ. එය භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"**නාහං, භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං මහාසාවජ්ජං යථයිදං, භික්ඛවෙ, මිච්ඡාදිට්ඨි. මිච්ඡාදිට්ඨිපරමානි, භික්ඛවෙ වජ්ජානීති**"

මහණෙනි, මෙම මිථ්‍යාදෘෂ්ටිය තරම් අතිශයින් වරද සහිත වූ අන් එක ධර්‍මයකුදු මම බුදු ඇසින් නොදකිමි. මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිය වනාහි අන් සියලු අකුසලයන්ට වඩා වරද සහිත වේ.

මෙලෙස සත්වයන් විසින් සිදුකරන කුසලාකුසල කර්‍ම බලයෙන් සුගති දුගතීන්හි සැරිසරති. උපපජ්ජවේදනීය[1] කර්‍ම බවට පැමිණියා වූ බලවත් කුසල කර්‍ම ශක්තියෙන් ඇතැම් කෙනෙක් ඒකාන්ත වශයෙන් මරණින් මතු ස්වර්‍ග සැපයට පැමිණේ. එසේම අකුසල පක්‍ෂයෙහි ද උපපජ්ජවේදනීය වූ ඇතැම් අකුසල කර්‍ම ශක්තියෙන් ඇතැම් කෙනෙක් මරණින් මතු එකහෙලාම අපා දුකට වැටෙති.

ඇතැම් සත්ව කෙනෙක් සුචරිත හා දුසිරිත් කර්‍ම විටින් විට සිදුකරගන්නේ වේද, මරණාසන්න අවස්ථාවෙහි කුසලයක් වශයෙන් කරගත් **ආසන්න කර්‍මයක්** හෝ වේද, බොහෝ කලක් පුරුදු කරගන්නා ලද **ආචින්න කුසල කර්‍මයක්** හෝ වේද ඒ අරමුණ **කර්‍ම, කර්‍මනිමිති, ගතිනිමිති** අතරින් එකක් අරමුණු වීමෙන් ස්වර්‍ග සැපයට පැමිණේ.

අකුසල පක්‍ෂයෙහි ද ආසන්න, ආචින්න, කටත්තා කර්‍ම අතරින් යම් කර්‍මයක් කර්‍ම, කර්‍මනිමිති, ගතිනිමිති අතරින් එකක් වශයෙන් අරමුණු වීමෙන් දුගතියට පැමිණේ.

## ☸ සතර අපාය

"**චත්තාරො අපායා නාම නිරය තිරච්ඡාන පෙත්තිවිසය අසුරකායාති**" තිරිසන් අපාය, ප්‍රේත අපාය, අසුර අපාය, නරකය යන සතර, සතර අපාය නම් වේ.

## ❁ තිරිසන් අපාය

"**තිරියං අඤ්ජිතාති තිරච්ඡානා. තෙසං යොනි තිරච්ඡානයොනි**" කොඳු ඇට පෙළ හරස් ව තබාගෙන ගමන් කරන,

---

[1] ආනන්තර්‍ය කර්‍ම, නියත මිථ්‍යාදෘෂ්ටිය වැනි මරණින් මතු ඊළඟ භවයෙහි ඒකාන්තයෙන් අපායෝත්පත්තියට පමුණුවන බැවින් උපපජ්ජවේදනීය කර්‍ම නම් වේ

හිඳින, නවතින, වසන තැන තිරිසන් නම් වේ. එලෙස පැවතුම් ඇතිව උපදින තැන තිරිසන් භවයයි.

කිසි ලෙසකින් මග ඵල නිවන් සුව ලැබීමට නොහැකි වූ එසේ හෙයින්ම පහතට පතිතවන කාමයෙන් හා බියෙන් නිතර තැවෙන සත්වයෝ තිරිසන් සත්වයෝ නම් වෙති. මෙම සත්වයෝ මෝහයෙන් මුලා වී අකුසල් කර්‍ම කරන ලද්දේ ද ඔවුහු තිරිසන් අපායෙහිම උපදිති.

මේ තිරිසන් සත්වයන්ගේ ද වෙනස්කම් බොහෝ ය. ඇසට පෙනෙන්නා වූද, නොපෙනෙන්නා වූද, දිග වූද, කෙටි වූද, මැදියම් වූද, මහත් වූද, සියුම් වූද බොහෝ වර්‍ගයන්ට අයත් සත්වයෝ වෙති. අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික යන සතර යෝනියෙහිම උපදිති. මෙම සත්වයෝ අපා, දෙපා, සිව්පා, බහුපා ඇති නා නා විධ සත්වයෝ වෙති. මේ තිරිසන් අපායෙහි ඉපදීම හා එහි දුක් විඳීම පෙර කරන ලද අකුසල කර්‍ම බලයෙන්ම සිදුවෙති. තිරිසන් සත්වයන් විඳින දුක් ද, ඔවුන් පිළිබඳ ජාති ද, උපදින ස්ථාන ද මෙතෙකැයි නියම නැත. එක් මිනිස් සිරුරක් ඇසුරු කොට උපදින තිරිසන් සත්ව කුල අසූදහසක් පමණ වේ. තිරිසන් අපායෙහි එක් සත්වයෙත් තව සත්වයෙකුට ගොදුරක් වේ. කාම සේවනය, කිනම් වේලාවක ආහාර ලැබේ ද යැයි නිතර ආහාර සොයා ඇවිදීම, මරණ බියෙන් තොරව ගෙවන එක් මොහොතකුදු නැති බව යන සඤ්ඤා තුන තිරිසන් සත්වයන් කෙරෙහි නිරන්තරයෙන් දක්නට ලැබෙති. ධර්‍ම සඤ්ඤාවක් ඇතිවීම අතිශයින් දුර්ලභ ය.

## ❁ ප්‍රේත අපාය

**"පාකටසුඛතො ඉතා විගතාති පෙතා"** මුළුමනින්ම සැපයෙන් පහව ගියෝ ප්‍රේතයෝය. ඔවුන් අතර **නිජ්ඣාමතණ්හික, ඛුප්පිපාසක, පංසුපිසාචක, පරදත්තූපජීවික, කාලකඤ්ජික, අට්ඨිසංඛලික, මංසපිණ්ඩික** යනාදී ප්‍රේත වර්‍ග අත්තාහ.

❖ **නිජ්ඣාමතණ්හික**

සිරුැර තුළ දැල්වුණු ගිනිදැළින් දැවෙන සිරුැරු ඇති ප්‍රේතයෝ නිජ්ඣාමතණ්හික නම් වෙති. ගස් සිදුරක හටගත් ගින්නකින් එම ගස දැවෙන්නාක් මෙන් ඔවුන් දැවෙති.

❖ **ඛුප්පිපාසක**

මල මුත්‍ර සෙම සොටු වැනි දෙයක් පමණවත් ආහාරයක් නොලබා බුද්ධාන්තර දහස් ගණන් සා පිපාසා දෙකින් පීඩා විඳින්නෝ ඛුප්පිපාසික නම් වෙති.

❖ **පංසුපිසාචක**

පස් ගොඩැලි, කුණු ගොඩවල්හි, අසූචි වලෙහි, කඳු බැවුම් ආදී අපිරිසිදු තැන්හි උපදින්නෝ පංසුපිසාචක නම් වෙති.

❖ **පරදත්තූපජීවික**

අනුන් කුසල් කොට දෙන පින් ආදියෙන් ජීවත් වන්නෝ පරදත්තූපජීවික නම් වේ.

❖ **අට්ඨිසංඛලික**

තුන් ගව් පමණ උස ඇත්තා වූ, සිවි සම් මස් නහර පමණක් ඇති, ලේ මස් නැති ඇට සැකිලි දරන්නෝ අට්ඨිසංඛලික නම් වේ.

❖ **මංසපිණ්ඩික**

සම නැති ඇට මස් නහර වැසුණු කුණු වූ මස් ගොඩක් වැනි සිරුැරු දරන්නෝ මංසපිණ්ඩික නම් වේ.

දන් නොමදෙන්නෝ ද, ඔවුනොවුන්ට ඊර්ෂ්‍යා කරන්නෝ ද, ලෝභයෙන් තද බද වන්නෝ ද, සම්පත් සඟවන්නෝ ද, මව්පියන් කෙරෙහි විළිබිය නොදක්වන්නෝ ද, පින්කම්වලට අනතුරු - බාධා පමුණුවන්නෝ ද, මල මූ කව කියා අනුන්ට පරිභව කරන්නෝ ද, අධර්මයෙන් ගම් වැසියන් පෙළන්නෝ ද, අගතියෙන් නොමග යන්නෝ

ද, අල්ලස් ගන්නෝ ද යනාදී පාපකර්‍ම කරන්නෝ මේ ප්‍රේත අපායෙහි උපදිති.

මේ සැම ප්‍රේතයෝම සා පිපාසා දුකින් මැඩී වැහැරී ගිය සිරුරු ඇත්තෝ වෙති. මහත් ඔලු ඇත්තෝය. ඇටසැකිලි බඳු ශරීර ඇත්තෝය. කෙළ, සොටු, කැහි, කුණු, කසල, මල, මුත්‍ර, වැදෑමස්, මළකුණු කන්නෝය. රළු වූ හිස කෙස්, ලොම්, නිය, දත් ඇත්තෝය. නග්නව වසන්නෝය. බිහිසුණු රූප සටහන් ඇත්තෝය. ඉදිකටු සිදුරු තරම් වූ කුඩා මුව ඇත්තෝය. කකුළු ඇස් සේ පිටතට නෙරාගිය ඇස් ඇත්තෝය. නාස් පුටු දෙකෙන් නික්ම පාපිට දක්වා දික්ව එල්ලෙන මස් වැදලි ඇත්තෝය. යමක් කන බොන විට හිස තබා කති. බොති. ගිනි ගත් යකඩ මුගුරුවලින් උනුන් ඇන කොටා ලේ සැරව උරා බොති. මෙසේ ප්‍රේත අපායෙහි අනන්ත දුක් ඇත්තේය.

## ❁ අසුර අපාය

ඉසුරු මදයෙන් මත්ව ක්‍රීඩා නොකරන්නෝ අසුරයෝය. මෙයින් ප්‍රේත අසුරයෝම අපායෙහිලා ගැනෙති. මෙහි කාලකඤ්ජික අසුර අපාය හා ලෝකාන්තරික අසුර අපාය යැයි අසුර අපාය දෙකක් වෙති.

### ❖ කාලකඤ්ජික,

යන්තමින්වත් ඉර - සඳ එළියක් නොලබා තද ගනඳුරෙන් වැසුණු අධික සීතලයෙන් අතරක් නැර පීඩා විඳින්නා වූ ද, උපන්නවුන්ගේ සිරුරු සිඳ බිඳ දමන කාරම් දියෙන් පිරුණා වූ චක්‍රාවාට තුනක් අතර උපන්නෝ කාලකඤ්ජික නම් වෙති. මෙහි දිග පළල යොදුන් අසූහාරදහසක් පමණ වේ. මහාමේරු පර්‍වතය වුව ද මෙහි බහාලන ලද්දේ නම්, එහි ඇති අධික සීතලයෙන් ලුණු පිඩක් සේ විසිරී වැගිරී යන්නේ ය. මෙහි උපන්නවුන්ගේ ශරීර ගව් තුනක් පමණ වේ. එහෙත් එවුන්ගේ මුව ඉදිකටු සිදුරක් තරම්ය. ඇස් කකුළු ඇස් මෙන් පිටතට නෙරා ඇත්තේය. මොවුහු ද යමක් කන බොන කල්හි හිස තබා කන්නෝය. බොන්නෝය. මෙහි දුක් බොහෝ ඇත්තේ වේ.

**"තිරච්ඡානපෙත්තිවිසයො අසුරකායොති ඉමෙසං විසුං භූමි නාම නත්ථි. තෙසං ඛන්ධප්පවත්තිවිසයොයෙව භූමි නාම"**

තිරිසන්, ප්‍රේත, අසුර යන අපා සත්වයන්ට අයත් ඔවුන්ටම වෙන් වී ඇති වාසභූමි නැත්තේ වේ. ඔවුන්ගේ ස්කන්ධයෝම ඔවුන්ගේ වාසභූමි වෙති.

## ❁ නරකය

**"නිරයො හි සග්ගමොක්ඛහෙතුභූතා පුඤ්ඤසම්මතා අයා අපෙතත්තා, සුඛානං වා ආයස්ස අභාවා අපායො. දුක්ඛස්ස ගති පටිසරණන්ති දුග්ගති, දොසබහුලතාය වා දුට්ඨෙන කම්මුනා නිබ්බත්තා ගතීති දුග්ගති. විවසා නිපතන්ති තත්ථ දුක්කටකාරිනොති විනිපාතො, විනස්සන්තා වා එත්ථ නිපතන්ති සම්භිජ්ජමානඞ්ගපච්චඞ්ගාතිපි විනිපාතො. නත්ථි එත්ථ අස්සාදසඤ්ඤිතො අයොති නිරයො."**

මේ නිරය වනාහි ස්වර්ගී මෝක්ෂ සුවයට හේතුභූත වූ පින යැයි සම්මත අයෙන් (සම්පත්තියෙන්) තොර වූ බැවින් ද, සැප නම් වූ අයෙන් දුරු වූ බැවින් ද **"අපාය"** නම් වේ. දුකටම උරුම වූ ගතිය පිළිසරණ වූ හෙයින් **"දුගති"** නම් වේ. දෝෂ බහුලතාවයෙන් හෝ දුෂ්ට කර්මයෙන් උපන් ගති ඇති බැවින් ද **"දුගති"** නම් වේ. පවුකම් කරන්නෝ එහි නපුරුව වැටෙන බැවින් **"විනිපාත"** නම් වේ. තව ද විනාශ වෙමින් මෙහි වැටෙති. බිඳී කැඩී යන අංග ප්‍රත්‍යංග ඇති බැවින් **"විනිපාත"** නම් වේ. මෙහි ආස්වාද සඤ්ඤවෙන් උපන් කිසිවෙක් නැති බැවින් **"නිරය"** නම් වේ.

භාග්‍යවතුන් වහන්සේ ඇතැම් දේශනාවක් නිරය විස්තරයෙන් පටන් ගෙන දිව්‍යලෝක විස්තරයෙන් අවසන් කරන සේක. ඇතැම් දේශනාවක් දිව්‍යලෝක විස්තරයෙන් පටන් ගෙන නිරය විස්තරයෙන් අවසන් කරන සේක. ස්වර්ගී සම්පත් වදරනු කැමති සේක් නම් නිරය තිරිසන් ප්‍රේත යෝනි පිළිබඳ විස්තර කෙටියෙන් දේශනා කොට දිව්‍ය සම්පත්තියම මහත් කොට වදරන සේක. නිරය පිළිබඳව වදරනු කැමති සේක් නම් ස්වර්ගී සම්පත් හා සෙසු තිරිසන් ප්‍රේත යෝනි පිළිබඳ විස්තර

කෙටියෙන් දේශනා කොට නිරය විස්තරයම මහත් කොට වදරන සේක. මෙම දේවදූත සූත්‍රය වනාහි නිරය විස්තරයම මහත් කොට වදරන ලද දේශනාවකි.

මෙහි විස්තර කෙරෙන නරකය වනාහි ප්‍රධාන වශයෙන් **"සංජීව නරකය, කාලසූත්‍ර නරකය, සංඝාත නරකය, රෞරව නරකය, මහා රෞරව නරකය, තාප නරකය, ප්‍රතාප නරකය, අවීචිමහා නරකය"** යැයි අට වැදෑරුම් වේ. ඒවායෙහි විස්තරය මෙසේය.

## 1. සංජීව නරකය

යමපල්ලන් විසින් ගිනිගෙන දිලිසෙන නන් වැදෑරුම් අවි ආයුධ රැගෙන එහි උපන් නිරි සතුන්ව කඩ කඩ කොට සිඳින නමුත් නැවත නැවත නොමැරී ජීවත් වන තැන සංජීව නරකය නම් වේ.

ලෝභ දෝෂ මෝහයෙන් මැඩී සතුන් මැරීම, සොරකම් කිරීමාදී පවුකම් කරන්නෝ ද, අධර්‍මයෙන් වැරදි ලෙසින් ලෝවැසියන්ට දුක් දෙන්නෝ ද, අනුන් කෙරෙහි ක්‍රෝධයෙන් මැඩී යුධ කල කෝලාහල කරන්නෝ ද මේ ආදී අපරාධ කරන්නෝ සංජීව නරකයෙහි උපදිති.

මනුලොව අවුරුදු පනසක් චාතුර්‍මහාරාජික දෙව්ලොවට එක් රෑ දවාලකි. එසේ වූ දින තිසක් එක් මාසයකි. එසේ වූ මාස දෙළොසක් එක් වර්‍ෂයකි. එසේ වූ වර්‍ෂ පන්සියයක් ඒ දෙව්ලොව ආයුෂය වේ. ඒ දිව්‍ය වර්‍ෂ පන්සියය මනුෂ්‍ය ආයුෂයෙන් ගුණ කළ කල්හි අවුරුදු අනූ ලක්‍ෂයකි (90,000,00). එම අවුරුදු අනූ ලක්‍ෂය සංජීව නරකයට එක දවසකි. එසේ වූ තිස් දවසක් එක මාසයකි. එසේ වූ දෙළොස් මසක් එක් වර්‍ෂයකි. එබඳු අපාය වර්‍ෂ පන්සියයක් සංජීව නරකයෙහි ආයුෂය වේ. මෙම සංජීව නරකය මේ පොළොව මතුපිට සිට යොදුන් පහළොස් දහසකට යටින් පොළොවෙහි පිහිටා ඇත්තේ ය.

## 2. කාලසූත්‍ර නරකය

යමපල්ලන් විසින් ගිනි ඇවිලගත් වෑ ආදිය ගෙන නිරි සතුන්ගේ ශරීරයන්හි කළු නූල් ගසා සතරැස් අටැස් කොට සසින්නා වූ තැන කාලසූත්‍ර නරකය නම් වේ.

මව්පිය ගුරුවර කුල දෙටුවන්ට හා දුගී මගී යාචකාදීන්ට අපරාධ කරන්නෝ ද, බොරු කියන්නෝ ද මෙහි උපදිති.

මනුලොව අවුරුදු සියයක් තාවතිංස දෙව්ලොවට එක් රෑ දවාලකි. එසේ වූ දින තිසක් එක් මාසයකි. එසේ වූ මාස දෙළොසක් එක් වර්ෂයකි. එසේ වූ වර්ෂ දහසක් ඒ දෙව්ලොව ආයුෂය වේ. ඒ දිව්‍ය වර්ෂ දහස මනුෂ්‍ය ආයුෂයෙන් ගුණ කළ කල්හි අවුරුදු තුන්කෝටි සැටලක්ෂයකි (3,60,000,00). එම අවුරුදු තුන්කෝටි සැටලක්ෂය කාලසූත්‍ර නරකයට එක දවසකි. එසේ වූ තිස් දවසක් එක මාසයකි. එසේ වූ දෙළොස් මසක් එක් වර්ෂයකි. එබඳු අපාය වර්ෂ දහසක් කාලසූත්‍ර නරකයෙහි ආයුෂය වේ. මෙම කාලසූත්‍ර නරකය සංජීව නරකයට යොදුන් පහළොස් දහසකට යටින් පොළොවෙහි පිහිටා ඇත්තේ ය.

## 3. සංඝාත නරකය

නව යොදුන් ඝන වූ අයෝමය පොළොවෙහි ඉන වටක් පමණ එරී සිටින නිරි සතුන්ගේ ශරීරයන් සුන්බුන් කරමින් යොදුන් ගණන් විශාල පර්වතයන් හෙන හඬ නංවමින් සතර දිසාවෙන් පෙරළෙන්නා වූ තැන සංඝාත නරකය නම් වේ.

අත් පා දඬු මුගුරින් අනුන්ට පහර දෙන්නෝ ද, ඇත් අස් ගවාදී සත්වයන්ට වධ දෙමින් මරව මරවා වැඩ ගන්නෝ ද, සතුන් මැරුවෝ ද මෙහි උපදිති.

මනුලොව අවුරුදු දෙසීයක් යාම දෙව්ලොවට එක් රෑ දවාලකි. එසේ වූ දින තිසක් එක් මාසයකි. එසේ වූ මාස දෙළොසක් එක් වර්ෂයකි. එසේ වූ වර්ෂ දෙදහසක් ඒ දෙව්ලොව ආයුෂය වේ. ඒ දිව්‍ය වර්ෂ දෙදහස

මනුෂ්‍ය ආයුෂයෙන් ගුණ කළ කල්හි අවුරුදු දහතරකෝටි සතළිස් ලක්‍ෂයකි (14,40,000,00). එම අවුරුදු ද හතරකෝටි හතළිස් ලක්‍ෂය සංඝාත නරකයට එක දවසකි. එසේ වූ තිස් දවසක් එක මාසයකි. එසේ වූ දෙළොස් මසක් එක් වර්‍ෂයකි. එබඳු අපාය වර්‍ෂ දෙදහසක් සංඝාත නරකයෙහි ආයුෂය වේ. මෙම සංඝාත නරකය කාලසූත්‍ර නරකයට යොදුන් පහළොස් දහසකට යටින් පොළොවෙහි පිහිටා ඇත්තේ ය.

## 4. රෞරව නරකය

නිරි සතුන්ගේ සිරුරු තුළට ඇස්, කන්, නාසය, මුඛය, මල, මූත්‍ර මාර්‍ග යන නවද්වාරයෙන් වැදගන්නා ගිනි දැලින් හා නපුරු විෂ දූමාරයෙන් එම සතුන්ගේ ශරීර ඇතුළත හා පිටත දවනු තවනු ලැබීමෙන් හඬන නිරි සතුන්ගේ නාදය නිරතුරුව පවතින්නා වූ තැන රෞරව නරකය නම් වේ.

බොරු සාක්‍ෂි කියන්නෝ ද, හොර වෙළඳම් කරන්නෝ ද, ඉන්ද්‍රජාල මායාකාරයෝ ද මෙහි උපදිති.

මනුලොව අවුරුදු හාරසියයක් තුසිත දෙව්ලොවට එක් රෑ දවාලකි. එසේ වූ දින තිසක් එක් මාසයකි. එසේ වූ මාස දෙළොසක් එක් වර්‍ෂයකි. එසේ වූ වර්‍ෂ හාරදහසක් ඒ දෙව්ලොව ආයුෂය වේ. ඒ දිව්‍ය වර්‍ෂ හාරදහස මනුෂ්‍ය ආයුෂයෙන් ගුණ කළ කල්හි අවුරුදු පනස් හත්කෝටි සැටලක්‍ෂයකි (57,60,000,00). එම අවුරුදු පනස් හත්කෝටි සැටලක්‍ෂය රෞරව නරකයට එක දවසකි. එසේ වූ තිස් දවසක් එක මාසයකි. එසේ වූ දෙළොස් මසක් එක් වර්‍ෂයකි. එබඳු අපාය වර්‍ෂ හාරදහසක් රෞරව නරකයෙහි ආයුෂය වේ. මෙම රෞරව නරකය සංඝාත නරකයට යොදුන් පහළොස් දහසකට යටින් පොළොවෙහි පිහිටා ඇත්තේ ය.

## 5. මහා රෞරව නරකය

අතිශයින් රෞද්‍ර වූ රතු ලේ වන් ගිනිදැළින් හා දුමාරයෙන් තවනු ලැබීමෙන් පීඩිතව හඬන නිරි සතුන්ගේ මහ හඬ ඇති තැන හා එම නිරි සතුන්ගේ ලෙයින් එම භූමිය පිරී පවත්නා තැන මහා රෞරව නරකය නම් වේ.

තෙරුවන් සතු ඉඩකඩම් - වතුපිටි - ඇඳපුටු - කොට්ට - මෙට්ට - ඇඳ ඇතිරිලි - පහන් - පඩික්කම් ආදිය සොරා ගන්නෝ ද, එම ආරාම විහාර භූමීන්හි ඇති කොස් - දෙල් - පොල් - පුවක් - කෙසෙල් ආදිය කා දමන්නෝ ද, තෙරුවන් උදෙසා එක්රැස් කළ මිලමුදල් ගසා කන්නෝ ද, දුප්පතුන්ට අයත් ඉඩකඩම් මිල මුදල් ආදිය පැහැර ගන්නෝ ද මෙහි උපදිති.

මනුලොව අවුරුදු අටසියයක් නිම්මාණරතී දෙව්ලොවට එක් රෑ දවාලකි. එසේ වූ දින තිසක් එක් මාසයකි. එසේ වූ මාස දෙළොසක් එක් වර්ෂයකි. එසේ වූ වර්ෂ අටදහසක් ඒ දෙව්ලොව ආයුෂය වේ. ඒ දිව්‍ය වර්ෂ අටදහස මනුෂ්‍ය ආයුෂයෙන් ගුණ කළ කල්හි අවුරුදු දෙසිය තිස් කෝටි සතළිස් ලක්ෂයකි (230,40,000,00). එම අවුරුදු දෙසිය තිස් කෝටි සතළිස් ලක්ෂය මහා රෞරව නරකයට එක දවසකි. එසේ වූ තිස් දවසක් එක මාසයකි. එසේ වූ දෙළොස් මසක් එක් වර්ෂයකි. එබඳු අපාය වර්ෂ අටදහසක් මහා රෞරව නරකයෙහි ආයුෂය වේ. මෙම මහා රෞරව නරකය රෞරව නරකයට යොදුන් පහළොස් දහසකට යටින් පිහිටා ඇත්තේ ය.

## 6. තාප නරකය

යමපල්ලන් විසින් නිරි සතුන් ගිනිගෙන දිලිසෙන යවුල් මත ඇමිනවීමෙන් නිශ්චලව ගුගුර ගුගුරා පැසෙන්නා වූ තැන තාප නරකය නම් වේ.

පරුෂ වචන කියා අනුන් වෙහෙසට පත් කරන්නෝ ද, සතර අගතියෙන් බැඳී සිටින්නෝ ද, පින් පව් නැත යනාදී ලෙස මිසදිටු ගත්තෝ ද, පණ පිටින් සතුන් දවා මැරුවෝ ද මෙහි උපදිති.

මනුලොව අවුරුදු එක්දහස් හයසියයක් පරනිර්මිත වසවර්ති දෙව්ලොවට එක් රෑ දවාලකි. එසේ වූ දින තිසක් එක් මාසයකි. එසේ වූ මාස දෙළොසක් එක් වර්‍ෂයකි. එසේ වූ වර්‍ෂ සොළොස් දහසක් (16000) ඒ දෙව්ලොව ආයුෂය වේ. ඒ දිව්‍ය වර්‍ෂ සොළොස්දහස මනුෂ්‍ය ආයුෂයෙන් ගුණ කළ කල්හි අවුරුදු නවසිය විසි එක්කෝටි සැටලක්‍ෂයකි (921,60,000,00). එම අවුරුදු නවසිය විසි එක්කෝටි සැටලක්‍ෂය තාප නරකයට එක දවසකි. එසේ වූ තිස් දවසක් එක මාසයකි. එසේ වූ දෙළොස් මසක් එක් වර්‍ෂයකි. එබඳු අපාය වර්‍ෂ සොලොස් දහසක් තාප නරකයෙහි ආයුෂය වේ. මෙම තාප නරකය මහා රෞරව නරකයට යොදුන් පහළොස් දහසකට යටින් පොළොවෙහි පිහිටා ඇත්තේ ය.

## 7. ප්‍රතාප හෙවත් මහාතාප නරකය

තාප නරකයට වඩා බිහිසුණු ලෙස බොහෝ කාලයක් ගුගුර ගුගුරා පැසෙන්නා වූ තැන ප්‍රතාප නරකය නම් වේ.

බුද්ධ ධම්ම සංඝ යන තෙරුවන් නැත යනාදී ලෙස මිසදිටු ගෙන කටයුතු කරන්නෝ මෙහි උපදිති.

මෙම ප්‍රතාප නරකයෙහි ආයුෂය අන්තඃ කල්ප භාගයකි. මෙම ප්‍රතාප නරකය තාප නරකයට යොදුන් පහළොස් දහසකට යටින් පොළොවෙහි පිහිටා ඇත්තේ ය.

## 8. අවීචි මහ නරකය

ගිනි දැල්වලින් ද, සත්වයන්ගෙන් ද, දුක්ඛයන්ගෙන් ද අතරක් නැර පවත්නා වූ තැන අවීචි මහ නරකය නම් වේ.

මෙම අවීචි මහ නරකය විවට්ටට්ඨායි කල්පය හටගත් ද පටන් එම කාල පරිච්ඡේදය අවසන් වීම දක්වාම උතුර, දකුණ, නැගෙනහිර, බටහිර, උඩ, යට යන සය දිසාවෙන්ම නැගෙන ගිනි දැල් ඊට ප්‍රතිවිරුද්ධ දිසාවේ අයෝමය බිත්තියේ හැපී එම බිත්තිය ද විනිවිද ගොස් නිරයෙන් පිටත ද යොදුන් සියයක් අතරක් නැර පැතිර පවත්නේ ය. එබැවින් ගිනි දැලින් අතරක් නැත්තේ ය.

නලයක පිරවූ ඊයම් සේ අතරක් නැර සත්වයන්ගෙන් පිරී ඉතිරී පවත්නේය. එහෙත් එක් සත්වයෙකුට අන් සත්වයෙක් නොපෙනෙන්නේ ය. මෙසේ සත්වයන්ගෙන් අතරක් නැත්තේ ය.

මොහොතක් පාසා ගිනි දැලින් වෙලී පිළිස්සීම ද, යමපල්ලන් විසින් දුක් පැමිණවීම ද අතරක් නැර පවත්නේ ය. මෙසේ දුක්ඛයන්ගෙන් අතරක් නැර පවත්නේ ය. එබැවින් අවීචිය නම් වේ.

**මව මැරීම, පියා මැරීම, රහතුන් මැරීම, ලෝහිතුප්පාද කර්මය, සංඝ භේදය** යන පඤ්ච ආනන්තර්‍ය කර්ම කරන්නෝ ද, තෙරුවන් අයත් දගැබ්, බෝධි වෘක්ෂ, ප්‍රතිපිළිම, ආරාම වස්තු ආදිය නසන්නෝ ද, නියත මිසදිටු ගන්නෝ ද මෙහි උපදිති.

අවීචි මහ නරකයෙහි ආයුෂය අන්තඃ කල්පයකි. අප වසන මේ දඹදිව මනුෂ්‍යයන්ගේ ආයුෂය එක සමානව සැම කල්හි නොපැවතී කලින් කලට මනුෂ්‍යයන්ගේ කුසලාකුසල කර්ම බලයෙන් අඩු වැඩි වෙමින් වෙනස් වන්නේ ය. මෙලෙස ඒ ඒ කාල පරිච්ඡේද අනුව මනුලොව පවත්නා ආයුෂය **"ආයුෂ්කල්පය"** නම් වේ. මෙසේ වෙනස්වන ආයුෂය වර්ෂ සියයකට එකක් බැගින් අඩුවීම වැඩිවීම වන්නේ ය. අකුසල කර්ම බලවත් භාවයෙන් කාලයක දී මිනිස් ආයුෂය අවුරුදු දසය දක්වා අඩු වන්නේ ය. නැවත කුසල් කිරීම හේතුවෙන් එම ආයුෂය අවුරුදු අසංඛෙය්‍යක් දක්කා වැඩෙන්නේ ය. මෙලෙස මනුෂ්‍ය ආයුෂය දස වර්ෂයේ සිට අසංඛ්‍යෙය දක්වා වැඩී නැවත වර්ෂ දසය දක්වා පිරිහෙන කාලය එක් **අන්තඃ කල්පයකි**. මෙම අවීචි මහ නරකය පිහිටා ඇත්තේ ප්‍රතාප නරකයට යොදුන් පහළොස් දහසකට යටින් පොළොවෙහි පිහිටා ඇත්තේ ය.

### ❁ අසංඛෙය්‍යය

එකේ ඒවා දසයක් දසයකි.
දසයේ ඒවා දසයක් සියයකි.
සියයේ ඒවා දසයක් දහසකි
දහස් සියයක් ලක්‍ෂයකි
ලක්‍ෂ සියයක් කෝටියකි
කෝටි කෝටියක් ප්‍රකෝටියකි
ප්‍රකෝටි කෝටියක් කොටි ප්‍රකෝටියකි
කොටි ප්‍රකෝටි කෝටියක් නහුතයකි
නහුත කෝටියක් නින්නහුතයකි
නින්නහුත කෝටියක් අක්‍ෂෝභිණියකි
අක්‍ෂෝභිණී කෝටියක් බින්දුවකි
බින්දු කෝටියක් අබ්බුදයකි
අබ්බුද කෝටියක් නිරබ්බුදයකි
නිරබ්බුද කෝටියක් අහහයකි
අහහ කෝටියක් අබබයකි
අබබ කෝටියක් අටටයකි
අටට කෝටියක් සෝගන්ධිකයකි
සෝගන්ධික කෝටියක් උප්පලයකි
උප්පල කෝටියක් කුමුදයකි
කුමුද කෝටියක් පුණ්ඩරිකයකි
පුණ්ඩරික කෝටියක් පදුමයකි
පදුම කෝටියක් කථානයකි
කථාන කෝටියක් මහා කථානයකි
මහාකථාන කෝටියක් අසංඛෙය්‍යයකි

මෙසේ ලෝක සත්වයෝ නීවරණ, උපක්ලේශ, වඤ්චක ධර්‍ම, ආශ්‍රව, ඕඝ, යෝඝ, උපාදාන ආදී අනේකවිධ කෙලෙස් බන්ධනයන්ට හසුව අනවරාග්‍ර සංසාරයෙහි දුක් විඳිති. මෙසේ සසර සැරිසරන සත්වයෝ බොහෝ කාලයක් සතර අපායන්හිම උපදිමින් දුකට පත් වෙති. මේ අතර කලාතුරකින් මනුලොව, දෙව්ලොව ඉපදෙමින් ච්‍යුතවෙමින් කුසලාකුසල කර්‍ම සිදුකර ගනිමින් සසර දුකටම පත්වෙති. සත්වයන්ගේ ච්‍යුති උත්පත්ති පිළිබඳව දක්වෙන නිදසුනක් මෙසේය.

| | |
|---|---|
| පරමානු තිස්හය | - අනු එකයි |
| අනු තිස්හය | - තජ්ජාරි එකයි |
| තජ්ජාරි තිස්හය | - රතරේණු එකයි |
| රතරේණු තිස්හය | - ලික්කා එකයි |
| ලික්කා සත | - ඌකා එකයි |
| ඌකා සත | - දඤ්ඤමාස එකයි |
| දඤ්ඤමාස සත | - අංගුල එකයි |
| අංගුල දෙළොස | - වියත් එකයි |
| වියත් දෙක | - රියන් එකයි |
| රියන් සත | - යෂ්ටි එකයි |
| යෂ්ටි විසි අට | - ඉස්බ (උෂභ) එකයි |
| ඉස්බ අසූව | - ගව් එකයි |
| ගව් සතර | - යොදුන් එකයි |

පළමු බ්‍රහ්ම ලෝකය පිහිටි තැන් සිට පහළට ලෝවාමහ ප්‍රාසාදය තරම් පාෂාණ කුට්ටියක් අත හැරිය හොත් එය විනාඩියකට යොදුන් දහ තුනයි තුනෙන් එකක් (13 1/3) පහත් වේ. එය පැයකට යොදුන් අටසියයක් (800) පහත් වේ. දිනකට යොදුන් සතලිස් අටදහසක් (48000) පහත් වේ. එය මනුලොවට පැමිණීමට සාර මාසයක් ගත වේ.

තව ද භවාග්‍රය නම් වන නේවසඤ්ඤා නාසඤ්ඤායතනයෙහි සිට එවැනිම පාෂාණ කුට්ටියක් අත හැරිය හොත් එය විනාඩියකට යොදුන් දහ තුනයි තුනෙන් එකක් පහත් වේ. එය පැයකට යොදුන් අටසියයක් පහත් වේ. දිනකට යොදුන් සතලිස් අටදහසක් පහත් වේ. එය මනුලොවට පැමිණීමට වර්ෂ සතරකුත් මාසයකුත් දින විසිහතක් (04-01-27) ගත වේ. එය දින වශයෙන් ගත් කල්හි එක්දහස් සාරසිය අනූ සතක් (1497) වේ. මෙපමණ දුරක සිට යමක් පොළොවට ඒමට දීර්ඝ කාලයක් ගත වුව ද, සත්වයෙක් මෙලොවෙන් ච්‍යුතව මෙම සක්වළෙහිම හෝ පිට සක්වළක ඉපදීම වනාහි ච්‍යුතියට අනතුරුවම පිළිසිඳ ගැනීම් වශයෙන් කිසි පමාවක් නැතිව සිදු වේ.

ඉහත කියන ලද මහා නිරයන්හි සතර දිසාවෙහි දොරටු සතර බැගින් ඇත්තේ වේ. එම එක් එක් දොරටුවක් අබියස එක එක යම

රජෙකු බැගින් ඇත්තේ වේ. මෙලෙස එක් අපායකට යම රජවරුන් සතර දෙනා බැගින් අට මහ නිරයට යම රජවරුන් දෙතිස් දෙනෙක් වෙති.

එම මහා නරකයක සතර දිසාවෙහි සතර බැගින් ඒ හා සමාන වූ උස්සද (ඔසුපත්) නරක සොළොසක් වෙති. මෙසේ අට මහ නිරයටම ඔසුපත් නරක එකසිය විසි අටක් වෙති. මහා නිරය අට ද සමග සියල්ල එකසිය සතිසක් (136) වෙති. මෙම එක මහා නිරයක සොළොස් ඔසුපත් නරකයන් ද සමග වගී ප්‍රමාණය යොදුන් දසදහසක් (10,000) වේ.

## ☸ පළමුවන දේව දූතයා

මනුලොව දී කුසලාකුසල කර්‍ම කළා වූ මිනිසුන් අතර ඇතමෙක් මරණාසන්න අවස්ථාවෙහි තමන් විසින් කරන ලද අකුසල පාක්‍ෂික වූ ආසන්න කර්‍මයක් හෝ ආචින්න කර්‍මයක් හෝ කටත්තා කර්‍මයක් සිහි වී ඒ අනුව කර්‍මයක් හෝ කර්‍ම නිමිත්තක් හෝ ගති නිමිත්තක් වශයෙන් මතු වී ච්‍යුතව ඔසුපත් නිරයන්හි නිරි සතෙකු වශයෙන් ඕපපාතිකව පහළ වේ. එවිට යමපල්ලන් විසින් එම නිරිසතා අල්ලාගෙන ගොස් යම රජුට දක්වා "**දේවයන් වහන්ස, මේ පුරුෂ තෙමේ මවට නොසැළකු කෙනෙකි. පියාට නොසැළකු කෙනෙකි. ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට උපස්ථාන නොකළ කෙනෙකි. කුල දෙටුවන්ට ගරු සැලකිලි නොකළ කෙනෙකි. දේවයන් වහන්ස, මොහුට සුදුසු දඬුවමක් පමුණුවන සේක්වා**" යැයි කියා සිටිති.

එවිට යමරජු එම නිරිසතාගෙන් පළමුවන දේවදූතයා පිළිබඳව කරුණු විචාරයි.

යමරජු :- "එම්බා පුරුෂය, නුඹ මිනිසුන් අතර පහළ වූ පළමු දේවදූතයා නොදුටුවෙහි ද?" යැයි අසයි.

නිරිසතු :- "නොදුටුවෙමි ස්වාමීනි" යැයි කියයි.

යමරජු :- "එම්බා පුරුෂය, නුඹ මිනිසුන් අතර උඩ බලා හෝනා තමන්ගේ මලමුත්‍රයෙහිම තැවරී ඒ බවවත් නොදන්නා වූ කුඩා ළදරුවෙකු නුදුටුවෙහි ද?" යැයි අසයි.

නිරිසතු :- "දුටුවෙමි ස්වාමීනි" යැයි කියයි.

යමරජු :- "එම්බා පුරුෂය, නුවණ මේරුවා වූ මහළු වූවා වූ ඒ නුඹට 'මමත් ඉපදීම ස්වභාව කොට ඇත්තේ වෙමි. ඉපදීම නො ඉක්මවූයේ වෙමි. එබැවින් කයින් වචනයෙන් සිතින් කුසල් කරන්නෙම් නම් යෙහෙක' යැයි මෙබඳු අදහස් පහළ නොවූවෙහි ද?" යැයි අසයි.

නිරිසතු :- "ස්වාමීනි, කුසල් කරන්නට නොහැකි වීමි. වහන්ස, පමා වූයෙමි" යැයි කියයි.

යමරජු :- "එම්බා පුරුෂය, පමා වූ බැවින් කයින්, වචනයෙන් සිතින් කුසලයක් නොකෙළෙහිය. එම්බා පුරුෂය, පමා වූවහුට යම් සේ කෙරෙත් ද, එසේ නුඹට කරමි. නුඹගේ ඒ මේ පාප කර්‍මය මව විසින් කරණ ලද්දක් නොවෙයි. පියා විසින් කරණ ලද්දක් නොවෙයි. සොහොයුරා විසින් කරණ ලද්දක් නොවෙයි, සොයුරිය විසින් කරණ ලද්දක් නොවෙයි. යහළු මිත්‍රයන් විසින් කරණ ලද්දක් නොවෙයි. සහලේ නෑයන් විසින් කරණ ලද්දක් නොවෙයි. මහණ බමුණන් විසින් කරණ ලද්දක් නොවෙයි. දෙවියන් විසින් කරණ ලද්දක් නොවෙයි. නුඹ විසින් ඒ පාප කර්‍මය කරණ ලදි. ඒ පාප කර්‍මයාගේ විපාකය නුඹම විඳින්නෙහි ය" යැයි කියයි.

## ❁ යමරජ

චාතුර්‍මහාරාජ දෙව්ලොවට අයත් වන ඒ හා සමාන සැප සම්පත් ඇති ත්‍රි හේතුක ප්‍රතිසන්ධි ලාභී වූ එසේ වුව ද අසුර අපායට අයත් වෛමානික අසුර සංඛ්‍යාවට ගැනෙන මහත් කරුණාවක් ඇති

අතිශයින් ගුණවත් වූ යමරජු පරම ධාර්මික සත්පුරුෂයෙකි. මෙසේ වූ යම රජවරු දෙතිස් දෙනෙක් අපාය දෙරටු සමීපයෙහි නඩු විසඳති.

## ❁ නිරය පාලයෝ (යමපල්ලෝ)

මනුලොව රජ අණ පරිදි අපරාධ කළවුන්ට දඬුවම් පමුණුවන වධකයෝ ඇත්තාහ. එමෙන්ම නිරයෙහි ද පෙර කරන ලද අකුසල කර්ම බලයෙන් එහි විපාක විඳින එම සත්වයෝ අලුතින් නිරයට පැමිණෙන්නන්ට ඔවුන්ගේ පූර්ව කර්ම ස්වභාවයට අනුව අනේකාකාර වධ කම්කටොළු පමුණුවති. ඔවුහු යමපල්ලෝ නම් වෙති.

## ❁ දේවදූත

දේව යනු මාරයාට නමකි. ඒ මාරයාගේ දූතයෝ දේවදූත නම් වේ. බාල - ජරා - ව්‍යාධි ආදිය "**නුඹ මරහු වෙත පැමිණිය යුතුය**" යැයි චෝදනා කරන්නවුන් වැනි වෙති. දෙවියන් වැනි දූතයෝ හෝ දේවදූත නම් වේ. දෙවියෙකු අහසෙහි සිට "**නුඹ අසවල් දින මැරෙන්නෙහිය**" යැයි කියන්නනේ නම් එම වචනය පිළිගත යුතුය. බාලාදීහු ද "**නුඹත් මෙබඳු ස්වභාවය ඇත්තෙහිය**" යැයි චෝදනා කරන්නවුන් වැනි වෙති. විශුද්ධ දේවයන්ගේ දූතයෝ ද දේවදූත නම් වෙති. සියලු විශුද්ධි දේව සංඛ්‍යාත මහ බෝසතාණන් වහන්සේලා **මහල්ලෙක්, ලෙඩෙක්, මෘත දේහයක්, පැවිදි රුවක්** දැකම ගිහිගෙයින් නික්ම යති. මෙලෙස දේවදූත යන්නෙන් අදහස් කරනුයේ කෙනෙකු ඉදිරිපත්ව යටිකුරුව තබන ලද්දක් උඩුකුරු කොට පෙන්වන්නාක් මෙන් යථා ස්වභාවය නුවණින් දැකීමයි.

යමරජු තමන් ඉදිරියට පැමිණි එම නිරි සත්වයාගෙන් "**පළමු දේවදූතයා නොදුටුවෙහි ද**" යැයි විචාළ කල්හි නිරි සත්වයා "**නැත**" යැයි කියන්නේ එබඳු කෙනෙකු තමන් වෙතට නොපැමිණි බැවින් නොදුටු නිසාය. එවිට යමරජු ඒ නිරි සත්වයා දේවදූත යනුවෙන් කී කාරණය නොදත් බව දැන එය අවබෝධ කරවනු පිණිස "**තමන්ගේම**

මල මූත්‍රයෙහි වැතිරුණු ළදරුවෙකු නොදුටුවෙහි ද" යැයි ප්‍රශ්න කරයි. එහි අර්ථය මෙසේය.

"පින්වත්නි මා දෙස බලත්වා. මට ද නුඹලාට මෙන් අත් පා ඇත. එහෙත් මම ස්වකීය මල මූත්‍රයෙහි තැවරුණේ වෙමි. මගේ කාය චිත්ත ශක්තියෙන් නැගිට පිරිසිදු කර ගැනීමට හෝ නෑමට නොහැකි වෙමි. කිලුටු වූ මා නාවන්න කියා අන්‍යයන්ට කීමට ද නොහැක්කෙමි. මෙලෙස මල මූත්‍රයෙහි වැතිර සිටින බවක් ද නොදනිමි. මා මෙබඳු දුකට පත් වූයේ ඉපදීමෙන් නොමිඳුණු බැවිනි. මා පමණක් නොව නුඹලා ද උත්පත්තියෙන් නොමිඳුනාහුය. මම මෙන්ම නුඹලාට ද නැවත ඉපදීමක් ඇති වන්නේය. දැන් නුඹලා මල මූත්‍රයෙහි නොතැවරී එසේ සිටිනා අන් අය පිළිකුල් කරන්නේ මුල නොදන්නා නිසාය. නැවත නැවත සසරෙහි වසන්නේ නම් භවයක් පාසාම මට මෙන් නුඹලාටද මල මූත්‍රයෙහි වැතිර මහත් දුක් විඳීමට වන බව ඒකාන්තය. එහෙයින් කල් ඇතිවම පමා නොවී ඉපදීමේ දුක නැති කිරීම පිණිස පින් දහම් කරගන්න" යැයි කියා ඒ කුඩා ළදරුවා කරුණු කියා පාන්නකු මෙන් නුවණින් වටහා ගැනීම දේවදූත නම් වේ.

## ☸ දෙවන දේවදූතයා

මෙලෙස යමරජු පළමු දේවදූතයා ඉදිරිපත් කළ කල්හි ඇතැම් කෙනෙක් සිහි උපදවා කුසලාරම්මණයෙහි සිත පිහිටුවා එයින් ච්‍යුතව ස්වර්ග උත්පත්තියට පැමිණේ. එසේ සිහි උපදවා ගැනීමට නොහැකි වී නම් එවිට යමරජු එම නිරිසතාට දෙවන දේවදූතයා දක්වයි.

යමරජු :- "එම්බා පුරුෂය, මනුෂ්‍යයන් අතරෙහි පහළ වූ දෙවෙනි දේව දූතයා නුඹ නුදුටුවෙහි ද?" යැයි අසයි.

නිරිසතු :- "ස්වාමීනි, නොදුටුවෙමි" යැයි කියයි.

යමරජු :- "එම්බා පුරුෂය, නුඹ මනුෂ්‍යයන් අතර උපතින් අසූ වයස් ගියා වූ, හෝ අනූ වයස් ගියා වූ හෝ අවුරුදු සියයක් ඉක්ම ගියා වූ හෝ ජරාජීර්ණ වූ ගොනැස්සක්

සේ වක් වූ, මැදින් බිඳුණු සිරුරු ඇති සැරයටිය පිහිට කොට ඇති, වෙවුලමින් හැසිරෙන්නා වූ, ජරාවෙන් ආතුර වූ ඉක්ම ගිය තරුණ කම් ඇති, වැටුණු දත් ඇති, පැසුණු හිස කෙස් ඇති, ඉගිළී ගිය හිස කෙස් ඇති, බොහෝ සේ ඉගිළී ගිය හිස කෙස් ඇති, රැළි නැගුණ සම ඇති, තල කැළලින් යුත් සිරුර ඇති, ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු හෝ නුදුටුවෙහි ද?" යැයි අසයි.

නිරිසතු :- "ස්වාමීනි, දුටුවෙමි යැයි" කියයි.

යමරජු :- "එම්බා පුරුෂය, නුවණැති වැඩි වයසට පැමිණි ඒ නුඹට මමත් ජරාව ස්වභාව කොට ඇත්තේ වෙමි. ජරාව නො ඉක්ම වූයේ වෙමි. එබැවින් මම කයින්, වචනයෙන්, සිතින් කුසල් කරන්නෙම් නම් යහපති යන අදහස ඇති නොවී ද?" යැයි අසයි.

නිරිසතු :- "ස්වාමීනි, කුසල් කරන්නට නොහැකි වීමි. ස්වාමීනි, පමා වීමි" යැයි කියයි.

යමරජු :- "එම්බා පුරුෂය, පමා වූ බැවින් කයින්, වචනයෙන් සිතින් කුසලයක් නොකෙළෙහිය. එම්බා පුරුෂය, පමා වූවහුට යම් සේ කෙරෙත් ද, එසේ නුඹට කරමි. නුඹගේ ඒ මේ පාප කර්මය මව විසින් කරණ ලද්දක් නොවෙයි. පියා විසින් කරණ ලද්දක් නොවෙයි. සොහොයුරා විසින් කරණ ලද්දක් නොවෙයි, සොයුරිය විසින් කරණ ලද්දක් නොවෙයි. යහළු මිත්‍රයන් විසින් කරණ ලද්දක් නොවෙයි. සහලේ නෑයන් විසින් කරණ ලද්දක් නොවෙයි. මහණ බමුණන් විසින් කරණ ලද්දක් නොවෙයි. දෙවියන් විසින් කරණ ලද්දක් නොවෙයි. නුඹ විසින් ඒ පාප කර්මය කරණ ලදි. ඒ පාප කර්මයාගේ විපාකය නුඹම විඳින්නෙහි ය" යැයි කියයි.

මෙහි ද යමරජු දෙවන දේවදූතයා නොදුටුවෙහි ද යැයි ඇසූ විට නිරිසතු නැත යැයි කියන්නේ එවැන්නෙකු තමා වෙත නොපැමිණි

බැවින් නොදුටු නිසාය. එම නිරිසතාගේ එම අදහස දත් යමරජු ජරාවට පත් කෙනෙක් නොදුටුවෙහිද යැයි ප්‍රශ්න කරයි. මෙහි දේවදූත යනු එලෙස ජරාවට පත් තැනැත්තා සෙස්සන්ට මෙලෙස කරුණු කියා පාන්නකු වැනිය.

**"පින්වත්නි, මා දෙස බලව්. මම ද පෙර නුඹලා මෙන් ලස්සන රූමත් තරුණයෙක් වීමි. අත් පා ආදියෙහි කාය ශක්තිය ඇත්තෙක් වීමි. එහෙත් බලව් ඒ කාය ශක්තිය පිරිහුණේය. ශරීර සෝභාව විකෘති විය. අත් පා ආදියෙන් කළ යුතු වූ කටයුතු කිරීමට අපොහොසත් වීමි. ඇස් ගිලී, කොන්ද කුදු වී, දත් වැටී, සම රැලි ගැසී, සිරුරෙහි තැන් තැන්වල තල කැලැල් සෑදී, දුගඳ හමන ස්වභාවයෙන් යුක්තව, තම ශරීර කෘත්‍ය ටිකවත් සිදුකර ගැනීමට නොහැකි ව අනුන් විසින් පිළිකුල් කරන ස්වභාවයට පත් වූවෙමි. මම ජරා දුකින් නොමිදුණු බැවින් මෙසේ ජරා දුකට පත් වූවෙමි. පින්වත්නි මෙසේ ජරා දුකට පත් වන්නේ මම පමණක් නොව, නුඹලාගේ ද ඔය ලස්සන රූමත් දකුම්කලු තරුණ ජීවිත සැමද පවතින්නක් නොව. නුඹලා ද ඒකාන්තයෙන් ජරා දුකට පත්වන්නාහ. ජරා දුකින් නොමිදුණු බැවින් මේ දුක් සසරේ අනේක වාරයන්හි ජරා දුකට පත්වීමට සිදුවන්නේය. එබැවින් මේ නින්දිත ජරා දුකින් අතමිදීමට මා දෙස බලා සංවේග උපදවා අප්‍රමාදීව කටයුතු කරව්"** යැයි ඒ ජරාවට පත් තැනැත්තා කරුණු කියා දෙන්නකු ලෙස තම ශරීර ස්වභාවය ගැන නුවණින් පරීක්ෂාකොට බලා කරුණු අවබෝධයෙන් වටහා ගැනීම මෙහි දේවදූත නම් වේ.

## ☸ තෙවන දේවදූතයා

මෙලෙස යමරජු දෙවන දේවදූතයා ඉදිරිපත් කළ කල්හි ඇතැම් කෙනෙක් සිහි උපදවා කුසලාරම්මණයෙහි සිත පිහිටුවා එයින් ච්‍යුතව ස්වර්ගී උත්පත්තියට පැමිණේ. එසේ සිහි උපදවා ගැනීමට නොහැකි වී නම් එවිට යමරජු එම නිරිසතාට තෙවන දේවදූතයා දක්වයි.

යමරජු :- "එම්බා පුරුෂය, නුඹ මිනිසුන් අතරෙහි පහළ වූ තුන් වන දේවදූතයා නුදුටුවෙහි ද?"

නිරිසතු :- "ස්වාමීනි, නොදුටුවෙමි" යැයි කියයි.

යමරජ :- "එම්බා පුරුෂය, නුඹ මනුෂ්‍යයන් අතරෙහි හටගත් රෝග ඇත්තා වූ, දුකට පත් වූ, දැඩි ගිලන් බව ඇත්තා වූ, ස්වකීය මළ මුත්‍ර මත සයනය කරණ අනුන් විසින් නැගිට වනු ලබන, අනුන් විසින් හොවනු ලබන ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු හෝ නොදුටුවෙහි ද" යැයි අසන්නේය.

නිරිසතු :- "ස්වාමීනි, දුටුවෙමි" යැයි කියයි.

යමරජු :- "එම්බා පුරුෂය, නුවණැත්තා වූ වැඩි වයසට පැමිණියා වූ ඒ නුඹට මමත් ලෙඩ වීම ස්වභාව කොට ඇත්තේ වෙමි, ලෙඩ වීම නො ඉක්ම වූයේ වෙමි. එබැවින් මම කයින්, වචනයෙන්, සිතින් කුසලයක් කරමි කියා අදහස් නොවූයෙහිද" යැයි අසන්නේය.

නිරිසතු :- "ස්වාමීනි, කුසල් කරන්නට නොහැකි වීමි. ස්වාමීනි, පමා වීමි" යැයි කියයි.

යමරජු :- "එම්බා පුරුෂය, පමා වූ බැවින් කයින්, වචනයෙන් සිතින් කුසලයක් නොකෙළෙහිය. එම්බා පුරුෂය, පමා වූවහුට යම් සේ කෙරෙත් ද, එසේ නුඹට කරමි. නුඹගේ ඒ මේ පාප කර්මය මව විසින් කරණ ලද්දක් නොවෙයි. පියා විසින් කරණ ලද්දක් නොවෙයි. සොහොයුරා විසින් කරණ ලද්දක් නොවෙයි, සොයුරිය විසින් කරණ ලද්දක් නොවෙයි. යහළු මිත්‍රයන් විසින් කරණ ලද්දක් නොවෙයි. සහලේ නෑයන් විසින් කරණ ලද්දක් නොවෙයි. මහණ බමුණන් විසින් කරණ ලද්දක් නොවෙයි. දෙවියන් විසින් කරණ ලද්දක් නොවෙයි. නුඹ විසින් ඒ පාප කර්මය කරණ ලදි. ඒ පාප කර්මයාගේ විපාකය නුඹම විඳින්නෙහි ය" යැයි කියයි.

මෙහි ද යමරජු තෙවන දේවදූතයා නොදුටුවෙහි ද යැයි ඇසූ විට නිරිසතු නැත යැයි කියන්නේ එවැන්නෙකු තමා වෙත නොපැමිණි බැවින් නොදුටු නිසාය. එම නිරිසතාගේ එම අදහස දත් යමරජු ව්‍යාධියට පත් කෙනෙක් නොදුටුවෙහිද යැයි ප්‍රශ්න කරයි. මෙහි දේවදූත යනු එලෙස ව්‍යාධියට පත් තැනැත්තා සෙස්සන්ට මෙලෙස කරුණු කියා පාන්නකු වැනිය.

පින්වත්නි බලව්. මමත් පෙර නුඹලා මෙන් නිරෝගි වූවෙකු වීමි. එහෙත් ඒ මම දැන් රෝගියෙකි. තමන්ගේම මල මුත්‍රයෙහි වැටී නැගිට ගන්නට නොහැකිව එක්තැන් වූවෙක්මි. මගේ ශරීර කෘත්‍යය අන්‍යයන්ගේ උපකාරයෙන් සිදු නොවන්නේ නම් මරණයට පත්වීම හෝ වන්නේ ය. මරණාසන්න දුකට හෝ පත්වන්නේ ය. පින්වත්නි මෙලෙස ලෙඩ සෑදෙන්නේ මට පමණක් නොව, නුඹලා ද ලෙඩවීම ස්වභාව කොට ඇත්තෝ ය. මෙසේ මම මෙන් ලෙඩ වූ දට නුඹලාට වන්නේ ද මේ ටිකමය. එබැවින් මෙසේ ලෙඩ ඇතිවීමට මත්තෙන් ව්‍යාධි දුකින් අත මිදීම පිණිස පින් කරගන්නේ නම් යෙහෙක යැයි එම ව්‍යාධියට පත් දුක්ඛිත තැනැත්තා කරුණු කියන්නාක් මෙන් තම නුවණින් කරුණු වටහා ගැනීම දේවදූත නම් වේ.

## ☸ සිව්වන දේවදූතයා

මෙලෙස යම රජු තෙවන දේවදූතයා ඉදිරිපත් කළ කල්හි ඇතැම් කෙනෙක් සිහි උපදවා කුසලාරම්මණයෙහි සිත පිහිටුවා එයින් ච්‍යුතව ස්වර්ග උත්පත්තියට පැමිණේ. එසේ සිහි උපදවා ගැනීමට නොහැකි වී නම් එවිට යම රජු එම නිරිසතාට සිව්වන දේවදූතයා දක්වයි.

යම රජු :- "එම්බා පුරුෂය, නුඹ මිනිසුන් අතරෙහි පහළ වූ සිව්වන දේවදූතයා නුදුටුවෙහි ද?" යැයි අසයි.

නිරිසතු :- "ස්වාමීනි, නොදුටුවෙමි" යැයි කියයි.

යම රජු :- "එම්බා පුරුෂය, රජුන් විසින් මිනිසුන් අතර අපරාධ කළ සොරෙකු අල්ලාගෙන එම වරදට නොයෙක් කම්කටොළු, දෙතිස් වධ දඬුවම් කරවත්. එනම්:-

1. වේවැලින් තැළීම,
2. කසයෙන් තැළීම,
3. දෙරියන් දිග මුගුරින් තැළීම,
4. කටු සහිත මිටියෙන් තැළීම
5. අත කැපීම,
6. පය කැපීම,
7. අත් පා කැපීම,
8. කණ කැපීම,
9. නාසය කැපීම,
10. කණ් නාසා කැපීම,
11. හිස් කබල උගුළුවා ගිනියම් රතට රත් කළ ලෝදිය වත්කොට හිස් කබල උතුරවා හරින්නා වූ "**බිලංගථාලික**" නම් වධය,
12. හිසෙහි සම උගුළුවා බොරලු දමා අතුල්ලා හක් ගෙඩියක් මෙන් කරන්නා වූ "**සඞ්ඛමුණ්ඩික**" නම් වධය,
13. අඬුවෙන් කට විවර කොට තෙල් තිර දමා පහන් දල්වන්නා වූද, කටෙහි සිට කන් සිළුව දක්වා පලා කටෙහි ලේ පිරීමට හරින්නා වූ "**රාහුමුඛ**" නම් වධය,
14. තෙල් පෙඟවූ පිලි කයෙහි වෙලා මුලු සිරුරම ගිනි දල්වන්නා වූ "**ජෝතිමාලික**" නම් වධය,
15. තෙල් පෙඟවූ පිලි අත් දෙකෙහි වෙලා පන්දම් මෙන් ගිනි දල්වන්නා වූ "**හත්ථපජ්ජොතික**" නම් වධය,

16. බෙල්ලෙහි පටන් සම ගලවා කෙණ්ඩයෙහි වලලු කොට තඹ යොතකින් බැඳ තමාගේ ම සම් වැටිය පෑගි පෑගී, වැටි වැටී යන ලෙස එහා මෙහා ඇදෑ ඇවිදින්නා වූ "**එරකවත්තික**" නම් වධය,

17. බෙල්ලෙහි පටන් සම උගුල්වා ඉනෙහි තබා එතැන් පටන් සම ගලවා ගොප් ඇටයෙහි තබා උඩ කොටසෙහි සමෙන් යට සිරුර වසා වැහැරි සිවුරක් ඇන්දෙකු මෙන් කරන්නා වූ "**චීරකවාසික**" නම් වධය,

18. බිම හොවා දෙදණ දෙවැලමිට යකඩ උල් ගසා බිමට සවි කොට අවට ගිනි දල්වන්නා වූ "**ඒණෙය්‍යක**" නම් වධය,

19. දෙපැත්තෙහි අඬු ඇති බිලි කටුවලින් ගසා සම් මස් නහර උපුටා හරින්නා වූ "**බලිසමංසික**" නම් වධය,

20. තියුණු මුවහත ඇති පිහියවලින් මුළු සිරුරම කහවණු පමණට පෙති පෙති කපන්නා වූ "**කහාපණක**" නම් වධය,

21. සිරුර තැන් තැන් වලින් ආයුධවලින් කොටා කාරම් දිය ඉස සම් මස් නහර දියකොට ඇට සැකිල්ල පමණක් ඉතිරි වීමට හරින්නා වූ "**ඛාරාපතච්ඡික**" නම් වධය,

22. එක් ඇළයකින් බිම හොවා උඩ කන් සිදුරෙන් යවුලක් ගසා යට කන් සිදුරෙන් මතුව පොළොවට සවි කොට දෙපයින් අල්ලාගෙන වටේට කරකවන්නා වූ "**පලිඝපරිවත්තික**" නම් වධය,

23. දක්‍ෂයෙකු විසින් සිවිය හා සම නොසිඳෙන පරිදි අතකොළුවලින් තලා ඇට බිඳ සුනු විසුනු කොට එකට ගුලි කොට පිදුරු කට්ටයක් මෙන් කෙස් වැටියෙන් ඔතා තබන්නා වූ "**පලාලපිට්ඨික**" නම් වධය,

24. යටිපතුල් පලා ලුණු දමා මසා බොරලු බිම ඇවිද්දවීම

25. යකඩ බිළි කොක්කෙහි ඇමිණවීම

26. උණු තෙල් ඇඟ වත් කිරීම

27. දින ගණනක් බඩසයින් තැබූ සුනඛයන් ඉදිරියට දමා එම සුනඛයන් ලවා කැවීම,

28. වධබෙර ගැස්වීම

29. ජීවත් ව සිටියදීම උල තැබීම,

30. කරවටක් දක්වා වලක් කපා එහි බස්වා වසා ඇතුන් ලවා පෑගවීම

31. හිටුවා පස් ගසා නඟුල්වලින් සෑම

32. දං ගෙඩියෙහි ගෙල තබා කඩුවෙන් හිස සිඳීම

යන දෙතිස් වධ පමුණුවන්නා වූ රජවරු නොදුටුවෙහි ද" යැයි අසයි.

නිරිසතු :- "ස්වාමීනි, දුටුවෙමි" යැයි කියයි.

යම රජු :- "එම්බා පුරුෂය, නුවණැත්තා වූ වැඩි වයසට පැමිණියා වූ ඒ නුඹට මමත් ලෙඩ වීම ස්වභාව කොට ඇත්තේ වෙමි, ලෙඩ වීම නො ඉක්ම වූයේ වෙමි. එබැවින් මම කයින්, වචනයෙන්, සිතින් කුසලයක් කරමි කියා අදහස් නොවූයෙහිද" යැයි අසයි.

නිරිසතු :- "ස්වාමීනි, යහපතක් කරන්න නොහැකි වීමි. ස්වාමීනි, පමා වීමි" යැයි කියයි.

යම රජු :- "එම්බා පුරුෂය, පමා වූ බැවින් කයින්, වචනයෙන් සිතින් කුසලයක් නොකෙළෙහිය. එම්බා පුරුෂය, පමා වූවහුට යම් සේ කෙරෙත් ද, එසේ නුඹට කරමි. නුඹගේ ඒ මේ පාප කර්‍මය මව විසින් කරණ ලද්දක් නොවෙයි. පියා විසින් කරණ ලද්දක් නොවෙයි. සොහොයුරා විසින් කරණ ලද්දක් නොවෙයි, සොයුරිය විසින් කරණ ලද්දක් නොවෙයි. යහළු මිත්‍රයන් විසින් කරණ ලද්දක් නොවෙයි. සහලේ නෑයන් විසින් කරණ ලද්දක් නොවෙයි. මහණ බමුණන් විසින් කරණ ලද්දක් නොවෙයි. දෙවියන් විසින් කරණ ලද්දක් නොවෙයි. නුඹ විසින් ඒ පාප කර්‍මය කරණ ලදි. ඒ පාප කර්‍මයාගේ විපාකය නුඹම විඳින්නෙහි ය" යැයි කියයි.

මෙහි ද යමරජු සිව්වන දේවදූතයා නොදුටුවෙහි ද යැයි ඇසූ විට නිරිසතු නැත යැයි කියන්නේ එවැන්නෙකු තමා වෙත නොපැමිණි බැවින් නොදුටු නිසාය. එම නිරිසතාගේ එම අදහස දත් යමරජු මිනිසුන් අතර අපරාධ කර්මයන් කොට එම අකුසල කර්මයන්ට දිට්ඨධම්ම විපාක වශයෙන් දඬුවම් විඳින්නකු නොදුටුවෙහිද යැයි ප්‍රශ්න කරයි. මෙහි දේවදූත යනු එලෙස අකුසල කර්මයන්ට දිට්ඨධම්ම විපාක වශයෙන් දඬුවම් විඳින්නා වූ තැනැත්තා සෙස්සන්ට මෙලෙස කරුණු කියා පාන්නකු වැනිය. එය මෙසේය.

මෙහි දෙතිස් වධ කම්කටොළු හෝ එලෙස කම්කටොළු කරවන්නා වූ වධකයන් හෝ දේවදූත නම් වෙති. එම දෙතිස් වධ කම්කටොළු සෙස්සන්ට මෙසේ කියන්නවුන් වැනිය.

**"අපි වනාහි ගසක, ගලක හෝ එබඳු අන් තැනක පහළ නොවන්නෝ වෙමු. ගස් ගල් ආදිය අපරාධ නොකරන හෙයින් ඒවාට දඬුවම් පැමිණවීමෙන් පළක් නැත. ප්‍රාණවධ අදින්නාදනාදී අපරාධ කරන්නෝ නුඹලාම බැවින් නුඹලා වැනියවුන්ගේ සිරුරෙහිම පහළ වන්නෝ වෙමු. එබැවින් අපගේ පහළ වීමට මත්තෙන් පින් දහම් කරව්"** යැයි එම කම්කටොළු දේවදූතයන් වූයේ ඒ තුළින් ස්වකීය සිත තුළ කෙලෙස් පහළවීමට නොදී හික්මවන හෙයිනි. එසේම මෙම කම්කටොළු පමුණුවන වධකයෝ ද මෙසේ අවවාද කරන්නවුන් වැනි වෙති.

**"පින්වත්නි, අපි වනාහි මේ දෙතිස් කම්කටොළු වෘක්ෂ පර්වත ආදියට පමුණුවන්නෝ නොවෙමු. නුඹලා වැනි අපරාධ කළවුන්ගේ සිරුරෙහිම පමුණුවන්නෝ වෙමු. එබැවින් මෙම වධයන් පැමිණවීම අපරාධ කර්මයන් හේතුවෙන්ම වන බැවින්, අප විසින් දෙතිස් වධ පැමිණවීමට පෙර පින් දහම් කරව්"** යැයි එම වධකයන් තමන්ට කරුණු කියා පාන්නක් මෙන් තම සිතින් කරුණු සලකා අවබෝධ කර ගැනීම මෙහි දේවදූත නම් වේ.

## ☸ පස්වන දේවදූතයා

මෙලෙස යම රජු විසින් සිව්වන දේවදූතයා ඉදිරිපත් කළ කල්හි ඇතැම් කෙනෙක් සිහි උපදවා කුසලාරම්මණයෙහි සිත පිහිටුවා එයින් ච්‍යුතව ස්වර්ගී උත්පත්තියට පැමිණේ. එසේ සිහි උපදවා ගැනීමට නොහැකි වී නම් එවිට යම රජු එම නිරිසතාට පස් වන දේවදූතයා දක්වයි.

යම රජු :- "එම්බා පුරුෂය, නුඹ මනුෂ්‍යයන් කෙරෙහි පහළ වූ පස්වැනි දේවදූතයා නුදුටුවෙහි ද?" යැයි අසයි.

නිරිසතු :- "ස්වාමීනි, නොදුටුවෙමි" යැයි කියයි.

යම රජු :- "එම්බා පුරුෂයා, නුඹ මනුෂ්‍යයන් අතරෙහි මැරී එක දවසක් ගියා වූ හෝ දෙදවසක් ගියා වූ හෝ තුන් දවසක් ගියා වූ හෝ ඉදිමී ගියා වූ හෝ නිල් වූ හෝ ඕජාව වැහෙන්නා වූ හෝ ස්ත්‍රියක් හෝ පුරුෂයකු නුදුටුවෙහි ද" යැයි අසන්නේ ය.

නිරිසතු :- "ස්වාමීනි, දුටුවෙමි" යැයි කියයි.

යම රජු :- "එම්බල පුරුෂය, නුවණැති වැඩි වයසට පැමිණි නුඹට මම ද මරණය ස්වභාව කොට ඇත්තෙමි. මරණය නො ඉක්ම වූයෙමි. මම කයින්, වචනයෙන්, සිතින් කුසලක් කරන්නෙම් නම් යහපති යැයි අදහස් නොවූයෙහිද" යැයි අසයි.

නිරිසතු :- "ස්වාමීනි, නොහැකි විය. ප්‍රමාදයට පැමිණියෙමි" යැයි කියයි.

යම රජු :- "එම්බා පුරුෂය, පමා වූ බැවින් කයින්, වචනයෙන් සිතින් කුසලයක් නොකෙළෙහිය. එම්බා පුරුෂය, පමා වූවහුට යම් සේ කෙරෙත් ද, එසේ නුඹට කරමි.

නුඹගේ ඒ මේ පාප කර්‍මය මව විසින් කරණ ලද්දක් නොවෙයි. පියා විසින් කරණ ලද්දක් නොවෙයි. සොහොයුරා විසින් කරණ ලද්දක් නොවෙයි, සොයුරිය විසින් කරණ ලද්දක් නොවෙයි. යහළු මිත්‍රයන් විසින් කරණ ලද්දක් නොවෙයි. සහලේ නෑයන් විසින් කරණ ලද්දක් නොවෙයි. මහණ බමුණන් විසින් කරණ ලද්දක් නොවෙයි. දෙවියන් විසින් කරණ ලද්දක් නොවෙයි. නුඹ විසින් ඒ පාප කර්‍මය කරණ ලදි. ඒ පාප කර්‍මයාගේ විපාකය නුඹම විඳින්නෙහි ය" යැයි කියයි.

මෙහි ද යමරජු පස්වන දේවදූතයා නොදුටුවෙහි ද යැයි ඇසූ විට නිරිසතු නැත යැයි කියන්නේ එවැන්නෙකු තමා වෙත නොපැමිණි බැවින් නොදුටු නිසාය. එම නිරිසතාගේ එම අදහස දත් යමරජු මිනිසුන් අතර මැරුණු තැනැත්තෙකු නොදුටුවෙහිද යැයි ප්‍රශ්න කරයි. මෙහි දේවදූත යනු එම මෘත ශරීරය තමාට කරුණු කියා දෙන්නාක් මෙන් තම බුද්ධියෙන් කරුණු අවබෝධයට සැලැස්වීමයි. එය මෙසේය.

පින්වත්නි, අමු සොහොනට ඇද දමන්නට සුදුසු වූ ඉදිමීම, නිල් පැහැ වීම, ඇස් කන් ආදී නවද්වාරයෙන් සැරව ගැලීම, හාත්පස කුණුගඳ පැතිරීම ආදී ස්වභායටන්ට පැමිණියා වූ මා දෙස බලව්. මරණයෙන් නොමිඳුණු බැවින් මම මෙබඳු ස්වභාවයට පත් වූවෙමි. මෙම ස්වභාවය උරුම වූයේ මට පමණක් නොව, නුඹලා ද මරණයෙන් නොමිඳුණාහු වෙති. මොන තරම් කාය ශක්තිය තිබුණ ද, නිලතල තිබුණ ද, මිලමුදල් තිබුණ ද, වස්තු දේපළ තිබුණ ද ඒ සියල්ලම මරණය කෙළවර කොට පවතී. නුඹලාගේ ද අන්තිම ඉරනම මරණයයි. එබැවින් මරණය පැමිණීමට ප්‍රථමයෙන් කුසල් කරගත යුතුය යැයි ඒ මෘත ශරීරය කියා දෙන්නාක් මෙන් තම නුවණින් කරුණු වටහා ගැනීම මෙහි දේවදූත නම් වේ.

මෙලෙස යම රජු විසින් පස්වන දේවදූතයා ඉදිරිපත් කොට කරුණු වටහා දුන් කල්හි ඇතැම් කෙනෙක් සිහි උපදවා කුසලාරම්මණයෙහි සිත පිහිටුවා එයින් ච්‍යුතව ස්වර්ගී උත්පත්තියට පැමිණේ. එසේ සිහි උපදවා ගැනීමට නොහැකි වී නම් එවිට යම රජු එම සත්වයා විසින් පෙර කරන ලද කුසල කර්‍ම සිහිපත් කරවයි. ඇතැම්

සත්වයෝ යම රජුගේ සහායක් නොමැතිව තමන්ම කුසල් සිහි කොට ස්වර්ග සැපතට පැමිණෙති.

පෙර ලක්දිව **දීඝජන්තු** නම් ද්‍රවිඩ ජාතිකයෙක් විය. හෙතෙමේ සුමනගිරි විහාරයෙහි ආකාශ චෛත්‍යයට රන්වන් වස්ත්‍රයක් පිදීය. හෙතෙම අකුසල් ආරම්මණයකින් මිය ගොස් උත්සද නිරය සමීපයෙහි උපන්නේ ය. හෙතෙමේ අපායෙහි ගිනිදැල් හඬ ඇසෙන විට තමා පෙර ආකාශ චෛත්‍යයට රන්වන් වස්ත්‍රය පුදන වේලාවෙහි එහි ශබ්දය සිහි වී එම කුසලය සිහිපත්ව එයින් ච්‍යුතව ස්වර්ගයෙහි උපන්නේය. හෙතෙම අන් අයගේ උපකාරයකින් තොරව කුසල් සිහි කොට මතු විඳීමට තිබුණු අපා දුක්වලින් නිදහස්ව විය.

ඇතැම් කෙනෙක් යම රජු විසින් ප්‍රශ්න අසා කරුණු කියා දුන්නේ නමුත් කුසලාරම්මණයක් සිහි නොවෙයි. එවිට යමරජු එම නිරිසතා විසින් පෙර කරන ලද කුසල අවස්ථා මතුකොට දක්වයි.

පෙර එක් අමාත්‍යයෙක් ස්වර්ණමාලී චෛත්‍යරාජයාණන් වහන්සේට සමන් මල් මිටක් පූජා කොට එම කුසලය යම රජුට ද අනුමෝදන් කළේ ය. මරණාසන්න වූ හෙතෙම අකුසල කර්මයක් සිහි වී එම චේතනාවෙන් ච්‍යුතව ඔසුපත් නරක සමීමයෙහි උපන්නේය. යමපල්ලන් විසින් එම නිරිසතා යමරජු වෙත ඇදගෙන විත් ඉදිරිපත් කළහ. යමරජු එම නිරිසතාගෙන් දේවදූතයන් පස්දෙනා පිළිබඳවම කරුණු දක්වා චෝදනා කළ නමුත් එම නිරිසතාට කුසලාරම්මණයක් සිහි නොවීය. ඉක්බිති යමරජු එම සත්වයා පූර්ව ජාතියෙහි ස්වර්ණමාලී චෛත්‍යරාජයන් වහන්සේට කළ සමන් මල් පූජා කොට එම කුසලය තමන්ට ද අනුමෝදන් කළ සත්ක්‍රියාව සිහි කරවීය. එවිට එම නිරිසතාට එම කුසලය සිහි වී එයින් ච්‍යුතව දෙව්ලොව උපන්නේ ය.

මෙලෙස යමරජු විසින් කොතෙක් උත්සාහ කළ නමුත් ඇතැම් සත්වයන්ගේ අකුසල කර්මයන්ගේ මහත්බව හේතුවෙන් කුසල් අරමුණක් සිහි නොවෙයි. එවිට යමරජු **"අහෝ අකුසල කර්මයක මහත, දැන් මේ පවුකාර සත්වයා බොහෝ කාලයක් මහත් කටුක රෞද්‍ර දුක් විඳිනවා නේද?"** යැයි සිහි කොට මහත් කරුණා පෙරදැරිව සංවේගයට පැමිණ තෘෂ්ණීම්භූත වෙයි.

## ❁ නිරි සත්වයා අපා දුකට වැටීම

ඉක්බිති යමපල්ලන් විසින් එම නිරිසත්වයා ඇදගෙන ගොස් ගිනියම් රතට රත්ව දිලිසෙන අයෝමය පොළොවෙහි තුන්ගව් පමණ වූ එම සත්වයා උඩුකුරුව හොවා අත් දෙකෙහි ද, පා දෙකෙහි ද, පපුවෙහි ද යන පස් තැන්හි ගිනිගෙන දිලිසෙන තල් කඳන් හා සමාන වූ උල් පසක් පොළොවට සවිවන සේ ගසමින් පඤ්ච විධ බන්ධන නම් වධය කරති. එම සත්වයා අනේක වර්ෂ කෝටි සත සහස්‍රයක් මුලුල්ලෙහි මහත් වූ කටුක රෞද්‍ර දුක් වේදනාවන් විඳී. යම්තාක් කාලයක් ඒ පාප කර්මය නො ගෙවේ ද, ඒ තාක් නොමැරෙයි.

නැවත ද එමපල්ලන් විසින් එම නිරිසතා ගිනි ඇවිලගත් යකඩ පොළොවෙහි නිද කරවා ගෙයක වහලයක් තරම් වූ කෙටේරිවලින් පලති. ඒ පැලුණු පැලුණු තැන්වලින් ලේ ගංගාවන් සේ ගලති. එසේ පැලුණු තැන්වල ගිනි ඇවිල බුර බුරා ඇවිලෙමින් පැසෙයි. එම සත්වයා අනේක වර්ෂ කෝටි සත සහස්‍රයක් මුලුල්ලෙහි මහත් වූ කටුක රෞද්‍ර දුක් වේදනාවන් විඳී. යම්තාක් කාලයක් ඒ පාප කර්මය නො ගෙවේ ද, ඒ තාක් නොමැරෙයි.

ඉක්බිති යමපල්ලන් විසින් එම නිරිසතා පා උඩුකුරු කොට හිස යටිකුරු කොට ගිනිගෙන දිලිසෙන අයෝමය පොළොවෙහි සිරසින් සිටුවා දෙපයින් අල්ලාගෙන මහත් වහලයක් පමණ වෑවලින් සසිත්. එම සත්වයා අනේක වර්ෂ කෝටි සත සහස්‍රයක් මුලුල්ලෙහි මහත් වූ කටුක රෞද්‍ර දුක් වේදනාවන් විඳී. යම්තාක් කාලයක් ඒ පාප කර්මය නො ගෙවේ ද, ඒ තාක් නොමැරෙයි.

නැවත ද යමපල්ලන් විසින් එම නිරිසතා අවයව සහිතව හාත්පසින් ගිනිගෙන දිලිසෙන රථයක බැඳ ගිනිගෙන දිලිසෙන අයෝමය පොළොවෙහි ඒ මේ අත ඇදෑ ඇවිදිති. එම සත්වයා අනේක වර්ෂ කෝටි සත සහස්‍රයක් මුලුල්ලෙහි මහත් වූ කටුක රෞද්‍ර දුක් වේදනාවන් විඳී. යම්තාක් කාලයක් ඒ පාප කර්මය නො ගෙවේ ද, ඒ තාක් නොමැරෙයි.

නැවත ද යමපල්ලන් විසින් එම නිරිසතා ගිනිගෙන හාත්පසින් දිලිසෙන එකම ගිනි ජාලාවක් වැනිව ඇවිල ගත්තා වූ මහත් කුළුගෙවල් පමණ වූ අඟුරු පර්වතයට ගිනිගෙන දිලිසෙන අයෝමය මුගුරුවලින් තල තලා ඇන නංවති. බස්වති. එම සත්වයා අනේක වර්ෂ කෝටි සත සහස්‍රයක් මුලුල්ලෙහි මහත් වූ කටුක රෞද්‍ර දුක් වේදනාවන් විඳී. යම්තාක් කාලයක් ඒ පාප කර්මය නො ගෙවේ ද, ඒ තාක් නොමැරෙයි.

නැවත ද යමපල්ලන් විසින් එම නිරිසතා පා උඩුකුරු කොට හිස යටිකුරු කොට අල්ලාගෙන කකියවන ලද ගිනිගෙන හාත්පසින් දිලිසෙමින් ඇවිලගත්තා වූ ලොහොකුඹු නිරයෙහි (ලෝහ කටාරමෙහි) දමත්. නිරිසතු එහි පෙණ නගිමින් පැසෙයි. විටෙක උඩ එමින් පැසෙයි. විටෙක යට යමින් පැසෙයි. විටෙක සරස යමින් පැසෙයි. එම සත්වයා අනේක වර්ෂ කෝටි සත සහස්‍රයක් මුලුල්ලෙහි මහත් වූ කටුක රෞද්‍ර දුක් වේදනාවන් විඳී. යම්තාක් කාලයක් ඒ පාප කර්මය නො ගෙවේ ද, ඒ තාක් නොමැරෙයි.

## ☸ මහා නිරය

ඉන්පසු යමපල්ලන් විසින් එම නිරිසතා මහා නිරයෙහි බහාලති. ඒ මහා නිරය වනාහි :-

**“චතුක්කණ්ණො චතුද්වාරො - විභත්තො භාගසො මිතො,**
**අයොපාකාරපරියන්තො - අයසා පටිකුජ්ජිතො”**

කොන් සතරක් ඇත්තේ ය. දෙරටු සතරක් ඇත්තේ ය. නිරය අභ්‍යන්තරයෙහි දිග පළල සියක් යොදුන් වන සේ කොටස් වශයෙන් බෙදෙන ලද්දේ ය. එහි අයෝමය පොළොව ද, අයෝමය පියන ද, සිව් දිසාවෙහි බිත්ති ද නව යොදුන් ඝනව ඇත්තේ වේ. එහි ගිනිගෙන දිලිසෙන ඇතුළත වර්ග ප්‍රමාණය යොදුන් (318) තුන්සිය අටළොසකි. පිටත ගිනි පැතිර පවත්නා වර්ග ප්‍රමාණය යොදුන් (954) නවසිය පනස් සතරකි. ඔසුපත් නරක සොළොස ද සමග වර්ග ප්‍රමාණයෙන් යොදුන් (10,000) දසදහසකි. එය ද අයෝමය පවුරකින් වට කරන ලද්දේ ය.

**"තස්ස අයොමයා භූමි - ජලිතා තෙජසා යුතා,**
**සමන්තා යොජනසතං - ඵරිත්වා තිට්ඨති සබ්බද"**

ඒ මහා නිරයෙහි බිම අයෝමය වන්නේය. ගිනි ඇවිල දිලිසෙන්නේ ය. අධික තේජසින් යුක්තය. හාත්පස සියක් යොදුන් නිතර පැතිර පවතින්නේය. යොදුන් සියයක් ඈත සිට බලන්නෙකුගේ පවා දෙනෙත් යගුළි දෙකක් මෙන් පිටතට නික්මෙන්නේ ය. එතරම් ම බිහිසුණු වන්නේය.

මෙම නිරයෙහි කල්පය හටගත් ද පටන් කල්ප විනාශය දක්වාම අපා ගිනි නොනිමී පවතී. එයට හේතුව නම් අතරක් නැර නිරයට පැමිණෙන සත්වයන්ගේ ශරීර පිළිස්සීමයි. දර කෘත්‍යය සිදුවන්නේ නිරි සතුන්ගේ ශරීර දැවීමෙන් ය.

මෙම මහා නිරයෙහි "**අබ්බුදය, නිරබ්බුදය, අහහය, අබබය, අටටය, සෝගන්ධිකය, උත්පලය, කුමුදය, පුණ්ඩරිකය, පදුමය**" යැයි නිරි සත්වයන් පැසෙන ස්ථාන දසයක් වෙති.

| | | | |
|---|---|---|---|
| මගධ නැලි | 4 | = කොසොල් නැලි | 1 |
| කොසොල් නැලි | 4 | = ලාස් | 1 |
| ලාස් | 4 | = ද්‍රෝණ | 1 |
| ද්‍රෝණ | 4 | = මානිකා | 1 |
| මානිකා | 4 | = ඛාරි | 1 |
| ඛාරි | 20 | = වාහ (කරත්ත) | 1 |

තල ඇට (800,000) අට ලක්‍ෂයක් තල නැලියකි. මෙලෙස කරත්තයකට තල ඇට (409,60,00,000) සාරසිය නවකෝටි සැටලක්‍ෂයකි.

යම් කෙනෙක් මෙම තල කරත්තයෙන් අවුරුදු සියයකට එක තල ඇටය බැගින් ඉවත් කිරීමෙන් යම්තාක් කාලයක් ගෙවීමෙන් එම කරත්තයෙහි තල අවසන් වේ ද, එහෙත් මහා නරකයෙහි සත්වයන් පැසිය යුතු **අබ්බුදය** නම් ස්ථානයෙහි ආයුෂය අවසන් නොවේ. මෙලෙස අබ්බුද විස්සක් පැසිය යුතු තැන **නිරබ්බුදය** නම් වේ. නිරබ්බුද

විස්සක් පැසිය යුතු තැන **අහහය** නම් වේ. අහහ විස්සක් පැසිය යුතු තැන **අබබය** නම් වේ. අබබ විස්සක් පැසිය යුතු තැන **අටටය** නම් වේ. අටට විස්සක් පැසිය යුතු තැන **සෝගන්ධිකය** නම් වේ. සෝගන්ධික විස්සක් පැසිය යුතු තැන **උප්පලය** නම් වේ. උප්පල විස්සක් පැසිය යුතු තැන **කුමුදය** නම් වේ. කුමුද විස්සක් පැසිය යුතු තැන **පුණ්ඩරිකය** නම් වේ. පුණ්ඩරික විස්සක් පැසිය යුතු තැන **පදුමය** නම් වේ.

ඒ මහා නිරයෙහි නැගෙනහිර බිත්තියෙන් නික්මෙන ගිනි දැල් බටහිර බිත්තියෙහි හැපී එම බිත්තිය ද විනිවිද නිරයෙන් පිටත ද යොදුන් සියයක් ඈත විහිදී පවතී. බටහිර බිත්තියෙන් නික්මෙන ගිනි දැල් නැගෙනහිර බිත්තියෙහි හැපී එම බිත්තිය ද විනිවිද නිරයෙන් පිටත ද යොදුන් සියයක් ඈත විහිදී පවතී. උතුරු දිග බිත්තියෙන් නික්මෙන ගිනි දකුණු දිග බිත්තියෙහි හැපී එම බිත්තිය ද විනිවිද නිරයෙන් පිටත ද යොදුන් සියයක් ඈත විහිදී පවතී. දකුණු බිත්තියෙන් නික්මෙන ගිනි දැල් උතුරු දිග බිත්තියෙහි හැපී එම බිත්තිය ද විනිවිද නිරයෙන් පිටත ද යොදුන් සියයක් ඈත විහිදී පවතී. අයෝමය පොළොවෙන් නික්මෙන ගිනි දැල් උඩ යපියනෙහි හැපී එම පියන ද විනිවිද නිරයෙන් පිටත ද යොදුන් සියයක් ඈත විහිදී පවතී. අයෝමය යපියනෙන් නික්මෙන ගිනි දැල් අයෝමය පොළොවෙහි හැපී එම පොළොව ද විනිවිද නිරයෙන් පිටත ද යොදුන් සියයක් ඈත විහිදී පවතී. එහි බහාලන ලද නිරි සත්වයා අනේක වර්ෂ කෝටි සත සහස්‍රයක් මුලුල්ලෙහි මේ ගිනිදැල් අතර පිලිස්සෙමින් මහත් වූ කටුක රෞද්‍ර දුක් වේදනාවන් විඳී. යම්තාක් කාලයක් ඒ පාප කර්මය නො ගෙවේ ද, ඒ තාක් නොමැරෙයි.

මෙලෙස එම නිරි සත්වයා සය දිසාවෙන් නැගෙන ගිනි ජාලාවන්ගෙන් දැවෙමින් දරුණු දුක් විඳිමින් පැසෙන අතර අනේක වර්ෂ කෝටි සත සහස්‍රයක කාලයක් ගෙවී ගිය පසු ඒ මහා නිරයෙහි පෙරදිග දිසාවෙහි දොරටුව විවෘත වේ. එය දුටු නිරි සත්වයා ඒ දොර වෙත ශීඝ්‍රයෙන් දුවයි. එසේ දුවන නිරි සත්වයා ගිනියම් රතට රත් වූ අයෝමය පොළොවෙහි එරෙමින් බුර බුරා නැගෙන ගින්නෙන් එම නිරි සත්වයාගේ සිවිය ද දවයි. සම ද දවයි. මස් ද දවයි. නහර ද දවයි. ඇට ද දවයි. මෙලෙස මුළු සිරුරම ගිනි ඇවිලගෙන දැවෙමින් පැසෙමින් යමපල්ලන් විසින් වෑ කෙටේරි ආදියෙන් සසිමින් කොටමින් හුල් ආදියෙන් අනිමින් කරන්නා වූ මහත් වධ වේදනාවන් විඳිමින් එම

දෙරටුවෙන් එළියට යෑමට දුවයි. එසේ දුවන එම නිරි සත්වයා එම දෙරටුව වෙත ළඟා වීමට මනුෂ්‍ය වර්ෂ දහසක කාලයක් ගත වේ. මෙසේ දෙරටුව වෙත සමීප වෙත්ම දොර වැසෙයි. එයින් එම නිරි සත්වයා දුකට පත්ව අතිශයින් බිහිසුණු කටුක දුක් විඳින නමුත් අකුසල කර්මය නොගෙවෙන තාක් නොමැරෙයි.

මෙලෙස එම නිරි සත්වයා සය දිසාවෙන් නැගෙන ගිනි ජාලාවන්ගෙන් දැවෙමින් දරුණු දුක් විඳිමින් පැසෙන අතර අනේක වර්ෂ කෝටි සත සහස්‍රයක කාලයක් ගෙවී ගිය පසු ඒ මහා නිරයෙහි බටහිර දිසාවෙහි දොරටුව විවෘත වේ. එය දුටු නිරි සත්වයා ඒ දොර වෙත ශීඝ්‍රයෙන් දුවයි. එසේ දුවන නිරි එම සත්වයා ගිනියම් රතට රත් වූ අයෝමය පොළොවෙහි එරෙමින් බුර බුරා නැගෙන ගින්නෙන් එම නිරි සත්වයාගේ සිවිය ද දවයි. සම ද දවයි. මස් ද දවයි. නහර ද දවයි. ඇට ද දවයි. මෙලෙස මුළු සිරුරම ගිනි ඇවිලගෙන දැවෙමින් පැසෙමින් යමපල්ලන් විසින් වෑ කෙටේරි ආදියෙන් සසිමින් කොටමින් හුල් ආදියෙන් අනිමින් කරන්නා වූ මහත් වධ වේදනාවන් විඳිමින් එම දෙරටුවෙන් එළියට යෑමට දුවයි. එසේ දුවන එම නිරි සත්වයා එම දෙරටුව වෙත ළඟා වීමට මනුෂ්‍ය වර්ෂ දහසක කාලයක් ගත වේ. මෙසේ දෙරටුව වෙත සමීප වෙත්ම දොර වැසෙයි. එයින් එම නිරි සත්වයා දුකට පත්ව අතිශයින් බිහිසුණු කටුක දුක් විඳින නමුත් අකුසල කර්මය නොගෙවෙන තාක් නොමැරෙයි.

නැවත ද එම නිරි සත්වයා සය දිසාවෙන් නැගෙන ගිනි ජාලාවන්ගෙන් දැවෙමින් දරුණු දුක් විඳිමින් පැසෙන අතර අනේක වර්ෂ කෝටි සත සහස්‍රයක කාලයක් ගෙවී ගිය පසු ඒ මහා නිරයෙහි උතුරු දිසාවෙහි දොරටුව විවෘත වේ. එය දුටු නිරි සත්වයා ඒ දොර වෙත ශීඝ්‍රයෙන් දුවයි. එය දුටු නිරි සත්වයා ඒ දොර වෙත ශීඝ්‍රයෙන් දුවයි. එසේ දුවන නිරි එම සත්වයා ගිනියම් රතට රත් වූ අයෝමය පොළොවෙහි එරෙමින් බුර බුරා නැගෙන ගින්නෙන් එම නිරි සත්වයාගේ සිවිය ද දවයි. සම ද දවයි. මස් ද දවයි. නහර ද දවයි. ඇට ද දවයි. මෙලෙස මුළු සිරුරම ගිනි ඇවිලගෙන දැවෙමින් පැසෙමින් යමපල්ලන් විසින් වෑ කෙටේරි ආදියෙන් සසිමින් කොටමින් හුල් ආදියෙන් අනිමින් කරන්නා වූ මහත් වධ වේදනාවන් විඳිමින් එම දෙරටුවෙන් එළියට යෑමට දුවයි. එසේ දුවන එම නිරි සත්වයා එම

දෙරටුව වෙත ළඟා වීමට මනුෂ්‍ය වර්ෂ දහසක කාලයක් ගත වේ. මෙසේ දෙරටුව වෙත සමීප වෙත්ම දෙර වැසෙයි. එයින් එම නිරි සත්වයා දුකට පත්ව අතිශයින් බිහිසුණු කටුක දුක් විඳින නමුත් අකුසල කර්මය නොගෙවෙන තාක් නොමැරෙයි.

නැවත ද එම නිරි සත්වයා සය දිසාවෙන් නැගෙන ගිනි ජාලාවන්ගෙන් දැවෙමින් දරුණු දුක් විඳිමින් පැසෙන අතර අනේක වර්ෂ කෝටි සත සහස්‍රයක කාලයක් ගෙවී ගිය පසු ඒ මහා නිරයෙහි දකුණු දිසාවෙහි දෙරටුව විවෘත වේ. එය දුටු නිරි සත්වයා ඒ දෙර වෙත ශීඝ්‍රයෙන් දුවයි. එසේ දුවන නිරි එම සත්වයා ගිනියම් රතට රත් වූ අයෝමය පොළොවෙහි එරෙමින් බුර බුරා නැගෙන ගින්නෙන් එම නිරි සත්වයාගේ සිවිය ද දවයි. සම ද දවයි. මස් ද දවයි. නහර ද දවයි. ඇට ද දවයි. මෙලෙස මුළු සිරුරම ගිනි ඇවිලගෙන දැවෙමින් පැසෙමින් යමපල්ලන් විසින් වෑ කෙටේරි ආදියෙන් සසිමින් කොටමින් හුල් ආදියෙන් අනිමින් කරන්නා වූ මහත් වධ වේදනාවන් විඳිමින් එම දෙරටුවෙන් එළියට යෑමට දුවයි. එසේ දුවන එම නිරි සත්වයා එම දෙරටුව වෙත ළඟා වීමට මනුෂ්‍ය වර්ෂ දහසක කාලයක් ගත වේ. මෙසේ දෙරටුව වෙත සමීප වෙත්ම දෙර වැසෙයි. එයින් එම නිරි සත්වයා දුකට පත්ව අතිශයින් බිහිසුණු කටුක දුක් විඳින නමුත් අකුසල කර්මය නොගෙවෙන තාක් නොමැරෙයි.

## ❁ මහා නිරයෙන් නිදහස් වීම

මෙසේ අන්තඃ කල්පයක් ගත වූ පසු ඒ මහා නිරයෙහි නැගෙනහිර දෙරටුව විවෘත වේද, එබඳු කාලයක් වන්නේ ය. එය දුටු නිරි සත්වයා ඒ දෙර වෙත ශීඝ්‍රයෙන් දුවයි. එසේ දුවන නිරි එම සත්වයා ගිනියම් රතට රත් වූ අයෝමය පොළොවෙහි එරෙමින් බුර බුරා නැගෙන ගින්නෙන් එම නිරි සත්වයාගේ සිවිය ද දවයි. සම ද දවයි. මස් ද දවයි. නහර ද දවයි. ඇට ද දවයි. මෙලෙස මුළු සිරුරම ගිනි ඇවිලගෙන දැවෙමින් පැසෙමින් යමපල්ලන් විසින් වෑ කෙටේරි ආදියෙන් සසිමින් කොටමින් හුල් ආදියෙන් අනිමින් කරන්නා වූ මහත් වධ වේදනාවන් විඳිමින් එම දෙරටුවෙන් එළියට යෑමට දුවයි. එසේ

දුවන එම නිරි සත්වයා එම දෙරටුව වෙත ළඟා වීමට මනුෂ්‍ය වර්‍ෂ දහසක කාලයක් ගත වේ. හෙතෙම එම දෙරටුවෙන් නික්මෙයි.

## ❀ ගූථ නරකයෙහි වැටීම

ඒ මහා නිරයට අනතුරුව එක කාමරයකින් අන් කාමරයකට යන්නා සේ සියක් යොදුන් දිග පළල ඇති මහත් වූ ගූථ නිරය එක්වම පිහිටියේය. එම නිරි සත්වයා එහි වැටෙයි. එම නිරි සත්වයාගේ එක් පාදයක් අවීචියෙහි වෙයි. අනෙක් පාදය ගූථ නරකයෙහි වෙයි. සියක් යොදුන් දුර සිටින්නෙකුට වුව ද ආග්‍රහණය වුවහොත් හිස පැලී යන තරම් වූ දුර්‍ගන්ධයක් ඇත්තේ වේ. නිරි සත්වයා එහි පා තැබූ කල්හි ඒ ගූථ නිරයෙහි ඉදි කටු තුඩ සමාන මුව ඇති පණුවන් විසින් එම නිරි සත්වයා වට කරගෙන ඔහුගේ සිවිය සිඳිත්. සිවිය සිඳ සම සිඳිත්. සම සිඳ මස් සිඳිත්. මස් සිඳ නහර සිඳිත්. නහර සිඳ ඇට සිඳිත්. ඇට සිඳ ඇට මිදුළු දක්වා කති. එයින් එම නිරි සත්වයා දුකට පත්ව අනේක වර්‍ෂ කෝටි සත සහස්‍රයක කාලයක් අතිශයින් බිහිසුණු කටුක දුක් විඳියි. අකුසල කර්‍මය නොගෙවෙන තාක් නොමැරෙයි.

## ❀ කුක්කුල නරකයෙහි වැටීම

ඒ ගූථ නරකයට අනතුරුව කුක්කුල (උණු අළු) නරකය එක්වම පිහිටියේ වෙයි. එය ද සියක් යොදුන් දිග පළල ඇතිව මහත් කුලු ගෙවල් පමණ අඟුරුවලින් පිරී මත්තෙහි ගිනි අළුවලින් වැසී ඇත්තේ වේ. එහි වැටෙන නිරි සතුන් අමු ධාන්‍ය ගොඩක් මත දැමූ හී වැල් සේ පතුළටම එරී යති. එම නිරිසත්වයා එහි වැටී අනේක වර්‍ෂ කෝටි සත සහස්‍රයක කාලයක් තියුණු වූ, කටුක වූ, දුක් වේදනාවන් විඳී. ඒ පාප කර්‍මය යම්තාක් නො ගෙවී පවතී ද, ඒ තාක් නොමැරෙයි.

## ❀ කටු ඉඹුල් වන නරකයෙහි වැටීම

එම කුක්කුල නරකයට අනතුරුව යොදුනක් පමණ උස නැගුණු අඟල් දහසයක් දිග අයෝමය කටු ඇති, ගිනි ගෙන අතිශයින් දිලිසෙන

මහත් වූ කටු ඉඹුල් වන නරකය පිහිටියේය. කුක්කුල නරකයෙහි පැසුණු එම නිරිසතා එම කටු ඉඹුල් වන නරකයෙහි වැටෙයි. එහි දී ගිනිගෙන දිළිසෙන භයානක රාක්ෂයෝ එම නිරිසත්වයා අල්ලාගෙන ගිනිගෙන දිළිසෙන යකඩ මුගුරුවලින් තල තලා කටු ඉඹුල් වෘක්ෂයන්හි නංවති. බස්වති. ඔවුන් එම වෘක්ෂයන්හි නගින විට එහි ඇති කටු පහළට හැරෙයි. නිරි සත්වයන් එහි ඇමිණෙමින් සිරුර විනිවිද යමින් මහත් දුක් විඳිමින් නගිති. නැවත පහළට බසින කල්හි එම වෘක්ෂයන්හි කටු ඉහලට හැරෙයි. එවිට ද එහි ඇමිණෙමින් සිරුර විනිවිද යමින් මහත් දුක් විඳිමින් බසිති. එම නිරිසත්වයා එහි වැටී අනේක වර්ෂ කෝටි සත සහස්‍රයක කාලයක් තියුණු වූ, කටුක වූ, දුක් වේදනාවන් විඳී. ඒ පාප කර්මය යම්තාක් නො ගෙවී පවතී ද, ඒ තාක් නොමැරෙයි.

## ❁ අසිපත්‍රවන නරකයෙහි වැටීම

එම කටු ඉඹුල් වනයට අනතුරුව කඩු වැනි තියුණු කොළ ඇති අසිපත්‍ර වන නම් නරකය එක්වම පිහිටියේය. එම නිරි සත්වයා මේ නරකයෙහි වැටුණු කල්හි එම සත්වයන්ගේ කර්ම බලයෙන් හමන කර්මජ සැඩ සුළඟක් හේතුවෙන් චංචලව වැටෙන්නා වූ එම වෘක්ෂයන්හි පත්‍රයෝ එම නිරි සත්වයන්ගේ අත්, පා, කන්, නාසා සිඳිති. පුවරුවක තබා කොටන මස් සෙයින් ඔවුන්ගේ සිරුරු නිරන්තරයෙන් වසින්නා වූ ආයුධ වර්ෂාවන්ගෙන් කෙටෙති. එයින් පලා යන විට අයෝමය පවුරක් පැන නැගී වට ආවරණය කරයි. එම නරකයෙහි බිම ද මුවහත් ඇති දැලිපිහිය තල මෙන් වූ පත්‍රයෝ උඩුකුරුව පහළ වෙති. එම නිරිසත්වයා එහි වැටී අනේක වර්ෂ කෝටි සත සහස්‍රයක කාලයක් තියුණු වූ, කටුක වූ, දුක් වේදනාවන් විඳී. ඒ පාප කර්මය යම්තාක් නො ගෙවී පවතී ද, ඒ තාක් නොමැරෙයි.

## ❁ වේතරණී ගංගාවෙහි වැටීම

එම අසිපත්‍රවන නරකයට අනතුරුව තඹ ලෝදියෙන් පිරුණු වේතරණී නම් මහත් ගංගා නරකය පිහිටියේය. යමපල්ලන් විසින් ගිනිගෙන දිළිසෙන කඩු, පිහි, තෝමර, භෙණ්ඩිමාල, මුග්ගර ආදියෙන්

පහර දෙති. විදිති. තලති. එයින් නිරි සත්වයන් ඉවසිය නොහැකිව මේ වේතරණී ගංගා නරකයෙහි පතිත වෙයි. එම නදියේ ඉවුරු දෙකෙහි වේවැල් කුස තණ ආදියෙන් ගැවසී ඇත්තේ වේ. මධ්‍යයෙහි අයෝමය වූ කර වැල් හා පියුම් පත් ඇත්තාහ. යට මුවහත දැළිපිහියා වැනිය. නිරි සත්වයන් එහි දිය සුළියක ගිලී පතුළටම බැස ඇති කර වැල් හා පියුම් පෙතිවල මුවහතින් සිඳී බොහෝ කාලයක් ගත වූ පසු උඩට මතුවෙයි. ඉන් පසු ගඟ දියෙහි ඉහළ පහළ ගෙන යනු ලැබීමෙන් තියුණු පොකුරුපතින් (නෙළුම් කොළ) කපනු ලැබීමෙන් ද, කර වැල් කටු ඇනීමෙන් ද, කුසතණවලින් සිඳිනු ලැබීමෙන් ද, වේවැලින් අඳිනු ලැබීමෙන් ද මහත් දුකට පත් වෙති. මෙලෙස අනේක වර්ෂ කෝටි සත සහස්‍රයක කාලයක් තියුණු වූ, කටුක වූ, දුක් වේදනාවන් විඳී. ඒ පාප කර්මය යම්තාක් නො ගෙවී පවතී ද, ඒ තාක් නොමැරෙයි.

## ❁ ලෝහගුලි ගිල්වීම

ඉක්බිති යමපල්ලන් විසින් එම නිරිසතා ගිනිගෙන දිළිසෙන කඩු, පිහි, තෝමර, හෙණ්ඩිමාල, මුග්ගර ආදියෙන් ඇන මත්ස්‍යයන් මෙන් විද අයෝමය බිලි කටුවලින් අමුණා ඇද ගොඩට ගෙන ගිනිගෙන දිළිසෙන යපොළොවෙහි හොවා 'එම්බා පුරුෂය, කුමක් කැමැත්තෙහි ද යැයි විමසති.

එම නිරි සත්වයන්ට මුලින් නිරයෙහි වැටුණු තැන් පටන් එම නිරි සත්වයාට මෙතෙක් කල් අපමණ කාලයක් දුක් විඳින නමුත් බත් ඇටයක් තරම් අහරක් හෝ පිණි පොදක් තරම් පානයක් ලැබී නැත. එබැවින් නිරිසත්වයා ස්වාමීනි, කුසගින් ඇත්තෙමි යැයි කියයි. එවිට යමපල්ලන් විසින් ගිනිගෙන දිළිසෙන අයෝමය අඬුවලින් ගිනිගෙන දිළිසෙන යගුළි ගෙනවිත් ළං කරති. නිරි සත්වයා එම ලෝහගුලි දැක කාරණය තේරුම් ගෙන එයින් තැතිගෙන ඇස් හා මුව තදින් පියා ගනී. එවිට යමපල්ලන් විසින් ගිනිගෙන දිළිසෙන අඬුවෙන් එම නිරි සත්වයාගේ මුව විවර කොට ගිනියම් වූ ලෝහගුලි මුඛයෙහි බහාලති. එයින් එම නිරිසතාගේ තොල් ද දවයි. කට ද දවයි. උගුර ද දවයි. ළය ද දවයි. බඩවැල් ද අතුණුබහන් ද දවාගෙන අධෝ භාගයෙන් නික්මෙයි. එම නිරිසත්වයා එහි අනේක වර්ෂ කෝටි සත සහස්‍රයක කාලයක් තියුණු

වූ, කටුක වූ, දුක් වේදනාවන් විඳී. ඒ පාප කර්මය යම්තාක් නො ගෙවී පවතී ද, ඒ තාක් නොමැරෙයි.

## ❁ ලෝදිය පෙවීම

ඉන් පසු යමපල්ලන් විසින් එම නිරිසතාගෙන් එම්බා පුරුෂය, කුමක් කැමැත්තෙහි ද යැයි විමසති. එවිට නිරිසත්වයා ස්වාමීනි, පිපාස ඇත්තෙමි යැයි කියයි. එවිට යමපල්ලන් විසින් ගිනිගෙන දිළිසෙන අයෝමය භාජනවලින් ගිනිගෙන දිළිසෙන ලෝදිය ගෙනවිත් ළං කරති. නිරි සත්වයා එම ලෝදිය භාජන දක කාරණය තේරුම් ගෙන එයින් තැතිගෙන ඇස් හා මුව තදින් පියා ගනී. එවිට යමපල්ලන් විසින් ගිනිගෙන දිළිසෙන අඬුවෙන් එම නිරි සත්වයාගේ මුව විවර කොට ගිනියම් වූ ලෝදිය මුඛයෙහි බහාලති. එයින් එම නිරිසතාගේ තොල් ද දවයි. කට ද දවයි. උගුර ද දවයි. ළය ද දවයි. බඩවැල් ද අතුණුබහන් ද දවාගෙන අධෝ භාගයෙන් නික්මෙයි. එම නිරිසත්වයා එහි අනේක වර්ෂ කෝටි සත සහස්‍රයක කාලයක් තියුණු වූ, කටුක වූ, දුක් වේදනාවන් විඳී. ඒ පාප කර්මය යම්තාක් නො ගෙවී පවතී ද, ඒ තාක් නොමැරෙයි.

මෙසේ එම නිරි සත්වයන් පඤ්චවිධ වධ බන්ධනයෙහි පටන් ලෝදිය බීම දක්වා අනුලෝම වශයෙන් ද, ලෝදිය බීමෙහි පටන් පඤ්චවිධ වධ බන්ධනය දක්වා ප්‍රතිලෝම වශයෙන් ද ප්‍රමාණාතික්‍රාන්ත වූ නිරා දුක් විඳිති. එහි ඇතැම් සත්වයෙක් පඤ්චවිධ වධ බන්ධන කර්ම පමණකින්ම නිරය දුකින් මිදෙති. ඇතැම් සත්වයෙක් දෙවැනි තුන්වැනි කර්මවලින් නිරය දුකින් මිදෙති. ඇතැම් සත්වයෙක් තඹ ලෝදිය බීම දක්වා සියලු දුක් විඳ නිරය දුකින් මිදෙති. කර්ම විපාක ගෙවී අවසන් නොවූ කල්හි යමපල්ලන් විසින් ඔවුන්ව අල්ලාගෙන නැවත ද මුල් දෙරටුවෙන් අවීචියෙහි බහාලති. එවිට පෙර සේම එම නිරිසත්වයා අනේක වර්ෂ කෝටි සත සහස්‍රයක කාලයක් තියුණු වූ, කටුක වූ, දුක් වේදනාවන් විඳී. ඒ පාප කර්මය යම්තාක් නො ගෙවී පවතී ද, ඒ තාක් නොමැරෙයි.

මෙහි දී භාග්‍යවතුන් වහන්සේ පෙර වූ පුවතක් මෙසේ වදාළ සේක. යම රජුට මෙබඳු සිතක් විය. "**මිනිස් ලොව යම් කෙනෙක්**

**පව්කම් කරත් ද, ඔවුහු මෙබඳු නාන ප්‍රකාර වධ බන්ධනයන් විඳිනු ලබති. එබැවින් මම මිනිස් ලොව උපදින්නෙම් නම් යෙහෙක. අභීත් වූ සම්‍යක් සම්බුද්ධ වූ සර්වඥ සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළවන්නේ නම් යෙහෙක. මම ඒ භාග්‍යවතුන් වහන්සේ ආශ්‍රය කරන්නෙම් නම් යෙහෙක. ඒ භාග්‍යවතුන් වහන්සේ මට ධර්ම දෙශනා කරන්නේ නම් යෙහෙක. මම ඒ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අවබෝධ කරන්නෙම් නම් ඉතා යහපත්ය"** කියායි.

මහණෙනි, මම මෙම කාරණය අන් ශ්‍රමණයකුගෙන් හෝ බමුණකුගෙන් හෝ අසා නො කියමි. යම් පමණ අට මහ නරකයෝ වෙත් ද, ඒ සියල්ල තමන් වහන්සේ විසින්ම දැන ගන්නා ලද්දේ ය, තමන් විසින්ම දක්නා ලද්දේය, තමන් විසින්ම ප්‍රත්‍යක්ෂ කරන ලද්දේය. එයම මම කියමි"

භාග්‍යවතුන් වහන්සේ මේ දේශනාව වදාළ සේක. මෙසේ වදාළා වූ දෙව් මිනිසුන්ට මනාව අනුශාසනා කරන්නා වූ සුගතයන් වහන්සේ නැවත මේ ගාථාවන් ද වදාළ සේක.

**"චොදිතා දෙවදූතෙහි - යෙ පමජ්ජන්ති මාණවා,**
**තෙ දීඝරත්තං සොචන්ති - හීනකායූපගා නරා"**

දේවදූතයන් විසින් චෝදනා කරන ලද්ද වූ, යම් මනුෂ්‍යයෝ කුසල ධර්මයන් වැඩීමෙහි පමා වෙත් ද, ඔවුහු හීන ආත්මභාව සංඛ්‍යාත අපායට පැමිණ බොහෝ කාලයක් මුළුල්ලේ සෝක කරති.

**"යෙ ච ඛො දෙවදූතෙහි- සන්තො සප්පුරිසා ඉධ,**
**චොදිතා නප්පමජ්ජන්ති - අරියධම්මෙ කුදාචනං.**

මේ ලෝකයෙහි ශාන්ත භාවයට පැමිණි සත්පුරුෂ වූ යම් කෙනෙක් දේවදූතයන් විසින් චෝදනා කරන ලද්දහු ද, ඔවුහු ආර්‍ය ධර්මයෙහි කිසි කලෙකත් ප්‍රමාද නොවෙති.

**"උපාදනෙ භයං දිස්වා - ජාතිමරණසම්භවෙ,**
**අනුපාද විමුච්චන්ති - ජාතිමරණසඞ්ඛයෙ"**

ඔවුහු ජාතියට හා මරණයට කරුණු වූ තෘෂ්ණා දෘෂ්ඨි දැඩිව ගැනීම හේතුවෙන් බොහෝ කලක් සසර දුක් විඳීමට සිදුවන බැවින් එහි බිය දැක කාම උපාදනා දී සතර විධ උපාදනයන්ගෙන් වෙන්ව ඉපදීම හා මරණය යන දෙකෙන් වෙන් වූවා වූ පැමිණෙති.

**"තෙ ඛෙමප්පත්තා සුඛිනො - දිට්ඨධම්මාභිනිබ්බුතා,**
**සබ්බවෙරභයාතීතා - සබ්බදුක්ඛං උපච්චගු'න්ති"**

නිර්භීය ස්ථානයට පැමිණියා වූ, සුවපත් වූ, මේ ආත්මභාවයෙහි කෙලෙස් සන්සිඳීමෙන් නිවියා වූ සියලු වෛර හා භය ඉක්ම සිටියා වූ බුදු පසේබුදු මහ රහත් ආදී සත්පුරුෂ උතුමෝ සියලු දුකින් නිදහස් වූවාහු වෙති.

## ❁ මිලක්ක තිස්ස

පෙර ලක්දිව රුහුණු රට ගාමෙණ්ඩල මහා විහාරයට සමීපයෙහි වූ ගොදුරු ගම වැදි පවුලක උපන් **මිලක්කතිස්ස** නම් වැදි පුත්‍රයෙක් විය. ඔහු දිනක් පාසාම සිය ගණන් උගුල් ඇටවීම මළු තැබීමාදියෙන් බොහෝ සතුන් මරා එයින් ජීවිකාව කරයි. මේ අතර එක් දිනක තම ගෙයින් ගිනි හා ලුණු ගෙන වනයට ගොස් මුවෙකු මරා පුලුස්සා ඒ මස් අනුභව කොට පිපාසිතව පැන් පානය පිණිස එම විහාරයට පැමිණියේ ය. එම විහාරයෙහි මලුවක ආගන්තුකාදීන්ට පානය කිරීම පිණිස පැන් කල දසයක් දිනපතාම තබන ලද්දේ වේ. එහි පැමිණි එම වැදි පුත්‍රයා කල දසයම බලා පැන් නොදැක **"මෙපමණ භික්ෂූන් වසන විහාරයෙහි අසරණයෙකුට පිපාසය දුරුකර ගැනීමට ජලය ටිකක්වත් නැත"** යැයි භික්ෂූන්ට දෙස් නගන්නට විය. එම විහාර වාසී වූ **චුල්ල පිණ්ඩපාතික තිස්ස ස්ථවිරයන් වහන්සේ** එසේ දෙස් නගන කථාව අසා එම වැදි පුත්‍රයා සමීපයට වැඩ පිරුණු පැන් කළ දසයද දැක **"මෙතෙමේ ජීවමාන ප්‍රේතයෙකි"** යැයි සිතා **"උපාසකය පැන් බොනු කැමැත්තෙහි නම් බොව"** යැයි කියා කළය ඔසවා ඔහුගේ

දෝතට පැන් වත්කළේය. අහෝ කර්‍ම විපාකයක මහත, බොන බොන දිය රත් වූ කබලකට දමන්නාක් මෙන් වහා නැසෙයි. මෙසේ පැන් කල දසයම පානය කළ නමුත් ඔහුගේ පිපාසය නොසන්සිඳුණේ ය. ඉක්බිති මහ තෙරුන් වහන්සේ **"උපාසකය, නුඹ විසින් දරුණු පාප කර්‍මයන් කරන ලද්දෙහිය. දැනුදු ප්‍රේතයෙකු වූවෙහිය. මත්තෙහි විපාක ද බොහෝ විය හැකිය"** යැයි වදාළ සේක. ඉන් පසු වැදි පුත්‍රයා සත්ව ඝාතනය පිණිස ගත් සියලු උපකරණ බිඳ දමා නිවසට ගොස් අඹු දරුවන් ද බලා බන්ධනාගාර ගත සියලු සතුන් මුදා හැර නැවත තෙරුන් වහන්සේ වෙත පැමිණ තමා පැවිදි කරන ලෙස ඉල්ලා සිටියේය. තෙරුන් වහන්සේ පැවිද්ද රැක ගැනීමෙහි දුෂ්කර භාවය නන් අයුරින් වදාළේය. එවිට වැදි පුත්‍රයා **"මෙබඳු ප්‍රත්‍යක්‍ෂ කාරනයක් දැක පැවිදි නොවී ගිහිව කෙසේ විසිය හැකි ද?"** යැයි කියා නැවත ද යාඥා කොට පැවිදි බව ලබා ගත්තේය. ඉක්බිති වත් පිළිවෙත්හි යෙදී ධර්‍ම විනය ඉගෙන ගනිමින් සිටි අතර එක් දිනක් දේවදූත සූත්‍රයෙහි සඳහන් **"තමෙනං, භික්ඛවෙ, නිරයපාලා පුන මහානිරයෙ පක්ඛිපන්ති"** "මහණෙනි යමපල්ලන් විසින් එම නිරිසතු නැවත ද මහා නිරයෙහි බහාලති" යන්න අසන්නට ලැබීමෙන් මෙයින් පෙර විස්තර කළ ලෙසින් අවීචි මහ නරකයෙහි අනේක වර්‍ෂ කෝටි සත සහස්‍රයක් දුක් විඳ නැවත ද පඤ්චවිධ වධ බන්ධනය පටන් ලෝදිය පෙවීම දක්වා වූ නොසිතිය හැකි තරම් වූ බලවත් දුක් විඳි නිරි සත්වයා නැවත ද මහා නිරයෙහි බැස්සවීම පිළිබඳ අසා චුල්ල පිණ්ඩපාතික තිස්ස තෙරුන් වහන්සේගෙන් **"ස්වාමින් වහන්ස, මහා නිරය ඉතා භයානක ද?"** යැයි ඇසුවේය. එවිට මහ තෙරුන් වහන්සේ **"ඇවැත්නි එසේය, භයානකය"** යැයි වදාළේය. ස්වාමීනි එය බැලිය හැක්දැයි ඇසුවේය. එවිට මහ තෙරුන් වහන්සේ **"ඇවැත්නි බැලිය නොහැකිය. දුටුවාක් මෙන් දැනගැන්ම පිණිස එක් කරුණක් දක්වන්නෙමි"** යැයි වදරා එම සාමණේරයන් වහන්සේ ලවාම අමු ගල් තලාවක් මත රැස් කරවා තම ඍද්ධියානුභාවයෙන් මහා නිරයෙන් කලාමැදිරියෙකු තරම් වූ ගිනි පුපුරක් ගෙනැවිත් එම සාමණේරයන් වහන්සේ බලා සිටියදීම අමු දර ගොඩට දැමූ සේක. එම ගිනි පුපුර දර මත වැටීම ද, දර ගොඩ අළු වී යාම ද පෙර පසු නොවී එක විටම සිදුවිය. එයින් එම සාමණේරයන් වහන්සේ මහ තෙරුන් වහන්සේ වෙතින්ම කමටහන් ලබාගෙන විවේක තැනකට ගොස් භාවනා වඩා සිව්පිළිසිඹියා ඤාණ සහිතව අර්හත්වයට පත් වූ සේක. මෙම දේවදූත සූත්‍ර දේශනාව ලොව පහළ වන සියලු

බුදුරජාණන් වහන්සේලා අත නොහැර දේශනා කොට වදාරන අවිජහිත දේශනාවකි. මෙම දේශනාව අසා මඟ ඵල ලැබූ ප්‍රමාණය අප්‍රමාණ වෙති.

**දේවදූත සූත්‍රය නිමි**

## ☸ අවීචි මහා නරකය වටා පිහිටි ඔසුපත් නරක සොළොස

### 1. අබ්බුද නරකය

අබ්බුද නරකයෙහි දිග, පළල, උස, යොදුන් තුන්සියය බැගින් වේ. මෙහි හාත්පස ගිනි ගෙන දිලිසෙන නව යොදුන් ඝන වූ යකඩ පවුරකින් වට වී ඇත. මුදුනෙහි ද නව යොදුන් යකඩ පියනකින් වැසී ඇත. මෙම නිරයේ වසන නිරි සතුන් යමපල්ලන් විසින් ගිනි ගෙන දිලිසෙන හීයෙන් ද. ලෙබින් ද, ඇත්කොහොලින් ද, පාරා වලල්ලෙන් ද, දඬු මුගුරින් ද යැයි මෙසේ නොයෙක් ආයුධ වලින් අනිනු ලබන්නේ ඒවා ඉවසිය නොහැකිව මහ හඬින් හඬමින් පැසෙති.

මනුලොව වයෝවෘද්ධයන් හෙලා දක ඔවුන්ට පරුෂ වචනයෙන් බැණ භය සැක උපදවා තම බල පැවැත්වූවන්, කුලවාසීන්ගෙන් තමන්ට ගැති මෙහෙවර කම් කරගන්නවුන් හා මව්පිය, ගුරුවර, වයෝවෘද්ධයන්, ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් මිටි අසුන්වල සිටියදී උසසුන් මහසුන් පරිභෝග කළවුන් මෙහි උපදිති.

මනුලොව අවුරුදු සියයකට වරක් අබ ඇටය බැගින් පිර වූ කොටුවකින් එක් යාල් නව අමුණු සතර ලාස්සක් අබ ඉවත් කරන තරම් කාලයක් මෙහි ආයුෂ වේ.

## 2. නිරබ්බුද නරකය

මෙහි ද දිග, පළල, උස යොදුන් තුන්සියය බැගින්ය. නව යොදුන් පමණ යකඩ පවුරකින් වටය. මෙහි නිරි සතුන් ගව් තුනක් පමණ උසය. යමපල්ලන් විසින් එහි නිරි සතුන් ගිනි ගෙන දිලිසෙන යපොළොවෙහි බිම පෙරළා නාඹර තල් කඳක් තරම් වූ යකඩ උල් අත්හි හා පාදයන්හි ගසති. එයින් බොහෝ කලක් දුක් වින්ද පසු පපුවෙහි ද එවැනි උලක් ගසති. කලකට පසු යමපල්ලන් එම නිරි සතුන්ගෙන් කුමක් වුවමනා දැයි අසති. පිපාසය කී විට ලෝදිය පොවති. එයින් ඔවුන්ගේ උගුර ද, අතුණු ද, අතුණුබහන් ද දවා අධෝ භාගයෙන් ඒවා නික්ම යති. මෙසේ මහත් දුක් විඳිති.

මනුලොව දී රහමෙර තනා අනුන්ට දී අන් අය දුසිරිතෙහි යෙදවූවන් ද, කංසා අබින් වැනි මත්වන දෑ ගනුදෙනු කොට ඒවා අනුභව කොට උමතු වූවන් ද මෙහි පැසෙති.

මෙහි ආයුෂය විසිනව යාල එක් අමුණු තුන් පැල තුන් ලාස්සක් අබ පිරවූ කොටුවකින් අවුරුදු සියයකට එක් අබ ඇටය බැගින් ඉවත් කොට එම කොටුවේ අබ ඇට සියල්ල ඉවත් කිරීමට ගත වන කාලය තරම් වේ.

## 3. අබබ නරකය

මෙහි ද, පළල, උස පෙර නිරයන්හි මෙනි. මෙම නිරයෙහි ගිනි ගෙන දිලිසෙන යපොළොවෙහි තුන් ගව් උස නිරිසතුන් පසුපස ලුහු බඳවා යමපල්ලන් විසින් තල් කඳන් පමණ වූ යකඩ මුගුරු වලින් නිරි සතුන්ට පහර දී බිම හෙලා සුන් සුන් කොට විනාශ කරති. එහෙත් නැවත කර්ම බලයෙන් එතන එතනම උපදිති.

මනුලොව මිනිසුන්ට වද බන්ධන ආදිය කොට තළා මැරූවන් මෙහි උපදිති.

අබ ඇට පන්සිය අසූ එක් යාල් සොළොස් අමුනු එක් පෑල පස් ලාස්සක් ඇති කොටුවකින් අවුරුදු සියයකට එකක් බැගින් ඉවත් කොට එම කොටුවේ අබ ඉවර වන තරම් කාලයක් මෙහි ආයුෂ වේ.

## 4. අටට නරකය

මෙහි ද ප්‍රමාණය පෙර මෙනි. මෙම නිරයෙහි තුන් ගව් පමණ උස ඇති නිරි සතුන් බිම පෙරළා නව රියන් ගෙයක පලයක් තරම් වෑයෙන් සසිති. කුළු පමණ කෙටේරිවලින් පොලු ගසති. ඉක්බිති හිස යටිකුරු කොට පා උඩු කුරු කොට සිටුවා සසිති. කියතින් ලී ඉරන්නා සේ ඉරති. තෙබින් අනිති. ඒ නරක ආවාටය ලේ ගඟක් මෙන් වේ. ලෝහ පොළොවෙන් ගිනි ඇවිල එම නිරි සතුන්ගේ ශරීර කැපූ කෙටූ ඉරූ තැනින් ගිනි ඇවිලගෙන දවෙති.  මොහොතක් පාසා යමපල්ලන් විසින් සසින නිරිසතුන්ගේ ශරිර පිට සිවියෙහි පටන් ඇටමිදුලු දක්වා සසිත්. එම සැසි තැන් නැවත නැවත පිරෙයි. එම පිරෙන පිරෙන තැන් ගිනි ඇවිල ගනී.

මනුලොව දී බුද්ධෝත්පාද කාලයෙහි ඉපද තිසරණ පන්සිල්හි නොපිහිටා රත්නත්‍රයට නින්ද අපහාස කොට දේව ඇදහිලි ආදි මිසදිටු ගතුවන් මෙහි ඉපද මහත් දුක් විඳිති.

අවුරුදු සියයකට එකක් බැගින් අබ ඇට එකොළොස්දහස් හයසිය තිස් යාල් සතර අමුණු එක් පෑල එක් ලාස්සක් කොටුවක පිරෙන තරම් කාලයක් මෙහි ආයුෂය වේ.

## 5. අහහ නරකය

මෙහි ද ප්‍රමාණය පෙර සේමය. මෙහි උපදින නිරි සතුන්ට යමපල්ලන් විසින් ගැල් නො අදිනා ගවයන් එළවන්නා සේ ගිනි ගෙන දිලිසෙන ආයුධවලින් ඇන වට කොට ගිනි ගෙන දිලිසෙන අඟුරු වලවල් වලට හෙළති. තුන් ගව් තරම් උස් වූ එම නිරි සතුන් එම වලෙහි ඉන දක්වා එරී දවෙමින් හිසෙහි ද මහත් පැසක අඟුරු තබාගෙන මහ

හඬින් හඬ හඬා පැසෙති. නැවත නැවතත් තමා ම හිසෙයි අඟුරු තබා ගනිමින් ලෝදිය බොමින් තමන්ගේ කර්ම බලයෙන් තමන් ම දුක් උපදවා ගනිති.

මනුලොව දී පින් කරන අය දැක අපිත් පින් කරන්නෙමු යි දන් දෙන්නෙමු යි අනුන්ගෙන් මිල මුදල් සහල් ආදිය සමාදන් කොට ඒවා කෙරෙහි ලෝභ සිත් උපදවා ස්වල්පයක් යොදවා දන් දුන්නා පින් කළා කියමින් ඒවා විකුණමින් කා බී හැඳ පැළඳ ජීවත් වූවන් ද අපි මෙසේ පින්කම් කළා යැයි ලොවටම කියාපාන්නන් ද මෙහි උපදිති.

අවුරුදු සියයකට එකක් බැගින් දෙලක්‍ෂ පනස් දෙදහස් සත්සිය විසිහත් යාල පසු අමුණු එක් පැල නව ලාස්සක් අබ ඇට කොටුවක පුරවන තරම් කලක් මෙහි ආයුෂ වේ.

## 6. කුමුද නරකය

මෙහි ද ප්‍රමාණය පෙර සේමය. මෙහි සිටින නිරි සතුන්ට දුක් දෙන යමපල්ලන් නිරි සතුන් කුමක් අවශ්‍ය දැයි විචාරා පිපාසය දැයි කී විට ගිනි ඇවිළ ගත් අයෝමය පොළොවෙහි පෙරළා ලෝදිය කැට කටට වත්කරති. එවිට නිරි සතුන්ගේ දිව ද, උගුර ද. හෘදය ද අතුණු ද, අතුණු බහන් ද, දවමින් එම ලෝදිය අධෝ භාගයෙන් නික්මෙති.

මනුලොව දී තුන් ලෝ සතුන් උතුම් නිවනට පමුණු වන බුදුරජාණන් වහන්සේලාට අභූත චෝදනා කළවුන් ද, නිවන් මඟ හැසිරෙන අය උදෙසා ඔවුන්ට නිවන් නැති දුගතිය විනා සුගතියක් නැතැයි. කී අය ද, ඇසට මිහිරි වූ බුද්ධ රූපයන් දැක සුවඳ මල් දුටු නිල මැස්සන් මෙන් අමනාප වූ අය ද බෝධි, චෛත්‍යාදිය දැක අමනාප වූවන් ද මෙහි උපදිති.

අවුරුදු සියයකට එකක් බැගින් සතලිස් සතර ලක්‍ෂ පනස්හතර දහස් පන්සිය හතළිස් පස් යාල් නව අමුණු සතර ලාස්සක් අබ ඇට කොටුවක පුරවන තරම් කලක් මෙහි ආයුෂ වේ.

## 7. සෝගන්ධික නරකය

මෙහි ද ප්‍රමාණය පෙර මෙනි. යොදුනක් තරම් උස් වූ ශරීර ඇති නිරි සතුන්ට යමපල්ලන් විසින් ගිනි ඇවිලගත් ආයුධ වලින් කොටති, අනිති, ගිනි ගෙන දිලිසෙන ලෝදිය කැට වත් කරති. මනුලොව සියලු සතුන් නිවන් දක්වන්නා වූ අනන්ත ගුණ ඇති බුදුරජාණන් වහන්සේලා දේශනා කරන ධර්ම රත්නයට එළු බණ, ගව බණ, වඳුරු බණ ආදී අපහාස කළවුන් හා කරවූවන් මෙහි පැසෙති. අවුරුදු සියයකට එකක් බැගින් නව කොටි තිස් එක්ලක්ෂ අනූදහස් නවසිය නව යාල් එක් අමුණු දෙපැල තුන් ලාස්සක් අබ ඇට කොටුවක පුරවන තරම් කලක් මෙහි ආයුෂ වේ.

## 8. උප්පල නරකය

මෙහි ද ප්‍රමාණය පෙර මෙනි. මෙහි පැසෙන නිරි සතුන්ගේ ශරීර තුන් ගව්වක් තරමය. යමපල්ලන් විසින් නාඹර තල් කඳන් තරම් වූ යමුගුරු වලින් දෙපා තලා ගිනි ඇවිල ගත් යකඩ පොළොවෙහි පෙරළා මුඛයෙහි ලෝදිය වත් කරත්. එයින් බලවත් දුක් පීඩා විඳිමින් කර්ම බලයෙන් නැවත එතන එතනම ඉපදෙමින් එලෙස දුක් විඳිති.

මනු ලොව දී සිල්වත් ගුණවත් එක් භික්ෂුවකට හෝ මහා සංඝයාට දෙස් පරොස් කී අය ද සංඝයා දැක මුන් එළු සමූහයක, ගොන් සමූහයක දී ලෙස අගෞරව කළා වූ අය ද මෙහි උපදිති.

අවුරුදු සියයකට එකක් බැගින් එක් නහුත අනූ හය කෝටි දහ අට ලක්ෂ දහ අටදහස් එකසිය අනූ දෙකක් යාල් සොලොස් අමුණු එක් පැල් ලාස් හයක් අබ කොටුවක පුරවන තරම් කාලයක් මෙහි ආයුෂය වේ.

## 9. පුණ්ඩරික නරකය

මෙහි ද ප්‍රමාණය පෙර මෙනි. මෙම නිරයෙහි යමපල්ලන් විසින් නාඹර පොල් කඳන් තරම් වූ යකඩ හා ආයුධ වලින් නිරි සතුන්ට එළව එළවා තලති. එවිට නිරි සතුන් මහ හඬින් හඬ හඬා ගිනි ඇවිළ ගත් යකඩ මත පිලිස්සෙමින් දුවති.

මනුලොව දී ආචාර ගුණ සම්පන්න මෛත්‍රී සිත් ඇති සිල්වතුන්ට ගසා තළා මැරූවන් මෙහි උපදිති.

අවුරුදු සියයකට එක බැගින් තිස්හත් නහුත විසිතුන් කෝටි හැටතුන් ලක්ෂ හැටතුන් දහස් හයසිය තිස් යාල් සතර අමුණු දෙපෑලකුත් ලාස්සක් කොටුවක අබ පුරවන තරම් කලක් මෙහි ආයුෂ වේ.

## 10. පදුම නරකය

මෙහි ද ප්‍රමාණය පෙර මෙනි. මෙහි නිරි සතුන්ගේ ශරීර යොදුනක් පමණය. යමපල්ලන් විසින් ගිනි ඇවිලගත් පොරවෙන් කොටා නාඹර තල් කඳන් සමාන යමුගුරුවලින් පයට ගසා ගිනි ඇවිලගත් බිම හෙළා කකියන ලෝදිය කටෙහි වක් කරති. එයින් එම නිරි සතුන්ගේ උගුර කට, අතුණු අතුණුබහන් ද සිරුරම ද ද ලෝදිය බැහැර යෙති. එතන එතනම කර්ම බලයෙන් මැරි මැරී උපදිති.

මනු ලොව දී මිනිසුන්ට රාජ අනින් හා තමා සිතා හෝ වධ බන්ධන කොට දඬු මුගුරින් තළා අතින් පයින් ඇන දුක් පීඩා කළවුන් හා කරවූවන් මෙහි උපදිති.

අවුරුදු සියයකට එක බැගින් සත්තිස් නහුත හැත්තෑ දෙකෝටි හැත්තෑ දෙලක්ෂ හැත්තෑ දෙදහස් එකසිය විසි හත් යාල් දහ හතර අමුණු දෙපෑල ලාස්සක් කොටුවක අබ පුරවන තරම් කලක් මෙහි ආයුෂ වේ.

## 11. ගූථ නරකය

මෙහි ද ප්‍රමාණය පෙර මෙනි. මෙම නිරයෙහි පිරී ඇති අසූචි දුර්ගන්ධය සියක් යොදුන් දුර සිටියවුන් ගේ හිස පැලී යන තරම් වේ කකිය කකියා පැසෙන ගූථ මූත්‍ර ආදිය පිරුණු මෙහි ඉදි කටු වැනි ලෝහ තුඩු ඇති ඔරු දඬු නැව් පමණ වූ පණුවෝ තුන් ගව් උස වූ නිරි සතුන් වට කොට සම පටන් මස්, නහර, ඇට, ඇටමිදුලු දක්වා කඩ කඩ කොට විදිති. එම නිරි සතුන්ම තම කර්ම බලයෙන් අසූචි පිඩු කොට කති. මූත්‍ර කුණු දිය බොති. යමපල්ලන් ගිනි ඇවිලගත් ආයුධ ගෙන නිරි සතුන්ගේ අත් පා කන් නාසා කපති. එහෙත් කර්ම බලයෙන් එතන එතනම මැරි මැරී ඉපද දුක් විඳිති.

මනුලොව දී දිළිඳු ව ඉපද පොහොසත් ගෙවලට ගොස් අපි දූන් දූප්පත් ය. මතුවට අපි ඔබලාගෙන් කාපු දෙයෙහි ද දුන් වී සහලෙහි ද ණය ගෙවමි. කෑ පතට මෙහෙ කරමි. එසේ කෑ දෙයෙහි ද ණය ගෙවා ගත නොහැකි වූ ජාතිවල විපාක වශයෙන් අසූචි කමි යැයි බොරු කියා අන් සතු දේ ගත්තවුන් ද, කෑ බතට මෙහෙ නොකළවුන් ද, ණය නැවත නොගෙව්වන් ද, මිත්‍ර ද්‍රෝහීන් ද, සම්මාදන් කළ මුදල් කෑවවුවන් ද, මිනිසුන්ගේ අත් පා කන් නාසා කැපූවන් ද මෙහි උපදිති.

## 12. කුක්කුළ නරකය

මෙහි ද ප්‍රමාණය පෙර මෙනි. මෙම නිරයෙහි ප්‍රාසාද තරම් වූ ගිනි අඟුරුවලින් හා උණු අළුවලින් පිරී ඇත්තේය. ගව් තුනක් තරම් උස වූ නිරි සතුන් එහි වැටීමෙන් මඩෙහි දමන ලද හී වැල් පතුළට බසින්නාක් මෙන් ගිනි අඟුරු අතරින් පතුළට බසී. ගිනි ඇවිලගත් එම නිරි සතුන්ගේ ශරීර ඇට, ඇටමිදුලු දක්වා පුපුරා දැවෙයි. එහෙත් කර්ම බලය අවසන් වනතුරු එතන එතනම ඉපදෙමින් දුක් විඳිති.

උණු දිය, උණු තෙල් යොදා සතුන් මැරුවන් ද, ගිනි තැබූවන් ද, ශ්‍රමණ බ්‍රහ්මණාදී සිල්වත් ගුණවත් උතුමන්ට කෙළ ගැසුවන් ද මෙහි උපදිති.

## 13. කොළහිඹු හෙවත් කටු ඉඹුල් වන නරකය

මෙහි ද ප්‍රමාණ පෙර මෙනි. මේ ඉඹුල් වන නරකයෙහි වේතරණී නම් ගං ඉවුරෙහි දහසක් බඹ ගස්වට සොලොස් අඟල් දිග ඇති කියත් බඳු වූ උල් කටු ඇති වනය ගිනි ගෙන දිලිසෙමින් පහන් රුක් මෙන් ඇවිල ගත්තේ වේ.

යොදුනක් පමණ උස ඇති, ගව්වක් තරම් දිග නිය ඇති කරත්ත රෝද තරම් වූ ඇස් ඇති අසූ රියන් ඇස් බැම ඇති යමපල්ලන් ගිනි ඇවිල ගත් නාඹර තල් කඳන් තරම් වූ යකඩ හා කුළුගෙඩි ගෙන එති.

මෙහි උපන් නිරි සතුන් ද උස ගව්, දෙගව්, තුන් ගව්, පමණ ශරීර ඇති ස්ත්‍රී පුරුෂයෝ වෙති.

යමපල්ලන් විසින් එම ස්ත්‍රීන්ගේ හිස සිට පා දක්වා ගිනි ඇවිලගත් ආභරණ පලඳවති. තල් කඳන් තරම් වූ සතරැස් වූ අටැස් වූ යකඩ මුගුරු වලින් පන්සිය වාරයක් තලා පහළට හැරී ඇති කටු ඇති ඉඹුල් රුක්හි නංවති. අනන්ත දුක් විඳිමින් හඬ හඬා එම රුක්හි උඩ නැග ස්ත්‍රිය ගීයක් කියයි.

එසේම ගිනි ගත් ආභරණ පැළඳගත් යමපල්ලන් විසින් පහර දෙනු ලබන පුරුෂයාට ස්ත්‍රියගේ ගී හඬ අසා ප්‍රේමයෙන් උඩ බලයි. එවිට යමපල්ලන් එම නිරිසතාට ද යකඩ වලින් පන්සිය වාරයක් තලා පහළට හැරුණු කටු ඉඹුල් ගස නංවයි. මෙසේ යමපල්ලන් පමුණුවන දුක් වලින් පීඩිතව ද ස්ත්‍රිය කෙරෙහි රාගයෙන් ඉඹුල් කටු ඇමිණී ශරීරය ඉරෙමින් එම ගසෙහි නගියි. එම නිරිසතා ස්ත්‍රිය සිටි තැනට යන විට ස්ත්‍රිය ගස අනෙක් පසින් පහළට බසී. නිරි සතු ද ස්ත්‍රිය කෙරෙහි රාගයෙන් පහළ බසින විට එම කටු ඉහළට හැරෙයි. ඒවා ඇනෙමින් ශරීර ඉරෙමින් පුපුරමින් ගිනි ඇවිළෙමින්, යමපල්ලන් පමුණුවන දුක් මධ්‍යයේ ගසේ පහළ බසියි.

මනුලොව දී තමන්ට කන්නට බොන්නට අඳින්නට ලබා දෙමින් දුක සැපයෙහි බැඳී සිටි තම පුරුෂයා කෙරෙහි ඇල්ම අත්හැර පර පුරුෂයන් කර ගිය ස්ත්‍රීන් ද, තම භාර්‍යාව කෙරෙහි සිත් ඇල්ම

අත්හැර පර ස්ත්‍රීන් කරා ගිය පුරුෂයන් ද, අලසව ජීවත් වූ පුරුෂයන් ද මෙහි උපදිති.

## 14. අසිපත්‍රවන නරකය

මෙහි ද ප්‍රමාණය පෙර මෙනි. මෙහි යොදුන් පමණ උස ඇති කඩු, පිහි, කිනිසි වැනි කොළ ඇති වනයක් වෙයි. ගිනි ගෙන ඇවිළෙන නිරි සතුන් අපි හෙවනට යමු යැයි එම කටු ඉඹුල් වනයේ ගස් යටට ගිය කල්හි එම සතුන්ගේ කර්‍ම බලයෙන් කර්‍මජ වාතයක් ඇති වී කඩු, කිනිසි, පිහය වැනි ගිනි ඇවිලගත් කොළ ගැලවී සතුන්ගේ ශරීර මත වැටෙති. එයින් ඔවුන්ගේ අත්, පා කන්, නාසා සිඳී කොටයක් මත තබා ඇති මස් ගොඩක් සෙයින් නිරන්තරයෙන් කැපී යයි.

මනු ලොව දී එළුවන්, කුකුළන්, හද මරා මස් කෑවවුන් ද, විකිණුවන් ද, වැදි, කොවුල්ව ඉපද සත්ත්ව ඝාතන කළවුන් ද, බිලි කොකු ආදියෙන් දැල් වලින් මසුන් අල්ලා මරා ජීවත් වූවන් ද මෙහි උපදිති.

## 15. ක්‍ෂාරොදිකා (ලුණු දිය) නරකය

මෙහි ද ප්‍රමාණය පෙර මෙනි. මෙම නිරයෙහි තඹ වන් පැහැ ඇති කල්පය හටගත් ද සිට ඇවිලගෙන අපවිත්‍ර මුත්‍රයෙන් පිරුණු කකියමින් පැසෙන ලවණ දිය දුම් දමමින් තිබේ. සියක් යොදුන් ඈත සිටියවුන්ගේ හිස පැලී යන තරම් දුර්ගන්ධය වේ. කර වැල් කටු, තියුණු මුවහත ඇති කඩු බඳු ආයුධ වලින් ද, කුසතණ වලින් ද, පිරී ඇත. එහි වැටුණු නිරිසතුන් එහි පතුළට ගිලී කටු ඇමිණී ආයුධ වලින් කැපී එම කැපුණු සිදුරු වූ තැන්හි එම ලවණ දිය වැදී දැවිලි හටගෙන එම තැන් ගිනි ඇවිල පිලිස්සෙමින්, උඩ එමින්, යට යමින්, අනේක වර්‍ෂ කෝටි ශත සහස්‍රයක් මුළුල්ලෙහි දුක් විඳිති.

මනු ලොව කාය බල, ධන බල, ආඥා බල යොදවා අශීලාචාර ස්ත්‍රී පුරුෂයන්ට වද හිංසා කොට තලා පෙළා මරා දුක් දුන්නවුන් ද,

සිල්වත් ගුණවත් අයට නින්ද අපහාස අමනාපකම් කළවුන් ද මෙහි උපදිති.

### 16. ලොහොකුම්භ නරකය

මෙහි දිග, පළල, උස, සැට යොදුන් පමණය, ගිනි ඇවිලගත් නව යොදුන් ඝන පවුරකින් වටය. උඩ යට පියන් පත් ද එපමණ ය.

කකියන දිය සැළියක බහා ලූ පරඬලා සේ නිරි සතුන් උඩ යට යමින් පැසී දුක් විඳිත්. මෙහි වැටුණු නිරි සතුන් අවුරුදු තිස් දහසක් යටට බසී. නැවත අවුරුදු තිස් දහසක් උඩ මතු වේ.

මනුලොව දී සෝවාන් ආදී ආර්‍ය උතුමන්ට අතින් පයින් පහර දුන්නවුන් ද, පොලු මුගුරින් තැලූවන් ද, සිල්වත් ගුණවත් අයට ආක්‍රෝශ පරිභව කළවුන් ද, තම ගේ දෙරට පැමිණ ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට මඳකුදු දන් නොදී මසුරු කම් කළවුන් ද මෙහි උපදිති. යමපල්ලන් විසින් හිස යටිකුරු කොට පා උඩු කුරු කොට දැමීමෙන් මෙහි දුක් විඳිති. ආර්‍ය භාවයට පැමිණි බිම්බිසාර රජු මැරූ අජාසත් රජු උපන්නේ ද මෙහි ය.

## ☸ සෙසු ඔසුපත් නරක

### 17. වේතරණී නරකය

මෙම නරකයෙහි දිග පළල උස සැට යොදුන් පමණය. මෙහි කකියන ලෝදියෙන් පිරී ඇත්තේය. මෙහි පතුලේ සිට නැගෙන ගිනි දැල් උඩ පියන වැද එයින් පිටතට ද නව යොදුනක් පැතිර පවතී. මෙහි ඇතුළත ගව් අඩ ගව් පමණ කියත් කඩු වැනි ආයුධ වැල් ගැවසී ඇති අතර යමපල්ලන් විසින් එහි උපන් නිරිසතුන්ට තල් කඳන් පමණ තරම් වූ සතරැස් යමුගුරෙන් හා කඩු ආදි ආයුධවලින් පහර දෙත්. ලෝහ දියෙහි ගිල්වති. එයින් යට ගිලුණු නිරි සතුන්ගේ වේ කටු, කර කටු, උල් ආදිය ඇනී, පැලී සිරුරු දෙකඩ වෙති. සුනු විසුනු වෙති. බොහෝ

කලක් එහිම ඉපදෙමින් දුක් විඳිති. එහි රළ වේගයෙන් උඩ යට යමින් පැසෙති.

මනු ලොවදී කාය බල, ධන බල, ආඥා බල යොදා දුබලයන්ට පීඩා කලවුන් ද, කුලවතුන්ට නින්දා කළවුන් ද, නිරපරාධයන් කෙරෙහි වරදවා පිළිපැදියවුන් ද, වෙහෙසූවන් ද මොවුහු මෙහි උපදිත්.

## 18. සෝණබාද නරකය

මෙහි දිග පළල උස පනස් යොදුන් පමණ ය. මෙහි ගිනි සිළු මෙන් රතු බල්ලෝ ද, සුදු, කළු, රන්වන් ආදී වරණ ඇති බල්ලෝ යොදුන් පමණ සිරුරු ඇත්තෝය. ගව් පමණ දළ ඇත්තෝය. ගව් තරම් කකුල් ඇත්තෝය. තුන් ගව් පමණ නිරි සතුන් ගිනි ඇවිලගත් යපොළොවෙහි පෙරලා වට කොට එම බල්ලන් විසින් එම නිරි සතුන්ගේ ඇට පමණක් ඉතිරි කොට ඉරා මස් කා දමති. නැවත නැවතත් කර්ම බලයෙන් උපදිති.

මනුලොවදි සිල්වත් ගුණවත් උතුමන් සුනඛයන් ලවා කෑවවුන්, දඬු මුගුරින් පහර දුන්නවුන් ද, දඩයම් පිණිස බල්ලන් ඇති කොට ආයුධ ගෙන සත්ත්ව දඩයම් කලවුන් ද, දියෙහි වසන සතුන් විෂ යොදා මැරූවන් ද, බිලී කොකු දැල් ආදියෙන් මසුන් මැරූවන් ද මඳු හබක් අටවා සත්ත්ව ඝාතන කරවූවන් ද මෙහි උපදිති.

## 19. ගිජ්ඣකාක නරකය

මෙහි ද දිග පළල උස පනස් යොදුන් ය. මෙහි මහත් ගැල් පමණ ගිජු ලිහිණියන් ද, යොදුන් පමණ බඳ ඇති ගව් පමණ දිග තුඩු ඇති ගව් පමණ දිග පියාපත් ඇති කවුඩන් ද, ඇතුන් සමාන විශාල උකුස්සන් ද වෙති. ගිනි ඇවිලගත් ලෝහ තුඩින් නිරි සතුන් එළව එළවා ලුහු බැඳ ඉර ඉරා නිරි සතුන් කති.

මනුලොව දී මසුරුව අනුන්ට කිසිවක් නොදුන්නවුන් ද, සිල්වතුන් පටන් සියල්ලන්ටම දෙන දේ වැළැක්වූවන් ද, ආර්‍ය්‍ය අනාර්‍ය්‍ය වූ ද සිල්වත් ගුණවත් අයට බැණ වැදුනවුන් ද, ප්‍රාණ වධ කළවුන් ද, කුලවතුන්ට හා ශිල්ප ශාස්ත්‍ර උගතුන්ට බැණ වැදුනවුන් ද මෙහි උපදිති.

## 20. සත්තිසුල නරකය

මෙහි දිග පළල උස තුන්සියයක් යොදුන් වේ. මෙහි යමපල්ලන් විසින් ගිනි ඇවිලගත් අවි ආයුධ වලින් තුන් ගව් පමණ වූ නිරි සතුන්ට අනිති. කොටති. ගිනි ඇවිලගත් පර්වතවල නංවති. පර්වත මුදුනට ගිය විට එම සතුන්ගේම කර්ම වේගයෙන් මහත් වාත වේගයෙන් හමා පර්වත පල්ලට හිස යටිකුරුව පා උඩුකුරුව වැටී තල් කඳන් තරම් වූ ගිනි ඇවිලගත් යවුල්හි ඇමිණී නිසොල්මන් ව හඬ හඬා මහත් දුක් විඳිති.

මනුලොව දී උල් ගසා ඌරන්, මුවන්, ගෝනුන්, මැරූවන් ද, දුනු හී ගෙන වනයට ගොස් උඩ සිටින වඳුරු, රිළව්, මොනරු, කුකුළු ආදී සතුන් මැරූවන් ද, සිල්වත් ගුණවත් අයට වද හිංසා කළවුන් ද මෙහි උපදිති.

## 21. බග්ගසිර නරකය

මෙය පනස් යොදුන් දිග පළල උස ඇත්තේය. මෙහි තුන් ගව් පමණ නිරි සතුන්ට යමපල්ලන් විසින් කඩු ගෙන කොට කොටා වධ පමුණුවති.

මනුලොව දී ඍද්ධිමතුන්ට, සිල්වතුන්ට, ගුණවතුන්ට, හා සතුන්ට වධ හිංසා පැමිණවූවන් මෙහි උපදිති.

## 22. ලෝකාන්තරික නරකය

මෙම නරකය සක්වළ තුනක් අතර අටදහස් යොදුන් පමණ වූ ද, දෙලක්ෂ සතලිස් දහසක් ඝන වූ පස් පොළොවෙන් යට ජලාන්තය දක්වා ගැඹුරට ඇත්තේය. ඒ නිරයට යට පොළොවක් නැත. උඩින් දෙව්ලොවක් නැත. හිරු සඳු ආලෝකයක් නොවැටෙන බැවින් අධික අන්ධකාරය. එහි නිරි සතුන් තුන් ගව් පමණය. පරඬලා පත් සේ වූ ශරීර ඇත්තෝ ය. හිස් මුදුනෙහි මුඛය ඇත. ඉදි කටු සිදුරු තරම් වූ කුඩා මුව සිදුරක් ඇත්තේය. කල්පයක් ආයුෂය වේ. දික් වූ නිය කුළු පමණ ය. සක්වළ ගලෙහි එම නියවලින් එල්ලී වවුලුන් මෙන් ඇවිදිති. අන් සතෙකු අත ගෑ වූ විට කෑමට ගොදුරක් යැයි සිතා එම නිරිසතාගේ ඇඟේ එල්ලී දෙදෙනාම ගිලිහී අධික සීතලෙන් යුතු මහාමේරු පර්වතය බැස්සවූ නමුත් ලුණු පිඩක් විසිරෙන තරම් අධික සීතල වූ අයිස් තට්ටුවේ වැටී කරකැවෙමින් පුපුර පුපුරා පොර බදිති. කර්ම බලය ඇති තාක් නොමැරෙති.

මනුලොව දී මෙලොව පරලොව නැතැයි මිසදිටු ගන්නවුන් ද, මව්පියන්ට වරද කළවුන් ද, නිවැරැද්දේ සතුන් මැරූවන් ද, තෙරුවන් මව්පියන් අත ගසා දිවුරා බොරු කියූවන් ද මෙහි උපදිති.

## 23. සීතිතරච්ඡ නරකය

මෙහි ද ප්‍රමාණය පනස් යොදුන් පමණය. මෙහි කඩි, සින්නන්, වලසුන් ගැවසුණේ වේ. එම සතුන්ට රිය සක් (කරත්ත රෝද) පමණ ඇස් ඇත්තේ වේ. ගව් පමණ දළ ඇත්තේ වේ. ඇතුන් පමණ ව්‍යාඝ්‍ර, වලස් ආදී සතුන්ගෙන් ගැවසුණහ. එහි උපන් නිරි සතුන් වට කොට කඩි සින්නෝ ඇටමිදුලු දක්වා කඩා කති. ව්‍යාඝ්‍රයෝ පැන පැන අල්ලා ගෙන ඇඟ මස් කති. වලස්සු නිරි සතුන් පසුපස එළවා අත්, පා, කන්, නාසා කඩා මස් කති. ශරීර කැඩුණු බිඳුණු තැන්වලින් ගඟක් මෙන් ලේ ගලයි. නැවත නැවතත් එහිම උපදියි.

මනුලොව දී පාලම් හේ දඬු කරවමු යැයි, ලැගුම් ගෙවල්, සංඝාරාම, අම්බලම් කරවමු යැයි ගෙවල, ගම්වල, රටවල ඇවිද සහල්,

රන්, මුදල් ආදිය එක් රැස් කොට ඒ නියම කළ පින්කම් නොකොට එම මිල මුදල් බඩු කෙරෙහි ලෝභ උපදවා අපි මේවා පරිභෝග කොට පසුව ණය ගෙවමු යැයි ඒවා කා නැසූවන් මෙහි ඉපද පැසෙති.

## 24. සීත නරකය

මෙය ද යොදුන් තුන්සියය බැගින් දිග, පළල, උස ඇත්තේය. මෙම නිරයෙහි කහ මල් පැහැ බඳු වූ, බදම දියක් බඳු ඉතා සීත වූ දියෙන් පිරුණේ ය. එම දියෙන් නැගෙන සීතල උඩ යපියන වැදී එයත් ඉක්ම සාරසියයක් ගව් පැතිර පවතී. එම සීතලෙන් එහි උපන් නිරි සතුන් එම සීත දියෙහි වැටී ඇට, නහර, මස්, සම් පුපුරා සුනු විසුනු වී යති. නැවත නැවත එතනම මැරි මැරී උපදිති.

මනුලොව දී දන ධර්ම නසා කඩ කළවූවන්, යස ඉසුරු ඇති අයගේ වස්තුනට හානි කරවූවන්, අන් අයගේ දිවි නසා ඔවුන් සතු දේ පැහැ ගත්තවුන් ද, ගෙවල් පැහැර සොරකම් කළවුන් ද මෙහි උපදිති.

## 25. අඟුරු මැල නරකය

මෙහි දිග, පළල, උස පනස් යොදුන් පමණ ය. ගින්නට දැමූ ඉටි ඉහිරෙන්නා සේ අඟුරු අතර දැවෙමින් මහ හඬින් හඬමින් කර්ම බලයෙන් තමන් ම අඟුරු හිසින් කණින් ද ගනිමින් පැසෙති. හිස සිට පාදන්තය දක්වා දැවි දැවී නැසී ගොස් නැවතත් කර්ම බලයෙන් උපදිති.

මනුලොව දී සතුන් මරා ඇඟ මස් කෑවවුන් ද, අනුන් දුන් මස් තම ගෙට ගෙන ගොස් පිස කන කල්හි මස් රසය ගුණය බොහෝ තෙල් ඇතැයි කී අය ද, ඌරන්, මුවන්, ගෝනුන් යනවා දැක මොවුන්ගේ ඇඟේ මස් බොහෝ යැයි කී අය ද, දිය මස්, ගොඩ මස් දැක සතුටු වූවන් ද මෙහි උපදිති.

## 26. දළකෙස්මැලි නරකය

මෙහි දිග, පළල, උස යොදුන් තුන්සියය බැගින් ය. මෙහි වසන කපුටන්ගේ ශරීර යොදුනක් පමණ විශාලය. ගව්වක් පමණ තුඩ ඇත්තේය. ගව්වක් තරම් උස් වූ පා ඇත්තේ වේ. ගව් පමණ දිග පියාපත් ඇත්තේ වේ. මෙසේ මහත් වූ කපුටන් හා මහත් වූ ඇතුන් ඩැහැගෙන යන උකුස්සන් වෙති.

මේ නිරයෙහි ඉතා වේගයෙන් පැසෙන, නිරි සතුන් හඬ හඬා දුක් විඳින අතර ඔවුන්ගේ දුක් වඩමින් යොදුන් දිග වූ තුඩින් කපුටෝ ඇස් උදුරා කති. ඇඟ මස් උකුස්සෝ ඇද කති. බඩවැල් ද ඇද කති. නැවත නැවත ද එතනම කර්ම බලයෙන් උපදිති.

මනුලොව දී තමන් නොගන්නා බඩුවල අගය වැඩි කළවුන් ද, ගන්නා බඩුවල අගය පහත හෙලූවන් ද, බඩු ඇති තැනින් නොකියා ගත්තවුන් ද, මහත් වූ ලාස්, පෙට්ටි තබාගෙන මඳක් දී බොහෝ මැන ඇත්තවුවන් ද, දර දිය ගෙනා අයට බොල් අකුරු මිශ්‍ර කොට දුන්නවුවන් ද, කුඩා ලාස්සෙන් දී මහත් ලාස්සෙන් මැන ගත්තවුන් ද, බඩු නොදෙන අදහසින් අන් අය දෙතුන් වතාවේ ඇවිද්දවා වෙහෙස කරවූවන් ද, මෙහි උපදිති.

## 27. පොකුරුපත් නරකය

මෙහි දිග, පළල, උස යොදුන් සාරසියයක් බැගින් වේ. මෙහි වසන කිනිතුල්ලන් ගව් දෙකක් තරම් විශාලය. ගව්වක් පමණ දළ ඇත්තේ වේ. ගව් පමණ කකුල් වේ. මෙහි උපන් නිරි සතුන් හඬව හඬවා මෙම කිනිතුල්ලන් නිරි සතුන්ගේ ඇට, ඇටමිදුලු දක්වා ඇද කති. කර්ම බලයෙන් එතන එතනම උපදී.

මනුලොව දී ද ගැබ්, මහා බෝධි ප්‍රතිමා, පිළිම දැක අගෞරව කළවූවන් ද, මහා සංඝයාට හා සිල්වතුන්ට බැණ වැදුනන් ද, කී නොකී දේ කියා සංඝයා බිඳවූවන් ද, මව්පිය, නැඳි, මයිලනු ආදී වැඩිහිටියන් ගරු කළ යුත්තන් දැක හුනස්නෙන් නොනැගිට ගරු නොකළවුන් ද,

ඔවුන් මිටි අසුන්වල හිඳිය දී තමන් උසසුන්, මහසුන් පරිභෝග කළවූවන් ද, තමා උසස් කොට අන් අය පහත් කොට කථා කළවූවන් ද මෙහි උපදිති.

## 28. අලුකුඩු නරකය

මෙහි දිග, පළල, උස පනස් යොදුන් පමණය. මෙම නිරයෙහි පනස් යොදුන් වූ පතුළ දක්වා ද, උඩින් සක්වළ මුව විට දක්වා ද ගිනි ඇවිලගත් උණු අලුවලින් පිරී ඇත. මෙහි උපන් නිරි සතුන් ගිනි අළු මත වැටී එහි ගිලී පතුළට බැස පුපුර පුපුරා ඇවිළගෙන දැවෙමින් නැවත උඩ මතු වෙති. ඔවුන්ගේ හිස මත මහත් වූ කළ ගෙඩි තරම් ගිනි පුපුරු වැටී පිලිස්සෙති. කර්‍මය ඉවර වන තෙක් නැවත නැවත එහිම ඉපද දුක් විඳිත්.

මනුලොව දී පොහොය දිනවල තොටවල රෙදි ඇපුල්ලූ රදවුවන් ද, පොහොය දිනයන්හි පර පණ නැසීමට බිළි කටු, ආයුධ සාද දුන්නවුවන් ද, ඔසප් බව නොකියා ස්වාමීහු සමඟ එක් යහනේ හොත් ස්ත්‍රීන් ද, ඔසප් බව දැනගෙන එම ස්ත්‍රීන් සමඟ එක් යහනේ හොත් පිරිමින් ද, දරු ගැබ් නැසීමට විෂ බෙහෙත් දුන්නවුන් ද, ඒ සඳහා විෂ අනුභව කළ ස්ත්‍රීන් ද මෙහි උපදිත්.

## 29. කිහිරි අඟුරු නරකය

මෙහි දිග, පළල, උස යොදුන් සත්සියය බැගින්ය. මෙහි යොදුන් පමණ දිග ඇති තියුණු කටුවෙන් ගැවසී ගත්තේ වේ. එම කටු අගින් නැඟෙන ගිනි දැල් උඩ යකඩ පියන විනිවිද ගොස් සියයක් යොදුන් දුර පැතිර පවති. මෙහි පැසෙන නිරි සතුන්ගෙන් සමහරක් ගිනි ඇවිලගත් නගුල්, විය ගස් කැවිටි හිස තබා මහ හඬින් හඬමින් කටු ඇනී පැසෙති. ඇතමෙක් සූක්‍ෂම වූ කටු මත තම දිව අතුරා ඒ මත දැවෙමින් පැසෙති. එතැනින් යන විට මහ හඬින් හඬමින් තම දිව ඇද පැදුරක් මෙන් දෙකට තුනට නමා අකුළා හිස තබා එම කටු ඇනෙමින් පැසෙති. ඇතමෙක් ගව්වක් තරම් උස කදුරු රැකක් හිස තබාගෙන මහ

හඬින් හඬමින් පැසෙති. ඇතමෙක් ගිනි ඇවිළ ගත් යකඩ කටාරම් හිස මත තබාගෙන හඬමින් පැසෙති. ඇතමෙක් ගිනි ඇවිළ ගත් දිලිසෙන ලෝදිය පිරවූ ලෝහ කටාරම් හිස ලබා පැසෙති.

මිනිස් ලොව දී ගවයන්ට දුක් දී කාලය ඉක්මව තෘණ කෑමට නොදී ගස් බැඳ සිටුවා සී සෑවා වූ අය නඟුල් වියගස් හිස තබා පැසෙති. දබර කොට අනුන්ගේ දිව ඇද කා මැරූ අය දිව කටු පිට අතුරා එය මත දැවී පැසෙති. සුනු සිරිගි මස් විෂ කා මැරුණවුන් කටට ගිනි අවිලගත් ලෝදිය වත් කරත්. කදුරු කා මැරුණු අය යකඩ කටාරම් හිස තබා ගෙන පැසෙති. ගෙල වැළලාගෙන මැරුණු අය ගිනි ඇවිලගත් ගව්වක් උස වැල් රැකක් හිස මත තබාගෙන මහ හඬින් හඬමින් පැසෙති.

## 30. රෝරුව නරකය

මෙහි රෝරුව නිරයෙහි දිග, පළල, උස යොදුන් දහස බැගින් ය. මෙහි යොදුන් පමණ උස ඇති, ගව් පමණ නිය ඇති, අසූ රියන් ඇස් බැම් ඇති කරත්ත රෝද තරම් ඇස් ඇති යමපල්ලන් නගරයක ප්‍රධාන දෙරටුවක් තරම් වූ වෑවලින් නිරිසතුන් සසිති. කැති ගෙන කොටති. ගිනි ඇවිලගත් කලු නූල් ගසති. ගිනි ඇවිලගත් යකඩ බිම හොවා කෙසෙල් කඳන් මෙන් දෙකඩ කොට කපති. එතනම නැවත කර්ම බලයෙන් උපදිති.

මනුලොව දී සිතුවම් කර්ම, වඩු කර්ම, ඉගෙන ලෝභයෙන් වැඩිපුර මුදල් ගැනීමට නිකැළැල් පිළිම කැළල් ඇති කොට නැවත ඒවා අලුත් වැඩියා කිරීම් වශයෙන් මිල ගත්තවුන් ද, කළ සේවයට වඩා වැටුප් ගත්තවුන් ද, දන්නා ශිල්පයෙන් නිවැරදිව වැඩ නොකොට වැඩියෙන් මිල ගත්තවුන් ද, ප්‍රතිපිළිම ගමින් ගමට රැගෙන ගොස් විකුණා ජීවත්වූවන් ද, අන් සන්තක බුදු පිළිම, ධාතුන් සොරකම් කළවුන් ද, ඒවා විකුණූ අය ද, කුසල් කිරීමට යැයි කියා වස්තු සපයා එයින් කුසල් නොකොට පරිභෝග කළවුන් ද මෙහි පැසෙති.

## 31. ශාප නරකය

මෙහි දිග, පළල, උස යොදුන් දහස බැගින් වේ. මෙහි වූ තඹ වන් දිය රසදිය මෙන් කකියා පැසෙයි. එහි වසන කුරුවණුන්ගේ දිග තුන්සියයක් යොදුන් වේ. හිස සියයක් යොදුන්ය. ශරීරයෙහි පළල් පනස් යොදුන්ය. මෙම නිරයෙහි තල ඇටයක් දැමීමට තරම්වත් ඉඩක් නැත්තේ වේ. මෙහි උපන් නිරි සතුන් කුරුවණුන් විසින් වට කොට සම්, මස්, නහර, ඇට, ඇටමිදුලු දක්වා කා දමන නමුත් කර්ම බලයෙන් නැවතත් එතනම ඉපද දුක් විඳිත්.

මනුලොව දී කකුළුවන්, සිලිබිල්ලන් මැරූවන් ද, දියෙහි වසන සතුන් වස විෂ යොදා මැරූවන් ද, දරුවන්, ස්වාමියන් කත්වා යැයි වස විෂ තැබූවන් ද, පිරිමින් මැරවීමට සතුරන් යෙදූ වූ අය ද, කේලම් කියා නිවෙස් වල අය භේද භින්න කළවුවන් ද මෙහි ඉපද පැසෙති.

## 32. පසුඝාත නරකය

මෙහි දිග, පළල, උස, තුන්සියයක් යොදුන් බැගින් ය. මෙහි ලෝදිය කකියා පැසෙයි. යමපල්ලන් විසින් ගිනි ඇවිල දිලිසෙන ආයුධ වලින් එහි උපන් නිරි සතුන්ගේ ඇඟ මස් කප කපා ගොඩ කෙරෙත්. නිරි සතුන්ගේ කැපූ තැන් ද සිරුර ද ලෝ දියෙන් දැවේ. නැවත නැවතත් එතනම කර්ම බලයෙන් උපදිති.

මනුලොව දී ගවයන් මරා මස් කෑවුන් ද, ගවයන්, මී ගවයන් ගෙල හිර කොට ගස් බැඳ හිසට පොරවෙන්, පොලු මුගුරින් පහර දී මරා මස් කොට විකිණූ අය ද මෙහි ඉපද පැසෙති.

## 33. මංසපේසි නරකය

මෙහි ද ප්‍රමාණ යොදුන් තුන්සියය බැගින් ය. මෙහි උපන් නිරි සතුන්ගේ ඇට නැති මස් වැදලි ශරිරයෙන් පැසෙති. මේ නිරයෙහි වූ ආජීව නම් යක්ෂ ගිජු ලිහිණින් විසින් ද, යක්ෂ උකුස්සන්, කබරයන්,

විසින් එම සත්ත්වයන්ගේ මස් වැදලි ඇද කන නමුත් කර්‍ම බලයෙන් එහිම ඉපදෙමින් පැසෙති.

මනුලොව දී ගවයන්, මී ගවයන් මරා සම ගසා මස් වැල් අමුණා, වේලා, විකුණූ අය ද, කා ඇවිද්ද වූ අය ද මෙහි උපදිති.

## 34. සාකුණික නරකය

මෙහි ප්‍රමාණ දිග පළල උස යොදුන් සාරසියය බැගින්ය. රත් වූ යකඩ කබලක තැබූ වෙඬරු පිඩක් දිය වී යන්නා සේ මෙහි වූ නිරි සතුන්ගේ ශරීර ගිනි ඇවිලගත් යකබල මත දිය වී වැගිරෙයි. නැවත නැවතත් කර්‍ම බලයෙන් එතනම උපදිත්.

මනු ලොව දී මදු, උගුල් අටවා, මර කණු අටවා, පක්‍ෂීන් අල්ලා, අතපය බිඳ ගෙනවුත් විකුණුවන් ද, ඉතිරි සතුන් මරා කෑවෝ ද මෙහි උපදිති.

## 35. ඕරබ්භික නරකය

මෙහි ප්‍රමාණය යොදුන් තුන්සියය බැගින් ය. මෙහි උපන් නිරි සතුනගේ මස් වැදලි යක්‍ෂයෝ ද, ගිජු ලිහිණියෝ ද, යක්‍ෂ උකුස්සෝ ද, කබරයින්ගේ කයෙහි මෙන් තිත් ඇති උකුස්සෝ ද ඇද ඇද එම සතුන් හඬව හඬවා කති. නැවත නැවත එතනම කර්‍ම බලයෙන් උපදිති.

මනුලොව දී එළුවන් ගස් බැඳ, බෙල්ල හිර කොට මරා, සම ගසා, මස් කොට විකුණා ඒවාම කමින් දිවි පැවැත්වූවන් මෙහි උපදිති.

## 36. අසිලෝම නරකය

මෙහි ද ප්‍රමාණ යොදුන් තුන්සියය බැගින්ය. මෙහි උපන් නිරි සතුනගේ ශරීරවල ලෝම දෙපැත්ත කැපෙන කඩු මෙනි. එම ලෝම

ගැලවී අහස්ගතව එම සතුන්ගේ ශරීරවලට වැටී කැපි කැපී පැසෙති. එයින් දුකට පත්වූවන් නොමිහිරි හඬින් හඬා පැසෙති.

මනුලොව දී ඌරන් ඇති කොට කඩුවෙන්, තෙබින්, පිහියෙන්, ඇන මරා මස් කා දිවි පැවැත්වූවන් මෙහි උපදිති.

## 37. සත්තිලෝම නරකය

මෙහි ද ප්‍රමාණ යොදුන් තුනසියය බැගින්ය. මෙහි වූ නිරි සතුන්ගේ ශරීර ගව් අඩ ගව් පමණය. එම නිරිසතුන්ගේ තෙප්, කොන්ත වැනි රෝම ශරීරයෙන් ඉගිළ ගොස් නැවත කයෙහි පතිත ව ඉරී යයි. එයින් දුකට පත්වූවන් මහ හඬින් හඬ හඬා බොහෝ කලක් පැසෙති.

මනු ලොවෙ දී දඩයමේ ගොස් මුවන්, අල්ලා තෙප්, කොන්ත ආදියෙන් ඇන මරා මස් කෑවවුවන් මෙහි පැසෙති.

## 38. උසුලෝම නරකය

මෙහි ද ප්‍රමාණ තුන්සියය බැගින් යොදුන් වේ. මෙහි නිරි සතුන්ගේ හිසින් කයෙන් ඊ දඬු වැනි කෙස් ලොම් ගැලවී ඉහල ගොස් ඔවුන්ගේ ගේ කයෙහි ම පතිත ව ඇනි ඇනී දුක් ඉවසාගත නොහී ඒ මේ අත දුවමින් හඬ හඬා පැසෙති.

මනුලොව දී රාජ අපරාධ කොට මරණීය දණ්ඩනය නියම වීමෙන් ඔවුන් වධකයන් විසින් ගෙන ගොස් අනින, කොටන, විඳින විට නොමැරෙනු දැක මෙතන මරු (නිල) ඇති තැන් යයි නියම කළවූවන් ද තම අතින්ම ඇන කොටා මැරූවන් ද, අන් මිනිසුන්ට වධ දී මැරූවන් ද මෙහි උපදිති.

## 39. රථාචායර්ක නරකය

මෙහි ද ප්‍රමාණ පෙර සේ ම වේ. මෙහි නිරි සතුන් ඉදි කටු තුඩ වැනි යකඩ කටු ඇනී එම කටු ශරීර විනිවිද යමින් ඒ දුකින් දුව පැන ඇවිදිමින් පැසෙති.

මනුලොව දී අශ්වයන් හික්මවීමට අශ්වාරෝහකම් ඉගෙන අශ්වයන්ට තලා පෙළා පහර දී ඇන වද දුන්නවුන් ද, මැරූවන් ද, ගවයන්ට, මී ගවයන්ට කෙවිටෙන් තලා උලින් ඇන බර පටවා රථ ඇද්දවූවන් ද මෙහි ඉපද අනේක වර්ෂ කෝටි ශත සහස්‍රයෙහි පැසෙති.

## 40. සූචක නරකය

මෙහි උපන් නිරි සතුන්ගේ උස දෙගව් පමණය. යමපල්ලන් ඔවුන්ගේ මුඛයෙහි ගිනි අවිලගත් ලෝදිය වත් කරත්. නැවත ඉදි කටු වැනි ගිනි ඇවිල දිලිසෙන කටු ඇනීමෙන් මහ හඬින් හඬ හඬා ඇවිද පැසෙති. කර්ම බලය ඇති තාක් එහිම ඉපදෙමින් දුක් විඳිති.

මනුලොව දී කේලම් කියා උනුන් බිඳවූවන් ද, කේලමින් ගම් භේද කළවූවන් ද මෙහි ඉපද පැසෙති.

## 41. ගාමකූටක නරකය

මෙහි නිරිසතුන්ගේ ශරීර දෙගව්වක් තරම් ය. මොවුන්ගේ අණ්ඩ කෝෂ මහත් විශාල ය. එය බිම තැබූ තැනින් සොලවාගත නොහැකිව ගිනි ගෙන දැවෙමින් මහත් දුක් විඳින අතර යක්ෂ වූ ගිජු ලිහිණින්, උකුස්සන්, කොක්කු, කවුඩු වැනි දරුණු සතුන් විත් ඉදී ගිය පලතුරු සාරා කන්නා සේ එම අණ්ඩ ඉර ඉරා කති. එයින් දුකට පත් නිරි සතුන් මහ හඬින් හඬමින් එම අණ්ඩය පිටම හිඳිති. නැවත එය පොළොවෙන් ඉගිළුණු පසු මහ හඬින් හඬමින් එය දැතින් ගෙන කර තබා ගෙන යන කල්හි ගිනි ඇවිලගත් යකඩ තුඩු ඇති උකුස්සන් එය ඇද ඇද ඉර ඉරා කති. එයින් මහත් දුක් විඳිමින් එය ඔසවාගෙන යා

නොහැකිව බිම තබා ලූ විට ගිනි ඇවිලගෙන පැසෙමින් දුක් විඳ නැව ඔසවා ගෙන යති. මෙසේ අණ්ඩ ව්‍යාධියෙන් මහත් සේ පීඩිත ව දුක් විඳිති.

මනුලොව දී රජ ඇමතියන් ව යුක්ති අයුක්ති දන "මා හැර යුක්ති කියන්නට අන් කවරෙක් ඇත් දැයි" මෙලෙස පිරිස් මැද තමන් හුවා දක්වා අල්ලස් ගෙන හිමියන් අහිමියන් කොට බොරුවෙන් නඩු විසඳූවන් ද හිමියන්ට අනිකක් කියා රවටා අල්ලස් ගෙන මෙලෙස රටවාසීන් රවටා වංචා කොට දිවි පැවැත්වූවන් මෙහි ඉපදී තම අණ්ඩය ගෙන යා නොහැකිව මහත් දුක් විඳිත්.

## 42. ගුථකූල නරකය

මෙහි උපන් නිරි සතුන් ගුථයෙහි වැටී හිස දක්වා ගැලී ගුථ අනුභව කෙරෙමින් අනේක වර්ෂ දහස් ගණන් නොයෙක් වාරයේ වලෙන් වල වැටුණු පණුවන් මෙන් දුක් විඳිති. මෙලෙස බුද්ධාන්තරයක් මෙහි පැසෙයි.

මනුලොව දී පරදර සේවනයෙහි යෙදුණ පුරුෂයන් ද මෙසේ දස භාර්‍යාවන් කෙරෙහි රාග සිත් උපදවා ඇඟ ස්පර්ශ කළවූවන් ද, රාග සිතින් බැලූවන් ද මෙහි ඉපද ගුථයෙහි පැසෙති.

## 43. මිළ්හගබ්භ නරකය

මෙම නිරයෙහි අසූචි පිරී ඇත්තේ වේ. එයින් නැගෙන දුර්ගන්ධය සියයක් යොදුන් ඇත සිටියහුගේ හිස පැලී යන තරම්ය. මෙහි උපන් නිරි සතුන් ගිනි ඇවිල කකියා පැසෙන එම අසූචි දැතින් ගෙන අනුභව කරති.

මනුලොව දී මහා සංඝරත්නය කෙරෙහි දුෂ්ටව දනට ආරාධනා කොට අපවිත්‍ර දෑ පිරවූ භාජන ගෙන ගොස් "**වහන්ස කැමති**

**තාක් අනුභව කරව**" යැයි සංඝයා කෙරෙහි වරදවා පිළිපැදි අය මෙහි ඉපද දුක් විඳිති.

මෙම මහ පොළොව අවුරුදු දහසකට අඟලක් බැගින් වැඩි වී ගව් හතර හමාරක් උස්ව වැඩෙන තරම් කාලයක් මෙහි ආයුෂ වේ.

## 44. නිච්ඡවි නරකය

මෙහි පැසෙන නිරි සතුන් ගව් අඩ ගව් පමණ වේ. නිරිසතුන්ගේ ශරීර හිස සිට පාදන්තය දක්වා සම ගැසූ කලක මෙන් ඇට සම් නැති මස් ගොඩක් මෙනි. මෙහි ඇති ලුණු මිශ්‍ර වූ ලෝදිය එම මස් වැදලි ශරීරවල වැද ලුණු දියෙන් දැවිල්ල හටගෙන ගින්නෙන් පිලිස්සෙමින් දුක් ඉවසිය නොහැකිව ඒ මේ අත දුවති. එසේ දුවන ඔවුන්ගේ මස් වැදලි ගිජු ලිහිණින්, උකුස්සන්, කොකුන් ලෝහ තුඩු වලින් ඇද කා දමති. මෙයින් පීඩිත ව කර්‍ම බලය අවසන් වන තෙක් එහිම ඉපදෙමින් දුක් විඳිත්.

මනුලොව දී තම ස්වාමියා ඉක්මවා පර පුරුෂයන් කරා ගිය ස්ත්‍රීන් ද, අන් පිරිමින් දෙස රාග සිතින් බැලුවා වූ ද, ඔවුන්ගේ පහස කැමති වූවා වූ ද, තම ස්වාමියාට අකීකරු වී ගමක් ගෙයක් පාසා ඇවිද අනාචාරයේ හැසිරුණු ස්ත්‍රීන් මෙහි වැටී දුක් විඳිත්.

## 45. මංගුලත්ථික නරකය

මෙහි නිරි සතුන්ගේ ප්‍රමාණ ගව් දෙගව් පමණ වෙත්. මෙහි ඇති දුගඳ නිරයෙන් පිටත ද සියක් යොදුන් පැතිර පවත්නේ ය. මෙහි වූ ගිජු ලිහිණි, උකුසු, කොක්කු වැනි දරුණු සතුන් නිරි සතුන් පසුපස එළව එළවා ලෝහ තුඩු බඳු තුඩුවලින් හඬව හඬවා ඇඟ මස් ඉරා කති.

මනුලොව දී යක්දෙහිකම් (මන්ත්‍ර ගුරුකම්) ඉගෙන ආයුධ ආදිය සාද ගමින් ගම ගොස් සෙනග රැස් කරවා අපගේ දෙවියෝ මහත් හාස්කම් ඇතැයි කියමින් ආරූඪ වූවෙකු මෙන් නටමින් ලෙඩ සුව

කරමි. පඬුරු දෙන්නේ නම් අල පතක දියක් මෙන් ලෙඩ සුව කරමි. රන් රිදී වස්ත්‍ර දෙන්නේ නම් ඉදිරියෙහි ලෙඩක් නො වැළඳෙයි, සැප ඓශ්චර්‍ය්‍ය බොහෝ වෙයි. යනුවෙන් බුදු සරණ බිඳුවා දෙවියන් පෙන්වා ලොව මුලා කොට ජීවත්වූවන් අනේක වර්‍ෂ කෝටි ශත සහස්‍රයෙහි මෙහි පැසෙති.

## 46. ඔකිලිනී නරකය

මෙම නිරයෙහි ගින්නේ බුර බුරා ඇවිලගත්, ගිනි අඟුරු මත පෙරළෙමින් ඔකිලිනී නම් කුණු දියෙන් තෙමෙමින් දැවෙමින් වකුටු ව නිරිසතුන් මහත් සේ දුක් විඳිත්.

මනුලොව අන් අය කෙරෙහි මහත් ඊර්‍ෂ්‍යා කොට ඔවුන් මත ගිනි අඟුරු දමා මැරූවන් මෙහි උපදී.

## 47. අසීසක නරකය

මෙහි උපන් නිරිසතුන් ගව් දෙගව් පමණ ය. මෙහි ඇති බුර බුරා නැගෙන ගිනි දැල්වලින් යුත් අඟුරු මත නිරි සතුන් පෙරළෙමින් පිලිස්සෙමින් දුක් විඳින අතර යක්‍ෂ ගිජු ලිහිණින්, කවුඩන්, කොකුන් අවිත් එම සතුන්ගේ ශරීර ඇද ඉර ඉරා කති. මොවුන්ගේ ඇස්, කන්, නාසා කඳෙහි ම වෙති.

මනුලොව දී සොරුන් අල්ලා රාජ දඬුවම් වශයෙන් හිස් සිඳ වූ අය හිස් සුන් සිරුරු ඇතිව මෙම නිරයෙහි වැටී දුක් විඳිති.

## 48. පරලෝභ නරකය

මෙහි නිරි සතුන්ගේ ශරීර යොදුනක් පමණය. මොවුන්ගේ සිරුර ඇතුළත ගිනිගෙන දැවෙයි. මුව විවර කළ පසු පන්දම් දැල්ලක්

මෙන් ගිනි දැල් පිටතට නික්මෙත්. මුඛය වැසූ පසු ඇතුළත සිදුරු තුළ ගිනි දැල් දිවෙමින් ගසක් මෙන් ඇවිලගෙන දැවෙති.

මනුලොව දී අනුන් ආහාර, දන, වස්ත්‍ර දෙනු දැක එයට ලෝභයෙන් මෙතෙක් නොදිය යුතුය යැයි වැළැක්වූවන් ද, දන් දෙන, තෑගි දෙන අය දැක වැළැක්වූවන් ද මෙහි උපදිති.

## 49. නච්චවාදක නරකය

මෙහි නිරි සතුන් ගව් දෙකක් තරම් ය. මෙම නිරි සතුන්ගේ සිරුරු ඇතුළත දැවෙමින් ඉවසාගත නොහී පය තැබූ තැන කටු ඇනෙමින් කෙටි කෙටී මහ හඬින් හඬමින් ඒ මේ අත දුවමින් පැසෙති.

මනුලොව දී ගී, නැටුම්, බෙර වාදන, සක් පිඹීම, දවුල්, තම්මැට්ටම්, උඩැක්කි වාදන ක්‍රම ඉගෙන තෑගි ලැබීමට ගමක් ගෙයක් පාසා ගොස් ඒවා වාදන කොට තෑගි ලැබූවන් ද, යමක් නොදුන් විට පරුෂ වචන කියා බලෙන් තෑගි ගත්තවුන් ද මෙහි ඉපද පැසෙති.

## 50. පාණහිංස නරකය

මෙහි උපන් නිරි සතුන්ට යමපල්ලන් විසින් අවි ආයුධ ගෙන අනිති. පඤ්ච විධ වධ බන්ධන පමුණුවති. මෙසේ නිරි සතුන් දර මැලයක් මෙන් නිසොල්මන් වී හිස ගිනි ගත් පර්වතයක් මෙන් දැවෙයි. මෙසේ මහ හඬින් හඬ හඬා පැසෙති. මෙසේ ගිනි ගත් යකඩ, බිම වැටී ඇති නිරි සතුන්ගේ ඇඟ මත සිට ගෙයක පලයක් තරම් වෑයකින් යමපල්ලන් විසින් සසිත්. සම සසිත්. මස්, නහර, ඇට, ඇටමිදුලු දක්වා සසිත්. පාප කර්මය නොගෙවේ ද එකල්හි යමපල්ලන් ගිනි ඇවිලගත් මහත් පොරව වලින් කපති. ලය දෙපළු කොට පලති. පර්වත තරම් වූ ඔලු පොලු වලින් තලති. නැවත නැවත එහිම කර්ම නොගෙවන තාක් උපදිති.

මනුලොව දී තමන් ම ප්‍රාණ වධ කළවුවන් ද, අනුන් ලවා කළවූවන් ද, අනුන්ගේ කීම අසා ප්‍රාණ වධ කළවූවන් ද මෙහි වැටී දුකට පත් වෙති.

## 51. කාකොළ නරකය

මෙහි උපන් නිරි සතුන් ගිජු ලිහිණි, කාක, උකුසු වැනි සතුන් විසින් ගව් තරම් වූ ලෝහ තුඩු වලින් ඇද කඩා කෑමෙන් මහත් දුකට පත් වෙති. ශරීර සිදුරු වූ කැඩුණු තැන්වලින් ගලන ලෙයින් ගංගා දියක් මෙන් පිරී ඉතිරී යයි.

මනුලොව දී රන් පනම්, වී, සහල් ණයට දී පසුව මාස අවුරුදු ගණන් ගත වූයේ යැයි කියා පොලී ගෙන අධර්මයෙන් දිවි ගෙවූවන් මෙහි පැසෙති.

## 52. වේලුනද නරකය

මෙහි යමපල්ලන් විසින් නිරිසතුන් ගිනි ඇවිලගත් යකඩ බිම හෙළා ගිනි ඇවිළ ගත් යමුගුරුවලින් අඹරති. පොරවෙන් පොලු ගසති. කියතින් කඩ කඩ කොට කපා මස් කුට්ටි ඉරා නිරි සතුන්ට ම කවති.

මනුලොව දී වැඩ කරන දසයන් වැඩ නොකොට සැඟවුණු විට ඔවුන් අල්ලා පොලු මුගුරින් තලා මස් උගුල්වා වද කළවුන් මෙහි පැසෙති.

## 53. සඤ්චිච්ච නරකය

මෙහි නිරි සතුන් මහ හඬින් හඬ හඬා පැසෙති. මනුලොව දී බල්ලන්, බළලුන්, ඌරන්, කුකුළන් මරා කෑවවුන් මෙහි ඉපද පැසෙති.

## 54. මහා ජාල නරකය

මෙම නිරයෙහි හය දිසාවෙන් ඇවිලගත් ගිනි දැල් අතර දැවෙමින් මහ හඬින් හඬ හඬා පැසෙන නිරිසත්වයෝ වෙති.

මනුලොව දී තම භාර්‍යාව, තම දරුවන්, තම සහෝදර සහෝදරියන්, මුනුබුරු මිනිබිරියන්, දාස දාසීන් සමඟ ඇසුරක් නැති පිටස්තර ස්ත්‍රී පුරුෂ අය කෙරෙහි ද අනියම් සම්බන්ධකම් කළා යැයි කථාවක්, සිනහවක්, දුටු කල්හි සැක උපදවා වරදවා තේරුම් ගෙන බැණ වැදුණු පහර දුන් ස්ත්‍රී පුරුෂයන් මෙහි ඉපද පැසෙති.

## 55. ඒක කල්ප නරකය

මෙහි උපන් නිරි සත්වයන්ගේ මුඛය විවර කොට යමපල්ලන් විසින් ගිනි ඇවිලගත් ලෝදිය වත් කරත්. එයින් එම සත්ත්වයෝ පිලිස්සී අළු වී ගොස් නැවතත් කර්‍ම බලයෙන් එතැනම උපදිති.

මනුලොව දී තම මවට, පියාට, ස්ත්‍රීන්ට, පුරුෂයන්ට, කුස හොත් දරුවන්ට, නැන්දා මාමාට, හිතමිතුරන්ට, උසස් කුල ප්‍රවේණියෙන් පැවත එන්නන්ට, තම ඥාතීන්ට කුලගොත් කියා අවමන් කොට බැණ වැදුණු ස්ත්‍රී පුරුෂයන් ද, පරුෂ වචන කියා හෙළා දැක්කවුන් ද මෙහි ඉපද පැසෙති.

## 56. ද්වීකල්ප නරකය

මෙම නිරයෙහි රහතන් වහන්සේලාට, මහ සඟරුවනට ආක්‍රෝශ කොට බැණ වැදුනන් ද, දස රාජ ධර්‍මයෙන් රජකම් කළ රජ දරුවන්ට බැණවැදුනන් ද, අනු සතුන්ට හා මහ පොළොවට බැණ වැදුනන් ද ඉපද දුක් විඳ පැසෙති.

## 57. තිකල්ප නරකය

අමනාපයෙන් අනාදරයෙන් මහා සංඝයාට දෙස් කියා ඇවිද්දවුන් ද, බැණ වැදුනන් ද මෙහි ඉපද පැසෙති. මෙහි ප්‍රමාණය පෙර මෙනි.

## 58. චතුකල්ප නරකය

අන් අයට දසව සිට ඉන් නොමි දී ඒ බව නොකියා සසුන් ගත වූවන් මෙහි ඉපද පැසෙති. ප්‍රමාණය පෙර මෙනි.

## 59. පඤ්චකල්ප නරකය

මෙහි ද ප්‍රමාණ පෙර සේමය. බුද්ධ ශ්‍රාවකයන් වී ධර්ම කථික ව ලාභ සත්කාර ලබනු සඳහා ධර්ම ගෞරවයක් නැතිව ගමක් ගෙයක් පාසා බණ කිය ඇවිද්දවුන් ඉපද පැසෙති.

## 60. සත්තකල්ප නරකය

මෙහි ද ප්‍රමාණ පෙර මෙනි. තමාගේ ඇසින් නොදුටු දෙය, නො ඇසූ දෙය, සැක ඇති නොවූ දෙය ගෙන තිසරණ පන්සිල් පිහිටා අටසිල් දසසිල් පිහිටා තමා දුටුවේය, ඇසුවේය යනාදි ලෙස බොරු කී රජවරු, බිසෝවරු, අන් ස්ත්‍රී පුරුෂයන් මෙහි ඉපද පැසෙති.

## 61. අට්ඨකල්ප නරකය

ප්‍රමාණ පෙර මෙනි. මෙහි කංසා රා අරක්කු ආදි සුරා හා මත්වන දෑ කා බී බණ කීවා වූ භික්ෂූන් ද, පණ්ඩිතයන් ද ඉපද දුක් විඳිති.

## 62. නවකල්ප නරකය

ප්‍රමාණ පෙර මෙනි. අල්ලස් ගෙන අනුන්ට ලාභ ඇති කළා වූ ස්ත්‍රී පුරුෂයන් මෙහි ඉපද පැසෙති.

## 63. දසකල්ප නරකය

ප්‍රමාණ පෙර මෙනි. අය බදු ගන්නා තැන්වල සිට එම බදු වැඩි කරවූවන් හා වැඩි කරවීමට කීවා වූ අය මෙහි ඉපද පැසෙති.

## 64. ඒකාදසකල්ප නරකය

මෙහි ද ප්‍රමාණ පෙර මෙනි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය ලියවා තිබූ දහම් පොත් සිඳ බිඳ දැමූවෝ ද, පොත්ගුල් විනාශ කරවූවෝ ධර්ම පොත්වල ධර්මය වෙනස් කළවුන් ද මෙහි ඉපද දුක් විඳිති.

## 65. ද්වාදසකල්ප නරකය

ප්‍රමාණ පෙර මෙනි. අන් සන්තක අඹු දරුවන්, දස දසීන්, පැහැර ගත්තා වූ අය ද, ගම් කුඹුරු, පුවක් වතු, පොල් වතු, කෙසෙල් වතු, පැහැර ගත්තවූවන් ද, අන් රජවරු සතු ගම්, රාජ්‍යයන් පැහැර ගත්තා වූ රජවරු ද මෙහි පැසෙති.

## 66. තේරසකල්ප නරකය

ප්‍රමාණ පෙර මෙනි. යම් රජෙක් හෝ රජ ඇමතියෙක් හෝ සෙනෙවියෙක් හෝ තම ආඥාව පතුරවා අන් රජුන් සන්තක නගර, ගමක්, පිටිසර ජනපදයක් හෝ නිවැරැද්දේ උදුරාගෙන තම අනසකට ගෙන පරිභෝග කළවුන් මෙහි පැසෙති.

## 67. චතුද්දසකල්ප නරකය

ප්‍රමාණ පෙර මෙනි. රජ නියමයෙන් ධාර්මික විනිශ්චයට පත් කල ඇමතිවරු එසේ නොකොට අල්ලස් ගෙන යුක්ති අයුක්ති කොට, අයුක්ති යුක්ති කොට අධර්මයෙන් අසාධාරණයෙන් වංචා කළ ඇමතියන් මෙහි ඉපද පැසෙති.

## 68. පඤ්චදසකල්ප නරකය

ප්‍රමාණ පෙර මෙනි. වෙහෙර විහාර සන්තක, බෝධි සන්තක, දගැබ් සන්තක, පිළිම ගෙවල් සන්තක, වී, හාල්, එලාඵල කෑවවුන් ද, ඒවා උදුරාගත්තවුන් ද මෙහි ඉපද පැසෙති.

## 69. සෝළසකල්ප නරකය

ප්‍රමාණ පෙර මෙනි. විහාර, දගැබ්, බෝධි, පිළිම ගෙවල් සන්තක දේ, සඟ සතු දේ, තමාගේ කියා දුන්නවුන් ද, එසේම විහාරාදිය සන්තක වූ රන්, රිදී, මිල මුදල්, තඹ, ලෝකඩ, යකඩ, ධන ධාන්‍ය, වී, සහල් ද, පිළිම තිර ජවනිකා තෙලි සම්, කොට්ට මෙට්ට, ඇතිරිලි, කලාල, ආදිය අල්ලස් ගෙන අනුන්ට තෑගි කොට දුන්නවුන් ද, තමා පරිභෝගයට ගත්තවුන් ද, ශ්‍රද්ධාවන්තයින් තුනුරුවන් උදෙසා කුඹුරු, වතුපිටි, ගහ කොළ පුදනු ලබන විට ඒවා සංඝ සන්තක කළ නොහැකි යැයි කියන්නෝ ද මෙහි ඉපද පැසෙති.

## 70. අවන්තර නරකය

ප්‍රමාණ පෙර මෙනි. මිළ මුදල්, රෙදි පිළි හෝ තමන් කැමති වන දෙයක් දෙමි යැයි කියා අනුන්ගෙන් වැඩපළ කරවා ගෙන කාර්‍ය්‍ය සිදු වූ පසු දෙමි කී දේ නොදී රැවටූවන් මෙහි ඉපද පැසෙති.

## 71. මහගුලු නරකය

ප්‍රමාණ පෙර මෙනි. තමන් හැදූ වැදූ මව්පියන් කෙරෙහි ද, ශිල්ප ශාස්ත්‍ර ඉගැන්නූ ගුරුවරුන් කෙරෙහි ද, බණ දහම් කියා දෙන ආචාර්‍ය්‍ය උපාධ්‍යයන් වහන්සේලා කෙරෙහි ද ආදර ගෞරව නොකළවුන් මෙහි ඉපද පැසෙති.

## 72. උච්චාරුළ්හ නරකය

මෙහි ප්‍රමාණ පෙර මෙනි. දගැබ්, මහා බෝධි, සංඝාරාම මලුවල ද, සීමා මාලකයන්හි ද, ඇත්, අස්, රථ, දෝලා, කුනම්වල නැගී ගියවුන් ද, කුඩ, තල් පත් ඉහලා ගියවුන් ද, වහන් පයලා ගියවුන් ද, හිස වසා ගියවුන් ද, හිස වසා ඇවිද්ද නිරෝගීන් ද මෙහි ඉපද පැසෙති.

## 73. ආරාම දූෂක නරකය

ප්‍රමාණ පෙර මෙනි. විහාර භූමියට අයත් මල්, ගෙඩි, උණ, දඬු, බට දඬු, ගත්තා වූ ස්ත්‍රී පුරුෂයන් ද, උළු, ගඩොල්වලින් සෑදීමට එම භූමීන්ගෙන් මිල නොගෙවා පස් ගත් අය ද මෙහි ඉපද පැසෙති.

## 74. ගීතග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. විහාරාරාමයන්ට පිදුවා වූ ද, පිදීමට සකස් කළා වූ ද, බෙර, දවුල් තම්මැට්ටම් ආදී පූජා භාණ්ඩ ද, සරසන ලද ඇත්, සිංහ ආදී රූප යොදා කරවන ලද පින් කැට ද, කළ ගෙඩි, ධජ පතාක, තොරණ ආදිය සිඳ බිඳ දැමූවන් ද, ඒවා පැහැර ගත්තවුන් ද මෙහි ඉපද පැසෙති.

## 75. ගෝතමුග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. විහාර ආරාම තුළ බුලත් සපා කෙළ ගසා අපිරිසිදු කරන ස්ත්‍රී පුරුෂයන් ද, ගවයින්, මී ගවයින් විහාරාමයන්හි බැඳ ගොම මුත්‍රවලින් අපිරිසිදු කරවූවන් ද, මලු කුණු කසලින් හැඩි කළවුන් ද, අඩුම වශයෙන් බුලත් නැට්ටක් තරම් දෙයකින් හෝ මලුපෙත්හි දමන්නෝ ද, පිළිම ගෙවල ගොම ගා ඉතිරිය මලුවේ දමා ගියවුන් ද මෙහි ඉපද පැසෙති.

## 76. මුක්තකරිසග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. විහාරාරාමවලට ගොස් දගැබ් මලු, බෝමළු, පිළිම ගේ, සංඝාරාම මලු, සීමා මලු ආදියෙහි මල මුත්‍රාදියෙන් ද, බුලත් කෙළ, බුලත් සප, සෙම සොටු, ලේ සැරව ආදී නොයෙක් අපවිත්‍ර දෑ දමා පිරිසිදු නොකර ගියා වූ ස්ත්‍රී පුරුෂයන් මෙහි ඉපද පැසෙති.

## 77. දූසමලග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. විහාර ආරාම භූමියෙහි ද, දගැබ් මහ බෝධි මලුවල, පිළිම ගෙය, සංඝාරාම මළුවල ද, රැස්ව හිඳ බත්, ධාන්‍ය, කැවිලි, පලතුරු, පොල්, කස පැන්, කෑවෝ ද, බීවෝ ද, අඩුම වශයෙන් හිස පැලඳි මලක් හෝ මළුවෙහි දමා නොහැමද ගියා වූ ස්ත්‍රී පුරුෂයෝ උපදිති.

## 78. අනුපට්ඨිතග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. තම මව්පියන්ට, ගුරුවරුන්ට, සත්කාර සම්මාන නොකරන ස්ත්‍රී පුරුෂයන් ද, තම ආචාර්‍ය්‍ය උපාධ්‍යායන් වහන්සේලාට සත්කාර සම්මාන නොකරන භික්ෂු සාමණේරයන් ද, මෙහි ඉපද පැසෙති.

## 79. කුම්භග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. බුද්ධොත්පාදයෙහි ඉපද දගැබ්, මහ බෝධි, පිළිම ගෙවල්, සංඝාරාම උදෙසා කුඩ, ධජ, පතාක පූජා නොකළවුන් ද, විහාරාරාමවලට පැන් පොකුණු සාද පූජා නොකළවූවන් ද, මල්වතු පොල් වතු වවා පූජා නොකළවූවන් ද, අම්බලම් නොසෑදවූවන් ද යන මොවුහු මෙහි ඉපද පැසෙති.

## 80. අභූතග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. අනුන්ගේ දෝෂයක් ඇසින් නොදැක, කනින් නො අසා, නොකී නොකළ දෙයට මෙසේ කියන ලද්දේ ය, මෙසේ කළේය යැයි බොරු චෝදනා කළවුන් ද, පවුකම් කොට තමන් එය නොකෙළෙමි බොරු කියූවන් ද මෙහි ඉපද පැසෙති. මඳ පවුකම් කළවුන් මඳ කලක් ද, බොහෝ පවුකම් කළවුන් බොහෝ කලක් මෙහි ඉපද පැසෙති.

## 81. විපරිතග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. ලැජ්ජා ඇතිවන ස්ථාන වැසුවොත් අපගේ තපස් බිඳී යන්නේ යැයි විලි නොවසා සිටියවුන් ද, කන බොන දැයක දූවිලි වැටුණු විට එය අනුභාවයෙන් සියුම් ප්‍රාණීන් නැසුවා වෙයි යැයි විපරිත දෘෂ්ටි ගත්තවුන් මෙහි ඉපද පැසෙති.

## 82. වාසිතග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. මෙහි නිරිසතුන්ගේ ශරීර අසූ යොදුනක් තරම්ය. හිස නව යොදුනකි. හොට විසිපස් යොදුනකි. දිව සත් යොදුනකි. රා අරක්කු ආදී මධ්‍යසාර පානය කළවුන් මෙහි කල්ප නවයක් පැසෙති.

## 83. සයනග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. මඩ, දූවිලි සහිතව බණ ඇසීමට ගොස් විහාරාරාමයන්හි ඇති වටිනා බුමුතුරුණු ආදියෙහි නිදා අපවිත්‍ර කළවුන් මෙහි ඉපද බුද්ධාන්තරයක් (අන්තඃ කල්පයක්) පැසෙති.

## 84. තේලග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. විහාරාරාම සතු වූ තුනුරුවන් උදෙසා පිදූ තෙල් ඇඟ ගැල්වූවන් හා පරිභෝග කළවුන් මෙහි අන්තඃ කල්පයක් පැසෙති.

## 85. නුට්ඨුහිතග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. පසේ බුදු, රහත් උතුමන්ගේ ද, සිල්වත් ගුණවත් භික්ෂු සාමණේරයන් වහන්සේලාගේ ද ශරීරයන්හි හටගත් වණ, කුෂ්ට, ගඩු, පොළ, හොරි ආදිය දැක කැත උපදවා කෙළ ගැසුවෝ ද, අනදර කළෝ ද මෙහි ඉපද පැසෙති.

## 86. පරභණ්ඩ පාර නරකය

ප්‍රමාණ පෙර මෙනි. යමෙක් හුණු ස්වල්පයක් තරම් දෙයක් හෝ කයින්, වචනයෙන් නොදුන් දෙයක් තමන් සොර සිතින් ගත්තේ ද ඔවුහු මෙහි ඉපද පැසෙති.

## 87. විහරග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. ස්ත්‍රීන් කෙරෙහි බලවත් ප්‍රේමයෙන්, ශෝකයෙන් හඬා වැලපී මළවුන් මෙහි ඉපද පැසෙති.

## 88. ක්‍රෝධග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. මිනිසුන් කෙරෙහි බොහෝ ක්‍රෝධ ඉපදූවන් මෙහි උපදිති.

## 89. එරුසග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. බොහෝ සෙයින් දැඩි මාන්නයෙන් අන් අය පහත් කර සිතුවෝ ද, අන් අය චණ්ඩාලයන් කොට සැලකුවෝ ද, දුටු දුටුවන්ට පරුෂ වචන කීවෝ ද, නැන්දා මාමා හා තම සැමියාට නොසැළකූ ස්ත්‍රීහු ද වහල් ආදීන්ට දුක් දී තලා මැරුවෝ ද මෙහි උපදිති.

## 90. විලාපග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. ප්‍රිය භාර්‍යාවන් කෙරෙහි සෙනෙහසින් හඬා වැලපී මළ පුරුෂයන් මෙහි ඉපද පැසෙති.

## 91. උභයග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. සඟරුවනට හා සිල්වතුන්ට නොගැළපෙන ලෙස අමනාපයෙන් ඇති ගුණ අකා මකා කථා කළවුන් ද, අන් අය ලවා එලෙස කළවූවන් ද අන් අයගේ කීම අසා එසේ කළවුන් ද මෙහි ඉපද පැසෙති.

## 92. උට්ඨාපිතග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. මව්පිය සතු ඉඩකඩම්, ගේ දෙර, ගම් බිම් ගහ කොළ, රන් රුවන් ආදිය ගෙන මව්පියන් ගමින්, ගේ දෙරින් නෙරපූවන් මෙහි ඉපද පැසෙති.

## 93. දිට්ඨානුගති නරකය

ප්‍රමාණ පෙර මෙනි. සිල්වතුන්ට, ගුණවතුන්ට අභූත චෝදනා කළෝ ද, එකී බස් ඇසුවෝ ද, ඒවා අදහාගෙන සිල්වතුන් කෙරෙහි වරදවා සිතුවෝ ද, මෙහි ඉපද පැසෙති.

## 94. හස්සාධිප්පාය නරකය

ප්‍රමාණ පෙර මෙනි. කෙළි සිනා පිණිස බොරු කිය කියා සිනාසෙමින් ඇවිද්දවුන් මෙහි ඉපද පැසෙති.

## 95. පථනදයග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. මහ සංඝයාට ද, සිල්වතුන්ට ද, වයසින් වැඩිහිටියන්ට ද ගුණවතුන්ට, ප්‍රඥවෙන් වැඩී ගියවුන්ට ද, කුලයෙන් උසස් වූවන්ට ද මඟ ඉඩ නොදී ගමන් කළවුන් මෙහි ඉපද පැසෙති.

## 96. උද්ධනජරික නරකය

ප්‍රමාණ පෙර මෙනි. තම සැමියාගේ මව්පිය ඥතීන් පැමිණි කල්හි ඇති සැටියෙන් ආහාර පාන, කැවිලි ආදියෙන් සංග්‍රහ නොකොට පිරිමැසූ ගැහැණුන් ද, තම පුරුෂයා සමඟ අමනාප ව "නුඹට උවමනා නම් නුඹගේ නෑයන්ට කැමති ලෙස සංග්‍රහ කරව" යැයි කියා ගරු සරු නැතිව හැසිරුණු ගැහැණුන් ද ගෙය අපිරිසිදුව හැඩි වී තිබිය දී නොහැමද මිනිසුන්ට ආහාර දුන් ගැහැණුන් ද, තම හිමියාට අකීකරු වූ ගැහැණුන් ද මෙහි ඉපද පැසෙති.

## 97. සුප්පසමුලග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. මෙහි නිරිසතුන් ගිනි ගෙන දිලිසෙන මොහොල් කුළු, වට්ටි ගෙන කලබලයෙන් කොටති. පොලති. පූ කරති. එකතු කරති. මෙසේ එක් කොට ගින්නෙන් දවති. මෙසේ කරමින් මහ හඬින් හඬ හඬාවා පැසෙති.

මනුලොව දී ගෙහිමියා දුක් සේ ඉපද වූ වී, හාල්, ධන ධාන්‍ය, බත් බුලත් ආදිය අටුවෙන්, කොටුවෙන්, මල්ලෙන්, පෙට්ටියෙන්, පැදුරෙන්, කලවිටින් ගරු සරු නැතිව දමූවන් ද, කොටන, පොළන, පාහින පූ කරන තැන දී වනෙන්, මොහොලෙන්, කුල්ලෙන්, පයින් විසිරූවන් ද, වී හා දිය වෙන් කොට තම හිමියාට සොරා අනාදරයෙන් කැමති කැමති තැන්වලට සිති සේ දුන්නවුන් ද යැයි මෙසේ නොමනා ලෙස සැමියා උපදවනා දෑ විනාශ කරන භාර්‍ය්‍යාවන් මෙහි ඉපද පැසෙති.

## 98. තේලහතු නරකය

ප්‍රමාණ පෙර මෙනි. මවගේ පියයුරු වලින් කිරි බී වැඩි, වැඩිවියට පැමිණි පසු මව්පියන්ට තළා ආදර ගෞරව නොකොට අකීකරුව මව්පියන් රවටා තම තමන් කැමති ලෙස කටයුතු කොට මව්පියන් හිමි ධනය, භෝග විනාශ කරමින් අපකීර්තියට පත් කරවමින් අවජාතක ව කටයුතු කරන අය මෙහි ඉපද පැසෙති.

## 99. සට්තග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. මනුලොව දී සිල්වතුන් කෙරෙහි ගරු සරුවක් නැතිව ගැටී විසූ මිනිසුන් ද, සිල්වතුන්ට අමනාප වූවන් මෙහි ඉපද පැසෙති.

## 100.යක්ඛග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. භවයෙන් භවයට වෛරයෙන් ආ ජාති වෛරයෙන් ද, බලි පිදේනි ආදිය ලබනු සඳහා ද, සිල්වත් ගුණවත් භික්ෂූන්ට ද, අන් සිල් ගුණ ඇතියන්ට ද ලෙඩ උපදවා නොයෙක් ගැහැට කොට මැරුවා වූ යක්ෂයින් ද, භූතයින් ද, පිසාචයින් ද, දෙවියන් ද, මෙහි ඉපද දුක් විඳිති.

## 101. මුසග්ගි නරකය

ප්‍රමාණ පෙර මෙනි. පස් පව් අකුසල් කොට බුදුන්, සඟුන්, දෙමාපියන්, හිරු, සඳු, දෙවියන්, මහා බෝධි, මහ පොළොව ගැන බොරු දිවුරුම් කළවුන් මෙහි ඉපද පැසෙති.

## 102.නිවාරික නරකය

ප්‍රමාණ පෙර මෙනි. අප පෙහෙවස් වසමු. බණ අසමු. ප්‍රතිපිළිම කරවමු. ඒ දඬු, අම්බලම් කරවමු. මංමාවත් ශුද්ධ කරවමු. දන් දෙමු. මල් පුදමු. සිව්රු පිළි පුදමු. යැයි කුසල් කිරීමට ඉදිරිපත් වූවන් වළක්වා අපි බණ දහම් උගනිමු. ප්‍රතිපත්ති පුරමු. ශාසනාභිවෘද්ධිය පිණිස කටයුතු කරමු යැයි කියා කුසල්හි නොයෙදුනන් ද මෙහි ඉපද පැසෙති.

## 103. උරචක්‍රමාල නරකය

මෙම නරකය දකුණු සාගරය අසල දඹදිවට කෙළවරෙහි මුතුවැල පන්තියක් මෙන් වාසල් දොරටු සතරකින් ද, ප්‍රකාර සතරකින් ද, වටව මනරම් නගර, වීථි පෙළින් යුක්තව මෙන් මහාමේරු පර්වතයට දකුණෙන් පිහිටියේ ය. මෙම නිරය සරසන ලද නුවරක් මෙන් පෙනෙයි. මෙහි පැසෙන නිරි සතුන් ඔටුනු, ආභරණ පැළඳ සැරසුනන් මෙන් පිටත සිටියවුන්ට පෙනෙති. පිටත උපන් නිරිසතුන් **"මමත් මෙහි රජකමට යමි"** යැයි රැවටී නිරය සමීපයට ගිය විට ඇතුළත සතුන්ගේ

ඔටුනු මෙන් පෙණුනු උරචක්‍රමාලා කැරකී භ්‍රමණය වී ඇවිත් නිරිසතුන්ගේ ශරිර කැපී සුනු විසුනුව යයි. නැවත එහිම කර්ම බලයෙන් හටගනිති.

මෙහි ඇතුළත උපන් නිරිසතුන්ගේ ශරීර මස් ලිය ලා වෙන් වී ලේ ගලත්. පිටත සිටියවුන් ඇඟ ලේ තැවරුණු එම සතුන්ගේ ඇඟ සඳුන් තැවරුණාක් මෙන් පෙනෙති. එම සතුන් බැගෑපත්ව හඬනා ශබ්දය ගී කියන්නාක් මෙන් ඇසෙයි. පිටත සිටියවුන්ගේ කර්ම බලයෙන් මෙලෙස රැවටී "යහළුව, ඔබලා මෙතෙක් විඳි සැප අපටත් දෙව" යැයි කී විට කරෙහි වූ උරචක්‍රමාලය ගලාවා පිටත සිටි නිරිසතුන්ගේ කරට දැමූ විට එය භ්‍රමණය වෙමින් නිරි සතුන් කැපි කැපී පැසෙන්නට පටන් ගනිති. මෙසේ නිරය තුළට වැටී මහත් සේ දුක් විඳිති.

මනුලොව දී තමන් හැදූ වැඩූ මව්පියන්ට අතින් පයින් පහර දුන්නා වූ ද, පොල්ලෙන්, දණ්ඩෙන් ගසා බිම හෙළා ගැහැට කළවුන් ද මෙහි වැටී පැසෙති. මොවුන්ගේ ආයුෂය මෙතැකැයි පමණ නැත. බුද්ධාන්තරයකින්වත් නොමිදි කර්මය ගෙවුණු දවසක ඉන් අත මිදෙති.

## 104.ශ්‍රමණාතාප නරකය

මෙහි උපන් නිරි සතුන් බෙනය ඇති ගසක් යටින් ගිනි ඇවිල ගත්තා සේ ගිනි ඇවිල දැවෙති. කයෙහි පොරවා ගෙන ඇති අඳන, සිවුරු, ඉන පටිය, ගිනි ඇවිල දැවෙති. අතේ ඇති පාත්‍රය ගිනියම් රතට රතු වී ඇවිලගෙන දැවෙයි. එසේ ඇවිලගත් ගිනි දැල් පිටතට නොගොස් කය තුළම දැවෙයි. එම ගිනි ගත් සිවුරු, පාත්‍ර ඉවත් කර ගැනීමට නොහැකිව හඬ හඬා පැසෙති. මෙලෙස කල්පයක් මුළුල්ලෙහි අතරක් නැර පැසෙති.

බුදු සසුනෙහි පැවිදි වී විනය ඉගෙන මහණ දම් නොපුරන්නෝ ද, කුහකව ත්‍රිපිටකය කටපාඩම් කොට ප්‍රගුණ කොට කාම විතර්කාදී කෙලෙස් විතර්කයන් ද, නීවරණයන් ද, ජය නොගෙන විසූ භික්ෂූන් ද, අල්පේච්ඡතාදී ලද දෙයින් සතුටු නොවූවන් ද, ශ්‍රමණ බැව්හි පෙනී සිට තුන් දෙර සංවර නොකළවුන් ද, සිත තුළ කසළ ගොඩක් මෙන්

කෙලෙස් කුණුවලින් පිරුණවුන් ද, දුස්සීල භික්ෂූන් ද, දුස්සීල භික්ෂුණීහු ද, දුස්සීල සික්ඛමානාවෝ ද, දුස්සීල සාමණේර, සාමණේරියෝ ද, මිනිසුන් සැදැහැ සිතින් පුදන සිව්පසය පරිභෝග කොට අන් භික්ෂු සාමණේරයන් කැටුව කෙළි කවට කම් කරමින් දවස නිකරුණේ ගෙවන්නවුන් ද, භාවනාවක නොයෙදී නොබැලිය යුතු දේ බලමින්, නො ඇසිය යුතු දේ අසමින් පවුකම් කරණ මහණ ගණයා මෙහි ඉපද බොහෝ දුක් විඳිති.

## 105. ඡකල්ප නරකය

බුදු සසුනෙහි මහණ උපසම්පදව ලබා සතර පාරාජිකාවන්ගෙන් යමකට පැමිණ දුසිල්ව සැදැහැතියන් දෙන ප්‍රත්‍ය පාරිභෝග කළවුන් මෙහි ඉපද පැසෙති.

## 106. පූජග්ගි නරකය

දගැබ්, මහ බෝධි, ධාතු, පිළිම සන්තක බඩු, සතු වූ හෝ කෑ යුතු බුදිය යුතු දේ දගැබ්, මහා බෝධි, ධාතු ප්‍රතිමා, පිළිම වලට පූජා නොකරන්නා වූ භික්ෂු, භික්ෂුණී, සාමණේර, ස්ත්‍රී, පුරුෂයන් මෙහි ඉපද පැසෙති.

## 107. තිප්පකටුකාලය නරකය

භික්ෂු භික්ෂුණී, සාමණේර, තාපස පැවිද්දෙන් පැවිදිවූවන් යැයි කියා අනුන් ශ්‍රද්ධාවෙන් දුන් දෙය වළඳ බුද්ධ වත්, බෝධි වත්, චෛත්‍ය වත් ආචායර්‍ය උපාධ්‍යාය වත් ආදී වත් පිළිවෙත් නොකොට ධර්‍ම විනය ඉගෙනීමක් නැතිව කැමති කැමති තැන්වල ගොස් බාලයින් හා එක්ව සමපලාප කියමින්, නිදන විට හිසට පයට කොට්ට තබා හිස වසා පොරවා නිද නැගිට පැන් ස්නානය කොට ක්‍රීඩා ආදිය බැලීමට ඇසීමට කැමතිව වෙසෙත් ද, ඔවුහු එම පවින් නිරයෙහි වැටීමෙන් පසු යමපල්ලන් විසින් ගිනි ඇවිලගත් රැහැනක් බෙල්ලේ බැඳ, ඇද ඇවිද

ගිනි ඇවිලගත් යපොළොවෙහි පෙරලා තල් ගස් තරම් උස වූ එම තිරිසතුන්ගේ මුඛය විවර කොට ලෝදිය වත් කරත්. එයින් ගුගුර ගුගුරා මහත් සේ දුක් වඳිමින් පැසෙති.

## 108. කුක්කුටග්ගි නරකය

බල්ලන්, බළලුන්, කුකුළන් පොර කෙට වූ භික්ෂු සාමණේරයන් ද, ගිහියන් ද මෙහි ඉපද මහත් දුක් විඳිති.

## 109. පත්තග්ගි නරකය

දගැබ්, මහා බෝධි, පිළිම ගෙවල් පෙනෙන මානයේ හිසට කුඩ ඉහලා, තල්පත්, වටාපත්, සේසත් අල්ලා විහාර සීමා ඇතුළත ඇවිදින්නෝ ද, විහාර මඟින් යන්නා වූ ද භික්ෂු, සාමණේර, තාපස, ගිහියෝ මෙහි ඉපද පැසෙති.

## 110. ඵලමූලග්ගි නරකය

අල, කුකුලල, කොස්, පොල්, කෙසෙල්, වැල, වරකා, දෙහි, දෙඩම්, නාරං, බුලත්, පුවක්, ආදි විහාර ආරාම සන්තක ගම්වල හා ඉඩම්වල ඇති දේ ලෝභ උපදවා දන් නොදී අනුභව කළ භික්ෂු, සාමණේර ගිහියෝ මෙහි උපදිති.

## 111. ඡඩ්ඩිතග්ගි නරකය

ආචාර්‍ය්‍ය උපාධ්‍යයන් සමඟ යම් ගමකට හෝ රටකට හෝ ජනපදයකට හෝ ආරණ්‍යකට හෝ විහාර ආරමයකට හෝ ගොස් ආචාර්‍ය්‍ය උපාධ්‍යයන් හැර තමන් කැමති තැන්වල, කැමති දිසාවල ගියා වූ භික්ෂු සාමණේරයන් ද, ආරාමිකයන් ද, ගිහියන් ද, මෙහි ඉපද පැසෙති.

## 112. ඔසක්කතාප නරකය

මෙහි තුන් ගව් පමණ වූ ශරීර ඇති නිරි සතුන්ගේ කටින් ගිනි කඳු කඩා හැළෙමින් ඇවිළෙති. යමපල්ලන් නා නා විධ වූ අවි ආයුධ ගෙන ඔවුන්ට අනිති. කොටති. විදිති. නිරි සතුන් මහ හඬින් හඬ හඬා පැසෙති. යමපල්ලන් අපවිත්‍ර වූ, කුණු වූ ලෝදිය පොවති. මෙසේ මහත් සේ දුක් විඳිති.

බුදු සසුනෙහි පැවිදි උපසම්පදව ලැබ, තුන් පිටකය ඉගෙන මානයෙන් මත්ව, මා හැර ධර්ම ධරයෙක්, විනය ධරයෙක් ඇත්දැයි සිතා අකැප දෙය කැප යයි ද, කැප දෙය අකැප දෙය යයි කියා ධර්ම විනය වරදවා කීවවුන් ද, ලාභයක් කෙරෙහි ලෝභයෙන් සිල්වතුන් කී බණට නුඹ වහන්සේලා කුමක් දනිත් ද? බොල් මෙන් හිස් ය. මම ධර්මධරය, විනයධර යැයි මානයෙන් ලාභයන් කෙරෙහි ලෝභයෙන් සිල්වතුන්ට, ගුණවතුන්ට, ධර්මයට, විනයට, අනදර කළවුන් මෙහි ඉපද පැසෙති.

## 113. අපච්චවෙක්ඛිතග්ගි නරකය

බුදු සසුනෙහි පැවිදිව සැදැහැයෙන් දෙන සිව්පසය ප්‍රත්‍යවේක්‍ෂා නොකොට පරිභෝග කළවුන් මෙහි ඉපද පැසෙති.

## 114. කුලදූසග්ගි නරකය

මෙහි උපන් නිරි සතුන් මහත් වූ ගිනි ජාලා මාද දැවෙමින්, මහ හඬින් හඬමින් පැසෙති. බුදු සසුනෙහි පැවිදිව ප්‍රත්‍ය ලෝභයෙන් එක් විසි අන්වේෂණයන්හි යෙදී ගිහියන්ගේ හිත් ගෙන ගිහියන්ගේ සැදැහැ ගුණ නසා බුදු සසුනට අනර්ථ කළ මහණුන් මෙහි ඉපද පැසෙති.

## 115. ලාභූපක්කම නරකය

තමාගේ සිත තුළ පවත්නා ඇති ගුණ විනාශ කොට ගෙන, කුසල හැඟීම් පහ කොට පිස්සෙකු මෙන් භ්‍රාන්ත සිතින් දුව පැන ඇවිද ලාභ උපයා ගැනීමෙන් ද, නැට්ටුවෙකු මෙන් තැන තැන ඇවිද ලාභ ඉපයීමෙන් ද, ඔවුනොවුන් බිඳුවා කෝලාහල කොට ලාභ ඉපයීමෙන් දැයි මෙලෙස බුදුරජාණන් වහන්සේ වදාළ සිකපද කඩ කොට පාපයෙහි ලැජ්ජා භය නැතිව ගසා කෑමෙහි ශූර වූ කපුටන් මෙන් අනුන්ගේ ගුණාගුණ නොසළකා දෙන නොදෙන සිත් නොසළකා ගමින් ගමට ගෙන් ගෙට ගොස් දුව පැන ඇවිදීමෙන් කිලිටි වූ ආජීව පාරිශුද්ධි ශීලය ඇති මහණුන් මෙහි ඉපද දුක් විඳිති.

## 116. කිලේසග්ගි නරකය

බුදු සසුනෙහි පැවිදිව, පඤ්ච නීවරණාදීන්ගෙන් වෙන් විය නොහැකිව කමටහන් අත්හැර විපරිත වූ සිතින් කෙලෙස්වලට වසඟ වූ සිතින් කටයුතු කොට අකුසල සිත් මතුව මළවුන් මෙහි උපදිති.

## 117. ඉන්ද්‍රිය අගුප්තද්වාර නරකය

බුදු සසුනෙහි නිවන් අවබෝධයට පැවිදිව ඉන්ද්‍රිය දමනයෙන් තොරව, ස්ත්‍රී රූපයන් දැක හෝ රන්, රිදී, මුතු, මැණික් හෝ නාන වස්ත්‍ර හෝ දැක එහි ලෝභ උපදවා ඒවායේ නිමිති ගෙන එම සිතින් මැරී මෙම නිරයෙහි ඉපද මහත් දුක් විඳිත්.

## 118. කුසග්ගි නරකය

බුදු සසුනෙහි පැවිදිව උපසම්පදව ලැබ, බුද්ධාවවාදයෙහි නොහික්මී, ගස් කොළන් සිඳිමින්, කොළ කඩමින්, කොස්, පොල්, තල, මුං, වී ආදී බීජ සිඳ බිඳ දමා ශික්ෂා කඩ කළවුන් මෙහි ඉපද පැසෙති.

## 119. උස්සද නරකය

සෙනසුන්, දගැබ්, මහා බෝධි කොටු බැඳවීමට ද, අම්බලම් සෑදීමට ද, ඒ දඬු දැමීමට ද එක් රැස් කළ මුදල් හා වස්තූන්ට ලෝභ කොට තමාගේ යැයි කියා වංචා කොට කැවවුන් මෙහි ඉපද පැසෙති.

## 120. නිච්ඡව නරකය

සතුන් මරා, පුලුස්සා කැවවුන් මෙහි ඉපද, ගිනි ඇවිලගෙන මහත් දුක් විඳිමින් යමපල්ලන් පමුණුවන දුක් පීඩා වලින් හඬ හඬා පැසේ.

## 121. ගෝපාල නරකය

පමණ ඉක්මවා අලි ඇතුන්ගෙන්, ගවයන්ගෙන්, මී ගවයන්ගෙන්, වැඩ ගත්තවුන් මෙහි ඉපද පැසෙති.

## 122. අයගුල නරකය

දැන දැනම භාග්‍යවතුන් වහන්සේ පනවා වදාළ ශික්ෂා පද කඩ කළා වූ භික්ෂු සාමණේරයන් මෙහි ඉපද, දැවෙමින්, ලෝදිය බොමින්, ලෝහ ගුලි ගිලිමින් මහත් සේ දුක් විඳිති.

## 123. භිදග්ගි නරකය

විහාර, ආරාම විනාශ කළවුන් මෙහි ඉපද මහත් දුක් විඳිති.

## 124. ගුථ කරීසග්ග නරකය

නුසුදුසු තැන්වල මල පහ කළවුන් ද, මංමාවත්හි මල පහ කළවුන් ද මෙහි ඉපද පැසෙති.

## 125. සතග්ගි නරකය

එක් විසි අන්වේශනයන් කළා වූ ද, කුල දූෂණය කළවුන් ද, වෙදකම් කළවුන් ද, නැකත් කීවා වූ ද මහණුන් මෙහි පැසෙති.

## 126. තේලපූලග්ගි නරකය

විහාර, ප්‍රති පිළිම, චෛත්‍ය, මහ බෝධීන්ට හානි වන ලෙස ද, අපවිත්‍ර වන ලෙස ද පහන් දැල්වූවන් මෙහි ඉපද පැසෙති.

## 127. විලසග්ගි නරකය

සඟ සතු වූ ඉඩකඩම්, කුටි සෙනසුන්, භාණ්ඩ, උපකරණ, මිල මුදල්, භුක්ති වින්දවුන් මෙහි ඉපද පැසෙති.

## 128. මහාසුණඛ නරකය

සිල්වතුන්ට, ගුණවතුන්ට, සුනඛයින් උසි ගන්වා පීඩා හානි කළවුන් සුනඛයන් ලවා කැවවවුවන් ද, සුනඛයන් යොදා ගෙන සත්ත්ව දඩයම් කළවුන් ද මෙහි ඉපද පැසෙති.

# ❄ නිගමනය

කරුණු මෙසේ හෙයින් නිරය දුක නම් ඉතා භයානකය. නිරයෙහි උපන් පසු එයින් මිදී මනුලොව ඉපද පින් කිරීමට කැමැත්ත ඇති වෙයි. පින්කම් නොකිරීමෙහි දෝෂයත් කිරීමෙහි ප්‍රයෝජනයත් ඔවුන්ට වැටහෙන්නේ එවිටය. එහෙත් එයින් අත මිදී මිනිසත් බව ලැබීම කවදා සිදුවේ ද? කවදා පින් කිරීමට ඉඩක් ලැබේ ද? එබැවින් පින් කිරීමට සෑම අතින්ම පහසුව ඇති මිනිසත් බව ලැබී ඇත. බුද්ධෝත්පාදය, මිනිසත් බව, ක්‍ෂණ සම්පත්තිය, පැවිද්ද, සද්ධර්ම ශ්‍රවණය සම්පූර්ණය. පෙර සඳහන් වූ දේවදූතයෝ ද දක්නට ලැබේ. එබැවින් පින් කිරීමට පමා නොවිය යුතුය. හිස ගිනිගත්තෙකුට කොතරම් වෙනත් කටයුතු ඇත්තේ නමුත් එම ගිනි නිවා ගැනීමට ඉක්මන් වන්නාක් මෙන් කල් නොදමා දැන් දැන්ම කුසල් කිරීමට ඉක්මන් විය යුතුය. මරණය කොයි මොහොතේ වේදැයි කිසිවෙකුටත් කිව නොහැකිය. එබැවින් මොහොතකුදු පමා නොවිය යුතුය.

යමරජු ඉදිරියට පැමිණි විට දේවදූතයන් දුටුවෙහි ද යැයි ඇසූ විට නැත යැයි කීමට නිර්මල බුදු සසුනෙහි ධර්ම විනය හදාළ කෙනෙකුට නොහැක්කේය. එසේ නැත යැයි වැරදීමකින් හෝ අමතක වීමකින් හෝ නොව නොසැලකිලිමත්ව කුසලයන්හි නොයෙදීම හේතුවෙන් ප්‍රකාශ කරත් ද, එහි ඇති තතු යමරජු වටහා ගන්නවා ඇත. එකල්හි කිසි ලෙසකින් සමාවක් බලාපොරොත්තු නොවිය හැකිය.

තමන් කළ අකුසල කර්මයන්හි විපාක තම මව්පිය නෑ හිතමිතුරු සොහොයුරු දෙව් බඹුන් ආදී කිසිවෙකුටවත් භුක්ති වින්ද නොහැක. එහි විපාක විඳීම තමන් සතුය. එබැවින් තම අතින්ම තම හිසට ගිනි අඟුරු දමා නොගෙන තමන් විසින් කරන කර්මයන්හි විපාක තමන්ම විඳින බව දැන දැනම තමන්ට ද අනුන්ට ද දෙපාර්ශ්වයටම ද සදේවක ලෝක වාසීන්ට ද යහපතක් සැනසිල්ලක් අර්ථයක් වන්නේ ද භව නිස්සරණයට හේතු වන්නේ ද එබඳු කර්ම දිවි හිමියෙන් කිරීම සුදුසුය.

**සාදු සාදු සාදු**